TETSUKO KUROYANAGI

# TOTTO-CHAN The Little Girl at the Window

# හරි පුදුම ඉස්කෝලෙ

දඟකාර ජපන් දැරියක හා
අසිරිමත් පාසලක් පිළිබඳ කථාව



පරිවර්තනය

ලීලානන්ද ගමාච්චි

ආදීති පුතාට
රමණා නැන්දාගෙන්
2004/06/30



# හරි පුදුම ඉස්කෝලෙ

දඟකාර ජපන් දැරියක හා අසිරිමත්
පාසලක් පිළිබඳ කතාව



# දුම්රිය නැවතුම් පොළ

ජියුගාවෝකා නැවැතුම් පොළේ දී ඔවුහු ඔයිමාචි දුම්රියෙන් බැස්සෝ ය. ටිකට් දොරටුවෙන් පිට වීමට මව ටොට්ටෝ චං ගේ අතින් අල්ලා ගත්තා ය. මීට පෙර දුම්රියෙන් ගමන් ගොස් නො සිටි දැරිය අතේ මිරිකා ගෙන සිටි අගනා ටිකට් පත දීමට මැලි වූවා ය.

“මේක මම තියා ගන්නද?” ටොට්ටෝ චං ටිකට් පත් එකතු කරන්නා ගෙන් විමැසුවා ය.

“බැහැ, ඔයාට ඒක තියා ගන්න බැහැ.” ඔහු ටිකට් පත ගනිමින් පැවැසුවේ ය.

ටිකට් පත්වලින් පිරී තිබුණු පෙට්ටියට ඇඟිල්ල දිගු කළ ඇය, මෙසේ ඇසුවා ය. “මේ ඔක්කොම ඔයාගෙද?”

“නෑ, නෑ. ඒවා අයිති දුම්රිය ස්ථානයට” පිට වී යන්නන් ගෙන් ටිකට් පත් උදුරා ගනිමින් ඔහු කීවේ ය. “ඔහෝ,” කෑදර කමින් පෙට්ටිය දෙස ඇස් දල්වා සිටි ඇය, “මං ලොකු වුණාම ටිකට් විකුණන කෙනෙක් වෙන්න ඕනෑ”යි කියන්නට වූවා ය.

ටිකට් පත් එකතු කරන්නා පළමු වරට ඇය දෙස නෙත් හෙළුවේ ය. “මගේ චූටි පුතාටත් දුම්රිය පොළේ රස්සාවක් ඕනැලු. ඔව්, ඔයාටත් එයත් එක්ක එකට වැඩ කරන්න පුළුවන්.” ඔහු කීවේ ය.

...පමණකට පිය මැන නැවැති, ටිකට් පත් එකතු කරන්නා දෙස හොඳින් බලා සිටියා ය. උපනෙත් පැළැඳ සිටි ඔහු කරුණාවන්ත යැයි ඇයට සිතිණ.

"හ්ම්," ඉණෙහි දෑත් තබා ගනිමින් ඇය තම අදහස පරිස්සමින් සලකා බැලුවා ය. "ඔයාගෙ පුතත් එක්ක වැඩ කරන එක මට ප්‍රශ්නයක් නොවෙයි. මං ඒ ගැන පස්සෙ හිතන්නම්. දැන් මේ අලුත් ඉස්කෝලෙට යන නිසා මට වෙලාවක් නැහැ." ඇය කීවා ය. ඈත නැවැතී බලා ගෙන සිටි මව වෙත දුවමින් ඇය මෙසේ හඬ ගෑවා ය. "මං ලොකු වුණාම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා."

මව පුදුම නො වූවා ය. නමුත් මෙසේ පැවැසුවා ය. "මං හිතුවේ ඔත්තු කාරියක් වෙන්න යනවා කියලා."

මව ගේ අත අල්ලාගත් ඇය, ඉදිරියට පිය මනින්නට වූවා ය. ඊයේ වනතුරු ම තමාට වුවමනා වූයේ ඔත්තු කාරියක වීමට බව ඇය සිහි කළා ය. එසේ වුවත් ටිකට් පත්වලින් පිරුණු පෙට්ටියක් අයිති කර ගැනීම මොන තරම් සතුටක් ද?

"ඒක හරි." අපූරු අදහසක් ඇයට පහළ විය. උස් හඬින් ඒ ගැන මවට කියන්නට වූවා ය. "ඔත්තු බලන ගමන්ම ටිකට් විකුණන කෙනෙකුත් වෙන්න මට බැරිද?"

මව පිළිතුරු නො දුන්නා ය. ඇය පැළැඳ සිටි සිගිති මල්වලින් හැඩ ගැන්වුණු ලොම් හිස් වැස්මට යටින් දිස්වූ පියකරු වත බියමුසු බවක් පළ කළේ ය. ඇත්තට ම, ඇය කනස්සල්ලට පත් ව සිටියා ය. ටොට්ටෝ චං අලුත් පාසලට බාර නො ගත්තොත් මොනවා කරන්න ද? මඟ දිගේ උඩ පනිමින් තමන්ට ම මුමුණමින් එන ටොට්ටෝ චං දෙස ඇය නෙත් හෙළුවා ය. මව ගේ සිතුවිලි ගැන නොදත් ටොට්ටෝ චං ඇගේ නෙත් දෙස බැලුවා ය. "මම අදහස වෙනස් කළා. විකුණන බඩු ගැන වර්ණනා කරන වීදි සංගීත කණ්ඩායමකට එකතු වෙන්න මට හිතෙනවා."

නො පහන් හඬකින් මව ගුගුරන්නට වූවා ය. "එන්න ළමයො, අපි ඉක්මනට යන්න. ලොකු මහත්තයා අපි එනතුරු බලාගෙන ඇති. කට වහගෙන පාර බලාගෙන පරිස්සමින් එන්න."

ඔවුන් ඉදිරියෙහි ඇසට හමු වන මානයේ, කුඩා පාසලෙක දොරටුව පෙනෙන්නට විය.

# කවුළුව අසල සිඟිති දැරිය

මව කනස්සලු වීමට හේතු වී තිබුණේ අපූරු සිදුවීමෙකි. ටොට්ටෝ චං පාසල් යාම ඇරඹුයේ ඉතා මෑතක දී ය. ඇය නොබෝ දිනකින් ම ඒ පාසලින් නෙරපා තිබිණ. "අගෙයි! පළමු වන ශ්‍රේණියේදීම දැරියක පාසලෙන් අස් කරලා!"

එය සිදු වූයේ සතියකට පමණ පෙරාතුව ය. ටොට්ටෝ චං ගේ ගුරුතුමිය ඇය ගේ මව පාසලට ගෙන්වා මෙසේ කීවා ය. "ඔයාගෙ දුව මගේ පන්තියට හැබෑම කරදරයක්. මා කියන්නෙ එයා වෙනත් පාසලකට ගෙන යන්න කියලයි." සිත්කලු තුරුණු ගුරුතුමිය මෙසේ ද කීවා යː "දැන් මගේ ඉවසීමේ සීමාව ඉවරයි."

මවට පුදුමයෙනුත් පුදුමයි. මුළු පන්තියකට කරදරයක් වන්නට ටොට්ටෝ චංට කරන්න පුළුවන් දෙයක් මේ මිහිපිට තිබෙනවා ද?

කොටට කපා ඇති හිස කෙස් අතින් පිරිමදිමින්, නොසන්සුන් ලෙස ඉක්මනින් ඇසි පිය හෙළමින් ගුරුවරිය විස්තරය ඇරැඹුවා ය. "මුල සිටම කියන්නම්කො. මෙයා, මෙයාගෙ පොත් මේසෙ සිය වාරයකටත් වඩා අරිනවා වහනවා. මා කියල තියෙන්නෙ, යම් දෙයක් ගන්න හරි දාන්න හරි මිසක් තමන්ගෙ මේසය අරින්න එපා කියලා. මෙයා කරන්නෙ මොකක්ද? එක දිගට නොනවත්වාම මොකක්' හරි දෙයක් ඒකෙන් ගන්නවා. ඒකට දානවා. සටහන් පොත, පැන්සල් පෙට්ටිය, පාඩම් පොත වැනි මේසය ඇතුළේ තියෙන මොනවා හරි එළියට ගන්නවා. ඇතුළට දානවා. අපි හෝඩිය ලියනවායි හිතමු. ඔයාගෙ දූ මේසය අරිනවා. සටහන් පොත ගන්නවා. මේසය වහනවා. නැවත එය අරිනවා. ඔළුව ඇතුළට දානවා. පැන්සලක් ගන්නවා. වේගයෙන් මේසය වහනවා. 'අ'යන්න ලියනවා. ඒක ලස්සණ නැත්නම්, ලියද්දී වැරැදුණා නම් නැවත මේසය අරිනවා. මකනය ගන්නවා. මේසය වහනවා. අකුර මකනවා. මකනය දමන්න මේසය ඇරලා වහනවා. මේ සියල්ලම කරන්නේ ඉතාම වේගයෙන්. අකුර ලියල ඉවර වුණාම ඒ ඒ දේ දමන්න වෙන වෙනම මේසය අරිනවා. වහනවා. පැන්සල දමනවා, මේසය වහනවා. නැවත ඇර සටහන් පොත දමනවා.

ඊළඟ අකුර ලියන්න ඕනෑ වුණාම නැවතත් ඒ සියල්ල ඒ විදියටම කරනවා. සටහන් පොත, ඊළඟට පැන්සල, ඊළඟට මකනය ගන්න මේසය වෙන වෙනම අරිනවා, වහනවා. මේක බලා ඉන්න කොට මට කැරකිල්ල වගෙයි. ඒත් මෙයාට බණින්න බෑ. මොකද? මෙයා හැම වෙලාවකම ඒක අරින්නෙ වහන්නෙ හේතුවක් ඇතිව."

ඇගේ සිත මදක් සැහැල්ලු වූ බව වේගවත් ව ඇසිපිය හෙළීමෙන් පෙනී ගියේ ය.

ටොට්ටෝ චං තම මේසය ඒ තරම් ඇරියේ වැසුවේ ඇයි? මවට වහා ම මේ ගැන මතක අවදි විය. ඒ පාසලට ගිය පළමු දිනයේ දී, ආපසු නිවසට පැමිණි ඇය කෙතරම් උද්දාමයෙන් කතා කළා දැයි ඇයට මතක් විය. "ඉස්කෝලෙ නම් හරි පුදුමයි. මගෙ ගෙදර මේසෙ ලාච්චුව අරින්න ඉස්සරහට අදින්න ඕන. ඒ වුණාට ඉස්කෝලෙදි මට ලැබුණ මේසෙ උඩ උස්සල අරින්න පුළුවන් පියනක් තියෙනවා. ඒක හරියට පෙට්ටියක් වගෙයි. ඕනෑම දෙයක් ඒක ඇතුළෙ අල තියා ගන්න පුළුවන්. ඒක හරිම අගෙයි."

ටොට්ටෝ චං මේ අලුත් මේසයේ පියන ඉමහත් සතුටින් අරිනු වසනු මවට මැවී පෙනෙන්නට විය. එය වරදක් යැයි ඇයට නො සිතුණි. කෙසේ වුවත් අලුත් ගතිය ඉවර වුණා ම මෙසේ කිරීම නවත්වනු ඇතැයි ඇයට හැඟිණ. ගුරුතුමියට ඇය කීවේ මෙපමණෙකි : "මම ඒ ගැන එයාට කියන්නම්."

ගුරුතුමිය ගේ හඬ ඉහළ ගියේ ය. "ඒක ඇතිය කියල මා හිතන්නෙ නෑ."

මව පසු බැස්සා ය. ගුරුතුමිය කතා කර ගෙන ගියා ය. "මෙයා මේසය හඬවන්නේ නැත්නම් මුළු කාලයම හිටගෙන ඉන්නවා."

"හිටගෙන ඉන්නවා? කොහේද?" විපිළිසර වූ මව ඇසුවා ය.

"කවුළුව ළඟ," ගුරුතුමිය පිළිතුරු දුන්නා ය.

"ඇයි, එයා කවුළුව ළඟ හිටගෙන ඉන්නෙ?" අවුල් සිතින් යුතු මව විචාළා ය.

"එතකොට එයාට පාරෙ යන වීදි සංගීත කාරයන්ට කතා කරන්න පුළුවන් නොවැ?" ඇය හඬ නඟා කීවා ය.

ගුරුතුමිය ගේ කතාවේ හරය මෙසේ යː පැයක් පමණ නොනවත්වා මේස පියන හඬ නැංවීමෙන් පසු ව, ටොට්ටෝ චං මේසය අතහැර ගොස් කවුළුව අසල සිට ගනී. පිටත බලා සිටී.



නිහඬ ව සිටින බැවින් ඇය එතැන සිටියාට කම් නැතැයි ගුරුතුමිය සිතත් ම, විසිතුරු ඇඳුමෙන් සැරසී, පාරේ යන වීදි සංගීත කණ්ඩායමට ඇය හඬ නඟා කතා කරයි. ටොට්ටෝ චං ගේ සතුටටත් ගුරුතුමිය ගේ කනස්සල්ලටත් හේතු වන පරිදි, පන්ති කාමරය පිහිටා තිබුණේ වීදියට මුහුණ ලා බිම් මහලේ ය. පන්ති කාමරයත් වීදියත් වෙන් වූයේ මිටි පඳුරු වැටකින් පමණි. පන්තියේ ඕනෑ ම කෙනෙකුට පාරේ යන්නන් සමඟ කතා කළ හැකි විය. ටොට්ටෝ චං කතා කළ විට සංගීත කණ්ඩායම පන්තිය අසලට පැමිණේ. ගුරුතුමිය පැවසූ පිරිදි ටොට්ටෝ චං මීළඟට කරන්නේ මේ කරුණ මුළු පන්තියට ම හඬ ගා කීමයි. "මෙන්න, එයාල ඇවිල්ල!" එවිට සියලු ම ළමයි කවුළුව අසලට දිව එති. ඔවුන් සමඟ කතාව අරඹති.

"සෙල්ලම් කරන්නකො." ටොට්ටෝ චං කියයි. වෙන දිනයන්හි දී නිහඬ ව පාසල පසු කර ගෙන යන සංගීත කණ්ඩායම ළමයින් ඉදිරියේ හොරණෑ, සිනු, බෙර, වීණා මහ හඬින් වයන්නට පටන් ගනිති. කිසිවක් කළ නොහැකි ව අසරණ වන ගුරුතුමිය, හඬ නවතින තුරු නිහඬ ව සිටී.

අවසානයේ දී සංගීතය නවත්වා, කණ්ඩායම ඉවත් ව ගිය පසු, ටොට්ටෝ චං හැර අනෙකුත් ළමයි තම අසුන්වලට යති. "ඔයා ඔතන කවුළුව ළඟ මොනවා කරනවා දැ"යි ගුරුතුමිය ඇසූ විට, ටොට්ටෝ චං ඉතා උනන්දුවෙන් මෙසේ පවසයි. "තවත් කණ්ඩායමක් එන්න පුළුවන්. තව අයත් ඇවිල්ලා, එයාලා අල්ල ගන්න අපට බැරි වුණොත් ඒක හරිම ලජ්ජාවක් නේද, ගුරුතුමී?"

"මේ ඔක්කොම කොතරම් හිරිහැරද කියලා ඔයාට පේන්නෙ නැද්ද?" ගුරුතුමිය හැඟුම් බර ව ප්‍රශ්න කළා ය. "ඊළඟට...." තවත් තියුණු හඬින් කතා කරන්නට වූවා ය. මව තුළ ඇය කෙරෙහි අනුකම්පාවක් ඇති විය.

"එයා තව මොනවද කරන්නෙ?" බිඳ වැටුණු හඬකින් මව අසා සිටියා ය.

"තව මොනවද? එයා කරන දේවල් ගණන් බැලුවොත් අස් කර ගෙන යන්න කියල මදි."

ගුරුතුමිය තැන්පත් බවක් පා, මව වෙත කෙළින් ම නෙත් යොමු කළා ය. "මේ ඊයේ ටොට්ටෝ චං පුරුදු විදියට කවුළුව ළඟ හිට ගෙන හිටියා. වීදි සංගීත කරුවන් එනතුරු එයා බලා

ඉන්නවායි හිතා ගෙන, මම පාඩම කර ගෙන ගියා. හදිසියේම එයා කාගෙන් දෝ අහන්න පටන් ගත්තා. "ඔයාල මොනවද කරන්නේ?" කියලා. එයා කතා කළේ කාටද කියලා මා හිටිය තැනට පෙනුණේ නෑ. මොකක්ද මේ සිද්ද වෙන්නෙ කියලා මට පුදුම හිතුණා. එයා නැවතත් ඇහුවා "ඔයාලා මොනවද කරන්නේ?" කියලා. එයා කතා කළේ පාරේ සිටි කෙනෙකුට නො වෙයි. කොහේ හරි ඉහළින් සිටි කෙනෙකුට. මට මේ ගැන නොසොයා ඉන්න බැරි වුණා. එයාගෙ විමසීමට පිළිතුරක් දෙනවා ඇසෙන තුරු මට ඉවසුමක් තිබුණේ නැහැ. නමුත් කිසිම පිළිතුරක් ලැබුණෙත් නෑ. එහෙම වුණත් එයා දිගින් දිගටම කෑගසා ඇසුවේ "ඔයාලා මොනවද කරන්නේ?" කියලා. මේ අස්සේ ඉගැන්වීම කර ගෙන යන්න මට පුළුවන් වුණේ නෑ. මාත් කවුළුව ළඟට ගිහින් ඔයාගෙ දුව කතා කළේ කාට දැයි බැලුවා. එළියේ පියස්සේ වැහිළිහිණි දෙන්නෙක් කූඩුවක් හදහදා හිටියා. එයා කතා කළේ වැහිළිහිණියන්ට! මට ළමයින් තේරුම් ගන්න පුළුවන්. ඒ නිසා වැහිළිහිණියන්ට කතා කිරීම වැරැද්දක්ය කියල දැන් මම කියන්නෙ නෑ. එහෙම වුණත් උන් මොනවා කරනවා දැයි පන්තියේ ඉඳ ගෙන උන්ගෙන් ඇසීම සුදුසු නැති බවයි මා හිතන්නෙ."

මව සමාව ඉල්ලීමට මුව විවර කිරීමට පෙර, ගුරුතුමිය කතා කර ගෙන ගියා ය. "ඊළඟට චිත්‍ර පන්තියේ සිද්ධිය. මම ළමයින්ට කීවා, ජපන් කොඩිය අඳින්න කියලා. අනෙක් සියලු ම ළමයි ඒක හරියට ඇන්දා. ඔයාගෙ දුව නාවික කොඩිය අඳින්න පටන් ගත්තා. ඔයා දන්නවානේ, අර එළිය තීරු තියෙන නාවික කොඩිය. කමක් නෑ. ඒකෙ වරදක් නැහැ කියල මම හිතුවා. නමුත් එයා ඊළඟට ඒක වටේට අයින් තීරුවක් අඳින්න පටන් ගත්තා. ඔව්! තීරුවක්. තරුණ කණ්ඩායම්වල බැනර්වල තියෙන අයින් තීරු ඔයා දන්නව නේද? ඒ වගේ තීරුවක්. එයා කොහේදි හරි ඒ වගේ එකක් දැකල ඇති. එයා මොනවා කරනවා දැයි මට තේරුම් යන්නත් කලින් කහ පාට තීරුව කඩදාසියෙන් පිට මේසය මතුපිටත් අඳින්න පටන් ගත්තා. ඇගේ කොඩිය කඩදාසියේ වැඩි කොටසක පැතිරී තිබුණු නිසා, අයින් තීරුව අඳින්න ඉඩ තිබුණේ නැහැ. එයා කහපාට හුණු කූරු අරගෙන කඩදාසිය වටේට මේසය මත සියගණන් ඉරි ඇන්දා.



කඩදාසිය ඉවතට ගත්තාම, මේසය පුරාම කහපාට ඉරි වැසී තිබුණා. ඒක පිරිසිදු කරන්න අපි ගත් මහන්සිය ප්‍රශ්නයක් නොවෙයි. වාසනාවකට ඒ සලකුණු තිබුණේ තුන් පැත්තක පමණයි."

අවුල් වූ සිතැති මව වහා මෙසේ ඇසුවා ය. "තුන් පැත්තක් කිව්වෙ?"

වෙහෙසට පත් ව සිටිය ද, ගුරුතුමිය කාරුණික ලෙස කරුණු පැහැදිලි කළා ය. එයා වම් පැත්තෙ කොඩි කණුව ඇන්දා. ඒ නිසා අයින් තීරුව කොඩියේ තුන් පැත්තකට විතරයි, ඇන්දේ."

මවට සහනදායක හැඟීමක් ඇති විය. "මට දැන් තේරෙනවා, තුන් පැත්තකින් විතරයි කියූ එක."

හැම වචනයක් ම බර තබමින් ගුරුතුමිය මෙසේ පැවසුවා ය. "නමුත් කොඩි කණුවෙන් වැඩි කොටස කඩදාසියේ පිටතට ගොස් තිබුණා. තාමත් ඒක මේසෙ තිබෙනවා."

පුටුවෙන් නැඟී සිටි ගුරුතුමිය රළු ලෙස මේ වචන පැවැසුවා ය. "නරක් වුණේ මගේ හිත පමණක් නොවෙයි. අල්ලපු පන්තියෙ ගුරුතුමියත් කරදරයට පත් වුණා."



පැහැදිලි ව ම, මේ ගැන යමක් කිරීමට මවට සිදු විය. ඔව්! තමන් ගේ දැරියට වෙනත් පාසලක් සොයා ගත යුතු විය. ඔව්! තමන් ගේ සිඟිත්තිය තේරුම් ගැනීමට හැකි, අන් අය සමඟ කටයුතු කළ යුතු අන්දම කියා දෙන්නට දන්නා අය සිටින පාසලක්!

සෑහෙන තරම් උත්සාහ කිරීමෙන් පසු ව, සොයා ගත් පාසල වෙත ය, ඔවුන් මේ ගමන් කරමින් සිටින්නේ.

පාසලින් නෙරපා හරින ලද බවක් මව ටොට්ටෝ චංට නො කීවා ය. වරදක් කරන ලදැයි වටහා ගැනීමට ඇයට නො හැකි බව මව දැන සිටියා ය. දුව ගේ සිත අවුල් කිරීමට මවට වුවමනා නො වී ය. කාරණාකාරණ තේරෙන වයසට පත් වන තුරු මේ ගැන ඇයට කිසිවක් නො කීමට මව වග බලා ගත්තා ය. ඇය කීවේ මෙපමණකි. "ඔයා අලුත් ඉස්කෝලෙකට යන්න කැමති නැද්ද? මට හරිම අගේ ඇති ඉස්කෝලයක් ගැන දැනගන්න ලැබී තියෙනවා...."

"හරි හොඳයි." ටොට්ටෝ චං පැවැසුවා ය. ඒ වුණත්... තමන් අස්කර ඇතැයි ඇය දනී දැයි මවට සැකයක් ඇති විය. ඉමහත් සතුටෙන් ටොට්ටෝ චං මෙසේ ඇසුවා ය. "වීදි සංගීත කාරයො අලුත් ඉස්කෝලෙටත් ඒවිද අම්මෙ?"

## නව පාසල

නව පාසලේ දොරටුව දුටු විට, ටොට්ටෝ චං නැවතුණා ය. ඇය මීට කලින් ගිය පාසලේ දොරටුව විශාල අකුරු පුවරුවක් රැගත් කදිම සිමෙන්ති කණුවලින් සැදුණේ විය. එහෙත් මේ පාසලේ දොරටුව, ඇනුත් කොළ සහ රිකිලි වැඩෙන වාම් මිටි කණු දෙකකින් යුතු විය.

"මේ දොරටුව ඇනුත් වැඩෙනවා..." ටොට්ටෝ චං කීවා ය. "ටැලිපෝන් කණුවක් තරම් උසට එය තව තවත් වැඩේවි..."

දොරටු කණු දෙක ඇත්තට ම, මුල් අදින ගස් දෙකකි. ඇය ඒ අසලට එත් ම, හැමූ සුළඟින් නාම පුවරුව ඇද වී ගිය බැවින් එය කියැවීමට නැවැතී, හිස හරවා බැලීමට ඇයට සිදු විය.

"ටො - මෝ - පා - ඨ - ශා - ලා - ව"

'ටොමෝ' යන්නෙහි තේරුම කුමක් දැයි මව ගෙන් අසන්නට ඇයට සිතෙත් ම, තමන් දකින්නේ සිහිනයක් දැයි සැක ඇති වන දසුනක් ඇස් ඉදිරියේ පෙනෙන්නට විය. ඇය පහත් වී පඳුරු අතරින් එබී බැලුවා ය. ඇයට තම ඇස් අදහා ගත නො හැකි විය.



"අම්මේ, අම්මේ, අර කෝච්චියක්ද, ඉස්කෝලෙ වත්තෙ තියෙන්නෙ?"

අතහැර දමා තිබුණු දුම්රිය මැදිරි හයක් පාසලේ පන්ති කාමර ලෙස යොදා ගෙන තිබිණි. ටොට්ටෝ චංට එය සිහිනයක් ම විය. දුම්රියක් තුළ පාසලක්!

දුම්රිය මැදිරිවල කවුළු උදා හිරු රැසින් දිලිසෙමින් තිබිණ. එහෙත් රෝස පැහැ කොපුලැති සිඟිති දැරිය ගේ, පඳුරු අතරින් යොමු වී පැවැති දෙනුවන් ඊට වඩා දීප්තිමත් විය.

## "මේ පාසලට මා කැමැතියි"

මොහොතකට පසු ටොට්ටෝ චං තුටු ගොස නඟමින් 'දුම්රිය පාසල' දෙසට දුවන්නට වූවා ය. තම උරහිසට උඩින් මව දෙස බලා, "එන්න, ඉක්මනට එන්න. අපි මේ කෝච්චියේ නඟිමු. තාමත් ඒක නවත්තලා"යි කීවා ය.

තිගැස්සුණු මව ඇය පසුපස දුවන්නට වූවා ය. පැසි පන්දු ක්‍රීඩා කර පුරුදුකම් ඇති ඇය වඩා වේගයෙන් දුව ගියා ය. දොරටුවකට ළඟා වීමට පෙර ටොට්ටෝ චං ගේ ඇඳුමෙන් අල්ලා ගැනීමට ඇය සමත් විය.

"ඔයාට තාම ඒකට ඇතුල් වෙන්න බෑ." පිටෙන් අල්ලා ගනිමින් මව කීවා ය. "කෝච්චි පෙට්ටි මේ ඉස්කෝලෙ පන්ති කාමර. ඔයා තාම මේ ඉස්කෝලෙට ඇතුළත් කර ගෙන නෑ. මේ කෝච්චියට නඟින්නට ඔයාට ඕනෑ නම්, ඔයා හොඳ වෙන්න ඕනෑ. මුල් ගුරුතුමාට ගරු කරන්න ඕනෑ. අපි දැන් යන්නෙ එතුමාව බැහැදකින්න. ඔක්කොම හරි හැටියට සිද්ද වුණොත් මේ ඉස්කෝලෙට එන්න ඔයාට පුළුවන් වේවි. තේරුණා නේද?"

කෙළින් ම දුම්රියට නඟින්නට බැරි වීම ගැන ටොට්ටෝ චං කනස්සලු වූවා ය. නමුත් මව කී ලෙසට ම කටයුතු කිරීමට ඇය කල්පනා කළා ය. "හරි, හරි" ඇය කීවා ය. "මේ පාසලට මම ගොඩක්ම ආසයි."

මවට ප්‍රශ්නයක් වූයේ ඇය පාසලට කැමතිද නැද්ද යන්න නො වේ. මුල් ගුරුතුමා දැරියට කැමති වේද නැද්ද යන්නයි. මව ඇය ගේ අතින් අල්ලා ගෙන මුල් ගුරුතුමා ගේ කාර්යාලය දෙසට පිය මනින්නට වූවා ය.

දවසේ මුල් පන්ති ඇරඹී තිබුණු බැවින් දුම්රිය මැදිරි නිහඬ ව තිබිණ. එතරම් විශාල නුවූ පාසල් වත්ත, තාප්පයකින් නො ව ගස්වලින් වට වී තිබිණ. කහ රතු මලින් පිරී ගිය මල් පාත්ති ද විය.

මුල් ගුරුතුමා ගේ කාර්යාලය තිබුණේ දුම්රිය මැදිරියක නො වේ. පාසල් දොරටුවට විරුද්ධ පැත්තේ, අර්ධ කවාකාර ව නැඟී ගිය සෙල් පිය ගැට හතකට ඔබ්බෙන් පිහිටි එක් බුමු හලෙක දකුණු පැත්තේ එය පිහිටා තිබුණි.

මව ගේ අත මුදා ගෙන ගල් පඩි මතින් වේගයෙන් දිව ගිය ටොට්ටෝ චං හදිසියේ ම ආපසු හැරී දුවන්නට වූවා ය. පසුපස හඹා ගිය මව දැරිය පාසල ගැන හිත වෙනස් කර ගෙන යැයි සිතා, "මොකක්ද ප්‍රශ්නෙ?"යි ඇසුවා ය. ටොට්ටෝ චං මව ගේ කනට කොඳුරන්නට වූවා ය. "අපි හමු වෙන්න යන එක්කෙනා ස්ටේෂන් මාස්ටර් කෙනෙක් වෙන්න ඕනෑ."

මව තුළ සතුටක් ඇති විය. ඇය ඉවැසීමෙන් යුතු ව, දූව ගේ කනට මුව ළං කොට "ඒ ඇයිදැ?"යි ඇසුවා ය.

"ඔයා කිව්වෙ එයා මුල් ගුරුතුමෙක් කියලා. ඒ වුණාට මේ කෝච්චි පෙට්ටි ඔක්කෝම එයාගෙ නම්, එයා ස්ටේෂන් මාස්ටර් කෙනෙක් වෙන්න ඕන නේද?"

පරණ දුම්රිය මැදිරි පාසලක් සඳහා භාවිතා කිරීම අමුතු දෙයක් බව පිළිගැනීමට මවට සිදු විය. නමුත් මේවා විස්තර කර දීමට වේලාවක් නැත. ඇය මෙසේ කීවා ය. "ඇයි, ඔයා එහෙම කියන්නෙ? තාත්තා ගැන කොහොමද? එයා වයලින් වාදනය කරනවා. වයලින් කීපයක් එයාට තිබෙනවා. ඒ වුණාට අපේ ගෙදර වයලින් සාප්පුවක්ද?"

"නෑ, ඒක වයලින් සාප්පුවක් නෙවෙයි." මව ගේ අත ඇඩි සේ ගනිමින් ටොට්ටෝ චං එකඟ වූවා ය.

## මුල් ගුරුතුමා

මව ටොට්ටෝ චං සමඟ ඇතුළු වත් ම, කාර්යාලයේ සිටි තැනැත්තා පුටුවෙන් නැඟී සිටියේ ය. ඔහු ගේ හිස් මුදුනෙහි කෙස් තුනී විය. මුවෙහි දත් කිහිපයක් අඩු ව තිබිණ. එහෙත් ඔහු ගේ මුහුණ සුවබර හා පැහැපත් විය. බොහෝ උස නැතත්,



සවිමත් බාහු සහ උරහිස් ඔහුට තිබුණි. මදක් වියැකී ගිය කළුවන් වතින් ඔහු සැරසී සිටියේ ය. එය කොටස් තුනකින් යුතු පිළිවෙළ සහිත පිරිසිදු ඇඳුමක් විය.

වහා ම ඔහු ඉදිරියේ නැමී සිටි ටොට්ටෝ චං තියුණු වදනින් මෙසේ විමසා සිටියා ය: "ඔයා කවුද? හෙඩ් මාස්ටර් කෙනෙක්ද? ස්ටේෂන් මාස්ටර් කෙනෙක්ද?"

මව කනස්සලු වූවා ය. ඇය විස්තර කර දීමට පෙර ඔහු සිනහවෙන් ම පිළිතුරු දුන්නේ ය. "මම හෙඩ් මාස්ටර්, මේ පාසලේ මුල්ගුරු."

ටොට්ටෝ චංට සතුටුයි. "හරි, හරි, මං හරිම කැමතියි මොකද? මට ඔයාගෙන් උදව්වක් ඕනෑ හින්දා. මම ඔයාගේ ඉස්කෝලෙට එන්න කැමතියි."

මුල් ගුරුතුමා ඇයට පුටුවක් පිරිනමා, මව දෙසට හැරුණේ ය. "ඔයා දැන් ගෙදර යන්න. මට ටොට්ටෝ චං එක්ක කතා කරන්න තියෙනවා."

ටොට්ටෝ චං මොහොතක් අපහසුවට පත් වූවා ය. කෙසේ වුවත් මේ තැනැත්තා සමඟ සිටීමට හිත හදා ගත්තා ය.

"හොඳයි, මම මෙයා ඔබතුමාට බාර දෙනවා." නොබිය ව ම පැවැසූ මව දොර වසා පිටතට ආවා ය.

මුල් ගුරුතුමා පුටුවක් ඇද, ටොට්ටෝ චං ඉදිරි පිටින් තබා, ඇය අසලින් හිඳ ගෙන මෙසේ කිවේ ය. "හොඳයි, දැන් ඔයා ගැන ඔක්කොම මට කියන්න. ඔයාට කියන්න තියෙන ඕනෑම දෙයක් මට කියන්න."

"මං කැමති ඕනෑම දෙයක්ද?" ඇයට පුදුම ය. ඇය සිතා සිටියේ එතුමා තමා ගෙන් ප්‍රශ්න අසනු ඇත කියා ය. අසන දේට පිළිතුරු දිය යුතු ය කියා ය. ඇයට වුවමනා ඕනෑ ම දෙයක් කියන්නැයි ඔහු කියූ විට, ඇය ඉතා ම සතුටට පත් වූවා ය. ඇය කියා ගෙන කියා ගෙන ගියා ය. සමහරක් අනම් මනම් වුව ද, වැදගත් යැයි හැඟුණු සියල්ල ම ඇය කියා ගත්තා ය. එදා දුම්රිය කෙතරම් ඉක්මනින් ආවේ ද, ටිකට් එකතු කරන්නා ගෙන් කළ ඉල්ලීම, ඊට ඔහු ඉඩ නුදුන් අන්දම, කලින් පාසලේ ගුරුතුමිය කෙතරම් ලස්සණ ද? වැහිළිහිණි කැදැල්ල, තමා ගේ දුඹුරු වන් බල්ලා වන රොකී ගේ රැවැටිලි වැඩ, මුවහත් කැපුම් තල කටේ තබා ගෙන තමා බාලාංශ පන්තියේ දී උඩ පිනූ අන්දම, එයින් දිව

කැපී යතැයි ගුරුතුමිය අනතුරු හැඟවූ අන්දම, දිව කපා නො ගෙන තමා හරියට කළ අන්දම, තාත්තා කොතරම් හොඳ පිහිනුම් කරුවකු ද යන බව, ඔහුට දිය යට කිමිදීමට ඇති හැකියාව ආදි සියලු ම කරුණු ඇය මුල් ගුරුතුමාට පැහැදිලි කළා ය. ඇය කියා ගෙන කියා ගෙන යද්දී "ඉතින්, ඉතින්" කියමින් දිරි ගැන්වීමට එතුමා හුම්ටී තැබුවේ ය. සතුටින් ඉපිළී ගිය ඈ දිගට ම කතා කළා ය. අන්තිමේ දී කීමට යමක් ඇයට ඉතිරි නො වී ය. කීමට යමක් මතක් කර ගැනීමට වෑයම් කරමින් ඇය නිහඬ ව හිඳ ගෙන සිටියා ය.

"මට කියන්න තවත් මොනවත්ම ඔයාට නැද්ද?" මුල් ගුරුතුමා විමසුවේ ය.

දැන් නවත්වන එක කොයි තරම් ලජ්ජාවක් ද? මෙය පුදුමාකාර අවස්ථාවකි. තමාට කීමට කිසිවක් නැද්ද? ඇය මොළය අවුස්සන්නට වෑයම් කළා ය. ඇයට අදහසක් පහළ විය.

එදා ඇය ඇඳ සිටි ඇඳුම ගැන ඔහුට කියන්නට ඇයට හැකි විය. ඇගේ මව ඇගේ බොහෝ ඇඳුම් පිළියෙල කරයි. නමුත් මේ ඇඳුම ගත්තේ සාප්පුවකිනි. සවස් වී ගෙදර එන විට බොහෝ දිනවල ඇගේ ඇඳුම ඉරී ගොසිනි. සමහර ඉරීම් ඉතා ම විශාලයි. ඒවා ඉරුණේ කෙසේ දැයි මව කිසි දා දැන ගත්තේ නැත. ඇගේ සුදු යට ඇඳුම් පවා ඇතැම් විට තීරු තීරුවලට ඉරී ඇත. වැටවල් අස්සෙන් වෙන අය ගේ ඉඩම්වලට රිංගා යෑමේ දී, මෙසේ ඉරෙන බව ඇය මුල් ගුරුතුමාට පැහැදිලි කළා ය. එදින උදේ මෙහි පැමිණීමට සූදානම් වෙද්දී, මව මසා තිබුණු සියලු ම හොඳ ඇඳුම් ඉරී තිබුණු නිසා, මිලට ගෙනැවිත් තිබුණු ඇඳුමක් ඇඳීමට සිදු ව තිබුණු බව ඇය කීවා ය. එය රතු සහ දුඹුරුවන් කුඩා කොටු සහිත ව ගෙතුණක් බව කී ඇය ඒ ඇඳුම කැත නැති නමුත් එහි කර පටියේ ඇති රතු මල් ලස්සණ නැති බව මව ගේ අදහස යැයි කියා සිටියා ය. "අම්මා මේ කර පටියට කැමැති නැහැ" කර පටිය අල්ලා මුල් ගුරුතුමාට පෙන්වමින් ටොට්ටෝ චං කීවා ය.

එයින් පසු ඇයට තවත් කිව හැකි දෙයක් නො වී ය. කෙතරම් වෑයම් කළත් යමක් මතක් කර ගත නො හැකි වූ විට ඇයට කනගාටුවක් ඇති විය. එහෙත් එවිට ම මුල් ගුරුතුමා නැගී සිට, ඔහු ගේ ඇවැන්ත උණුසුම් හස්තය ඇගේ හිස මත තබා, "හොඳයි, දැන් ඔයා මේ පාසලේ ළමයෙක්"යි කීවේ ය.



ඒ වනාහී ඔහු ගේ ම වචන විය. ජීවිතයේ පළමු වන වරට, ඇත්තෙන් ම තමා කැමැති ම කෙනෙක් හමු විණැයි ඇයට හැඟිණ. ඒ දක්වා කිසි ම දවසක කිසි ම අයකු එතරම් දිගට ඇයට සවන් දී නො තිබිණ. සවන් දුන් කාලය තුළ දී, මුල් ගුරුතුමා එක ම වතාවක් වත් ඈනුම් ඇරියේ නැත. එපා බවක් පෙන්වූයේ නැත. පැවැසීමට ඇය තුළ පැවැති උනන්දුවට සමාන උනන්දුවක් එය ඇසීමට ඔහු තුළ ද තිබුණි.

ටොට්ටෝ චංට වේලාව කීමට හැකියාවක් මේ දක්වා නො වී ය. නමුත් මේ සඳහා විශාල කාලයක් ගත වී තිබුණි. එබඳු හැකියාවක් ඇයට තිබුණේ නම්, ඇය පුදුම වේවි. මුල් ගුරුතුමාට තව තවත් ස්තුතිවන්ත වේවි. මව සහ ටොට්ටෝ චං පාසලට පැමිණියේ උදාසන අටට පමණ ය. ඇගේ කතාව අවසන් ව, ඇය මේ පාසලේ සිසුවක බව පැවැසූ මුල් ගුරුතුමා සාක්කු ඔරලෝසුව ගෙන, "ආ දැන් කෑම වේලාව හරි"යි කීවේ ය. මේ අනුව එතුමා පුරා පැය හතරක් පමණ කාලයක් ඇයට සවන් දී තිබිණ!

මේ දක්වා කිසි ම දිනෙක කිසි ම පුද්ගලයෙකු මේ තරම් දිගු කාලයක් ටොට්ටෝ චංට සවන් දී නැත. තව ද සත් හැවිරිදි ඇය වන් දැරියකට නො නවත්වා එක දිගට පැය හතරක් කතා කළ හැකි යැයි මේ අසා විස්මිත වූ මවවත්, කලින් පාසලේ පන්ති ගුරුතුමියවත් සිතා තිබුණේ නැත.

කලින් පාසලින් තමා නෙරපා හරින ලද බවට කිසි ම අදහසක් ටොට්ටෝ චං තුළ නො වී ය. ඇයට කුමක් කළ යුතු දැයි පැහැදිලි අදහසක් ඒ පාසලේ 'ඇනුමැත්තන්ට' ද නො වී ය. හිරු රැස තුළ එළි මහනේ තම සිත ඉබාගාතේ යැවීමට ලැබුණු සහනදායක අවස්ථාවක් ලෙස ඒ පාසල් දිවිය ඇයට දැනී තිබුණි කෙසේ වෙතත් අන් සිසුන්ට වඩා වෙනස් ලෙස, අමුතු ලෙස තමාට සලකන ලද්දේ ය යන හැඟීමක් ඇය ගේ ඇතුළු හදවතට පිවිස තිබිණ. එහෙත් මුල් ගුරුතුමා ඇය තුළ සුරැකි බවක්, උණුසුමක්, සතුටක් ඇති කළේ ය. සදා ඔහු සමඟ සිටීමට ඇයට අවශ්‍ය විය. එදා, පළමු දිනයේ දී ටොට්ටෝ චංට සොසාකු කොබයාෂි මුල් ගුරුතුමා ගැන සිතුණේ එසේ ය. වාසනාවට, ඇය ගැන මුල් ගුරුතුමා ද එසේ ම සිතුවේ ය.

## අහර කිස

සිසුන් දිවා ආහාරය ගන්නේ කොහි දැයි දැන ගැනීමට මුල් ගුරුතුමා ටොට්ටෝ චං කැඳවා ගෙන ගියේ ය. "අපි කෝච්චියෙදි කෑම ගන්නේ නෑ. අපි කන්නෙ රැස්වීම් හලේදි." එතුමා පැහැදිලි කළේ ය. ටොට්ටෝ චං උඳයේ නැගී ආ ඉහළ ම සෙල් පිය ගැටයෙන් ඔබ්බෙහි රැස්වීම් හල පිහිටියේ ය. ඔවුන් එහි පැමිණෙන විට, ළමයි මේස පුටු එහා මෙහා කරමින් ඒවා වටයක හැඩයට තබමින් උන්හ. එක් මුල්ලක හිටගෙන ඒ දෙස බලා සිටි ටොට්ටෝ චං මුල් ගුරුතුමා ගේ කබායෙන් ඇද, "අනෙක් ළමයි කෝ?" ඔහු ගෙන් ඇසුවා ය.

"මේ ඔක්කොම තමයි." ඔහු පිළිතුරු දිනි.

"ඔක්කොම මේ?" ටොට්ටෝ චංට එය විශ්වාස කළ නො හැකි විය. ඇගේ කලින් පාසලේ එක පන්තියක මේ තරම් ළමයි ගණනක් සිටියෝ ය.

"පාසලේ ඉන්නෙ ළමයි පනහක් විතරය කියලද, ඔයා කියන්නෙ?" ඈ ඇසුවා ය.

"ඔව් එච්චර තමයි." ඒ මුල් ගුරුතුමා ගේ පිළිතුර ය.

මේ පාසලේ හැම දෙයක් ම අනෙක් පාසලට වඩා වෙනස් යැයි ටොට්ටෝ චංට සිතුණි.

සියලු ම ළමයින් ඉඳගත් පසු, "මුහුදෙනුත් කන්දෙනුත් මොනවාවත් ගෙනැවිත් තිබේදැ?"යි මුල් ගුරුතුමා ඔවුන් ගෙන් විමැසුවේ ය.

"ඔව්, ඔව්." කෑම බඳුන් අරිමින් ඔවුහු එක විට හඬ නැගූහ.

ළමයින් සතුටින් කසුකුසු ගාද්දී, "බලමුකො, මොනවද ගෙනැල්ල තියෙන්නෙ කියලා." කියමින් මේස වටය ඔස්සේ සක්මන් කළ මුල් ගුරුතුමා බඳුන් තුළට එබී බැලුවේ ය.

"මොන තරම් විනෝදද?" ටොට්ටෝ චංට සිතිණ. "මුහුදෙන් මොනව හරි, කන්දෙන් මොනව හරි කියල කියන්නෙ මොනවාද? මට තේරුම් ගන්න බෑ." ඇය පුදුමයට පත් විය. මේ පාසල අමුතු ම එකකි. එය විනෝද ජනක ය. පාසලේ කෑම වේලාව මේ තරම් විනෝද ජනක වෙතියි ඇය



කිසි විටෙක නො සිතුවා ය. තමාට හෙට මේ කවයේ පුටුවක හිඳ ගෙන මුහුදෙන් යමක් හා කන්දෙන් යමක් මුල් ගුරුතුමාට පෙන්වීමට ලැබෙන බව සිතීමෙන් ඇය පිනා ගියා ය. උඩ පැන සතුට දැක්වීමට ඇයට සිතිණ.

අහර බඳුන් පිරික්සන මුල් ගුරුතුමා ගේ උර හිස් සුමුදු හිරු රැසින් නැහැවී තිබිණ.

## ටොට්ටෝ චං පාසලට පිවිසෙයි.

"ඔයා දැන් මේ පාසලේ ළමයෙක්"යි මුල් ගුරුතුමා පැවැසූ මෙහොතේ සිට ඊළඟ දවස පහන් වන තුරු ටොට්ටෝ චංට ඉවැසුමක් නො වී ය. දවසක් උදා වීම කෙරෙහි මෙවන් නොතිත් පැතුමක් කිසි දා ඇයට නො වී ය. උදාසන ටොට්ටෝ චං ඇහැරැවීම අන් දිනවල දී මවට කරදයක් ම විය. නමුත් මේ දිනයෙහි හැම දෙනාට ම පෙර ඇය පිබිදුණා ය. ඈද පැළැඳ ගෙන පාසල් මල්ල පිටෙහි ඇති ව සූදානම් ව සිටියා ය.

නිවසෙහි සිටි ඉතාම නීති ගරුක සාමාජිකයා වන ජර්මානු එඬේර වර්ගයට අයත් වූ 'රොකී' තුළ ටොට්ටෝ චං ගේ නුහුරු හැසිරීම ගැන සැකයක් මෝදු විය. මඳ වේලාවක් වැතිර සිටි ඌ අලුත් යමක් සිදුවන බවට ඉව ඇති ව, ඇය ගේ පස්සෙන් වැටුණේ ය.

එදා උදාසන මවට කිරීමට බොහෝ වැඩ තිබුණි. ටොට්ටෝ චංට උදා අහර කිස සලසන ගමන් ම, 'මුහුදෙන් යමක්, කන්දෙන් යමක්' සහිත ව දිවා පත සැකැසීම සඳහා යුහුසුලු වන්නට ද ඇයට සිදු විය. ඇය දුම්රිය අවසර පත ඉටි වැස්මක බහා නූලකින් හොඳින් ගැටගසා, නැති නො වන ලෙස ටොට්ටෝ චං ගේ ගෙල වටා ගැට ගැසුවා ය.

"හොද ළමයෙක් වෙන්න"යි සමු දෙද්දී, පියා ගේ හිස කෙස් අවුල් වී තිබිණ.

ටොට්ටෝ චං "හොදයි, හොදයි" කියමින් පාවහන් පැළැඳ, ඉදිරි දොර හැර, වටයක් කැරැකී, ආචාරශීලී ලෙස ඉදිරියට නැමී, "මම යන්නම්" කීවා ය.

ටොට්ටෝ චං පිටත් වනු දුටු මව ගේ දෙනෙතට කඳුළු ගලා ආවේ ය. පාසලින් පලවා හළ විනා, මේ සිඟිති දැරිය මෙතරම් සතුටෙන්, උනන්දුවෙන් සහ හිතරුකමින් කටයුතු කිරීම ඇදැහිය නොහැකි තරම් ය. මේ වතාවේ සියලු කරුණු යහතින් ඉටු වේවායි මව අපේක්ෂා සහගත ව යාච්ඥා කළා ය.

ටොට්ටෝ චං දුම්රිය අවසර පත තම ගෙලෙන් ගලවා, රොකී ගේ ගෙලෙහි පළඳවනු මව මොහොතකින් දුටුවා ය. "අයියෝ!" එහෙත් ඇය කිසිවක් නොකියා සිදු වන දේ බලා සිටියා ය.

අවසර පත බැඳුණු නූල රොකී ගේ ගෙලෙහි ඇමූ පසු ව, ඌ එහා මෙහා පනින්නට විය. "බලන්න, මේක ඔයාට ගැළපෙන්නෙ නෑ." ටොට්ටෝ චං කීවා ය. නූල බොහෝ දිගු වූ අතර, අවසර පත පොළොවේ ඇදී ගියේ ය.

"ඔයාට තේරුණාද? මේක මගේ අවසර පත, ඔයාගෙ නොවෙයි. ඔයාට කෝච්චියට නගින්න බැහැ. මම මුල් ගුරුතුමාටත් දුම්රිය පළේ අයටත් කියල බලන්නම්, ඔයාට ඉස්කෝලෙට එන්න ඉඩ දෙනවද කියල." ඇය රොකීට කීවා ය.

රොකී කන් ඔසොවා ගෙන හොඳින් අසා සිට, අවසර පත කීප වරක් ලෙව කා, ඇණුම් හරින්නට විය. ටොට්ටෝ චං කියා ගෙන ගියා ය. "පන්ති කෝච්චිය යන්නෙ නැහැ. ඒ නිසා ඒකෙ නගින්න ඔයාට ටිකට් එකක් ඕන වෙන්නෙ නැහැ. කොහොම වුණත් අද ඔයා ගෙදර නවතින්න. මා ආපසු එන තුරු ඉන්න."

අනෙක් පාසලේ දොරටුව දක්වා ම ගොස් ආපසු ඒමට රොකී පුරුදු ව සිටියේ ය. අදත් එසේ විය හැකි යැයි ඌ බලාපොරොත්තු වූවා විය හැකි ය.

ටොට්ටෝ චං අවසර පත බැඳුණු නූල රොකී ගෙන් ඉවත් කොට, තම ගෙලෙහි ලා ගත්තා ය. මවට හා පියාට තව වරක් කතා කොට, "ගිහින් එන්නම්" කීවා ය.

පාසල් මල්ල පිටෙහි ගැටෙද්දී, ඇය පසු නොබලා දුවන්නට වූවා ය. රොකී සතුටින් ඇය පසු පස හඹා ගියේ ය. දුම්රිය නැවැතුමට ගිය මඟ, කලින් පාසලට යද්දී ගිය මඟ ම විය. මේ නිසා ටොට්ටෝ චංට ඇය දන්නා හඳුනන බලු බළල් සුරතලුන් මෙන් ම කලින් පාසලේ සගයන් ද පසු කර යන්නට සිදු විය.



තම අවසර පත පෙන්වා ඔවුන් පිනැවිය යුතු යැයි ඇයට සිතුණ ද, දැන් පමා විය නො හැකි ය. ඒවා පසු විටෙක කළ හැකි ය. ඇය පය ඉක්මන් කළා ය.

දුම්රිය නැවැතුම් පොළ අසල දී, ඇය සුපුරුදු පරිදි දකුණට නො ව, වමට හැරුණු විට, අසරණ රොකී නැවැතී නොනොඉවසිල්ලෙන් හාත් පස බැලුවේ ය. ටොට්ටෝ චං ටිකට් දොරටුවේ ය. ඇය රොකී වෙත ආපසු පැමිණ. උගේ සැකය දුරු කළා ය. "ඒ ඉස්කෝලෙට අද යන්නෙ නෑ. අද යන්නෙ වෙන ඉස්කෝලෙකට."

ටොට්ටෝ චං රොකී ගේ මුහුණ බැලුවා ය. උගේ මුහුණට මුහුණ ළං කළා ය. උගේ කන්වල කුයිල ඇයට සුවඳක් ම විය.

"යන්නම්" කියූ ඇය අවසර පත දොරටුවේ සිටි තැනැත්තාට පෙන්වා උස් පිය ගැට නඟින්නට වූවා ය. ඈ නොපෙනී යන තුරු රොකී සිහින් හඬක් නංවමින් බලා සිටියේ ය.

## දුම්රියේ පන්ති කාමරය

ටොට්ටෝ චං දුම්රිය මැදිරි පන්තිය අසලට පැමිණෙන විට, කිසි කෙනකු පැමිණ සිටියේ නැත. ඇගේ පන්තිය කුමක් දැයි මුල් ගුරුතුමා ඇයට කියා තිබුණි. එය පරණ මෝස්තරයේ දුම්රිය මැදිරියක් වුවත්, දොරෙහි පිට පැත්තේ අල්ලුව නම් මේ දක්වා නො ගැලැවී තිබුණි. අත් දෙකින් ම එය අල්ලා දොර දකුණු පසට තල්ලු කළ යුතු විය. ඇතුළත එබී බැලූ ටොට්ටෝ චං ගේ හද ගැස්ම වේගවත් විය. "ඕඕ....."

මෙහි ඉගෙනීම කෙළවරක් නැති ගමනක් යනවා වැන්න. කවුළුවලට ඉහළින් බඩු රාක්ක තාමත් තිබේ. එක ම වෙනස නම් මැදිරිය තුළ කවුළුවේ කළු ලෑල්ලක් තිබීමයි. දිග අතට ඇති අසුන් වෙනුවට ඒ දෙසට හරවා ළමා මේස සහ පුටු පනවා ඇත. එල්ලී සිටීමට ඇති පටි ඉවත් කර ඇතත් අන් සියල්ල එලෙසින් ම තිබේ. ටොට්ටෝ චං ඇතුළු වී, ළමා මේසයක් අසල හිඳ ගත්තා ය. කලින් පාසලේ දී ලී පුටු තිබුණ ද, මුළු දවස ම හිඳ ගෙන සිටිය හැකි මේ පුටු වඩාත් සැප පහසු ය. පිනා ගිය

ටොට්ටෝ චං මේ පාසලට බොහෝ සේ ඇලුම් කළා ය. හැම දිනක ම පාසලට පැමිණීමටත් කිසි දිනක නිවාඩු නො ගැනීමටත් ඇය දැඩි සේ තීරණයකට එළඹුණා ය.

ටොට්ටෝ චං කවුළුවෙන් පිටත බැලුවා ය. දුම්රිය ගමන් නො කරන්නක් බව ඇය දත්තා ය. එහෙත් පාසල් වත්තේ තුරු ලතා සහ මල් ගොමු මදින් මද සුළඟට සැලෙන්නට වූ හෙයින් එය ගමන් කරන්නා සේ ඇයට දැනිණ.

"මට හරි සතුටුයි." අවසන දී ඇය මහ හඬින් මොර දුන්නා ය. කවුළුවෙන් පිටතට හිස දැමූ ඇය දැඩි සතුටක් ඇති හැම විට ම කරන පරිදි, ගීයක් පබඳා මිමිණුවා ය.

"මට හරි සතුටුයි
හරි සතුටුයි මට
මෙතරම් සතුටක්
ඇයි ඇයි ඇයි?"

ඒ මොහොතේ ම තවත් අයෙක් ඇතුළු විය. ඒ දැරියකි. ඇය සටහන් පොත් සහ පැන්සල් පෙට්ටිය පාසල් මල්ලෙන් එළියට ගෙන, මේසය මත තැබුවා ය. ඇඟිලි තුඩු මතින් ඉස්සී, මල්ල රාක්කයට දැමුවා ය. පාවහන් මල්ල ද එහි දැම්මා ය. ටොට්ටෝ චං ගැයුම නවත්වා, වහ වහා එසේ ම කළා ය. ඊළඟට පිරිමි ළමයෙක් ඇතුළු විය. ඔහු පැසි පන්දු ක්‍රීඩා කරන්නකු සේ තම මල්ල රාක්කයට විසි කළේ ය. එය ආපසු විත් බිම පතිත විය. "වැරදි පහරක්" කියමින් එය අහුළා ගත් ඔහු එතැන සිට ම නැවත ඉලක්කය ගත්තේ ය. එවර එය රැඳුණේ ය. "කදිම පහරක්," ඔහු කෑගැසුවේ ය. "නරක පහරක් නොවෙයි." කියමින් යළිත් මල්ල ගෙන මේසය අසලට පැන එය විවර කර, සටහන් පොත හා පැන්සල් පෙට්ටිය එළියට ගත්තේ ය. කලින් මෙය කළ නොහැකි වීම ප්‍රමාදයක් ලෙස පෙනී ගියේ ය.

පන්තියේ සිසුහු නව දෙනෙක් වූහ. ටොමෝ පාසලේ පළමු වන ශ්‍රේණියට ඔවුහු අයත් වූහ.

ඒ සියල්ලෝ ම එක ම දුම්රියෙන් එකට ගමන් කරන්නෝ වූහ!



# ටොමෝවේ පාඩම්

දුම්රිය මැදිරියෙක පාසල් යාම අමුතු දෙයක් විය. මෙහි අසුන් පැනැවීම ද අමුතු විය. මුල් පාසලේ දී ඒ ඒ සිසුවාට නියමිත මේසයක් පවරා තිබිණ. එහෙත් එහි ඕනෑ ම වේලාවක ඕනෑ ම තැනක හිඳ ගැනීමට සිසුන්ට අවසර තිබුණි.

වටපිට හොඳින් බලා, බොහෝ සිතාමතා, එදා උදේ තමාට ඉක්බිති ව පැමිණි දැරිය අසල හිඳ ගැනීමට ටොට්ටෝ චං තීරණය කළා ය. දිගු සවන් සහිත හාවකු ගේ රුවක් ඒ දැරිය ගේ උඩු ඇඳුමෙහි සිත්තම් ව තිබිණ. ටොට්ටෝ චං එයට ප්‍රිය කළා ය.

මේ පාසලේ අමුතු ම අමුතු දෙය වූයේ එහි ඉගැන්වූ පාඩම් ය.

සාමාන්‍යයෙන් පාසල් කාල සටහනෙක කාල පරිච්ඡේද අනුව විෂය සඳහන් වේ. උදාහරණ ලෙස මුල් කාල ඡේදයේ ජපන් බස කළ පසු ඒ ළඟ කාල ඡේදයේ දී ගණිතය තිබිය හැකි ය. නමුත් මෙහි දී එය සම්පූර්ණයෙන් වෙනස් ය. පළමු කාල ඡේදයේ ආරම්භයේ දී, එදිනට උගත යුතු ප්‍රශ්න සහ ගැටලු ලේඛනයක් ගුරුවරිය ඉදිරිපත් කරයි. "මේවායින් ඔබ කැමති ඕනෑම තැනකින් පටන් ගන්න"යි ඇය කියනු ඇත.

ඔබ පටන් ගන්නේ ජපන් බසින් ද ගණිතයෙන් ද යන්න ප්‍රශ්නයක් නො වේ. රචනා ලිවීමට කැමැති යම් අයකු ඒවා ලියනවා ඇත. විද්‍යාව කැමැති අයකු ඊට පසුපසින් සිට, මද්‍යසාර දාහකයක් මඟින් යම් දෙයක් රත් කරනවා විය හැකි ය. මේ අනුව ඕනෑ ම පන්ති කාමරයෙක සුළු පිපිරීමක් වුවත් සිදු වීමට ඉඩ තිබේ!

සිසුන් නිරීක්ෂීම සඳහා මේ ක්‍රමය ගුරුවරුන්ට මහඟු අවස්ථාවක් ලබා දෙයි. සිසුන් ශ්‍රේණි ඔස්සේ පිළිවෙළින් ඉදිරියට යන විට, ඔවුන් කුමක් කැමැති ද, ඔවුන් සිතන්නේ කෙසේ ද, ඔවුන් ගේ ස්වභාවය කෙබඳු ද, යනාදී කරුණු දැන ගැනීමට ගුරුවරියට ඉඩකඩ සැලැසෙයි. තම සිසුන් නියම ලෙස හඳුනා ගැනීමේ අගනා මඟක් එයින් සැලසේ.

තමන් ගේ කැමැති ම විෂයය තුළින් ඉගෙනීම ඇරැඹීමට සිසුවෝ ද කැමැති වෙති. කාලය තමන්ට වුවමනා ලෙස වෙන් කර ගැනීමට හැකි බැවින් තමන් අකමැති විෂය වුව ද සාර්ථක ලෙස කිරීමට ඔවුන්ට හැකි වෙයි. ඉගෙනුම බෙහෙවින් ම නිදහස්

විය. තමන්ට වුවමනා ඕනෑ ම වේලෙක ගුරුවරිය හමු වී උපදෙස් ලබා ගැනීමට ඔවුන්ට හැකි ය. ගුරුවරිය ද අවශ්‍ය පරිදි සිසුන් වෙත පැමිණ ඕනෑ ම ගැටලුවක් හොඳින් තේරුම් යන තුරු පැහැදිලි කරනු ඇත. තනි ව කිරීම සඳහා සිසුන්ට පැවරුම් ද දෙන ලදි. මෙහි දී ඉගෙනුම, එහි නියම අරුතින් ම ක්‍රියාත්මක විය. ගුරුවරිය කතා කරද්දී, විස්තර කරද්දී ඒ දෙස බලා සිටින සිසුවෝ මේ ක්‍රමය තුළ නුවූ හ.

පළමු වන ශ්‍රේණියේ සිසුන් නිදහස් ඉගෙනුම් මට්ටමට සපුරා ළඟා ව නො සිටිය ද, කැමැති විෂයයකින් පාඩම ඇරඹීමට ඔවුන්ට ද නිදහස තිබුණි. සමහරු හෝඩියේ අකුරු පිටපත් කළහ. සමහරු සිතුවම් ඇන්දහ. සමහරු පොත් කියැවූ හ. සමහරු ශරීර වර්ධන ව්‍යායාම පවා කළ හ. ටොට්ටෝ චං අසල හිඳ ගෙන සිටි දැරිය මුළු ජපන් හෝඩිය ම දැන සිටි අතර, සටහන් පොතේ ඒ අකුරු ලියුවා ය. ඒ ගැන දැනුමක් නැති ටොට්ටෝ චං මදක් විපිළිසර ව කුමක් කරම් දැයි නිණවු නැති ව සිටියා ය.

එවිට ම ඇයට පසුපසින් හිඳ ගෙන සිටි සිසුවා සටහන් පොත ද රැගෙන, ගුරු උපදෙස් පතා කළු ලෑල්ල ළඟට යමින් සිටියේ ය. ගුරුතුමිය කළුලෑල්ල පසුපස පුටුවෙක හිඳ ගෙන අන් සිසුවකුට යමක් විස්තර කරමින් සිටියා ය. කාමරය හාත් පස බැලීම නැවැත්වූ ටොට්ටෝ චං නිකටෙහි අත තබා ගෙන, සිසුවා වෙත ඇස් යොමු කළා ය. ඔහු ගියේ කකුල අද්දවමිනි. ඔහු ගේ සිරුර බියකරු ලෙස පැද්දුණේ ය. ඔහු හිතාමතා එසේ කරන්නේ දැයි මුල දී ටොට්ටෝ චංට සැකයක් ඇති විය. නමුත් එය එසේ නො වන බව ඉක්මනින් ම ඇයට පසක් විය.

සිසුවා තම අසුනට පැමිණෙන තුරු ටොට්ටෝ චං ඔහු දෙස බලා සිටියා ය. ඔවුන් ගේ ඇස් හමු විය. සිසුවා සිනාසුණේ ය. ඇය ද වහා සිනාසුණා ය. ඔහුට හිඳ ගැනීමට අන් සිසුනට වඩා කාලයක් ගත විය. ඔහු හිඳගත් පසු ව, ටොට්ටෝ චං ඔහු දෙසට හැරී, "ඔයා ඒ විදියට ඇවිදින්නේ ඇයි?" යනුවෙන් විමසා සිටියා ය.

තැණවත් මහත්මා හඬින් ඔහු තැන්පත් ලෙස පිළිතුරු දුන්නේ ය. "මට පෝලියෝ හැදුණා."



"පෝලියෝ?" ඒ වචනය ඇය කිසි දාක අසා නො තිබිණ. "ඔව්, පෝලියෝ." ඔහු මිමිණුවේ ය. "මගේ කකුල විතරක් නොවෙයි අතත්." ඔහු අත පෙන්වමින් කීවේ ය. ටොට්ටෝ චං ඔහු ගේ වම් අත දෙස නෙත් යොමු කළා ය. ඔහු ගේ දිගු ඇඟිලි එකට බැඳී ඇති සේ නැමී තිබිණ.

කනස්සල්ලට පත් ඇය, "මේකට මොකුත්ම කරන්න බැරි වුණාද?" යනුවෙන් විමසුව ද පිළිතුරක් නො ලැබිණ. නො ඇසිය යුතු දෙයක් ඇසුවෙමැයි ඇය කනස්සලු වූවා ය. එහෙත් සිසුවා සතුටින් කතා කළේ ය. "මගේ නම, යසුවාකි යමමෝටෝ. ඔයාගෙ නම?"

දිරි ගන්වන සුළු ඒ හඬ ඇසීමට ඇය ඉතාමත් ආශා කළා ය. "මං ටොට්ටෝ චං" ඒ ඇගේ පිළිවදන් ය.

ඒ අන්දමටයි යසුවාකි යමමෝටෝ සහ ටොට්ටෝ චං මිතුරන් වූයේ.

හිරු නැගෙත් ම, දුම්රිය තුළ උණුසුම වැඩි විය. එක් අයෙක් කවුළුව ඇරියේ ය. වසන්තයේ මාරුතය මුළු මැදිරිය සිසාරා හමා ගියේ ය. සිසුන් ගේ හිස කෙස් අවුල් විය.

මෙසේ ටොට්ටෝ චං ගේ, ටොමෝ පාසලේ මුල් දිනය ඇරැඹුණේ ය.

## මුහුදු අහර ගොඩ අහර

දැන් 'මුහුදෙන් යමක් කන්දෙන් යමක්' සඳහා වේලාව විය. ටොට්ටෝ චං දවල් ආහාරය සඳහා බලා සිටියේ නො ඉවැසිල්ලෙනි.

මුල් ගුරුතුමා ඒ කියමන යොදා ගෙන තිබුණේ දවල් කෑම වේල සඳහා බත්වලට අමතර ව ගෙන ආ යුතු සමබල ආහාර හැඟැවීම සඳහා ය. සුලබ උපදෙස් වන 'හැම දේ ම කන්නට ඔබේ දරුවා පුරුදු කරන්න', 'පෝෂ්‍යදායක සමබල ආහාරයක් ඔහු අත එවන්න' යන කියමන් වෙනුවට මුල් ගුරුතුමා කීවේ, 'මුහුදෙන් යමක් සහ කන්දෙන් යමක්' ඔවුන් ගේ දිවා පනට එකතු කරන ලෙස ය.

මුහුදෙන් යමක් යනුවෙන් අදහස් කරන ලද්දේ මුහුදෙන් ලැබෙන ආහාර ය. මාළු සහ 'ෂුකුඩානි' වැනි දෑ එයින් අදහස් කරන ලදී. (කබලු සහිත කුඩා බෙල්ලන් වැනි මසුන් සෝස්වල තම්බා ගෙන පැණි රසැති සකේ සමඟ එක් කර ගත් විට එය ෂුකුඩානි නමින් හැඳින්වේ.) කන්දෙන් යමක් යනු එළවළු, ගව මස්, ඌරු මස්, කුකුළු මස් වැනි ගොඩ බිමෙන් ලබා ගන්නා ආහාරයි.



මේ කියමන ටොට්ටෝ චං ගේ මව ගේ සිත පෙලැඹැවී ය. එතරම් වැදගත් නීතියක් මෙතරම් සරල ලෙස ඉදිරිපත් කළ හැකි මුල් ගුරුවරුන් දුලබ බව ඇයට හැඟිණ. එක් අතකින් මේ වර්ග දෙක අතරින් දිවා ආහාරය තෝරා ගැනීම ඉතා සරල කාරියක් ලෙස ද පෙනී ගියේ ය. ඒ හැර මේ කොටස් දෙක ගැන පමණ ඉක්මවා කරදර වීම වුවමනා නො වන බව ද ගුරුතුමා දන්වා තිබුණි. මුහුදු ආහාර ලෙස වියළි බොන්ටෝ කරවල පෙත්තක්



හෝ ගොඩ ආහාර ලෙස 'කින්පිරා ගොබෝ' (එනම්, කුළුබඩු යෙදූ බර්ඩොක් සලාද) ටිකක් වුවත් සෑහෙයි. එසේ නැත්නම්, නෝරි (මුහුදු පැළෑටි වර්ගයෙකි) මුහුදෙන් ද, මිදි අච්චාරු ගොඩින් ද ගත හැකි වෙයි.

පෙර දිනයේ මෙන් ම, ටොට්ටෝ චං ආසාවෙන් බලා සිටිද්දී, මුල් ගුරුතුමා පැමිණ සියලු අහර බඳුන්වලට එබී බැලුවේ ය. එකිනෙක පිරික්සමින් 'මුහුදෙන් යමක් කන්දෙන් යමක්' තිබේ දැයි ඇසුවේ ය. ඒ ඒ දෙය ආවේ මුහුදෙන් ද කන්දෙන් දැයි සොයා ගැනීම සිත පොලඹවනසුලු විය.

වැඩ බහුල මවක් සමහර විට, තම දරුවා ගේ අහර බඳුනට බහා තිබුණේ මුහුදෙන් හෝ කන්දෙන් හෝ ගත් යමක් පමණි. මේ ගැන කිසි ගැටලුවක් නො වී ය. මුල් ගුරුතුමා තම පිරික්සුම කර ගෙන යද්දී ම, සුදු උඩු වැසුමකින් සැරසුණු ඔහු ගේ බිරිඳ දෑතෙහි අහර බඳුන් දෙකක් දරා ගෙන, ඔහු පසුපස පැමිණියා ය. එතුමා කිසියම් ළමයකු ළඟ නැවැති "මුහුදෙන්"යි කිවහොත් 'මුහුදු බඳුනෙන්' චිකුවා (මාළු රෝල්) දෙකක් ඔහුට නොමිලේ ලැබිණ. එතුමා අනෙකකු ළඟ නැවැතී, 'කන්දෙන්'යි කිවහොත් 'කඳු බඳුනෙන්' සෝස්වලින් තැම්බූ අල කැබැලි කිපයක් එසේ ම ලැබිණ.

"මාළු රෝල්වලට මා කැමැති නැත." මෙවැන්නක් කීමට කිසිවෙක් සිහිනෙනුදු නො සිතූ හ. 'මෙය කදිම කෑමක්ය' නැතහොත් 'මේ කෑම කමකට නැතැ'යි සිතීමට කිසිවෙක් යොමු නො වූ හ. ඔවුන් සැලකිලිමත් වූ එක ම කරුණ වූයේ, 'මුහුදෙන් හා කන්දෙන්' යමක් ඇතුළත් වීමේ අවශ්‍යතාව ම පමණි. එසේ වී නම් ඔවුහු තුටු වූ හ. ඒ ගැන සියල්ලෝ පිනා ගියහ.

'මුහුදෙන් යමක්', 'කන්දෙන් යමක්' යන්න තේරුම් ගැනීම මෙහි දී සැහුණි. එදින උදයේ මව කලබලයෙන් සකස් කළ ආහාරය මුල් ගුරුතුමා විසින් පිළිගනු ලැබේ දැයි ටොට්ටෝ චං තුළ කුකුසක් ඇති විය. නමුත් ඇය බඳුන් විවර කළ වහා අගනා ම ආහාරයක් ඒ තුළ දක්නට ලැබුණි. "අගෙයි, හරි අගෙයි" කියා කෑගසන්නට ඇයට සිතුණත් අමාරුවෙන් එය මැඩ පවත්වා ගත හැකි විය. දිලිසෙන කහමදය සහිත කුකුළු බිජු, ග්‍රීන්පීස්, දුඹුරු ඩෙන්බු, තීරුවලට කැපූ රෝස පැහැ මාළු බිජු, ඇය ගේ පතෙහි විය. එය මල් උයනක් සේ වර්ණවත් විය.

"හරි ම ලස්සණයි" මුල් ගුරුතුමා කීවේ ය.

ටොට්ටෝ චංට පුදුම සතුටක් ඇති විය. "අපේ අම්මා උයන්න දක්ෂයි." ඇය කීවා ය.

"ංආ. ඇත්තද?" මුල් ගුරුතුමා කීවේ ය. ඔහු ඩෙන්බු පෙන්වා "හරි හරි මේ මොකක්ද? ඒක මුහුදෙන්ද? කන්දෙන්ද?" ප්‍රශ්න කළේ ය.

'කුමක් හරි දැ'යි සිතමින් ටොට්ටෝ චං එදෙස බැලුවාය. එය බිමේ පාටයි. ඒ නිසා එය කන්දෙන් විය හැකියි. නමුත් නිසැක නැත. "මා දන්නෙ නෑ" ඇය කීවා ය.

මුල් ගුරුතුමා මුළු පාසල ඇමැතුවේ ය. "ඩෙන්බු කොහෙන්ද ලැබෙන්නෙ? මුහුදෙන්ද? කන්දෙන්ද?"

නිහඬ බවකින් පසු ව, සමහරු "කන්දෙන්"යි කීහ. තවත් සමහරු "මුහුදෙන්"යි හඬ නැඟූ හ. කිසිවකු නිසැක ලෙස දන්නා බවක් නො පෙනිණ.

"හොඳයි, මම කියා දෙන්නම්" මුල් ගුරුතුමා කීවේ ය. "ඩෙන්බු ලැබෙන්නෙ මුහුදෙන්"

"ඇයි, එහෙම කියන්නෙ?" තරබාරු ළමයෙක් ඇසුවේ ය.

ළමා මේස වටය මැද සිට ගත් මුල් ගුරුතුමා, මෙසේ විස්තර කළේ ය: "තැම්බූ මාළුවල කටු අතර, තිබෙන මස් සූරා ගෙන මදක් කර කොට, කුඩා කැබලි ඇති වන සේ අඹරා ඊළඟට වේලා රස වර්ග එකතු කරලයි, ඩෙන්බු හදා ගන්නෙ."

"....ඕඕ" සිසුහු විස්මයට පත් වූහ. ටොට්ටෝ චං ගේ පතෙහි ඇති ඩෙන්බු බැලීමට සමහරු අවසර ඉල්ලූ හ. "ඔව්, පුළුවන්." එතුමා අවසර දුන්නේ ය. ඇගේ ඩෙන්බු බැලීමට මුළු පාසල ම රොක් විය! ඩෙන්බු යනු මොනවා දැයි දත් ළමයින් ද සිටියා විය හැකි ය. නමුත් ඔවුන් ගේ ද උනන්දුව වැඩි තිබුණි. එසේ ම, ටොට්ටෝ චං ගේ ඩෙන්බු තම තමන් දන්නා ඩෙන්බු ම ද? නො එසේ නම් වෙනත් වර්ගයක් දැයි දැන ගැනීමට ඔවුන්ට වුවමනා වූවා විය හැකි ය. බොහෝ ළමයි ඇගේ පතට එබී බැලූ හ. ඩෙන්බු ටික නැති වෙතැයි බියක් ද ඇය තුළ ඇති විය.

පළමු දින දිවා ආහාරයේ දී, ටොට්ටෝ චං මදක් කලබල ගතියෙන් පසු වුව ද, එය ඇයට මහත් විනෝදයක් විය. කුමක් මුහුදු ආහර ද, කුමක් ගොඩ ආහර ද, යනු දැන ගැනීම විස්මිත



සතුටක් ඇති කළේ ය. මාළුවලින් ඩෙන්බු සකස් කරන බව දැනගත් ඇය මුහුදෙන් හා කන්දෙන් යමක් එකතු කිරීමට මව අමතක කර නැති බව සිතුවා ය. සියල්ල ම සියලු අයුරින් ම සතුටුදායක වී ඇති බව ඇය සතුටින් මෙනෙහි කළා ය.

ටොට්ටෝ චං සතුටට පත් කළ අනෙක් හේතුව දැනුණේ ආහාරය බුදින විට ය. මව එය ඉතා ම රසවත් ලෙස සකස් කර තිබුණි.

## "හොඳින් හපන්න"

සාමාන්‍යයෙන් අන් අය සමඟ ආහාර ගන්නා කෙනෙකු බිදීම අරඹන්නේ "ඉතදකිමසු" යන වචනය කීමෙනි. (ස්තුතියි, මම බිදීම පටන් ගන්නම් යන්න එහි අරුතයි.) ටොමෝ පාසලේ පැවැති තවත් වෙනසක් නම්, මුලින් ම ගීයක් ගැයීමයි. සංගීත වේදියකු වූ මුල් ගුරුතුමා අහර කිසට පෙර ගැයීම සඳහා වෙන ම ගීයක් රචනා කර තිබුණි. ඔහු කළේ 'පදින්න පදින්න වටයට පදින්න' යන ජනප්‍රිය ගීයේ තනුවට අලුත් පද මාලාවක් යෙදීමයි. ඔහු ගේ වචන මෙසේ ය.

"හපන්න, හපන්න, හොඳ හැටි හපන්න,
කන විට සියල්ල හපන්න,
බත් මාළු මස් අවුළු,
හපහපා හපහපා හපහපා බුදින්න,"

ඔවුන් 'ඉතදකිමසු'යි කීවේ මේ ගීය ගැයූ පසු ව ය. ජනප්‍රිය ගීයේ තාලයට මේ වචන ඉතා හොඳින් ගැළැපුණි. එබැවින් අවුරුදු ගණනාවකට පසු පවා මේ ගීය තමන් ආහාරයට පෙර ගැයූවක් ලෙස ඔවුන්ට මතක තිබිණ.

මුල් ගුරුතුමා මේ ගීය පැබැඳුවේ, ඔහු ගේ දත් කිහිපයක් හැලී තිබුණු නිසා විය හැකි ය. නමුත් ඔහු නිතර නිතර ම ළමයින්ට කීවේ සතුටින් විනෝදයෙන් කතාබහ කරමින්, බොහෝ සේ කාලය ගනිමින් හෙමිහෙමින් ආහාර ගත යුතු බව ය. එය සිහිපත් කිරීමට ඔහු මේ ගීය පැබැඳි යැයි සිතීම වඩාත් උචිත ය.

සිසුහු තමන්ට හැකි ඉහළ ම හඬින් ගීය ගයා, එයින් පසු ව 'ඉතදකිමසු' කියා, මුහුදෙන් යමක් සහ කන්දෙන් යමක් වෙත යොමු වූහ.

රැස්වීම් හල මොහොතකට නිහඬ විය.

## පාසලේ පා ගමන්

අහර කිසට පසු ව, අන් සිසුන් සමඟ ටොට්ටෝ චං, පාසල් පිටියෙහි සෙල්ලම් කළා ය. අනතුරු ව ඔවුන් පන්තියට පැමිණෙද්දී ගුරුතුමිය පොරෝත්තු ව සිටියා ය.

"ඔයාල ඔක්කොම අද උදේ වරුවෙ හුඟාක් මහන්සි වෙලා වැඩ කළා නේ?" ඇය කීවා ය. "අපි මොනවද, හවස් වරුවෙ කරන්නෙ?"

කුමක් කළ යුතු දැයි සිතීමටත් ටොට්ටෝ චංට ඉඩක් නො ලැබුණි. සිසුවෝ එක හඬින් මෙසේ කීහ: "අපි ඇවිදින්න යමු."

"හරි හරි" ගුරුතුමිය අනුමත කළා ය. සියල්ලෝ කලබලයෙන් දොර අසලට රොක් වූහ. ටොට්ටෝ චං තම පියා සමඟත් රොකී සමඟත් ගමන් ගොස් පුරුදු ය. නමුත් පාසලෙන් යන ගමනක් ගැන ඇය අසා නැත. ඇත්තට ම ඇය විස්මයට පත් වූවා ය. ඇය ඇවිදින්නට කැමැති ය. එබැවින් දැන් නවතින්නට නුපුළුවන.

පසු ව ඇයට දැන ගන්නට ලැබුණු අන්දමට, සිසුන් උදය වරුවේ හොඳින් වැඩ කර, කළුලෑල්ලේ දී ඇති වැඩ සියල්ල අවසන් කර තිබුණහොත්, සවස් වරුවේ පාසලෙන් පිටත ඇවිදීමට යාමට ඔවුන්ට ඉඩක් ලැබුණි. පළමු වන ශ්‍රේණියේ සිට සවන ශ්‍රේණිය තෙක් සියලු ම සිසුන් සඳහා මෙය පොදු කරුණක් විය.

පළමු වන ශ්‍රේණියේ සිසුහු නව දෙනා ම, ගුරුතුමිය මැදි කරගෙන දොරටුවෙන් පිටතට පැමිණ, ඇළක් අයිනෙන් ගමන් කරන්නට වූහ. ඇළෙහි ඉවුරු දෙකෙහි ම විශාල චෙරි ගස් වැවී තිබුණි. ඒවා මලින් පිරී ගොස් තිබුණේ මෑතක දී ය. අවට පෙනෙන සියලු මානයේ කහ පැහැයෙන් හෙබි



අබ කෙත් දකින්නට ලැබිණ. වත්මන් කල්හි ඇළ වෙනුවට ගොඩනැඟිලි පැන නැඟී මිනිසුන් ගෙන් පිරී ගොස් ඇතත් එකල ජියුගාවෝකා පෙදෙස කෙතින් වැසී තිබිණ.

"කුහොන්බුත්සු විහාරය තරම් ඈතට අපි යනවා." උඩු ඇඳුමෙහි සස රුව සහිත දැරිය පැවැසුවා ය. ඇගේ නම සක්කෝ චං විය.

"පසුගිය වාරෙ ඒ විහාරෙ පොකුණ ළඟදී අපි සර්පයෙක් දැක්කා." සක්කෝ චං කීවා ය. "විහාර ඉඩමේ පරණ ළිඳක් තියෙනවා. ඒකට උල්කාවක් කඩා වැටී තියෙන බව මිනිස්සු කියනවා."

ළමයි ගමන් කරන අතරතුර තම තමන් කැමැති ඕනෑ ම දෙයක් ගැන කතා බස් කළහ. අහස නිල්වන් විය. අවට සමනලයන් ගෙන් පිරී තිබිණ.

මිනිත්තු දහයක් පමණ ගමන් කළ පසු ව, ගුරුතුමිය නැවැතුණා ය. කෙතෙහි කහවන් මල් දක්වමින් මෙසේ පැවසුවා ය. "මේ අබමල් බලන්න. මල් පිපෙන්නෙ ඇයි කියල ඔයාල දන්නවද?"

සිසුන් මහ මඟින් මෑත් ව මල් පිරික්සද්දී, ඇය මල්වල 'ජායාංගය' (ඩිම්බය) හා 'පුංකේසර' (රේණු) පෙන්වා හඳුන්වා දුන්නා ය. මල් පරාගණය වීමට සමනලයන් උදවු කරන අන්දම ද ඇය පැහැදිලි කළා ය. ඇත්තට ම, සමනල්ලු ඉතා ම කඩිසර ව උදවු කාරියෙහි නිරත ව සිටියහ.

ගුරුතුමිය නැවතත් පිටත් වූවා ය. සිසුහු මල් පිරික්සුම නවතා සිට ගත්හ. "ඒවා 'පිස්ටිල්' (ජායාංග) කීවාට පිස්තෝල වගේ නැහැ." එක් සිසුවෙක් කීවේ ය.

ටොට්ටෝ චංට ද එසේ නොසිතුණි. නමුත් ජායාංගය සහ පුංකේසර ඉතා වැදගත් බව අන් සිසුන්ට මෙන් ම ඇයට ද පැහැදිලි විය.

තවත් මිනිත්තු දහයක් පමණ ගමන් කළ පසු, තුරුලතා ගැවැසි උයනක් ඔවුන් ඉදිරියේ දිස් විය. ඒ තුළ කුහොන්බුත්සු විහාරය පිහිටා තිබිණ. වෙහෙර බිමට ඇතුළු වූ වහා ම, ළමයි නොයෙක් අතට විසිරී ගියහ.

"තාරකාව වැටුණු ළිඳ බලන්න ඕනෑද?" සක්කෝ චං ඇසුවා ය. එකඟ වූ ටොට්ටෝ චං ඇය පසුපස දිව්වා ය.

ගලින් තැනුණු බව පෙනුණු ළිඳ ඔවුන් ගේ තරමට උස් විය. එහි ලී පියනක් ද තිබුණි. පියන ඔසවා, ඔවුහු එතුළට එබී බැලුවෝ ය. එය අඳුරු ම අඳුරු විය. සිමෙන්ති කැටයක් හෝ ගලක් වැනි යමක් ටොට්ටෝ චංට එතුළ දැකිය හැකි වුව ද, තමන් සිහින මැවූ දිලිසෙන තරුවක් වැන්නක් එහි නො වී ය. දිගු වේලාවක් ඇතුළට එබී සිටි ඇය, "ඔයා තරුව දුටුවාදැ"යි සක්කෝ චං ගෙන් ඇසුවා ය. ඇය අත ඔසවා දෙපසට සොලවා "නෑ නෑ කවදාවත්ම නෑ"යි කීවා ය.

එය නො දිලිසෙන්නේ ඇයි දැයි ටොට්ටෝ චං විස්මිත වූවා ය. මොහොතක් කල්පනා කොට, "ඔව්, ඒක නිදා ගන්නවා ඇති"යි කීවා ය.

සක්කෝ චං ඇස් මහත් කොට, "තාරකා නිදා ගන්නවා දැ?"යි ඇසුවා ය.

"මම හිතනවා, එයාලා දවාලට නිදා ගන්නවා කියලා. රෑට අවදි වෙලා එයාල දිලිසෙනවා ඇති." ඇය වහා ම පිළිතුරු දුන්නා ය. එහෙත් ඒ ගැන නිසැක බවක් ඇය තුළ නො වී ය.

ඊළඟට ඔවුහු එක්රැස් ව වෙහෙර බිම වටා යන්නට වූහ. විහාරය රකිමින් එහි දොරටුව දෙපස නැඟී සිටි දෙව්රජුන් දෙදෙනා ගේ නිරුවත් උදර දැක ඔවුහු සිනාසුණහ. මහා ශාලාවෙහි අඩ අඳුරේ වැඩ සිටි බුදුරුව දෙස ඔවුහු බුහුමන් සහිත ව බලා සිටියෝ ය. දිගු නාසා ඇති, තෙන්ගු නමැති රකුසා ගේ යැයි සැලැකෙන මහ සෙල් පා සටහනෙක ඔවුහු සිය දෙපා තැබුවෝ ය. එයින් පසු ඔරු පදිමින් සිටි මිනිසුන්ට අත වනමින් පොකුණ වටා ඔවුහු සක්මන් කළෝ ය. සොහොන් බිමෙහි හාත්පස විසිර ඇති දිදුලන ගල්කැටවලින් ඔවුහු සිත් පුරා ක්‍රීඩා කළහ. සියල්ල ටොට්ටෝ චංට අලුත් විය. හැම අලුත් දෙයක් ම ඇය පිළිගත්තේ සතුටින් ඔල්වරසන් දෙමිනි.

ඉර අවරට හැරී තිබුණි. "ආපසු යන්න වෙලාව හොඳයි" ගුරුතුමිය කීවා ය. අඹ යාය සහ චෙරි ගස් අතුරින් මහමඟ දිගේ ළමා කැල පාසල වෙත පිය මැන්නෝ ය.

මේ ගමන මඟින් විද්‍යාව, ජීව විද්‍යාව සහ ඉතිහාසය පිළිබඳ අගනා පාඩම් සැබෑ ලෙස ම ඉගෙනීමට ලැබෙන බව සෙල්ලමට හා නිදහසට ආශා කළ ළමයි එකල නො දත්හ.



ටොට්ටෝ චං සියලු ළමයින් සමඟ මිතුරු වූවා ය. ඔවුන් උපන් දා සිට දැන සිටි සෙයක් ඇයට දැනුණි.

"අපි හෙටත් ඇවිදින්න යමු." ආපසු එද්දී ඇය සෙසු අයට හඬ නඟා කීවා ය. "ඔව්, හෙටත් යමු." ඔවුහු උඩ පනිමින් කී හ.

සමනල්ලු තව දුරටත් තම කටයුත්තෙහි යුහුසුලු ව උන්හ. කුරුලු ගීයෙන් වාතලය වැසී ගියේ ය. ටොට්ටෝ චං ගේ හදවත සතුටින් ඉල්පිණ.

## පාසල් ගීය

ටොමෝ පාසල දිනපතා ම ටොට්ටෝ චංට පුදුමය ගෙනාවේ ය. පාසල් යාම සඳහා ඇය ගේ උනන්දුව කෙතෙක් වී ද යත් උදය ළඟා වීම පමා වෙතැයි ඇයට දිනපතා ම සිතෙයි. පාසල ඇරී ගෙදර ආ විට, ඇයට කතාව නවත්වා ගත නො හැකි ය. එදා පාසලේ දී කළේ මොනවා ද? එයින් කොතරම සතුටක් ඇති වී ද? පුදුම වුණේ මොනවාට ද? ආදි වශයෙන් රොකීට, මවට, පියාට කියා ඉවරයක් නැත. මවට අන්තිමේ දී මෙසේ කීමට සිදු වෙයි: "දැන් ඇති, මගෙ දූ කතාව නවත්තල මොනවත් කන්නකො."

ටොට්ටෝ චං දැන් දැන් පාසලට සුපුරුදු ය. එහෙත් දිනපතා ම කීමට කන්දක් උසට කරුණු ඇයට තිබුණි. මවට එය විශාල ම සතුටක් විය.

දිනක් ඇය පාසලට දුම්රියෙන් ගමන් කරද්දී, ටොමෝවට පාසල් ගීයක් තිබේ දැයි කුකුසක් හදිසියේ ම ඇති විය. හැකි ඉක්මනින් එය දැන ගැනීම අවශ්‍ය ය. පාසලට යන තුරු ඇයට ඉවැසුමක් නැත. බැසීමට තවත් දුම්රිය නැවැතුම් දෙකක දුර ඇතත්, ජියුගාවෝකාවේ දුම්රිය නැවැත්වූ වහා ම පැනීමට සූදානම් ව, ඇය දොර ළඟට ගොස් සිට ගත්තා ය. කලින් නැවැතුමෙන් දුම්රියට නඟිමින් සිටි කාන්තාවක් ඇරිය එතැනින් බසිනු ඇතැයි සිතුවා ය. දිවීමට සූදානම් ක්‍රීඩිකාවක 'සැරසෙන්' විධානය අනුව සීරුවෙන් සිටිනු මෙන් නිසල ව සිටින දැරිය දුටු ඇය, "මොනවද, මෙයාට වෙලා තියෙන්නෙ?"යි සෙමින් මිමිණුවා ය.

බසින නැවතුමට දුම්රිය පැමිණි වහා ම, ටොට්ටෝ චං සැණෙකින් පැන ගත්තා ය. තරුණ රිය නියමුවා, "ජියුගාවෝකා, ජියුගාවෝකා" කියන විටත් ඇය දොරටුවෙන් පැන නො පෙනී ගොස් ඉවර ය.

පාසලෙහි මැදිරි පන්තියට ඇතුළු වූ වහා ම, එවිටත් පැමිණ සිටි තායිජි යමනවුචි ගෙන් ඇය මෙසේ ඇසුවා ය. "තායි චං අපේ ඉස්කෝලෙට පාසල් ගීයක් තියෙනවාද?"

විද්‍යාව ආසා කළ තායි චං මදක් සිතා බලා, පිළිතුරු දුන්නේ ය. "මං හිතන්නේ නෑ." ඇය සංවේගයට පත් වූවා ය. "මං හිතන්නෙ අපට පාසල් ගීයක් තියෙන්න ඕනෑ. කලින් ඉස්කෝලෙදි අපට කදිම ගීයක් තිබුණා." ඇය කීවා ය.

ටොට්ටෝ චං මහ හඬින් එම ගීය ගයන්නට වූවා ය.

"ගැඹුරු නැති සෙන්කෝකු විලේ දිය වගේ නො ව,
පෙනෙන මානෙන් එහා අප දැනුම ගැඹුරු වේ."

ටොට්ටෝ චං ඒ පාසලට ගියේ ටික දිනකි. වචන අසීරු වුවත් ඒ ගීය මතක තබා ගැනීමට ඇයට අපහසුවක් නො වී ය. ගැයූ කොටස ඕනෑ ම වේලාවක ඇයට මතක ය.

තායි චං ද පිනා ගියේ ය. මේ වන විට අනෙක් සිසුහු ද පැමිණ සිටියෝ ය. ඇය කියූ ලොකු වචන ඔවුන් ගේ සිත් ගත් බව පෙනුණි.

"අපේ ඉස්කෝලෙට ගීයක් හදන්න අපි මුල් ගුරුතුමාට කියමු." ටොට්ටෝ චං කීවා ය. "ඔව් ඔව්, කියමු." කවුරුත් එකඟ වූහ. සියල්ලෝ මුල් ගුරුතුමා ගේ කාර්යාලය වෙත ගමන් කළහ.

කලින් පාසලේ ගීය ටොට්ටෝ චං ගයනු අසා සිටි මුල් ගුරුතුමා, සිසුන් ගේ ඉල්ලීමට සවන් දී, "හරි හරි, මම හෙට උදේ ම ඔයාලට පාසල් ගීයක් දෙන්නම්"යි කීවේ ය.

"ඇත්තටම දෙනවා දෑ"යි කියමින් ඔවුහු පන්තියට ගියහ.

සියලු ම දෙනා පාසල් බිමේ රැස් වන වන ලෙසට දැන්වීමක් පසු දා උදෑසන පන්ති කාමරවල තබා තිබුණි. රැස් වූ සියල්ලන්ට ටොට්ටෝ චං ද එකතු වූවා ය. කළුලෑල්ලක් පිටිය මැදට ගෙන්වන ලදි. "ටොමෝවට, ඔබේ පාසලට දැන් ගීයක් තිබෙනවා."යි කියමින් ඔහු සමාන්තර ඉරි පහක් ලෑල්ලේ ඇඳ, ගී ප්‍රස්තාර පේළියක් සටහන් කළේ ය.






"දැන් අපි එකට ගායනා කර බලමු"යි සංගීත කණ්ඩායමක නියමුවකු ලෙස, ඔහු දෑත් ඔසවමින් පැවසුවේ ය. මුල් ගුරුතුමා තාලය තබමින් ගයද්දී, මුළු පාසල ම එයට එකතු විය.

"ටෝ - මෝ - ටෝ - මෝ - ටෝ - මෝ - ඕ"

සුළු නිහැඬියාවකින් පසු, "එච්චරද?" යි ටොට්ටෝ චං ඇසුවා ය.

"ඔව්, එච්චරයි." මුල් ගුරුතුමා සාඩම්බර ව පැවැසී ය.

"ලස්සණ වචන ටිකක් එකතු වුණොත් හොඳයි නේ?" ඇය බිඳ වැටුණු හඬින් පැවසුවා ය.

"ගැඹුරු නැති සෙන්කෝකු විලේ දිය වගේ"

"ඇයි? ඔයා මේ ගීයට කැමති නැද්ද?" මුල් ගුරුතුමා සිනාසෙමින් ඇසුවේ ය. "මා හිතුවෙ ඒක ලස්සණයි කියලා."

ඒ ගීයට කිසිවෙක් කැමැති නොවූ හ. එය ඉතා ම සරල විය. ඔවුන්ට ගීයක් නැතිවාට වඩා අමුත්තක් එහි නැත.

මුල් ගුරුතුමා මදක් කනස්සලු වන බවක් හැඟුණි. එහෙත් ඔහු කෝප වූයේ නැත. ඔහු කළුලෑල්ල මකා දැම්මේ ය. තමා අවිනීත විණැයි ටොට්ටෝ චංට හැඟුණි. අන්තිමේ දී සුළු සතුටක් ද ඇය තුළ මෝදු විය.

ඇත්ත නම්, සිසුන්ට සහ පාසලට මුල් ගුරුතුමා ගේ ඇති ආදරය පැවැසීමට වචන නැත. නමුත් මෙය තේරුම් ගැනීමට තරම් ළමයි වැඩී නො සිටියහ. පාසලට ගීයක් අවශ්‍යය යන්න ඔවුන්ට ඉක්මනින් ම අමතක විය. එය අවශ්‍ය වූ වැදගත් දෙයකැයි මුල් ගුරුතුමා කිසි විටෙක නො සිතුවේ ය. මේ නිසා, තනුව කළුලෑල්ලෙන් මකා දූ පසු ව කාරණය අවසන් විය. ටොමෝවට කවදාවත් පාසල් ගීයක් නො වී ය.

## "ඔක්කොම ආපහු දමන්න"

ජීවිත කාලය තුළ, ටොට්ටෝ චං එතරම් මහන්සි වී වැඩ කළ දවසක් ඊට පෙර නො වී ය. ඒ තමා ගේ ප්‍රියතම පසුම්බිය වැසිකිළි වළට වැටුණු දවසයි. එහි මුදල් තිබුණේ නැත. ඇය ඒ පසුම්බියට මොන තරම් ආදරය කළා දැයි කිවහොත්, වැසිකිළියට යද්දී පවා එය රැගෙන ගියා ය. රතු, කහ, කොළ වර්ණ කොටු සහිත ටැපටා රෙද්දෙන් සැකැසුණු එය ඉතා ම සිත්කලු පසුම්බියක් විය. එය හතරැස් ය. සමතලා ය. එහි තුන් මුළු වැස්ම හාරිච්චියක් සේ රිදී පාටින් වැඩ දමා තිබුණි.

ටොට්ටෝ චංට අරුම පුරුද්දක් තිබුණි. වැසිකිළියට ගිය හැම විට ම, සිරුරු කිස අවසන් කොට වළට එබී බැලීමට ඇය පුරුදු ව සිටියා ය. මේ පුරුද්ද නිසා, පාසල් යාම ඇරැඹීමට පෙර සිට ම, පිදුරු තොප්පියක්, රේන්ද තොප්පියක් ඇතුළු හිස් වැසුම් කීපයක් ම ඇයට අහිමි ව තිබිණ. ඒ කාලයේ වැසිකිළිවල, ජල මුද්‍රා ක්‍රමය නො වී ය. මේ නිසා වළ වැසිකිළිවල හිස් වැසුම් පා වුණි! වැසිකිළි කිස නිමවා වළට එබී නො බලන්නැයි මව නිතර ම ටොට්ටෝ චංට කියා තිබුණි.

එදා, පාසල ඇරැඹීමට පෙරාතුව ටොට්ටෝ චං වැසිකිළියට ගිය විට, මව ගේ උපදෙස ඇයට අමතක ව තිබිණ. එය මතක් වීමට පෙර ම, ඇය එබුණා ය. ඒ මොහොතේ, අතෙහි තබා ගෙන සිටි පසුම්බිය අතහැරී ගොස්, හඬක් නංවමින් වළට වැටුණේ ය. පහළ අඳුරෙහි එය නොපෙනී ගිය විට, ටොට්ටෝ චං හඬා වැටුණා ය.

නමුත් කඳුළු සලා පසුම්බිය අතහැර දැමීමට ඇය කැමති නො වූවා ය. ඇය මුර මඩුවට ගොස් වත්තට වතුර දැමීමට භාවිත කළ, දිගු මිට සහිත විශාල ලී කෙණෙස්සක් සොයා ගත්තා ය. මිට ඇය ගේ උස මෙන් දෙගුණයක් පමණ විය. ඇයට පසුබට වීමට හේතුවක් නො වී ය. එය රැගෙන පාසල පසුපසට ගොස් මලවළ හිස් කරන මුවවිට සොයා ගැනීමට වෑයම් කළා ය. වැසිකිළියෙහි පිටත බිත්තිය අසල



එය විය යුතු යැයි ඇය සිතුවා ය. බොහෝ සොයා බැලූ පසු ව, යාරයක් පමණ ඈතින් සිමෙන්ති වළ පියනක් දැකිය හැකි විය. අමාරුවෙන් එය එසැවූ විට වළෙහි මුවවිට හමු විය. ඇය සෙවූ තැන හමු වී තිබුණි. ඇය එහි තුළ හිස දමා එබුණා ය.

"හාතේ! ඒක ලොකුයි, කුහොන්බුත්සු විහාරෙ පොකුණටත් වඩා." ඇයට කියැවිණ.

ඇය සිය කාරිය ඇරැඹුවා ය. වළෙහි මල පිටතට ඇදීමට පටන් ගත්තා ය. මුල දී ඇය පසුම්බිය වැටුණු හරිය අස් කරන්නට තැත් කළා ය. නමුත් වළ බොහෝ සේ ගැඹුරු විය. අඳුරු විය. වැසිකිළි තුනක් සඳහා මේ වළ සකසා තිබුණු බැවින්, එය විශාල විය. එසේ ම, වළ තුළට හිස දැමුව හොත් එහි තුළ ඇද වැටීමේ අනතුර ද තිබුණි. ඒ නිසා දිගට ම මල පිටතට ඇදීමට ඇය තීරණය කළා ය. කෙණෙස්සෙන් උඩට ඇද ගත් මල ඇය මුවවිට වටා දැමුවා ය. හැම වාරයක දී ම කෙණෙස්සෙහි පසුම්බිය රැඳී ඇත් දැයි පිරික්සුවා ය. කාලය ගත වීම ඇයට නොදැනුණි. පසුම්බියක සලකුණක්වත් හමු නො වී ය. ඇත්තට ම ඒක කොහේ ද? පන්තිය ඇරැඹීමට සීනුව නාද විය.

කුමක් කළ යුතු දැයි ඇය සිතුවා ය. මෙපමණ දුර ගොසින් නැවැත්විය හැකි ද? ඇය තව තවත් උනන්දු වෙමින් වැඩෙහි නිරත වූවා ය.

මුල් ගුරුතුමා එතැනින් යාමට පැමිණෙන විට, කුණු කන්දක් නැඟී තිබිණ. "මොනවද ඔයා කරන්නේ?" ඔහු ටොට්ටෝ චං ගෙන් විමැසී ය.

"මගේ පර්ස් එක වැටුණා." ඇය පිළිතුරු දෙමින් ම මොහොතක් අපතේ නො යවා, වැඩෙහි ම නිරත වූවා ය.

"හා, හා." මුල් ගුරුතුමා නො නැවැතී ම ගියේ ය. මෙබඳු සක්මන්හි දී අත් පිටුපසට ගෙන එකිනෙක මත තබා ගැනීම ඔහු ගේ පුරුද්දෙකි.

කාලය ගත විය. පසුම්බිය මේ දක්වා නොලැබුණි. දුගඳ විහිදුවමින් මල කන්ද උසින් උසට වැඩෙයි. මුල් ගුරුතුමා නැවතත් පැමිණියේ ය. "ඔයාට ඒක හම්බ වුණාද?" ඔහු විමැසුවේ ය.

"නැහැ" මල කන්ද මුදුනේ සිට ගෙන, ටොට්ටෝ චං ප්‍රසන්න ලෙස පැවැසුවා ය.

මුල් ගුරුතුමා අසලට ම පැමිණ, මිතුරු හඬින් මෙසේ කීවේ ය. "ඉවර වුණාම ඔක්කොම ඇතුළට දාන්න ඕනෑ. හොඳද?"

"හොඳයි, හොඳයි" ටොට්ටෝ චං කාරියෙහි නිරත වෙමින් ම, දිරිමත් ලෙස කීවා ය. හදිසියේ ම, ඇයට කල්පනාවක් පහළ විය. ඇය කන්ද දෙස බැලුවා ය. "ඉවර වුණාම ඝන ඒවා නම් ඇතුළට දාන්න පුළුවන්. නමුත් දියරවලට මා කුමක් කරන්නද?"

දියර කොටස වේගයෙන් පොළොවට උරා ගනිමින් තිබිණ. ටොට්ටෝ චං වැඩ නවත්වා, ඒ කොටස ආපසු වළට දමන්නේ කෙසේ දැයි සිතන්නට වූවා ය. සියල්ල ආපසු දමන බව ඇය මුල් ගුරුතුමාට පොරොන්දු වී ඇත. තෙත පස් කොටසක් ද ඇතුළට දැමිය යුතු යැයි ඇය අවසන දී තීරණය කළා ය.

මේ වන විට කන්ද, කඳු වැටියක් වී තිබිණ. වළ මුළුමනින් ම වාගේ හිස් ව තිබිණ. නමුත් පසුම්බිය ගැන හෝඩුවාවක් නො වී ය. එය වළේ අයිනේ ඇලී තිබෙන්නට හෝ පතුළට බැස තිබෙන්නට හෝ පිළිවන. ටොට්ටෝ චංට කම් නැත. කළ හැකි සියල්ල කර ඇති නිසා, ඇයට සතුටුයි. ඇය ඇත්තට ම සතුටු වූයේ, මුල් ගුරුතුමා ඇය බියපත් නො කොට, ඈ කෙරෙහි විශ්වාසය තැබීම නිසා, තමා ගේ ආත්ම ගෞරවය රැකුණු හෙයිනි. නමුත් එය ඉඳුරා තේරුම් ගැනීමට තරම් ඇය වැඩී නො සිටියා ය.

ටොට්ටෝ චං එබන්දක් කරනු දුටුවහොත් බොහෝ වැඩිහිටියන් කරනු ඇත්තේ කුමක් ද? "මොනවද, අයියෝ මේ කරන්නේ? නවත්වන්න, නවත්වන්න. ඕක අනතුරුදායකයි." ඔවුන් කියනු ඇත. නො එසේ නම් ඇයට උදව්වට එනු ඇත.

"ඉවර වුණාම ඔක්කොම ඇතුළට දාන්න ඕනෑ, හොඳද?" යන කියමන ගැන සිතා බලන්න. "කොයි තරම් අපූරු මුල් ගුරුතුමෙක්ද?" ටොට්ටෝ චං ගේ වාර්තාව කන වැටුණු විට, මව කල්පනා කළා ය.

මේ සිදු වීමෙන් අනතුරු ව, ටොට්ටෝ චං සිරුරු කිසෙන් පසු එළියට එබී බැලීම නවත්වා දැමුවා ය. මුල් ගුරුතුමා සම්පූර්ණයෙන් ම විශ්වාසය තැබිය හැකි අයෙකියි ඇයට හැඟිණ. ඔහු කෙරෙහි පෙරට වඩා කැමැත්තක් ඇය තුළ ජනිත විය.



ටොට්ටෝ චං තම පිළිණ කඩ නො කළා ය. ගොඩට ගත් සියල්ල ආපසු වළට දැමුවා ය. පිටතට ඇදීම බිය දනවන අපහසු කාරියක් වුව ද, ආපසු දැමීම එසේ නො වී ය. තෙත පස් කොටසක් ද ඇය මලවළට දැමුවා ය. බිම සුමට කර, පියන මුවවිට මත නිසි ලෙස තැන්පත් කළා ය. කෙණෙස්ස මුර මඩුවට ගෙන ගොස් තැබුවා ය.

එදා යහනට යාමට පෙර, පෙරවරුවේ අඳුරට පුද දුන් තමා ගේ පසුම්බිය ගැන ඇය නැවත සිතුවා ය. එය නැති වීම ගැන ඇයට දුකක් ඇති විය. එහෙත් එදා ගත් උත්සාහයෙන් ඇය වෙහෙසට පත් ව සිටියා ය. යහන් ගත වෙත් ම ඇයට නින්ද ගියේ ය.

ඒ අතර, ඇගේ වැඩ බිමේ තෙත පොළොව අලංකාර ලෙස සඳ රැසින් දිලිසුණේ ය.

කොහේ හෝ ඇගේ පසුම්බිය සාමදානයේ සැතැපුණේ ය!

## ටොට්ටෝ චං ගේ නම

ටොට්ටෝ චං ගේ නියම නම ටෙට්සුකෝ ය. ඇය ඉපැදීමට පෙර ම, මව ගේත් පියා ගේත් නෑ මිතුරෝ උපදින්නට නියමිත බිළිඳා පුතකු වෙතියි පෙරකීවෝ ය. මාපියෝ එය ඇදැහුවෝ ය. ඒ අනුව, බිළිඳාට 'ටෝරු' යන නම දැමීමට ඔවුහු තීරණය කර උන්හ. බිළිඳා දැරියක වූ විට, ඔවුන් මදකට නො පහන් වුව ද, 'ටෝරු' යන්න සඳහා භාවිතා වන චීන අකුරු ඇගේ නම සඳහා යොදා ගැනීමට දෙදෙනා ම කැමැති වූහ. (එහි චීන අරුත විනිවිද යාම, ඈතට ගෙන යාම යනුයි.) ඒ චීන අක්ෂරය අනුනාද වන පැහැදිලි හඬින් යුතු වෙයි. ඒ අකුරේ චීන උච්චාරණය 'ටෙට්සු' යනු ය. දැරියන් ගේ නම් සඳහා නිතර ම යොදනු ලබන 'කෝ' යන ප්‍රත්‍යය ද එකතු කොට, ඇයට 'ටෙට්සුකෝ' යන නම තබන ලදි.

සියල්ලෝ ම ඇයට 'ටෙට්සුකෝ චං' යි ඇමතූ හ. (චං යනු පුද්ගලයන් ගේ නම් අගට යෙදුණු සං යන්නෙහි ම වඩා සුපුරුදු රූපය විය.) මේ නම එලෙසින් ම ශබ්ද කිරීම ඇයට එතරම් පහසු නො වී ය. යමකු ඇගේ නම ඇසුවහොත්, ඇය කීවේ 'ටොට්ටෝ චං' යනුවෙනි. 'චං' යන්න ඒ නමේ ම කොටසකැයි ඇය සිතුවා ය.

පියා ඇතැම් විට ඇයට පිරිමි දරුවකුට මෙන් 'ටොට්ස්කී' යි ඇමැතී ය. ඔහු ඇතැම් විට මෙසේ කියයි: "එන්න, ටොට්ස්කී, රෝස මල්වලින් මේ කුරුම්බිය ඉවත් කරන්න මට උදවු කරන්න." පියා සහ රොකී හැර අන් සියල්ලන්ට ම ඇය 'ටොට්ටෝ චං' වූවා ය. ඇය පාසලේ සටහන් පොත්වල 'ටෙට්සුකෝ' යනුවෙන් ලියූ නමුත් තාමත් ඇය සිතන්නේ තමා 'ටොට්ටෝ චං' බව ය.

## ගුවන් විදුලි රසාංග

ඊයේ ටොට්ටෝ චං බොහෝ කනස්සල්ලට පත් වූවා ය. "ගුවන් විදුලි රසාංගවලට මීට පස්සෙ ඇහුම්කන් දෙන්න එපා." මව ඇයට කීවා ය.

ටොට්ටෝ චං සිඟිති දැරියක කාලයේ ගුවන් විදුලි යන්ත්‍ර බොහෝ සේ විශාල විය. ඒවා දැවයෙන් නිමවන ලද්දේ ය. වටකුරු මුදුනක් සහිත ව, දිගැටි හතරැස් ව රමණීය ලෙස ඒවා නිමැවී තිබිණ. රන්වන් පැහැ විසිතුරු ගෙතුම් සහිත සේද වැස්මකින් ආවරණය වූ විශාල ශබ්ද විකාශනයක් ඉදිරි පසට සවි වී තිබිණ. පාලක මොට්ටු දෙකක් ද එහි විය.

ටොට්ටෝ චං පාසල් යාම ඇරැඹීමට පෙර පවා, සේද වැස්මට කන තබා 'රකුගෝ' රසාංගවලට සවන් දීමට පුරුදු ව සිටියා ය. එහි ඉදිරිපත් කැරුණු විහිළු ඉතා ම විනෝද ජනක යැයි ඇයට සිතිණ. ඊයේ වන තුරු ඒවාට සවන් දීම ගැන මව ගේ විරුද්ධත්වයක් නො වී ය.

ගත වූ රැයෙහි පියා ගේ තූර්ය කණ්ඩායම් මිතුරෝ වාදන පුහුණුවට පැමිණියහ. සෙලෝව වයන ශුනෙසඳා තච්බානා මහතා ද ඒ අතර විය. "මෙන්න, තච්බානා මහත්තයා ඔයාට කෙසෙල් ගෙඩි ගෙනැල්ලා." මව ටොට්ටෝ චංට කීවා ය.

ඇයට සතුටක් ඇති විය. ආචාරශීලී ලෙස ඔහු වෙත නැමී, තුති පිදීමක් වශයෙන් මවට මෙසේ කීවා ය. "හා හා අම්මෙ, හරි ලස්සණයි, හරි ම අගෙයි."

ටොට්ටෝ චං සිටිය දී මව සහ පියා බැහැර ගියෝ ය. ගුවන් විදුලියේ ප්‍රචාරය වෙමින් පැවැති රසාංගවලට ඇය රහසේ සවන් දුන්නා ය. එහි විහිළුවලට ඇය හඬ නගා සිනාසුණා ය. වැඩිහිටියකු බලා සිටියහොත් මෙතරම් කුඩා දැරියක මෙතරම්



ගැඹුරු විහිළු තේරුම් ගන්නේ කෙසේ දැයි විස්මිත වනු ඇත. නමුත් ළමයින්ට විහිළු රස විඳීමේ සහජ හැකියාවක් ඇති බවට කිසි ම සැකයක් නැත. ඔවුන් කෙතරම් ළපැටි වුව ද, එය ගැටලුවක් නො වේ. විහිළු සහිත දේ, විනෝද ජනක දේ ඔවුහු හැම විට ම හඳුනා ගනිති.

## දුම්රිය මැදිරියක් පැමිණෙයි

"අද රෑට අලුත් කෝච්චි පෙට්ටියක් එනවා" දිවා ආහාර විවේකයේ දී මියෝ චං කීවා ය. ඇය මුල් ගුරුතුමා ගේ තෙවැනි දුව ය. උගන්නේ ටොට්ටෝ චං ගේ පන්තියේ ය.

ඇනට මත් පන්ති කාමර ලෙස මැදිරි හයක් පෙළ ගස්වා තිබේ. තවත් එකක් පැමිණෙයි. ඔවුහු කැලැඹී ගියහ.

"ඒක එන්නේ මොන පාරෙන් දැයි මට හිතන්නවත් බැහැ" එක් අයෙක් කීවේ ය. එය ගැටලු මතු කරන මැයකි. කරුණු පැහැදිලි නැත.

"ඒක ඔයිමාචි පාරේ එනවා ඇති. දුම්රිය හරස් පාරේදී මේ පැත්තට හරවාවි." අයෙක් කීවේ ය. "එහෙම වුණොත් ඒක පීලි පනීවි." අනෙකෙක් කීවේ ය.

"ඔවුන් ඒක කරත්තයකින් ගෙන එනවා ඇති." තවත් අයෙක් කීවේ ය. "කෝච්චි පෙට්ටියක් ගේන්න පුළුවන් කරත්ත තියෙන්නේ කොහේද?" තවෙකෙක් විමැසුවේ ය. "මං හිතන්නෙ නෑ."

මත අවසන් විය. කරත්තයක නො ව, ට්‍රක් රථයකවත් දුම්රිය මැදිරියක් ගෙන ආ නො හැකි බව කාටත් පැහැදිලි විය. බොහෝ සිතාමතා ටොට්ටෝ චං කතා කළා ය. "එයාල ඉස්කෝලෙ දක්වා පීලි හයි කරනවා ඇති."

"කොහේ ඉඳලද?" අනෙකෙක් විමැසී ය.

"කොහේද, දැන් ඒක තියෙන තැන ඉඳලා." තම මතය හොඳ මදි යැයි සිතමින් වුවත් ඇය පිළිතුරු දුන්නා ය. මැදිරිය එන්නේ කොහි සිට දැයි ඇය නො දන්නා ය. කෙසේ වුව ද කෙළින් පාරක් සඳහා ඔවුන් ගෙවල් හා වෙනත් දේ සමතලා නො කරනු ඇතැයි ඇය සිතුවා ය.

සිදු වේ යැයි සිතූ නොයෙක් හිතලු ගැන නිෂ්ඵල සාකච්ඡාවලට පසු ව, එදින සවස ගෙදර නො ගොස් මැදිරි රිය එන තුරු පාසලේ ම නැවැති සිටීමට ළමයි තීරණය කළහ. මේ ගැන තම පියා වූ මුල් ගුරුතුමාට කීම මියෝ චංට පැවැරිණ. රෑ වන තුරු පාසලේ සිටීමට අවසර ලැබේ දැයි දැන ගැනීම ඇයට පවරන ලදි. සුළු වේලාවකට පසු ඇය පැමිණියා ය.

"කෝච්චිය එන්නේ හොඳට ම රෑ වෙලා" ඇය පැවැසුවා ය. "අනිකුත් කෝච්චි ඔක්කොම ගිහිල්ලා අවසන් වුණාම තමයි, ඒක එන්න පිටත් වෙන්නේ, ඒක බලන්න කැමති අය සිටිනවා නම් කල් ඇතිව ගෙදර ගිහිල්ලා අවසර අරගෙන එන්න ඕනෑ"



කිසි විටෙක ඇති නොවූ තරම් කැලැඹීමක් මහ සතුටක් පැතිර ගියේ ය." රෑ ඇඳුම් ගේන්න කියලා එතුමා කිව්වද?"

"ඔව්, ඔව්, පොරෝනයකුත් එක්ක." මියෝ චං කීවා ය.



එදින සවස කිසි ම කෙනකුට පාඩම්වලට සිත එකඟ කර ගත නො හැකි විය. පාසල ඇරී ටොට්ටෝ චං ගේ පන්තියේ සියල්ලෝ ම කෙළින් ම ගෙදර ගියෝ ය. සියලු ම අය රෑ ඇඳුමෙන් එදා රෑ ම හමු වීමට බලාපොරොත්තු වූහ.

ටොට්ටෝ චං නිවසට ළඟා වූ වහා ම, මවට මෙසේ කීවා ය. "කෝච්චියක් එනවා. ඒක එහේට එන්නේ කොහොම දැයි අපි කවුරුත් දන්නේ නෑ. රෑ ඇඳුමක්, පොරෝනයක්, මං යන්නද?"

එවැනි විස්තරයකින් මව කුමක් සිතන්න ද? ටොට්ටෝ චං කී දේ කිසිවක් මවට නො වැටැහිණ. නමුත් දුව ගේ මුහුණේ බරැරුම් පෙනුම අනුව යමක් සිදු වන බව ඇයට අනුමාන කළ හැකි විය.

ඇය ටොට්ටෝ චං ගෙන් නොයෙකුත් ප්‍රශ්න ඇසුවා ය. දුව කුමක් කියන්නී දැයි අවසානයේ සොයා ගත් ඇය සිදු වන්නට යන දේ තේරුම් ගත්තා ය. ටොට්ටෝ චං එය දැක්ක යුතු යැයි ඇය තීරණය කළා ය. එබඳු සිදුවීමක් සාමාන්‍යයෙන් දක්නට නො ලැබේ. තමා ද එය දුටුවොත් මැනැවැයි ඇයට හැඟිණ.

මව ටොට්ටෝ චං ගේ රෑ ඇඳුම් ද පොරෝනයක් ද රැගෙන රෑ කෑමෙන් පසු ව, පාසලට ඇය කැටුව ගියා ය. ළමයි දස දෙනෙක් පමණ එහි වූහ. සිදුවීම සැලවූ ආදි සිසුහු කිහිප දෙනෙක් ද පැමිණ සිටියහ. තවත් මවුවරු දෙදෙනක් ද තම ළමයින් සමඟ පැමිණ සිටියහ. ඔවුන් ද නතර වීමේ කැමැත්ත හැඟැවුව ද, මුල් ගුරුතුමා ගේ භාරයට සිසුන් නතු කිරීමෙන් පසු ව, ඔවුහු නිවෙස් බලා ගියහ.

"ඒක එන කොට, මම ඔයාලා අවදි කරවන්නම්" මුල් ගුරුතුමා සිසුන්ට පොරොන්දු විය. ඔවුහු රැස්වීම් හලෙහි පොරෝන තුළ එතී වැතුරුණ හ. දුම්රිය එහි එන්නේ කෙසේ දැයි දැන ගැනීමේ කුහුල නිසා තමන්ට නින්ද නො යනු ඇතැයි ඔවුහු සිතූ හ. නමුත් වෙහෙස ව සිටි ඔවුන්ට නිදිමත පැමිණියේ ය. "නොවරදවාම මා අවදි කරන්නැ"යි කීමට පෙර ම නින්ද ගියේ ය.

"ඒක ඇවිල්ලා! ඒක ඇවිල්ලා!" මහා ඝෝෂාව තුළ ඔවුහු අවදි වූ හ.

ටොට්ටෝ චං එළියට පැන පාසල් පිටිය හා දොරටුව පසුකොට දිව ගියා ය. විසල් දුම්රිය මැදිරියක් අරුණලු අතරින් දැකිය හැකි විය. මෙය සිහිනයක් ද? පීලි නැති පාරේ කිසි හඬක්

නොනගා දුම්රියක් පැමිණෙයි. ට්‍රැක්ටරයක් මඟින් අදිනු ලැබූ ට්‍රේලරයක් මත ඔයිමාචි දුම්රිය පළේ සිට එය පැමිණ ඇත. කලින් දැන නො සිටි වැදගත් දෙයක් මෙහි දී ටොට්ටෝ චං ඇතුළු පිරිස දැන ගත්හ. කරත්තයකට වඩා බොහෝ විශාල වූ ට්‍රේලරයක් ඇදගෙන යා හැකි ට්‍රැක්ටරය නමැති වාහනයක් ඇති බව ඔවුන්ට දැන ගත හැකි විය. ඔවුහු මහත් සතුටට පත් වූ හ.

ට්‍රේලරය මත නැඟී සිටි මැදිරිය උදාසන පාළු පාරෙහි හෙම්හෙමින් ඉදිරියට ඇදුණේ ය. ඊළඟට මහත් කෝලාහලයෙකි. එදා අද මෙන් යෝධ දොඹකර නො වී ය. ඒ නිසා මැදිරිය ට්‍රේලරයෙන් බා ගැනීමට ද, පාසල් වත්තේ නියමිත තැනට ගෙන යාමට ද, මහ මෙහෙයුමක් කිරීමට සිදු විය. මැදිරිය යටින් විශාල කොට කීපයක් තබා, ඒවා මත තල්ලු කර එය 'ගමනාන්තය'ට ගෙන යා යුතු විය.

'පරිස්සමින් බලන්න' මුල් ගුරුතුමා කීවේ ය. "ඒවාට කියන්නේ 'රෝලර්' කියලා. ලිස්සා යාමේ බලය ඒ විශාල මැදිරිය ගමන් කරවීමට යොදාගෙන තිබෙනවා."

ළමයි ඉතා උනන්දුවෙන් එය නැරඹූ හ.

"...හීව් හෝ.... හීව් හෝ" තල්ලු කිරීමේ දී කම්කරුවෝ රිද්මයට හඬ නැගූහ. ඔවුන් ගේ හඬෙහි රිද්මය අනුව, හිරු නැගෙන බවක් පෙනී ගියේ ය.

පාසලේ ඇති අනෙක් මැදිරිවල මෙන් ම, බොහෝ අය ගමන් කර තිබුණු මේ මැදිරියේ ද රෝද ඉවත් කර තිබුණි. එහි ගමන් කාලය අවසන් වී ඇත. මෙයින් පසු ව සිසුන් ගේ සිනා හඬ එමඟින් ගෙන යනු ඇත.

දරු දැරියෝ රෑ ඇඳුම් සහිත ව, උදා හිරු රැසෙහි නැහැවෙමින් උන්නෝ ය. ඔවුන්ට සතුට උසුලා ගත නො හැකි විය. ඔවුහු උඩ පැන්නෝ ය. ඉහළ පහළ ගියෝ ය. මුල් ගුරුතුමා ගේ අතේ එල්ලුණහ. ගෙල බදා ගනිමින් ගී ගයමින් විනෝද වූ හ.

මුල් ගුරුතුමා විස්මිත ව, ළද ගැහැටෙන් පීනා ගියේ ය. ඔහු ගේ සිනාවට ළමයි සිනාවෙන් ම පිළිතුරු දුන්හ. එදා අත්විඳි සතුට කිසිවකුට කිසි දා අමතක කළ නො හැකි විය.



# පිහිනුම් තටාකය

ටොට්ටෝ චංට එය රන් අකුරෙන් ලියැවෙන දිනයකි. පළමු වරට ඇය තටාකයෙක පිහිනූ දවසයි, ඒ. ඇගේ නූල් පටක්වත් නැති ව!

එය සිදු වූයේ උදාසනක ය. මුල් ගුරුතුමා සියල්ලන් අමතා මෙසේ කීවේ ය. "අද හදිසියෙන්ම රස්නය වැඩි වෙලා වගෙයි නේද? මා හිතනවා තටාකය පිරෙව්වොත් හොඳයි කියලා"

"ඔඔ....." සියල්ලෝ සතුටින් උඩ පැන්නෝ ය. ටොට්ටෝ චං ඇතුළු පළමු වන ශ්‍රේණියේ ළමයි වඩාත් සතුටු වූ හ. බොහෝ පිහිනුම් තටාක මෙන් ටොමෝ තටාකය දිගැටි හතරැස් නො වී ය. එක් පැත්තක් අනෙක් පැත්තට වඩා පටු විය. එය බෝට්ටුවක් මෙන් පියකරු හැඩයක් ඉසිළී ය. පිහිටි බිමේ හැඩය ද එයට හේතු වී තිබිණ, කෙසේ වුව ද එය විශාල වූ කදිම තටාකයක් විය. පන්ති කාමර මැදිරි සහ රැස්වීම් හල අතර බිමෙහි එය පිහිටා තිබිණ.

පාඩම් අතරතුර දී ටොට්ටෝ චං සහ සෙස්සෝ කවුළු අතරින් හොර බැලුම් හෙළූ හ. එය හිස් ව තිබෙන විට කොළ වැටීම නිසා, කෙළි බිම සේ ම දිස්වෙයි. දැන් එය පිරිසිදු ය. පිරෙන්නට සූදානම් ය. ටිකෙන් ටික එය නියම පිහිනුම් තටාකයක් ලෙස ම පෙනෙන්ට විය.

අවසන කෑම පැය පැමිණියේ ය. සියලු ම ළමයින් තටාකය වටා රැස් වූ විට, "අපි පිහිනීමට පෙර අභ්‍යාස කීපයක් කරමු"යි මුල් ගුරුතුමා යෝජනා කළේ ය.

"පිහිනීමට මට නාන ඇඳුමක් ඕනෑ නේද" ටොට්ටෝ චංට එක් වර ම සිහිපත් විය. මව සහ පියා සමඟ ඇය කමකුරා වෙත ගිය විට, නාන ඇඳුමක් ද රබර් වළලු ඇතුළු ආම්පන්න සියල්ල ද මිලට ගත්තා ය. නාන ඇඳුම් ගෙනෙන ලෙස ගුරුතුමිය කියුවා දැයි මතක් කර ගැනීමට ඇය වෑයම් කළා ය.

මුල් ගුරුතුමා ඇගේ සිත කියවූ බවක් පෙනුණි. ඔහු මෙසේ කීවේ ය. "නාන ඇඳුම් ගැන කරදර වෙන්න එපා. රැස්වීම් හලට ගිහින් බලන්න"

ටොට්ටෝ චං ඇතුළු පළමු වන ශ්‍රේණියේ ළමයින් රැස්වීම් හලට යන විට, ළමයි නෑමට යන්නට සූදානම් වෙමින් කෑගසමින් ඇඳුම් උනමින් සිටියහ. ඔවුහු එකිනෙකා පසු පස අමු නිරුවතින්

පිටිය වෙත දිව යමින් සිටියහ. ටොට්ටෝ චං සහ ඇගේ මිතුරු මිතුරියෝ ද ඔවුන් අනුගමනය කළහ. උණුසුම් වටපිටාවෙහි උපන් ඇඳුමෙන් සිටීම ඔවුන්ට පුදුමාකාර සතුටක් ගෙන ආවේ ය. රැස්වීම් හලෙන් පිටත, ඉහළ පියගැට මතට පැමිණි ඔවුන්ට සෙස්සන් සිරුරු උණුසුම් කිරීමේ ඇබෑසිවල නිරත වනු පෙනිණ. ටොට්ටෝ චං ඇතුළු ඇගේ පන්ති සගයෝ වහන් නැති පයින් පිය ගැට බැස ඔවුන් වෙත දිව ගියහ.

පිහිනුම් උපදේශක වූයේ මියෝ චං ගේ අය්යා ය, හෙවත් මුල් ගුරුතුමා ගේ පුතා ය. ඔහු ශාරීරික අභ්‍යාස පිළිබඳ දැනුමැත්තෙක් විය. ටොමෝවෙහි ගුරුවරයකු නුවූව ද, ඔහු සරසවියෙක පිහිනුම් කණ්ඩායමෙක සාමාජිකයෙක් විය. ටොමෝ යන පාසලේ නම ම ඔහුට තිබිණ. ටොමෝ සං නාන කලිසමකින් සැරසී සිටියේ ය.

අභ්‍යාසවලින් පසු ඔවුන් ගේ සිරුරුවලට සිහිල් දිය ඉසින ලදින්, සිසුහු මොර දෙන්නට වූ හ. ඔවුහු වහා ම තටාකයට පැන්නෝ ය. ටොට්ටෝ චං ඉක්මන් වූයේ නැත. අනෙක් අය දෙස බලා දියේ නො ගිලී සිට ගත හැකි දැයි පිරික්සුවා ය. නිවසේ නාන බේසම මෙන් එය උණුසුම් නො වී ය. එය විශාල විය. සිත්කලු විය, නිදහස් ලෙස අත් පා දිගු කළ හැකි විය.

කෙසඟ ළමයි, තර ළමයි, පිරිමි ළමයි, ගැහැනු ළමයි යන සියල්ලෝ ම සිනාසෙමින්, හඬ නගමින් දිය බුං ගසමින් උපන් ඇඳුමෙන් ක්‍රීඩා කළෝ ය.

කොතරම් සතුටක් ද කොතරම් විනෝදයක් දැයි ටොට්ටෝ චංට සිතුණි. ඇයට දුක සිතුණේ රොකීට පාසලට පැමිණීමට නො හැකි වීම ගැන පමණෙකි. නාන ඇඳුමක් නැති ව බැසීමට හැකි බව දන්නේ නම් ඌ ද පිහිනුම් තටාකයට එනු ඇතැයි ඇයට සිතුණි.

සිසුන්ට නිරුවතින් නෑමට මුල් ගුරුතුමා ඉඩ දීම ගැන ඔබ පුදුම වනු ඇත. ඒ ගැන නීති කිසිවක් නො වී ය. යමකුට නාන ඇඳුම් අඳින්නට අවශ්‍ය නම් එයට කිසි ම බාධාවක් නො වී ය. අනෙක් අතට, අද මෙන් කිසි ම ඇඳුමක් නැති ව එහි යාමට යමකුට වුවමනා වී නම් ඊට ද කිසි ම බාධාවක් නැත. ඇයි, නිරුවතින් නෑමට ඔවුන්ට ඉඩ හළේ? ඔවුනොවුන් ගේ සිරුරු



අතර වෙනස්කම් ගැන අනවශ්‍ය කුතුහලයක් තිබීම නුසුදුසු යැයි මුල් ගුරුතුමා සිතුවේ ය. තම සිරුර අන් අය ගෙන් සඟවා ගැනීමට උත්සාහ කිරීම අස්වාභාවික යැයි ඔහු කල්පනා කළේ ය.

සියලු ම සිරුරු පියකරු බව ළමයින්ට අවබෝධ කරවීමට ඔහුට අවශ්‍ය විය. ටොමෝහි සිසුන් අතර, යසුවාකි චං වැනි පෝලියෝ වැලඳුණු අය, කුරු මිට්ටෝ, වෙනත් අබාධිතයෝ වූ හ. ඔවුන් තම සිරුරු නිරුවත් කර, එකතැන එකට ක්‍රීඩා කළහොත් ලජ්ජාව ඔවුන් වෙතින් පලා යනු ඇත. ඔවුන් තුළ හීන මානයක් නො වැඩෙනු ඇත. මෙහි දී අත්දැකීමට ලැබුණු පරිදි අබාධිත ළමයි මුල දී ලජ්ජා වූ හ. ඉක්මනින් ම ඔවුහු තමන් ගැන සතුටුවීමට පටන් ගත්හ. අන්තිමේ දී මුළුමනින් ම ලජ්ජාවෙන් මිදුණහ.

සමහර මාපියෝ මේ අදහස ගැන කනස්සල්ලට පත් වූ හ. ඔවුහු තම දරුවන්ට නාන ඇඳුම් ලබා දී පිහිනන විට නො වරදවා ම ඒවා අඳින ලෙස බල කළෝ ය. ඒවා භාවිත වූයේ කොතරම් අඩුවෙන් දැයි ඔවුහු නො දත්හ. නිරුවතින් පිහිනීම හොඳ ම පිළිවෙළ බව මුල සිට ඇදැහූ ටොට්ටෝ චං වැනි ළමයි ද, නාන ඇඳුම් ගෙන ඒමට අමතක විණැයි කී ළමයින් ආදර්ශයට ගත් නාන ඇඳුම් ඇති සිසුහු ද ඔවුන් ලෙසින් නිරුවත් ව පිහිනීම වඩා විනෝද ජනක යැයි කල්පනා කළෝ ය. ඒ අනුව ඔවුන් කළේ තම නාන ඇඳුම තෙතබර ව ගෙදර ගෙන යාමට වගබලා ගැනීම පමණි! මේ නිසා ටොමෝවේ ළමයි සෑම තැනක ම එක ම පාටින් වැඩෙන පලතුරක් සේ සමජාතීය වූ හ.

## වාර්තා පත

දකුණ වම නො බලා ඇගේ පොත් මල්ල පිටේ හැපෙයි. ටොට්ටෝ චං දුම්රිය නැවැතුමේ සිට දිගට ම දිව ගියා ය. කිසියම් බියකරු දෙයක් සිදු වී ඇතැයි ඇය දුටු කෙනෙකුට සිතෙයි. ඇය දුවන්නේ පාසල් දොරටුවෙන් පිට වූ තැන් සිට ම ය. ගෙදර ආ වහා ම, ඉදිරි දොර ඇර, "මං ආවායි" හඬ නගා කී ඇය රොකී සොයා ගියා ය. පැතැලි කුස පොළොව පැහැසෙන සේ නිසල ව බිහිදොර අසල ඌ ලැග සිටියේ ය. වදනකුදු නො පවසා,

ටොට්ටෝ චං උදෑසන් ඉදිරියේ හිඳ ගත්තා ය. මිල්ල පිටෙන් උනා, එය විසිර නොයා පාවිත්තා සහ අතට ගත්තා ය. ඇගේ ලඳුඹුණු පරාසිට දුන සහ ඇති ව්‍ය මලක එය දිග හැර ඇල්ලුවා ය.

"ලස්සන ලැන්සා," ඇය තාවකීයත් ව කැවැසුවා ය. "ඒ 'මී' සහ කොහොත් පසුව, එම විය. ගිය වසා ම් කොහෙ දෑ ගිර වඩා ඒ කොහෙ තුලී පොටිවෙටෝ චං දැන ගතා පිටි හෙයින් පරාසිට එය දැන හැකිය. එයට වසා ආසාසු නො වී ය. කළුත් තමා ගේ මුල් ම ගැරියා සහ අන් මිහිවතුට පෙර පරාසිට පෙන්වීමට ටොට්ටෝ චං ටුවමතා විය. පරාසී සතුටු වන බව ඇයට හිතැක ය.

තම මිසුණ ඉදිරියේ ඇති තවලාසිය පුට් පරාසී එය ඉවතෙකට ටොට්ටෝ චං ඇදහ ඇස් යොමු කළේ ය.

"මියාට සතුටු නේද? කැද්ද?" ඇය කීවා ය. "ඒ වුණාට මෙහෙත අමාරු වඩා තියෙනවා. ඔක්කොම කියවන්න බැයාට බැහැ."

පරාසී වාර්තා සහ කැවන මලුන්ගෙන් ඉන් ඒ දෙසට හිස හැරවී ය. ටිඳුකම ටොට්ටෝ චං ගේ අත මලව කැමෙවී ය. "හොඳයි" සතුටින් කීවු ඇය නැගී සිටියා ය. "දැන් ගිහින් මෙම අමිමට පෙන්නන්න ඕනා."

ටොට්ටෝ චං හිස පසු නැගී සිටි පරාසී වඩා සිහිල් නැගතුව මතු විය. ගෙමින් එහි ඇතිර දුන් විසා ගත්තේ ය. උා ඒ වාර්තා සහ ගෙන ම කල්පනා කරන බව, ඒ දුටුවා කී ටොට්ටෝ චං පසුව පමණක් නො වී, අන් අයකුට වුව ද නොතෙරුණු ඇත.

## ගිම්හාන නිවාඩුව ආරම්භ වෙයි

"අපි හෙට කඳවුරකට යනවා. ඒ ඇඳුම් සහ පොරෝනා ද රැගෙන හෙට සවස පාසලට එන්න." මුල් ගුරුතුමා ගේ ලිපි සටහන ටොට්ටෝ චං ගෙට ගෙනැවුවා ය. ගිම්හාන නිවාඩුව පසු දින ඇරඹීම.

"කඳවුරක්ද?" ඇමිනේ කඳවුරකට යනේ කියන්නේ?" ටොට්ටෝ චං ඇහුවා ය.



පසුව පුදුමෙනුත් පුදුමයි. එහෙත් ඇය පිළිතුරු දුන්නා ය. "පුහුණුව හරි එළිමහනක කූඩාරම් ගහලා ගෙන ඒ ඇතුළේ නිදා ගන්නවා. ඒ අතර ම, තාරකා ආදිය නරඹන්නත් පුළුවන්. එපමණ කූඩාරම් ගහන්නේ කොහේ දැයි මම නම් දන්නේ නැහැ. ගත්තු ගැන තිබිම් දෙයක් කියලා නැති නිසා ඉස්කෝලේ කිට්ටුවම වෙන්න ඕනා."

එදා රෑ ටොට්ටෝ චං යහනේ සහ වූ පසු ව, මව්තොමෝ වේලා වෙන වන තුරු නිදන්ද ආවේ නැත. කඳවුරකට යාමේ අදහස සිතට ඩෑ දුන්නේ ය. එය භයානක වීර ක්‍රියාවෙකි. ඇගේ හදවත වේගයෙන් ගැහුණේ ය.

පසු දා අවදි වූ මොහොතේ සිට ම ඇය ඔවුන් අසුරන්නට වූවා ය. හවස් යාමයේ ඇගේ ඒ ඇඳුම් සහිත මහලාකුවෙකි උඩින් ම පොරෝනයත් තැන්පත් කර ගෙන "ගිහින් එන්නම්" කියා සමු ගත්තා විට, තමා ඉතා කුඩා වී ඇතැයි ඇයට හැඟිණ. ටොට්ටෝ චං තුළ බියක් ඇති විය.

ළමයින් පාසලට පැමිණි විට, "දැන් සියලු දෙනා රැස්වීම් ශාලාව රැස් වන්න" යි මුල් ගුරුතුමා කීවේ ය. ඔවුන් රැස් වූ විට, ඔහු වේදිකාවට නැග සහ දැව් යමක් පෙන්වමින් කතා කළේ ය. එය කොළ පැහැ කූඩාරමක් විය.

"කූඩාරමක් සවි කරන්නේ කොහොමදැයි මම දැන් සියලුට පෙන්වනවා" යි කියමින් ඔහු එය දිග හැරියේ ය. "හොඳ හැටි බලා ගන්න."

ඔහු තනිව සිටුවා ලණු ඇද, කිණිහිරයක් ගෙන ඩිමට ගසා, එය ඉදි කළේ ය. ලස්සන කූඩාරමක් ගොඩ නැගුණි.

"දැන් කඳවුරු එන්න. මුළු ශාලාව පුරා ම, කූඩාරම් ගැසී කඳවුරු පටන් ගන්නයි අපි සූදානම් වෙන්නේ." එතුමා කීවේ ය.

ඔවුන් එළිමහනේ කූඩාරම් ගසනු ඇතැයි ටොට්ටෝ චං මෙන් අන් සියල්ලෝ ද සිතූ හ. කළුත් මුල් ගුරුතුමා ගේ අදහස වෙනස් ය. වැස්සක් වැටුණත් සීත සුළං හැමුවත් රැස්වීම් ශාලාව තුළ සිදුවන කඳවුරක් බව ඔහු දනියි.

"අපි කඳවුරු බඳිනවා" කියමින් ළමයි නැගෙණු හ. ඔවුහු කණ්ඩායම්වලට බෙදී, ගුරුවරුන් ගේ උදවු ඇති ව, වුළුමනා කූඩාරම් ගණන ඇටැවීමට සමත් වූ හ. එක් කූඩාරමක තුන් දෙනෙකුට පමණ සැහුණි. ටොට්ටෝ චං ඉක්මනින් ඒ ඇඳුම් ඇඳ ගත්තා ය. ළමයි සතුටෙන් කූඩාරම් අතර බඩ ගා යිහ

කූඩාරමෙන් කූඩාරමට බොහෝ ගමන් තිබුණේ ය! සියල්ලන් රැ ඇඳුමෙන් සැරසුණු විට මුල් ගුරුතුමා මැදින් හිඳ ගත්තේ ය. සියල්ලන්ට ඔහු පෙනුණි. තමන් ගිය රට ගමන් ගැන ඔහු විස්තර කරන්නට විය.

සමහරු කූඩාරම්හි වැතිර හිස එළියට දමා ගෙන උන්හ. සමහරු වාඩි වී උන්හ. සමහරු තම හිස වැඩිහිටි ළමයින් ගේ උකුලේ තබා ගෙන උන්නෝ ය. තම තමන් ගොස් නැති ඇතැම් විට අසාවත් නැති විදෙස් රටවල් පිළිබඳ කතාවලට ඔවුහු සවන් දුන්හ. මුල් ගුරුතුමා ගේ කතා ඔවුන් සිත වශී කළේ ය. ඔහු ගේ කතාවල සිටින මුහුදෙන් එහා රටවල ළමයින් තමන් ගේ ම මිතුරන් ලෙස ඔවුන්ට හැඟී ගියේ ය.

රැස්වීම් හලේ කූඩාරම් තුළ නිදා ගැනීම ඉතා සරල ලෙසින් සිදු වුව ද, එය සිසුන්ට කිසි දා අමතක නො වූ, අගනා අත්දැකීමක් විය. ළමයින් සතුටු කරන්නේ කෙසේ දැයි මුල් ගුරුතුමා මැනැවින් දැන සිටියේ ය.

මුල් ගුරුතුමා කතා කළ පසු ව රැස්වීම් හලේ පහන් නිවන ලදී. ළමයි තම තමන් ගේ කූඩාරම්වලට ගියහ. ඇතැම් කූඩාරම් මතින් සිනහව නැඟිණ. අනෙකකින් කොඳුරනු ඇසිණ. ඇතැමකින් කෑගසනු ඇසුණේ ය. ක්‍රමයෙන් නිහඬතාව ළඟා විය.

එදා වූයේ හඳ තරු නැති කඳවුරෙකි. එහෙත් ළමයි එයින් බොහෝ සේ විනෝද වූහ. ඒ කුඩා රැස්වීම් හල ඇත්ත කඳවුරක් ලෙස ඔවුනට පෙනිණ. සඳ රැස් සහ තරු එළි ඒ රැය පිළිබඳ මතකය විසින් වෙළා ගන්නා ලදි.

## මහා වික්‍රමය

රැස්වීම් හලේ කඳවුරෙන් දෙදිනකට පසු ව, ටොට්ටෝ චං ගේ මහා වික්‍රමයේ දවස උදා විය. යසුවාකි චං හමු වීමට යොදා ගෙන තිබුණේ එදා ය. එය ඇගේ මව සහ පියා මෙන් ම යසුවාකි චං ගේ මව සහ පියා ද නො දැන සිටි රහසක් විය.



ටොමෝ පාසල් බිමෙහි හැම ළමයකුට ම ගසක් තිබුණේ ය. තම තම ගසට නැඟීමේ අයිතිය ඒ ඒ අයට තිබුණි. කුහොන්බුත්සු දෙසට දිවෙන පාර වෙත් වූ වැට අසල, පාසල් වත්ත අයිනේ ටොට්ටෝ චං ගේ ගස පිහිටා තිබිණ. විශාල ගසක් වූ එය නගින විට ලිස්සනසුලු විය. නමුත් ගස් නැඟීමේ හැකියාව ඇතියකුට බිමෙන් අඩි හයක් පමණ උසින් ඇති කරුවට නැඟ ගැනීම අමාරු නො වී ය. ඒ කරුව තොටිල්ලක් මෙන් සුවදායක විය. පාසලෙන් පසු ව හා විවේක ඇති විට, ටොට්ටෝ චං එහි යාමට පුරුදු වී සිටියා ය. සුව සේ එහි හිඳ ගෙන දුර ඈත හෝ අහස දෙස හෝ එසේත් නැත්නම් මඟ යන එන්නන් දෙස බලා සිටීමට ඇය පුරුදු වී සිටියා ය.

මේ ගස් තම තමන් ගේ දේපළ ලෙස ළමයි සිතුවෝ ය. අන් අයකු ගේ ගසට යාමට වුවමනා වූ විට ආචාර සම්පන්න ව අයිතිකරු ගෙන් අවසර ගත යුතු විය. "සමාවෙන්න, මටත් එන්න අවසරද?"

යසුවාකි චංට පෝලියෝ තිබුණු බැවින්, ඔහු කිසි දාක ගසකට නැඟී නැත. තනිව ම නඟින්නට ද නො හැකි ය. ඒ නිසා ය, ටොට්ටෝ චං තම ගසට එන ලෙස ඔහුට ඇරයුම් කරන්නට සිතුයේ. අන් අය දැන ගතහොත් අවුලක් ඇති කරතියි සිතා මෙය රහසක් ලෙස තබා ගැනීමට දෙදෙනා ම තීරණය කළහ.

ඩෙනෙන්චෝෆුවල යසුවාකි චං ගේ නිවසට යන බව ටොට්ටෝ චං ගෙදරින් පිටත් වෙද්දී කීවා ය. ඇය කීවේ බොරුවෙකි. මේ නිසා ඇය මව මුහුණ නොබලා පාවහන් දෙස බලා සිටියා ය. රොකී ඇය පසුපස දුම්රිය නැවැතුම දක්වා ගියේ ය. ඔවුන් වෙන් වෙද්දී ඇය රොකීට ඇත්ත එළිදරව් කළා ය. "මම යන්නේ යසුවාකි චං මගේ ගහට ගොඩ කරන්න" ඇය කීවා ය.

දුම්රිය අවසර පත ගෙලෙහි එල්ලෙද්දී පාසලට දිව ගිය ටොට්ටෝ චං ගිම්හානය නිසා හේ යමින් තිබුණු මල් පාත්ති අසල පොරොත්තුවෙන් සිටි යසුවාකි චං දුටුවා ය. ඔහු ඇයට වඩා එක් වසරකින් වැඩිමහලු විය. ඔහු ගේ කටහඬ නම් ඊටත් වඩා වැඩිමහලු අයකු ගේ බඳු විය.

යසුවාකි චං ටොට්ටෝ චං දුටු වහා ම පා අද්දවමින් අත් බැඳ ගෙන ඉදිරියට දිව ආවේ ය. තමන් දෙදෙනා රහස් වැඩක් කිරීමට යන බව හැඟුණු විට, ටොට්ටෝ චං තුළ ඇඩි සතුටක් ඇති විය. ඇය හොර බැල්මක් හෙළු විට, මිතුරා ද එසේ ම කළේ ය.



එහෙත් යසුවාකි චං ඇය කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබුවේ ය. ටොට්ටෝ චං ඔහු වෙනුවෙන් තම ජීවිතය අවදානමට ලක් කොට තිබුණි. සිගිති ඇතින් මිරිකා ගෙන මුළු වැර යොදා ඇය ඔහු උඩට ඇද්දා ය. විටින් විට, විශාල වලා කැටි පාව විත් දිලිසෙන හිරු රැසින් ඔවුන් රැක ගත්තේ ය.

අන්තිමේ දී දෙදෙනා ගස මත මුහුණට මුහුණ ලා බලා සිටියෝ ය. තෙත් වූ හිස කෙස් ඇඟිලිවලින් පස්සට කරමින් ටොට්ටෝ චං ගරුසරු ඇති ව, නැමී සිට, "මගේ ගසට ඔබ ගෞරවයෙන් පිළිගන්නවායි" කීවා ය.

යසුවාකි චං ගසෙහි කඳට ඇල වී සිටිමින් විනීත ලෙස සිනාසුණේ ය. "මම ඇතුළට එන්නද?" ඔහු ඇසුවේ ය.

කලින් කිසි දාක අත් නො විඳි හැඟීමක් ඔහුට දැනුණේ ය. "ගසකට නැඟීම මේ වගේ දෙයක් කියලා කවදාවත්ම මා දැන සිටියේ නැහැ." ඔහු සොම්නසින් කීවේ ය.

ඔවුහු ගස මත බොහෝ වේලාවක් ගත කළහ. නොයෙකුත් දේ ගැන කතිකා කළහ. "රූපවාහිනි කියලා ජාතියක් එහේ තියනවා කියලා ඇමෙරිකාවෙ ඉන්න මගේ අක්කා කියනවා," යසුවාකි චං මහත් උනන්දුවෙන් කීවේ ය. "ඒක ජපානෙට ආවා ම, ගෙදර ඉඳගෙන අපට සුමෝ පොර බලන්න පුළුවන්ලු. ඒක පෙට්ටියක් වාගේ යැයි එයා කියනවා."

එහි අදහස ටොට්ටෝ චංට වැටැහුණේ නැත. බොහෝ දුර යා නො හැකි යසුවාකි චංට ගෙදර සිට සියල්ල නැරඹීමේ වාසිය ඔහුට වැදගත් වන බව ටොට්ටෝ චංට නො වැටහිණ. ගෙදර තිබෙන පෙට්ටියක් තුළ සුමෝ පොරවල යෙදෙන්නේ කෙසේ දැයි ඇය විස්මයට පත් වූවා ය. මන්ද? ඒ ක්‍රීඩකයෝ එතරම් ම විශාල වූ හ. නමුත් එය අරුම පුදුම දෙයකි. එකල කිසිවෙක් රූපවාහිනිය ගැන නොදත්හ. ටොට්ටෝ චංට ඒ ගැන මුල් වරට කීවේ යසුවාකි චං ය. රැහැයියෝ ගී ගැයූ හ. සිඟිත්තෝ දෙදෙන පිනා ගියහ. යසුවාකි චං මුල් වරට සහ අවසන් වරට ගසකට නැංගේ එදා ය.



# නොබිය බව පිරික්සුම

"ගඳ ගහන තලු මරන කැතයා කවුද?" උත්තරය කවුරුනුත් දන්නා නමුත් මෙ තේරවිල්ල කවුරුත් ආසා කළහ. ටොට්ටෝ චං සහ ඇගේ මිතුරෝ මේ තේරවිල්ල නිතර ම උනුන් ගෙන් ඇසුවෝ ය. කවදාවත් ඔවුන්ට එය එපා නො වී ය. එහි පිළිතුර වූයේ "ජෑම් බනිසයක් කකා වැසිකිළියේ සිටින යකා" යනු ය.

ටොමෝවේ 'නොබිය බව පිරික්සුම' අවසන් වූ ආකාරය ද කදිම තේරවිල්ලක් වැනි ය. "ඔබට හිනා යන කැළැල් සහ තුවාල මොනවාද?" ඒ තේරවිල්ල මෙබඳු ය.

රැස්වීම් හලේ කූඩාරම් ගසා කඳවුරු ගත වූ එක්තරා රැයෙක, මුල් ගුරුතුමා මෙසේ කී ය. "අපි ළඟදි දවසක රැ කාලයේ කුහොන්බුත්සු විහාරයේ දී පිරික්සුමක් පවත්වන්න යනවා, මෙ ළමයි බය ද නැද්ද කියලා බලන්න. එදාට අවතාරයක් වෙන්න කැමැති ළමයි අත් උස්සන්න".

සත් දෙනෙක් පමණ ඉදිරිපත් වූ හ. යොදාගත් දිනයේ, ළමයින් පාසලේ රැස් වූ විට, අවතාර වීමට කැමැති වූ අය තමන් සකසා ගත් ඇඳුම් ගෙනැවිත් තිබිණ. පන්සල් බිමේ සැඟවී සිටීම සඳහා ඔවුහු කල් තබා පිටත් වූ හ. "අපි ඔයාලා මැරෙන තුරු බය කරනවා" පිටත් වීමට පෙර ඔවුහු කී හ.

ඉතිරි වූ තිහක පමණ සිසුන් පස් දෙනෙකු පමණ සිටින කණ්ඩායම්වලට බෙදී විටින් විට කුහොන්බුත්සු විහාරය දෙසට පිටත් ව ගොස් විහාර බිම වටා ද, ඊළඟට සොහොන් බිමට ද ගොස් ආපසු පැමිණිය යුතු විය.

මෙය ඔවුන් කොතරම් නිර්භීත දැයි විමසන පිරික්සුමක් වූව ද, ඕනෑ ම වෙලාවක ගමන නවත්වා ආපසු පැමිණීමට ඕනෑ ම කෙනෙකුට අවසර ඇති බවත් එය වරදක් නො වන බවත් මුල් ගුරුතුමා පැහැදිලි කළේ ය.

ටොට්ටෝ චං මව ගෙන් ඉල්ලා ගත් විදුලි පහනක් ගෙනැවිත් තිබුණි. "ඔක නැති කරගන්න එපා." ඇය කියා තිබිණ.

තමන් අවතාර අල්ලා ගැනීමට යන බව සමහර ළමයි කීවෝ ය. ඒ සඳහා සමහර ළමයි සමනල අතංගු ද ගෙනැවිත් තිබිණ! සමහරු අවතාර බැඳ ගැනීම සඳහා කඹ ගෙනැවිත් තිබිණ.

මුල් ගුරුතුමා ඔවුන් කළ යුතු දේ විස්තර කරන විට, අඳුර වැටී තිබිණ. 'ගල, කොළ, කතුර' ක්‍රීඩාව මඟින් ළමයි කණ්ඩායම්වලට බෙදන ලදහ. සෙස්සන් ජය ඝෝෂා නඟද්දී, පළමු නඩය පාසල් දොරටුවෙන් පිටත් වූ හ. අන්තිමට ටොට්ටෝ චං ඇතුළත් නඩයේ වාරය පැමිණියේ ය.

'කුහොන්බුත්සු විහාරයට යන තුරු අවතාර හමු නො වනු ඇත' යි මුල් ගුරුතුමා කියා තිබිණ. එය විශ්වාස නො කළ ළමයි, දොරටුපාල රූප ඇති විහාර දොරටුව හමු වන තුරු හොඳ පරිස්සමින් ඉදිරියට ඇදුණහ. විහාර බිම තද කළුවර විය. දවාලට එය පියකරු තැනක් වුව ද, කුමන මොහොතේ අවතාරයක් මුණ ගැසේ ද යන බිය නිසා, ළමයි නැති ගෙන සිටියහ. ගසක් සුළඟට සෙලැවෙන විට, එකෙක් කෑගසයි, මොළොක් යමක් පෑගුණොත් "මෙන්න, අවතාරේ" යි කියමින් උඩ පනියි. ඇතැම් විට, අත අල්ලා සිටින මිතුරා පවා, අවතාරයක් මෙන් දැනෙයි. සොහොන් බිමට නොයාමට ටොට්ටෝ චං සිත හදාගෙන අවසන් ය. එය අවතාර පදිංචි වී සිටින තැනකි. එබැවින් ආපසු යා යුතු ය. නඩයේ අය ද එවේලෙහි ඒ තීරණය ගත්හ. තමා තනි නො වන බව එයින් පැහැදිලි ය. දෙපාවලට හැකි වේගයෙන් පණ එපා කියා ඔවුනු ආපසු දිව ගියහ!

ඔවුන් පාසලට ආ විට, තමන්ට පෙර පිටත් වූ සියලු ම නඩ ආපසු පැමිණ සිටිනු දැකිය හැකි විය. සොහොන් බිමට යාමට කිසිවකු එඩිතර නුවූ බව පෙනුණි.

හිසෙහි සුදක් ඔතා ගත් ළමයෙක් එවිට ම මහ හඬින් හඬමින් පාසල් දොරටුව හරහා දිව ආවේ ය. ගුරුවරයෙක් ද ඔහු සමඟ ම පැමිණයේ ය. ඒ අවතාරයෙකි! මුළු කාලය තුළ ම සොහොන් බිමෙහි සැඟැවී එබී ගෙන සිටි ඔහු කිසිවකු නො පැමිණෙන විට, මහත් සේ බියට පත් ව, අන්තිමේ දී පිටතට පැමිණ පාරේ අඬමින් සිටිනු එතැනින් සංචාරය කළ ගුරුවරයාට දැක ගත හැකි වී ඇත. ඒ අවතාරය හඬමින් දිව ආවේ ය. ඔහු සමඟ හඬන තවත් ළමයෙක් ද විය. මේ අවතාරය සොහොනෙහි සැඟැවී සිට, කිසිවකු ඒ දෙසට එනු දැක, බිය කිරීමට ඉදිරියට පනිද්දී දෙදෙනා ගේ හිස් එකට හැපී ඇත. තුවාල වූ දෙදෙනා මර බියේ එකට ම පැමිණ ඇත. එය මහත් සේ විනෝද ජනක අවස්ථාවක් විය. ඉමහත් බිය ඉවත් වූ පසු ව, දැනුණු සහනය මත ඔවුහු 'බෙල්ල ගැලැවී යන තුරු' සිනාසුණහ. අවතාර ද ඒ සමඟ



ම සිනාසුණෝ ය. හැඬුවෝ ය. ඒ අතර මිජිටා නමැති, ටොට්ටෝ චං ගේ පන්ති සගයෙක් ද ආපසු පැමිණියේ ය. පත්‍ර කඩදාසියකින් තැනූ අවතාර හිසක් පැළැඳ සිටි ඔහු සොහොන් බිමට කිසිවකු නොපැමිණීම ගැන කෝපයෙන් සිටියේ ය.

"මම මුළු කාලයම එතනට වෙලා බලා සිටියා," ඔහු පැමිණිලි කළේ ය. මදුරුවන් විදීමෙන් ඇති වූ කැළලින් ඔහු ගේ අත් පා වැසී තිබුණි. "මදුරුවෝ අවතාරයක් හපලා" එකෙක් කීවේ ය. සියල්ලෝ සිනාසුණහ.

"කමක් නෑ මම ගිහිල්ලා අනිකුත් අවතාරත් එක්ක ගෙන එන්නම්" පස්වන ශ්‍රේණිය භාර මරුයාමා ගුරුතුමා පිටත් වෙමින් කීවේ ය. මංමුළා වී පහන් කණු යට සිටි අවතාර ද, බිය වී ගෙවලට දිව ගොස් සිටි අවතාර ද ඔහු විසින් අල්ලා ගනු ලැබූ හ. ඔහු සියලු දෙනා ම පාසලට කැටුව ආවේ ය.

එදායින් පසු ව ටොමෝ සිසුවෝ අවතාරවලට බිය නුවූ හ. එපමණක් නො ව අවතාර පවා ඔවුන්ට බිය වූ හ! නැද්ද?

## පෙර පුහුණු හල

ටොට්ටෝ චං සන්සුන් ව ඇවිද ගෙන ගියා ය. විටින් විට ඇය දෙස බලමින් රොකී ද සන්සුන් ලෙස පසුපස ගියේ ය. මෙයින් එක් කරුණක් තේරුම් ගත හැකි ය. මේ ඔවුන් යන්නේ පියා ගේ පෙර පුහුණු හලට එබී බැලීමට ය. ඇය සාමාන්‍යයෙන් ගමන් කරන්නේ මෙසේ නො වේ. ඇය හැකි වේගයෙන් දුවයි. ඇතැම් විට, වැටුණු යමක් සොයමින් එහා මෙහා යයි. නො එසේ නම්, වැටවලින් රිංගා අන් අය ගේ ඉඩම් හරහා යයි.

පියා ගේ පෙර පුහුණු හල පිහිටියේ, නිවසේ සිට මිනිත්තු පහකින් ඇවිද යා හැකි දුරක ය. ඔහු සංගීත කණ්ඩායමක ප්‍රසංග මූලිකයා විය. ඔහු වයලීනය වැයී ය. ප්‍රසංගයක් නැරැඹීමට ඇය කැටුව ගිය වාරයක දී ටොට්ටෝ චං ගේ කුතුහලය දනවන කරුණක් සිදු විය. නැරැඹුවන් අත් පොළසන් දුන් පසු ව, කණ්ඩායමේ නියමු තැන දහදියෙන් නාමින් තම වේදිකාවෙන් බැස අවුත්, වයලීනය වැයූ පියාට අතට අත දුන්නේ ය. එවිට පියා නැගී සිටියේ ය. සෙස්සෝ ද නැගී සිටියෝ ය.

"ඇයි එයා තාත්තාට අතට අත දුන්නේ?" ටොට්ටෝ චං කොඳුරා ඇසුවා ය. "වාදනය හොඳින් කළාට කණ්ඩායමට ස්තුති කරන්න නියමු මහත්මයාට ඕනෑ වුණා. කණ්ඩායමේ නියෝජිතයා වූ තාත්තාට ඒ නිසා අතට අත දුන්නා. එයින් කිව්වේ, කණ්ඩායමට ම ස්තුතියි කියලා" මව පැහැදිලි කළා ය.

පෙර පුහුණු හලට යාමට ටොට්ටෝ චං ආසා කළේ වැඩියෙන් ළමයින් ම සිටි පාසල මෙන් නො ව, හැම වයසක ම අය එහි සිටි නිසා ය. ඔවුහු සියලු ම වර්ගවල භාණ්ඩ වාදනය කළෝ ය. ඒ හැර කණ්ඩායමේ නියමු රොසෙන්ස්ටොක් මහතා කතා කරන ජපන් බස අන් අය සිනා ගැන්වී ය.

ජෝසප් රොසෙන්ස්ටොක් මහතා යුරෝපයේ ඉතා පසිද්ධ සංගීත නියමුවෙකැයි පියා පවසා තිබිණ. නමුත් හිට්ලර් නැමැති අයෙක් එහි භයානක දේ කරමින් සිටියේ ය. රොසෙන්ස්ටොක් මහතා ඔහු ගෙන් බේරීමට ජපානයට පැන අවුත්, සංගීත කටයුතුවල නිරත විය. හිට්ලර් යුදෙව් සංහාරය අරඹා තිබුණු නමුත් ටොට්ටෝ චංට ලෝක තත්ත්වය අවබෝධ කර ගැනීම පහසු නො වී ය. කෙසේ වුව ද තමා රොසෙන්ස්ටොක් මහතා බොහෝ සේ අගය කරන බව පියා ඇයට කියා තිබිණ. හිට්ලර් ගේ කටයුතු නො වන්නට ඒ මහතා කිසි සේත් ජපානයට නො පැමිණෙනු ඇත. එසේ වී නම්, සංගීත රචක කොෂැක් යමාඩා විසින් පිහිටුවන ලද තූර්ය කණ්ඩායමක් කෙටි කාලයක් තුළ මෙවැනි ප්‍රගතියක් නො ලබනු ඇත. යුරෝපයේ පළමු වන ශ්‍රේණියේ තූර්ය කණ්ඩායමකින් අපේක්ෂා කරන මට්ටම රොසෙන්ස්ටොක් මහතා මෙ කණ්ඩායමෙන් ද බලාපොරොත්තු විය. හැම පුහුණු වාරයක් අවසන දී ම ඔහු සංවේගයට පත් වූයේ ඒ නිසා ය.

"මම ඒ තරම් මහන්සි වෙද්දිත් ඔයාලට කිසිම ගණනක් නෑ" ඔහු පවසයි.

රොසෙන්ස්ටොක් විවේක ගන්නා විට, කණ්ඩායමෙ නියමු කාරිය බාර ගන්නා සෙලෝ වාදක හිඩියෝ සායිටෝ කදිමට ජර්මන් බස කතා කිරීමෙහි සමත් ය. ඔහු එබසින් ප්‍රසන්න ලෙස පිළිතුරු දෙයි. "අපට පුළුවන් සියලුම දේ අපි කරනවා. අපේ හැකියාව තාම හොඳ මට්ටමට ඇවිත් නැහැ. අපි හිතා මතා වැරදි නොකරන බවට මම සහතික වෙනවා"



මෙහි දී සිදු වන ඇතැම් දේ ඇයට තේරුම් ගැනීමට අපහසු ය. ඇතැම් විට, රොසෙන්ස්ටොක් මහතා ගේ මුහුණ රතු වී හිසෙන් දුම් දමන්නා සේ පෙනෙයි. ඔහු ජර්මානු බසින් හඬ තළන්නට වෙයි. නිකටට අත තබා කවුළුවෙන් එබී සිටින ටොට්ටෝ චං එබඳු අවස්ථාවල, එයින් මෑත් වී රොකී සමඟ බිමට නැඹුරු වෙයි. නැවත සංගීතය ඇරඹෙන තුරු හුස්ම ගැනීමට පවා බියක් ඇයට ඇති වෙයි.



එහෙත් සාමාන්‍යයෙන් රොසෙන්ස්ටොක් මහතා ඉතා යහපත් අයෙකි. ඔහු ගේ ජපන් බස සිත් කා වදී. ඔවුන් හොඳින් වැයූ විට, "හරි හොඳයි, කුරොයානගී සං", "හරි පුදුමයි" ඔහු කියයි.

ටොට්ටෝ චං කිසි දිනක පුහුණු හල ඇතුළට ගොස් නැත. කවුළුවෙන් එබී සංගීතයට සවන් දීමට ඇය කැමැති ය. සංගීතය අතර මග නැවැත්වූ විට, සමහරු දුමක් ඉරීම සඳහා පිටතට එති. පියාට නිතර ම එහි දී ඇය හසු වෙයි.

"ආ ටොට්ස්කි, ඔයා ඇයි මෙතන?" ඔහු අසයි. රොසෙන්ස්ටොක් මහතා ඇය දුටුවහොත් ඔහු තම සුපුරුදු අඩුතු හඬින් "සුබ උදෑසනක්"යි කියනු ඇත. ඇය දැන් තරමක් ලොකු වුවද, කුඩා අවධියේ කළ පරිදි ම ඇය දැතින් ඔසොවා දෙකොපුල් සිප ගනී. මෙය තමාට ගැහැටක් වුව ද, ඇය රෙසෙන්ස්ටොක් මහතාට කැමැති ය. තුනී රිදී රාමුවක් සහිත උපනෙත් පැළැඳ සිටින තුගු නැහැයක් ඇති ඔහු උස් සිරුරක් ඇත්තෙකි. කලාකරුවකු බව දුටු වන ම හැඟී යන කඩවසම් මුහුණක් ඔහුට තිබුණි.

ටොට්ටෝ චං පෙර පුහුණු හලට ද කැමැති ය. මදක් ගරා වැටී තිබුණ ද එය බටහිර රටාවේ ශාලාවක් විය. සෙන්සෝකු පොකුණ සිසාරා හමා ආ මාරුතය සංගීත රාවය පුහුණු හලෙන් බොහෝ ඈතට ගෙන ගියේ ය. ඇතැම් විට රන් මසුන් විකුණන්නා ගේ "කිංග්යෝ කිංග්යෝ" යන හඬ ඒ සංගීත රාවය සමඟ වෙළී ගියේ ය.




## උණුදිය උල්පතට ගමනක්

ගිම්හාන ඉසුඹුව නිමා විය. උණුදිය උල්පතට යාමේ දිනය උදා විය. එය ටොමෝවේ වැදගත් ම දිනය ලෙස සිසුහු සැලැකූ හ. ටොට්ටෝ චං පවසන බොහෝ දෙයින් විස්මයට පත් නො වන මව, දිනක් පාසලින් ගෙදර පැමිණි තම සිඟිත්තිය "අනෙක් ළමයිනුත් එක්ක මමත් උණු දිය උල්පත් බලන්න යන්නද අම්මේ?" යි විමැසූ විට අන්දුන් කුන්දුන් වූවා ය. වියපත් වැඩිහිටියන් කණ්ඩායම් ලෙස උණුදිය උල්පත් නැරැඹීමට යන බව අසා ඇතත්, පළමු වන ශ්‍රේණියේ ළමයින් එවැනි තැන්වලට



යන බවක් ඇය නො දන්නා ය. මුල් ගුරුතුමා ගේ ලිපිය පරිස්සමින් කියැවූ ඇය, මෙය කදිම අදහසක් බව වටහා ගෙන ඊට කැමැති වූවා ය. ශිෂුවෝකාවේහි ඉසු අඩ දිවයිනේ ටෝයි නම් ස්ථානයේ පිහිටි 'වෙරළ'ස' පාසලට මේ ගමන යොදා ගෙන තිබිණ. මේ අසල මුහුදෙහි උණුදිය උල්පතක් පැවැති අතර, එහි පිහිනීමට හා උණුදිය නෑමට සිසුන්ට වරම් ලැබී තිබිණ මේ ගමනට රෑ දෙකක් ඇතුළු ව දින තුනක් ගත වෙයි. ටොමෝහි සිසුවකු ගේ පියාට එහි ඉසුඹු නිවහනක් ඇති හෙයින් පනස් දෙනකු ගෙන් පමණ යුතු වූ කණ්ඩායමට එහි නවාතැන් ගත හැකි ය. ටොට්ටෝ චං ගේ මව ඇත්තට ම එයට එකඟ වූවා ය.

යොදා ගත් දිනයෙහි ගමනට පෙරාතුව සිසුහු ටොමෝවේ රැස් වූ හ. මුල් ගුරුතුමා ඔවුන් ඇමැතී ය. "දැන් අපි දුම්රියෙනුත් නැවෙනුත් මේ ගමන යනවා. ඔයාලා කිසිම කෙනෙක් මඟ හැරෙන්න බැහැ. තේරුණා නේද? ඔව්, අපි දැන් පිටත් වෙමු"

ඔහු දුන් උපදෙස එපමණි. ජියුගාවෝකාහි දී ටොයෝකෝ දුම්රියට නැඟුණු ඔවුහු පුදුම තරම් විනීත ලෙස හැසුරුණහ. කිසි සිසුවෙක් මැදිරි හරහා දිව නො ගියේ ය. තමන් අසල හිඳ ගෙන සිටියන් සමඟ පමණක් සිහින් හඬින් කතාබහ කළහ. පේළියට නිසි පිළිවෙළින් ගමන් කරන ලෙස හෝ දුම්රියේ දී නිශ්ශබ්ද ව සිටින ලෙස හෝ කෑම ගනිද්දී ඉඳුල් හා කසළ බිමට නො දමන ලෙස හෝ ටොමෝ සිසුන්ට කිසි දාක කිසිවකු කියා නො තිබුණි. තමන්ට වඩා දුර්වල කුඩා අය තල්ලු නො කළ යුතු බවත්, නො නිසි හැසිරීම ලජ්ජා විය යුතු දෙයක් බවත්, රොඩු කුණු දුටුවොත් අහුලා කුණු බඳුනට දැමිය යුතු බවත්, අන් අයට හිරිහැර වන ඔවුන් නො සතුටු වන කිසිවක් නො කළ යුතු බවත් එදිනෙදා පාසල් ජීවිතය තුළින් සිසුනට කා වැදී තිබුණි. මේවා අතර ඉතා ම වැදගත් වූයේ, පන්තියේ සිට විදි සංගීත කණ්ඩායමකට කතා කිරීමෙන් තම පාසල් දිවිය කඩා කප්පල් කර ගත් ටොට්ටෝ චං තුළ ඇති ව තිබූ වෙනසයි. ඇය ටොමෝවේ පන්ති මැදිරියේ තම මේසය වෙත හිඳ ඉගෙනුම් කටයුතු ඇරඹූ දා පටන් ම, තමා ගේ පාඩම් ඉතා මැනැවින් කර ගෙන ගියා ය. දුම්රියේ අන් සිසුන්

සමග හිඳ ගෙන ඉතා විනීත ලෙස හැසිරෙන ටොට්ටෝ චං ඇගේ කලින් පාසලේ ඔනෑ ම ගුරුවරියක විසින් දකිනු ලැබුවහොත් මේ වෙනත් ළමයකු බව එකහෙළා කියනු ඇත.

ඔවුහු, තමන් සිහින මවමින් සිටි අන්දමේ ම නැවකට නුමාසු නම් ස්ථානයේ දී ගොඩ වූ හ. එය විශාල නැවක් නුවූවත් සතුටින් පිනා ගිය ඔවුහු නැවේ හැම අස්සක් මුල්ලක් ම පිරික්සූ හ. අවසන. එය ගමන් ඇරඹූ විට, ජැටියේ සිටි අයට අත් වනා ආචාර කළ හ. පිටත් වූ සැණින් ම වැසි වට බැවින් ඔවුනට ඇතුළට වී සිටින්නට සිදු විය. මුහුද ඉක්මනින් ම රළු විය. ටොට්ටෝ චංට සහ තවත් කිහිප දෙනකුට අසනීප ගතියක් දැනිණ. එවිට එක් වැඩිමහල් සිසුවෙක් නැගිට, මැදට පැමිණ පැද්දීම නවත්වන්නට මෙන් සිට ගත්තේ ය. නැව පැද්දෙන විට, "ඕප්ස්" කියමින් එක් පැත්තකට දිව්වේ ය. යළිත් පැද්දෙන විට, "ඕප්ස්" කියමින් අනෙක් පැත්තට දිව්වේ ය. මුහුදු ගිලන් බව ඇති සිසුනට පවා සිනා නො වී සිටිය නො හැකි විය. නැව ටෝයි වෙත ළඟා වූ විට පවා, ඔවුන්ට සිනා හඬ නවත්වා ගත නො හැකි විය. අරුම පුදුම දෙය වූයේ, ගොඩ බට පසු ව අන් සියල්ලන් සුවපත් ව පියවි බව ලබා තිබියදීත්, "ඕප්ස් සිසුවා" ගිලන් ව සිටීමයි

'ටෝයි ස්පා' කඳුවලින් වට වූ කැලෑබද නිහඬ රමණීය වෙරළ'ස ගම් පියසක් විය. මඳ විවේකයකින් පසු ගුරුවරු ළමයින් මුහුදට කැඳවා ගෙන ගියහ. එය පාසලේ පිහිනුම් තටාකය වැනි නො වී ය. ඒ නිසා සියල්ලෝ නාන ඇඳුමෙන් සැදුණහ!

මුහුදේ උණුදිය උල්පත අමුතු එකකි. උල්පත මුහුදෙන් වෙන් කරන රේඛාවක් නො වී ය. උල්පත ඇතැයි කියන ලද තැන කිමිදුණු විට, උණුදිය ගෙල වටා පැමිණ උණුපැන් නාන විට ලැබෙන සතුට ඇතේ. උල්පත අත් හැර මුහුදට යාමට අවශ්‍ය නම් එයින් අඩි පසළොසක් පමණ ඇතට යාම සෑහෙයි. ඊළඟට ජලය ක්‍රමයෙන් සිසිල් වන්නට වෙයි. ඇතට යත් ම තවත් සිසිල් වෙයි. සාමාන්‍ය මුහුද ම හමු වෙයි. මුහුදෙහි ඇති තරම් පීනා, සීතල දැනුණු විට, උල්පත දෙසට පැමිණ ගෙල දක්වා උණු දියෙහි ගිලී සිටිය හැකි ය. එය නිවසේ දී නානවා වැනි ම ය. නමුත් ඊට වඩා විනෝදජනක ය. සමහරුන් මුහුදේ නාද්දී, උණු



දිය කොටසේ සිටි අය නාන බේසමෙහි මෙන් විවේකයෙන් ගත කළ හ. එහෙත් එකට රොක් වී කතා කරමින් සිටියහ! මේ දෙස බලා සිටින විට, උණුදිය උල්පතේ නාද්දී බාලයන් පවා වැඩිහිටියන් ලෙස හැසිරෙන්නේ ඇයි දැයි කෙනෙකුට සිතෙනු ඇත.

මේ දිනවල වෙරළ පාළු විය. එබැවින් එය මේ පිරිස ගේ පෞද්ගලික වෙරළක් වැනි විය. එයින් පෙර මුහුණ නුදුන් සිදු වීමක් වන මුහුදේ උණුදිය නෑමෙන්, ළමයි මහත් සතුටක් ලදහ. වතුරේ බොහෝ වේලා ගත කර සවස නිවහනට ආ ඔවුන් ගේ ඇඟිලි බොහෝ සේ හිරිවැටී තිබුණි.

ඒ ඒ රැයෙහි පොරෝන තුළ ගුලි වූ පසු ව, ළමයි අවතාර ගැන මාරුවෙන් මාරුවට කතා කළහ. ටොට්ටෝ චං ඇතුළු පළමු වන ශ්‍රේණියේ සිසුහු මහත් සේ බිය පත් ව හඬන්නට වූ හ. එහෙත් ඔවුහු කඳුළු අතරින් ම, "ඊළඟට මොකද, වුණේ? යි ඇසූ හ!

පාසල ඇතුළේ කඳවුරු බැඳීම සහ නොබිය බව පිරික්සුම මෙන් නො ව, ටෝයි ස්පාහි ගත කළ තෙදින නියම ජීවිත අත්දැකීමක් විය. උදාහරණ ලෙස, ආහාරය සඳහා මාළු එළවළු මිලට ගැනීමට ඔවුහු යවන ලදහ. ඔවුන් ආවේ කොහි සිට ද ගියේ කුමන පාසලට ද ආදී අමුත්තන් ගේ බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔවුනට සිදු විය. සමහරු කැලෑවේ මං මුළා වූ හ. සමහරු ආපසු ඒමට අමාරු තරම් ඈතට මුහුදේ පීනා ගියහ. වෙරළේ විසිර පැවැති වීදුරු කැබැලිවලට බොහෝ අයගේ පා තුවාල විය. මෙවැනි දෙයින් සියල්ලෝ කනස්සල්ලට පත් වූහ. එසේ ම, එවන් අවස්ථාවල දී තම තමන්ට හැකි වැඩි ම උදවු ලබා දීමට ද ඔවුන්ට සිදු විය.

එහෙත් බොහෝ විට එය විනෝද ජනක විය. කුරුමිණි වර්ග ගහණ වන ලැහැබක් ද, හිමකිරම මිලට ගත හැකි වෙළඳ හලක් ද අසල ම තිබුණි. විශාල දැව පාරුවක් තනි ව ම තනමින් සිටි මිනිහෙක් ඔවුන්ට වෙරළේ දී හමු විය. එහි මූලික හැඩය සම්පූර්ණ වී තිබුණි. තවත් කොපමණ සාදා ඇත් දැයි පිරික්සීමට දිනපතා උදාසන වෙරළට යාම ඔවුන් ගේ පළමු වන කාරිය විය. කැරලි ගැසුණු ඉතා දිගු යතු සුඹුලක් ඔහු ටොට්ටෝ චංට තෑගි කර තිබුණි.

සිසුන් පෙරළා එන දිනයේ දී "සමරු සේයා රුවක් ගනිමු දැ"යි මුල් ගුරුතුමා විමැසුවේ ය. ඔවුන් සියල්ල සිටින සේයා රුවක් මෙතෙක් ගෙන නො තිබූ බැවින් ළමයි උදම් වූ හ. වැසිකිළියේ සිටි ළමයින් ඒමට ද පෙර ගුරුවරයෙක් සේයාරුව ගැනීමට වහා ම සූදානම් විය. ක්‍රීඩා පාවහන් වරදවා මාරු කොට පැළඳ සිටි ළමයකු එය නිවැරදි කර ගැනීමට වෑයම් කරනු පෙනිණි. ගුරුවරයා අන්තිමේ දී කවුරුත් සූදානම් දැයි අසන විට සමහරු සේයාරුව සඳහා සීරුවෙන් සිටීමෙන් වෙහෙසට පත් ව බිම වැතිර උන්හ. මුළු කාරියට බොහෝ වේලා ගත වී තිබිණ.

සමුද්‍ර පසුබිමෙහි ඇති ව, සිසුන් තම තමන් කැමැති අයුරින් පෙනී සිටි ඒ සේයාරුව හැම අයකු ගේ ම අගනා වස්තුවක් විය. ඒ දෙස බැලූ විට, නැව් ගමන, උණුදිය උල්පත, අවතාර කතා, ඔප්ස් සිසුවා ආදී කොට ඇති අතීත මතක පෙළක් ම යම්කු ගේ මනසට ගලා ආවේ ය. ටොට්ටෝ චංට තමා ගේ පළමු වන ගිම්හාන ඉසුඹුව කිසි දාක අමතක නො වී ය.

ඒ වනාහි ටෝකියෝ ගෙවල් අසල පොකුණුවල පොකිරිස්සන් දැකිය හැකි වූ ද, කුණු කරත්තය විශාල ගොනකු විසින් ඇදගෙන යනු ලැබුවා වූ ද යුගයක් බව කිව යුතු ය.

## රිද්මචලන

ගිම්හාන ඉසුඹුව නිමා වී දෙවන අඩ වසර ඇරඹිණ. ජපානයේ පාසල් වසර ඇරඹෙන්නේ අප්‍රියෙල් මාසයේ දී ය. ගිම්හානය තුළ සිදු වූ නොයෙකුත් එක්රැස් වීම් නිසා තම පන්තියේ ළමයින්ට අමතර ව, ඉහළ පන්තිවල සිසුන් සමඟ ද මිතුරු වීමට ටොට්ටෝ චංට හැකි විය. ඇයට ටොමෝ පාසල් තව තවත් ප්‍රබල විය.

ටොමෝවේ පන්ති සාමාන්‍යයෙන් අන් පාසල්හි පන්තිවලට වඩා වෙනස් විය. සංගීතයට වැඩි ම කාලයක් යොදා ගැනීම මෙහි තිබූ එවැනි වෙනසකි. නොයෙක් අන්දමේ සංගීත පාඩම් එහි තිබුණි. 'රිද්මචලන' ඒ අතර සුවිශේෂ විය. ඒ වනාහි ස්විස්



ජාතික සංගීත රචකයකු හා ගුරුවරයකු වූ එමිලි ජැක්විස් ඩැල්ක්‍රොස් විසින් සැලැසුම් කරන ලද වෙසෙසි අන්දමේ රිද්මික ඉගෙනුමක් විය. ඔහු ගේ කටයුතු 1904 දී පමණ මුල් වරට ප්‍රසිද්ධ විය. ඔහු ගේ ක්‍රමය ඉතා ඉක්මනින් යුරෝපය සහ ඇමෙරිකාවේ පැතිර ගියේ ය. ඒ පිළිබඳ පුහුණු සහ පර්යේෂණ ආයතන ලොව පුරා ඇති විය. ඩැල්ක්‍රෝස් ගේ රිද්මචලන ටොමෝවේ ක්‍රියාත්මක වීම පිළිබඳ කතාව මෙසේ ය.

ටොමෝ පාසල ඇරඹීමට පෙර, අන් රටවල ළමයින්ට ඉගැන්වෙන්නේ කෙසේ දැයි සෙවීමට සොසාකු කොබයාෂි මහතා යුරෝපයට ගියේ ය. ඔහු මූලික පාසල් රැසකට ගොස් අධ්‍යාපන ආයකයන් සමඟ කතාබහ කළේ ය. කදිම සංගීත රචකයකු සහ අධ්‍යාපන වේදිකයකු වූ ඩැල්ක්‍රෝස් පැරිසියේ දී ඔහුට මුණ ගැසුණේ ය. කනින් නො ව සිතින් සංගීතය අසන්නට හා විඳින්නට ළමයින්ට උගන්වන්නේ කෙසේ ද? ජීවයක් නැති නීරස විෂයයක් ලෙස නො ව, චලනය හා සම්බන්ධ රසවත් කාර්යයන් ලෙස සංගීතය විඳගැනීමට සලස්වන්නේ කෙසේ ද? ළමයින් ගේ සංවේදී භාවය පුබුදුවන්නේ කෙසේ ද? යනාදී කරුණු විමසන්නට ඔහු බොහෝ කාලයක් ගත කොට තිබුණි.

ළමයින් පනිනු, පැන පැන යනු, දුව පනිනු හොඳින් නිරීක්ෂා හෙතෙම රිද්මික අභ්‍යාස පිළිබඳ මතය නිර්මාණය කළේ ය. ඔහු එය හැඳින්වූයේ 'රිද්මචලන' යනුවෙනි.

වසරකට වැඩි කලක් පැරිසියේ ඩැල්ක්‍රෝස් පාසලේ ඉගෙනීම ලැබූ කොබයාෂි මහතා, මේ ක්‍රමය මැනවින් හදාළේ ය. බොහෝ ජපන් කලා කරුවන්ට ඩැල්ක්‍රෝස් බලපෑවේ ය. සංගීත රචක කොෂැක් යමාඩා ජපානයේ නවීන නර්තන නිර්මාතෘ බාකු ඉෂි, කබුකි රංගන ශිල්පී ඉචිකාවා සදන්ජි (II), නූතන නාට්‍ය පුරෝගාමී කාවෝරු ඔසන්නායි, නර්තන ශිල්පී මිචියෝ ඉටෝ යන සියලු දෙනා ම ඒ බලපෑමට ලක් වූ හ. එහෙත් මුල් වරට එහි බලපෑම මූලික අධ්‍යාපන අවස්ථාවට උපයෝගී කර ගැනුණේ සොසාකු කොබයාෂි මහතා විසිනි.

රිද්මචලන යනු කුමක් දැයි ඔහු ගෙන් විචාළහොත් ඔහු මෙසේ පිළිතුරු දෙනු ඇත. " එය ශරීරයේ ක්‍රියාව පිරිපහදු කරන ක්‍රීඩාවෙකි. සිරුර පාලනය කරන්නේ කෙසේ ද භාවිත කරන්නේ

තොරෝ දැයි සිතට සිතා දෙන ක්‍රීඩාවෙකි. සිතට සතා රිද්මය අවුහා ගැනීමට අව පලසහා ක්‍රීඩාවෙකි. රිද්මචලන අභ්‍යාස කළ විට ඒ සැතැන්නා ගේ ස්වීයත්මය රිද්මානුකූල වෙයි. රිද්මානුකූල ස්වීයත්මය සිහකරු ය. සවිමත් ය. එය ස්වභාව ධර්මයේ නීතිවලට ගරු කරන්නේ ය. ඒ සමග පැහැදෙසත්තේ ය."

රිද්මය තෙරුම් ගැනීමට සිරුර පුහුණු කිරීමෙන් වොච්මෙට් වර ගේ දවසේ පන්ති ආරම්භ ණ ය. රැස්වීම් ශාලේ කුඩා වේදිකාව මතට වී, මුල් ගුරුතුමා පියානෝව වාදී ය. සිසුහු තමන් සිටි තැන සිට සංගීතයට අනුව ගමන් කිරීම ඇරඹූ හ. අන් අය ගේ ඇඟේ නොහැපී තමන් තැන්පතිව මිතුරු ම අනුරසින් ගමන් කළ හැකි විය. එසේ හැපීම වැළැක්වීම සඳහා ඔවුහු විධානාර ව, එක් අසෙකට ගමන් කළෝ ය. සංගීතයේ තාලය මාතුා දෙක නම්, ගමින් කරමින් ඔ ඒ අනුව, අත් ඉහළ පහළ දැමීය යුතු විය. පාද මෙහෙසෝ ගේ එසැවීම් වුවමනා නො වී ය. ඉඟි නටවන ලෙස ඇඟිලි තුඩුවලින් යාම ද අවශ්‍ය නො වී ය. ඉතා පහසුවෙන් ලිහිල් ලෙස ගමන් කිරීම නාගිණ. අවශ්‍ය වූ ඉතා වැදගත් ම කරුණ වූයේ ස්වාභාවික ගමනයයි. හරි යැයි තමන්ට සිතෙන මිනු ම පිළිවෙලකට ගමන් කළ හැකි විය. රිද්මයේ මාත්‍රාව මාරු වූව හොත් අලුත් මාත්‍රාව අනුව අත් සැලිය යුතු විය. ගමනේ වේගය ද ඒ අනුව අඩු වැඩි නොකට සකස් කර ගත යුතු ය. මාත්‍රා හය දක්වා තාලය අනුව, අත් සැලීම පුහුණු විය යුතු විය. මාත්‍රා හතර සැලෙනා තරම් සරල විය. එවිට, පහත සඳහන් පරිදි අත් සලනු හැකි ය.

"පහළට. වමට, පැත්තට, ඉහළට."

මාත්‍රා තුනට ආ විට එය එතරම් පහසු නැත!

"පහළට. වමට, පෙරට. පැත්තට, ඉහළට."

මාත්‍රා හයේ දී අත් සැලුනේ මෙසේ ය:

"පහළට. වමට, පෙරට. නැවත වමට, පැත්තට, ඉහළට."

මෙසේ මාත්‍රාව වෙනස් වන විට, අනුක්‍රමයෙන් වැඩි වැඩියෙන් දුෂ්කර විය. එය ඔවුන් දුෂ්කර වූයේ. මුල් ගුරුතුමා "මා පියානෝවේ තාලය වෙනස් කළත් වහාම ඔබත් තාලය මාරු කරගත යුතුයි" යි කියා හඬ නගා කියූයේ ය.



ඉතා අඳුරට ඇවිදිසිය සිතමු. සංගීතය මාත්‍රා තුනට මාරු කොට ලද්දේ, නමුත් තුනෙන් රිද්මය අසමින් දෙපෙන් රිද්මය අනුව ඇවිදීමට සිදු වෙයි. එය ඉතා ම දුෂ්කර ය. එහෙත් මුල් ගුරුතුමා ස්වලින් අවුලුණු කලේ. සිත එකඟ කර ගැනීමේ හැකියාව ළමයින් තුළ වැඩෙන්නට ඉඩ ලබා දීමයි.

"දැන් මාරු කරන්න." මුල් ගුරුතුමා හඬ නගා පවසයි. සතකයට පත් ව ළමයින්ට තුනෙන් රිද්මයට මාරු වෙන්නට ඉඩ දෙයි. එහෙත් එසේ හැකි වන්නේ ඔවුන් හොඳ අවදියෙන් සිත යොමු කර සිටියහොත් පමණි. දෙපෙන් රිද්මය නවතා තුනෙන් රිද්මයට මාරු වන ලෙස සිත මගින් පේශිවලට පණිවුඩය දිය යුතු ය. හදිසියේ ම, සංගීතය පහෙන් රිද්මයට මාරු වෙයි. මුල දී ළමුන් ගේ අත් තිහි නැත්තේ ක්‍රියාත්මක නො වන අතර "ගුරුතුමා, නවත්වන්න, නවත්වන්න" යි කියූ හෙයින් හැරෙයි. නමුත් පුහුණුව ලබත් ම, වලනයන් සතුට වළඳින අතර, ළමයි ක්‍රියා ම විය හැකි වෙනස් වීම ගැන සිතමින් වඩාත් සතුටු විනෝදයක් ලබති.

කාලානුක්‍රමයෙන් ඒ ඒ ළමයා තනි තනි ව ක්‍රියාත්මක විය. නමුත් ඇතැම් විට, අත් අල්ලා ගෙන යුගල වශයෙන් ද දෙදෙනා මැනි රිද්මයක් ඇරඹූ හ. ඇතැම් විට ඇස් පියා ගෙන ඇඟ වලනවල නියුතු වූ හ. තාතාම් එක ම දෙය වූයේ කතා කිරීමයි.

ඇතැම් විට ගුරු දෙතුරා එකතුවිත් පැමිණෙන්නට ළමයා කඩුවලින් එබී බලති. එය බලන්නට කදිම ය. ඒ ඒ ළමයා සංගීතය අනුව යමින් තාලයට පහසුවෙන් අත් පා සලමින් සතුටින් පනිමින් සිටියි!

මෙසේ රිද්මචලනයෙහි පළමු අරමුණ වූයේ, රිද්මය ගැන සංවේදී වීමට ගත සිත පුහුණු කිරීමයි. දෙවනුව එමගින් කල්පනාව සහ පේශි අතර එකමුතුවක් ඇති කිරීමයි. තෙවනු ව, පරිකල්පනය අවදි කොට, නිර්මාණ හැකියාව නැංවීමයි.

රොකෙමි යනු කොමැටිත හැඩය ඇති පැරණි සංස්කෘතියකි. මුල් ගුරුතුමා කොහෙටු දෙකක් ඇති සම්ප්‍රදායානුකූල සලකුණක් ගමේ පාසල සඳහා යොදා ගෙන තිබුණි. සුදු, කළු, කොහෙ දෙකක් එකුනේ කලක මැද වී තැනුණු වස්ත්‍රයක් එම සලකුණට අයත් විය. ළමයින් සඳහා මතු ගේ අරමුණ මෙම් සංකේතයක් විය. ශරීර සැලසුමක් ඇති ව ගත සිත සමාන ලෙස වර්ධනය සඳහා ඉඩ සැලැසීම ඒ අරමුණ විය.

මුල් ගුරුතුමා පාසල් විෂය මාලාවට රිද්මචලන එක් කර තිබුණේ අනවශ්‍ය වැඩිහිටි බලපෑමෙන් තොර ව, ස්වාභාවික ලෙස සිසුන් ගේ ස්වීයත්වය වැඩෙන්නට එය ඵලදායක ලෙස උදවු වනු ඇත යන බලවත් විශ්වාසයෙනි.

ලිඛිත වචනය මත රැඳී පවතින සමකාලීන අධ්‍යාපනය ස්වභාව ධර්මයට සංවේදී වීම වළක්වතියි ද දෙවියන් ගේ සුමියුරු සුමුදු හඬ සවන් වැකීමෙන් උපදනා පැණැස වසතියි ද ඒ අනුව සංජානනය හා ප්‍රතිභාව හානියට පත් කරතියි ද මුල් ගුරුතුමා සංවේගයට පත් විය.

බෂෝ කිවිඳු මෙසේ ලිවී ය:

"අසවු මැඬියෙක්
පොරණ පොකුණෙක
නිසල බවට
පැන්නේය."





මැඬියකු පොකුණට පැනීම අන් බොහෝ අය ද දැක ඇති සුලබ සිදු වීමෙකි. මේ කවියා එය දුටු අපූරුව බලන්න. උතුරන සේනලයකින් හුමාලය නිකුත් වනු, ඉදුණු ඇපල් පල බිම වැටෙනු ලොවේ බොහෝ අප දැක ඇතත්, ඒ කිසිවෙක් වොට් හා නිව්ටන් දුටු පරිදි නො දුටුවෝ ය.

"ඇස් ඇතිවත් ලස්සණ නො පෙනෙයි. සවන් ඇතිවත් සංගීතය නො ඇසෙයි. සිත් ඇතිවත් සත්‍යය නො වැටැහෙයි. හදවත් ඇතිවත් ඒ නො සැලෙයි. නො දැවෙයි. අප බිය විය යුත්තේ මේවාටය." මුල් ගුරුතුමා කීවේ ය.

ඉසදෝරා ඩන්කන් සේ ම, ටොට්ටෝ චං ද නිරාවරණ පා තබමින් දිව්වා ය. පැන්නා ය. ඇය ඉමහත් ප්‍රමෝදයට පත් වූ අතර, මෙය පාසල් ඉගෙනීමේ ම කොටසක් දැයි ඇයට සිතා ගැනීමට පවා නො හැකි විය.

## "මට වුවමනා එක ම දෙය"

ඒ ටොට්ටෝ චං විහාර බිමේ පොළකට ගිය පළමු වතාව ය. ඇගේ කලින් පාසල අසල සෙන්සෝකු පොකුණ මැද කුඩා දිවයිනක් තිබුණි. සුන්දරත්වයට සහ සංගීතයට අරක්ගත් බෙන්තන් දෙවිඳුවට කැප වූ දෙවොලක් එහි පිහිටියේ ය. වාර්ෂික පොළ පැවැති දින රැයෙහි අඳුරු පහන් වූ මඟ දිගට මව හා පියා සමඟ ඇය ගමන් කළා ය. ඔවුන් පොළට ළඟා වෙත් ම, දීප්ත පහනින් හාත් පස දිදුලන්නට විය. ටොට්ටෝ චං ඒ ඒ වෙළෙඳ කුටිවලට එබී බැලුවා ය. හැම තැනින් ම නොයෙකුත් අමුතු හඬ නිකුත් විය. කෙදිරිලි මෙන් ම, ගිගුරුම් හා පිපුරුම් ද ඇසිණ. සිත පොලඹවන නොයෙකුත් සුවඳින් ඒවා පිරී තිබිණ. සියල්ල අලුත් ය. අමුතු ය.

'පෙපර්මින්ට්' උරා බිය හැකි සෙල්ලම් දුම් පයිප්ප තැනෙක විය. බළලුන්, බල්ලන්, ආදී සුරතලුන් ගේ රූපවලින් ඒවා සරසා තිබිණ. 'ලොලි පොප්' සහ සූකිරි ද පැළ බඩ, උණ්ඩ සඳහා යොදා වෙඩි හඬ නැංවිය හැකි බට තුවක්කු ද, විය.

[illegible] විදුලි කොටමින් කළු පිළිමින් සිටියේ ය. [illegible] සඳහා උළෙන තුළු වර්ෂාව විදුලියෙන් [illegible] ද විය. [illegible] ආලෝකයක් කරන රශ්මිය, [illegible] වීම [illegible] නිල් වැසි [illegible] ද විය. [illegible] ඇගේ ඇස් [illegible] හැකි සිට ගත්තා ය.

"[illegible]" [illegible] කුකුළු පැටවුන් [illegible] දුන ඇය [illegible] ය. මව හා පියා [illegible], "[illegible] එකෙක් විතර, අනේ, මට එකෙක් අරන් දෙන්න" යි කීවා ය.

[illegible] ටොට්ටෝ චං දෙසට හැරී, [illegible] ඇය දෙස බැලූ හ.

"[illegible]" ඇයට සිනිඳු. [illegible] ජීවිත කාලය තුළ ඇය මීට පෙර [illegible] අසල [illegible] ගත්තා ය.

"අනේ" [illegible] ඇය පැද්දා ය. [illegible] ඇය [illegible] ඇද [illegible] යාමට [illegible]

"[illegible] අරගෙන දෙනවා කියලා [illegible]" ඇය කීවා ය.

"[illegible] කුකුළු පැටවු [illegible]" [illegible] ව කීවා ය.

"ඒ මොකද?" ටොට්ටෝ චං හඬමින් විචාළා ය. පියා [illegible] ඇය ඇද [illegible] කීවේ ය. "[illegible] උන් [illegible] ටොට්ටෝ, උන් [illegible]. වැඩි වෙලාවක් ජීවත් වෙන්නේ නෑ. [illegible] අපාවී. ඒක නිසයි, එකෙක් අරන් නො දෙන්නේ."

[illegible] කුකුළු පැටියකු ලබා ගැනීමට ඇය [illegible] සිටියා ය. [illegible] ඇගේ කතාව නොවැටුණි.

"[illegible] මිලට ගන්නවා." ටොට්ටෝ චං [illegible] යාමට [illegible] [illegible] කුකුළු පැටවුන් [illegible] සිත්



[illegible] සිටියා ය. [illegible] හඬමින් [illegible] ඇය [illegible] ඇගේ [illegible] කුකුළු පැටවා [illegible] කළා ය.

"අනේ, අනේ මට එකෙක් අරන් දෙන්න."

"[illegible] අවසන් සිද්ද [illegible] කියා, අපට ඒක කරන්න බෑ."

ටොට්ටෝ චං [illegible] වැටුණා ය. [illegible] ගලා බැස්සේ ය. [illegible] සිටියා. [illegible] පසු ව, ටොට්ටෝ චං [illegible] වදනින් [illegible] "මගේ ජීවිත කාලයටම, [illegible] දෙයක් ඉල්ලන්නේ නෑ. අනේ මට එක කුකුළු පැටියෙක් අරගෙන දෙන්න."

අන්තිමේ දී මව හා පියා දෙදෙනාම [illegible] ටොට්ටෝ චං [illegible] කුකුළු පැටවුන් දෙදෙනකු ඇති ව නිවසට පිය [illegible] ය.

පසු දින [illegible] කුකුළු පැටියන් [illegible] ලැබීම සඳහා විදුලි [illegible] ලැලි පෙට්ටියක් [illegible] කරන ලදී. ටොට්ටෝ චං මුළු දවස පුරා උන් දෙස බලා සිටියා ය. [illegible] පැටියෝ [illegible] ප්‍රාණවත් ව සිටියහ. [illegible] දිනයේ දී, එකකු [illegible] නැවැත්තිණි. පස්වන දින [illegible] ද එසේ විය. ඇය [illegible] උන් [illegible] ය. [illegible] එත් වරක්වත් උන් [illegible] කළා ය. [illegible] ඇය බලා සිටියා ය. බලා සිටියා ය. උන් [illegible] ඇය [illegible] ව [illegible] ය. [illegible] දෙදෙනා [illegible] කළා ය. [illegible] කුඩා [illegible] ය. උන් සිටි පෙට්ටිය [illegible] විශාල ව [illegible] දී [illegible] දින උන් [illegible] සිහි කළා ය. [illegible] ඇය [illegible] ය.

ඇගේ ජීවිත කාලය තුළ සිහි [illegible] දෙයක් ඇයට [illegible] නො වී ය. [illegible] දී [illegible] අතිශ [illegible] පිළිබඳ ඇගේ [illegible] විය.

## ඔවුන් ගේ කඩමාලු

ළමයින්ට ඇති නරක ම ඇඳුම් අන්දවා ඔවුන් පාසලට එවන්නැයි මුල් ගුරුතුමා නිතර ම කීවේ ය. ඒ ඇඳුම් ඇන්ද විට මඩ ගෑවීම ඉරී යාම ප්‍රශ්නයක් නො වේ. ඇඳුම් කිලිටි වීම ගැන හෝ ඉරී යාම ගැන බියක් ලජ්ජාවක් ඇති නො වන බැවින් ක්‍රීඩාවලින් ඉවත් වීමට අවශ්‍ය නො වේ. නාවික ඇඳුම් වැනි නිල ඇඳුම් අඳින දැරියෝ ද, උස් කරපටි සහිත උඩු කබා අඳින දරුවෝ ද ටොමෝව අසල පාසල්වලට පැමිණියහ. ටොමෝවේ ළමයි තම සාමාන්‍ය ඇඳුමෙන් පැමිණියහ. ඇඳුම ගැන කිසිවක් නොසිතා, සිත් වූ පරිදි කෙළි සෙල්ලම් කිරීමට ගුරුවරුන් ගෙන් ඔවුන්ට අවසර තිබිණ. අද මෙන් එකල කල් පවත්නා රෙද්දෙන් කළ කලිසම් නො තිබුණු බැවින්, සියලු දරුවන් ගේ කලිසම්වල අණ්ඩ දමා තිබුණි. දැරියන් ගේ සාය ගවුම් ආදිය එකල පැවැති වැඩි ම සවිමත් රෙද්දෙන් මසා තිබිණ.

ටොට්ටෝ චං ගේ ප්‍රියතම විනෝදාංශය වූයේ පිටස්තරයන් ගේ වතුවලට සහ හිස් ඉඩම්වලට වැටවලින් රිංගා යාමයි. ඇඳුම ගැන කරදර නො වීම ඒ නිසා ඇයට හොඳින් ම ගැළැපිණ. එකල කටු කම්බි වැටවල් සුලබ විය. එයින් සමහරක බිම සිට ම කම්බි තිබිණ. එබැවින් ඒවායින් බල්ලකු මෙන් රිංගා යා යුතු විය. කෙතරම් පරිස්සම් වුවත් ඇඳුම් කම්බිවලට ඉරී යාම ඇයට වළක්වා ගත නො හැකි විය. ඇය පරණ මස්ලින් ඇඳුමකින් සිටි විටෙක, එය උඩ සිට පහළට මුළුමනින් ම කීතු වී ගියේ ය. ඇඳුම පරණ වුවත් මව ඊට බොහෝ සේ ආදරය කළ නිසා, කුමක් කියම් දැයි ටොට්ටෝ චං විපිළිසර වූවා ය. කටු කම්බියට ඉරිණැයි කීමට ඇයට සිත් නුදුනි. ඉරී යාම තමාට වළක්වා ගත නො හැකි වූ බවට බොරුවක් ගෙතුව මැනැවැයි ඇයට සිතිණි. අන්තිමේ දී ඇය මෙබඳු කතාවක් කීවා ය.

"මම පාර දිගේ ගෙදර එද්දී මං අඳුනන්නේ නැති ළමයි කට්ටියක් මගේ පිටට පිහිවලින් දමා ගැහුවා. ඒකට මගේ ඇඳුම ඉරුණා." මෙසේ කියා ගෙන යද්දී ම, මව ඇසිය හැකි ප්‍රශ්නවලට උත්තර දෙන්නේ කෙසේ දැයි ඈ සිතුවා ය.

මවට ස්තුති වේවා! ඇය පැවැසුවේ මෙපමණෙකි: "ඒක හරි භයානකයි."



ටොට්ටෝ චංට සහනයක් දැනිණ. මෙබඳු අවස්ථාවක දී තමා ගේ ප්‍රියතම ඇඳුම වුවත් ඉරී යාම වළක්වා ගත නො හැකි බව මවට පැහැදිලි විය.

පිහි පිළිබඳ ඇගේ කතා මව විශ්වාස නො කළා ය. පිහි විසි කළා නම් ඇඳුම ඉරී නො නවතියි. ඇයටත් තුවාල විය යුතු ය. ටොට්ටෝ චං ඒ සිද්ධියෙන් බියපත් වූ බවක් ද නො පෙනිණ. එය දුව ගේ ගෙතුමක් බව ඇයට පැහැදිලි ය. කෙසේ වුව ද සමාවට කරුණක් සොයා ගැනීමට ඇය මෙතරම් දුර යාම අමුත්තකි. එහෙත් ඇඳුම ගැන ඇය ඉතා කනගාටු වන බව මවට පැහැදිලි වූයෙන් ඇයට සතුටක් ඇති විය. එහෙත් ටොට්ටෝ චං ගෙන් පැහැදිලි කර ගත යුතු කරුණක් කලෙක සිට මවට තිබිණ.

"පිහිවලිනුත් තවත් ඒ වගේ දේවලිනුත් ඔයාගේ ඇඳුම ඉරෙන එක මට තේරුම් ගන්න පුළුවන්. ඒත් හැමදාම ඔයාගෙ යට කලිසම් ඉරෙන්නෙ මොනවාටද?"

ටොට්ටෝ චං ගේ රේන්ද වාටි සහිත යට කලිසම් දිනපතා ම පසු පැත්තෙන් ඉරෙන්නේ ඇයි ද යන්න මවට ගැටලුවෙකි. ලිස්සා යාමෙන්, වැටීමෙන් ඒවායේ මඩ ගෑවීම, ඒවා තුනී වීම ප්‍රශ්නයක් නො වේ. ඒවා කීතු කීතුවලට ඉරී යන්නේ ඇයි?

ප්‍රශ්නය ගැන මඳක් සිතා බලා ටොට්ටෝ චං පිළිතුරු දුන්නා ය. "හොඳයි, බලන්න, වැටක් යටින් හාරලා ඒකෙන් රිංගන කොට, සාය අල්ලා ගෙන ම ඉන්න බැහැ. 'මම ඇතුළට රිංගන්න දැ'යි අවසර ඉල්ලන්න වෙනවා. ඊළඟ වැටෙන් රිංගන කොට 'ගිහින් එන්නම්' කියා සමු ගන්න සිද්ද වෙනවා. මේ නිසා යට කලිසම් වගේ ම අනිත් ඇඳුමුත් ඉරෙන්න පුළුවන්."

මවට අන්දුන් කුන්දුන් ය, පුදුම ය, කිසිවක් නො වැටහෙයි. "මේක විහිළුවක්ද?" ඇය අසයි.

විස්මයට පත් ටොට්ටෝ චං පිළිතුරු දෙයි. "ඇයි අම්මේ, ඔයා කරල බලන්නේ නැත්තේ? ඒක හරිම විනෝදයි නේ? හැබැයි ඔයාගෙ යට කලිසමත් ඉරෙන්න පුළුවන්."

ටොට්ටෝ චං එතරම් ආසා කළ සෙල්ලම මෙසේ කෙරී ගෙන ගියේ ය. කටු කම්බිවලින් වට වූ ඉඩමක් මේ සඳහා සොයා ගත යුතු ය. "සමාවෙන්න, මම ඇතුළට එන්න දැ?"යි අසා සවි වී ඇති කම්බි ඔසවා, වළක් හාරා එතුළින් රිංගා යා යුතු ය. ඇතුළට

ගිය පසු ව, යාබද වැටේ ද කම්බිය ඔසවා වළක් හාරා, "ගිහින් එන්නම්" කියා එයින් රිංගිය යුතු ය. ටොට්ටෝ චං ගේ ඇඳුම් ඉරෙන්නේ කෙසේ දැයි මවට විකෙන් විට පැහැදිලි විය. මෙය නැවත නැවතත් සිදු විය හැකි ය. එසේ ම සිදු විය. ඇය ගේ යට ඇඳුම් නැවත නැවතත් ඉරී ගියේ ය.

වැඩිහිටියකුට සතුටක් නො එළවන, එවැන්නකු වෙහෙසට පත් කරන මෙබඳු ක්‍රියාවකින් ළමයකුට මහත් සතුටක් ලද හැකි වෙයි. ඇස් කන්වල ඇඟිලි තුඩුවල දූහුවිලි මඩ වකාගෙන පැමිණෙන ටොට්ටෝ චං දකින මවට ඇතැම් විට ඇය ගැන පුංචි ඉරිසියාවක් ඇති වෙයි. ඇය මුල් ගුරුතුමාට සිතින් පින් දෙයි. ළමයින්ට සිතේ හැටියට අපිරිසිදු වීමට ඉඩ ලැබෙන ඇඳුම් ලබා දිය යුතුය යන එතුමා ගේ උපදෙස ඔහු හොඳින් ම ළමයින් හඳුනා ගෙන සිටි බවට සාක්ෂියෙකි.

## තකහෂි

දිනක් උදෑසන, සියල්ලන් පාසල් පිටියේ දිවීමේ යෙදී සිටිය දී, මුල් ගුරුතුමා මෙසේ කීවේ ය. "මේ ඔයාලගෙ අලුත් යාළුවෙක් එයාගෙ නම තකහෂි. එයා පළමු ශ්‍රේණියේ මැදිරියට එකතු වේවි."

ටොට්ටෝ චං ඇතුළු ළමයි තකහෂි දෙස බැලූ හ. ඔහු හිස්වැසුම උනා, ඉදිරියට නැමී ලජ්ජාශීලි ව, කතා කළේ ය. "කොහොමද සැප සනීප?"

ටොට්ටෝ චං සහ ඇගේ පන්ති සගයෝ පාසලේ පළමු වන ශ්‍රේණියේ සිටින සිඟිත්තෝ ය. තකහෂි පිරිමි ළමයකු වුව ද, ඔවුන්ටත් වඩා කුඩා ය. ඔහු ගේ අත් පා කෙටි ය. නමුත් උරහිස් පළල් ය. ඔහු අසරණ බැල්මෙන් බලා සිටියි.

"අපි එයා එක්ක කතා කරමු" ටොට්ටෝ චං, මියෝ චංට සහ සක්කෝ චංට කීවා ය. ඔවුන් ළඟට යන විට ඔහු සුහද ලෙස සිනාසුණේ ය. ඔවුහු ද සිනාසුණහ. විශාල වටකුරු ඇස් ඇති ව, ඔහු යමක් කීමට සූදානම් බවක් පෙන්වී ය.



"කෝච්චි පන්ති කාමරය බලන්න ඔයා කැමැතිද?" ටොට්ටෝ චං ඇසුවා ය. හිස්වැස්ම පැළඳ ගනිමින් තකහෂි පිළිතුරු දුන්නේ ය. "හ්ම්"

පන්ති කාමරය පෙන්වීමට ඇය කලබලයෙන් දිව ගොස් මැදිරියට නැංගා ය. දොරටුවේ සිට, "ඉක්මනට එන්නැ"යි කීවා ය.

තකහෂි වේගයෙන් එන බව පෙනුණත් සිටියේ බොහෝ ඈත ය. දිවීමට වෑයම් කරමින්, "මං එනවා"යි කීවේ ය. පෝලියෝ ඇති යසුවාකි චං මෙන්, පා අද්දවමින් ගමන් නො කළත් මැදිරියට ඒමට ඔහුට වැනි ම කාලයක් තකහෂිට ද ගත වන බව ටොට්ටෝ චංට පෙනිණ. ඔහු පැමිණෙන තුරු ඇය නිහඬ ව බලා සිටියා ය. තකහෂි ඔහුට හැකි වැඩි ම වේගයෙන් එමින් සිටියේ ය. ඒ නිසා ඉක්මනින් එන්නට කීමේ කිසි ම තේරුමක් නැත. ඔහු ගේ පා කෙටි ය. බකල ය. ඔහු ගේ වැඩීම අවසන් ව තිබුණු බව ගුරුවරුත් වැඩිහිටියෝත් දැන සිටියහ. ටොට්ටෝචං තමා දෙස බලා සිටිනු දුටු ඔහු අත් පද්දමින් ඉක්මනින් ඒමට වෑයම් කළේ ය. දොරටුවට පැමිණි ඔහු, "ඔයා හරි වේගයෙන් දුවනවා. මං එන්නේ ඔසාකා ඉඳලා"යි කීවේ ය.

"ඔසාකා!" ටොට්ටෝ චං සතුටින් කෑගැවා ය. ඔසාකා ඇය නුදුටු ඇගේ සිහින නුවරක් විය. සරසවි සිසුවකු වූ ඇය ගේ මාමා, එනම් මව ගේ මල්ලි ඇගේ නිවසට ආ විට ඇගේ හිස දැතින් අල්ලා ඔසවා, "මං ඔයාට ඔසාකා පෙන්වනවා. ආ! ඔසාකා. ඔයා දැක්කාද?" යනුවෙන් අසයි.

වැඩිහිටියන් නොදරුවන් සමඟ කරන සෙල්ලමකි, ඒ. එය නො දත් ටොට්ටෝ චං ඔහු ගේ වචන විශ්වාස කළා ය. මේ සෙල්ලමෙන්, ඇය ගේ මුහුණේ සම වේදනාකාරී ලෙස ඇදුණේ ය. ඇස්වල හැඩය ද වෙනස් වෙමින් ඇදී ගියේ ය. කන් රිදුණේ ය. නමුත් ඔසාකා දැකීම සඳහා ඈත දෙස නො ඉවැසිල්ලෙන් බැලුවා ය. කිසි දාක එය දැකීමට නම් ඇයට නො හැකි විය. නමුත් කවර දා හෝ එය දැකිය හැකි වෙතැයි ඇය විශ්වාස කළා ය. එබැවින් මාමා පැමිණි ඕනෑ ම විටෙක දී "මට ඔසාකා පෙන්වනවාද?"යි ඇය විමසයි. මෙසේ ඔසාකා ඇය ගේ සිහින නුවර වී තිබිණි. අගෙයි! තකහෂි පැමිණ ඇත්තේ එහි සිට ය!

"මට ඔසාකා ගැන විස්තර කියන්න." ඇය කීවා ය.

"ඔසාකා ගැනද?" ඔහු සතුටින් සිනහ සෙමින් ඇසී ය. ඔහු ගේ හඬ පැහැදිලි ය. වැඩිහිටියකු ගේ වැනි ය. ඒ මොහොතේ ම වැඩ පටන් ගැනීමේ සීනුව නාද විය.

"කෙතරම් කතාගාවු දායකද?" ඇයට සිතිණ. බාගයට වැඩී තිබුණු කුඩා සිරුර පද්දමින් ගාටා ගොස් ඔහු ඉදිරි පේළියේ සිට ගත්තේ ය. ටොට්ටෝ චං ඔහු ළඟින් හිඳ ගත්තා ය. ඔහු අසලින් හිඳ ගැනීමට ඉඩ ලැබීම ගැන ඇය සතුටු වූවා ය. ඔහු අත්හැර යාමට ඇයට සිත නුදුනි. මෙසේ තකහෂි ඇගේ මිතුරකු බවට පත් විය.

## "පනින්නට පෙර සිතා බලන්න"

පාසල ඇරී ටොට්ටෝ චං ගෙදර අසලට ම පැමිණ තිබුණි. පාර අයිනේ සිත පොලඹවන යමක් තිබුණි. ඒ විශාල වැලි ගොඩකි. මෙතැනට වැලි කොයින් ද? මුහුද කොපමණ දුර ද? ඇයට මේ පෙනෙන්නේ සිහිනයක් ද? විස්මිත සතුටක් ඇයට දැනිණ. සූදානම් පිම්මකින් පසු, මහ පිම්මකින් එහි මුදුනට ම පැන්නා ය. පුදුමයකි. ඒ වැලි ගොඩක් නො වී ය. ඇතුළත වූයේ වැලි නො ව, බිත්ති කපරාරුවක් සඳහා අනා සකස් කරන ලද මැටි ගොඩකි! ඇය එහි ගිලී ගොස්, ඇලෙන මැට්ටෙහි පපුව දක්වා ම එරුණා ය. පොත් මල්ල හා පාවහන් මල්ල ද සමග ම, පිළිමයක් සේ එරී ගියා ය. පිටතට නැගී සිටීමට වෑයම් කරත් කරත් ම, පාද තව තවත් ලිස්සා ගියේ ය. පාවලින් පාවහන් ගිලිහී ගිය අතර, කිමිද යාම වළක්වා ගැනීම සඳහා බොහෝ පරිස්සම් වීමට සිදු වී තිබුණි. නිසල ව සිටීම හැර ඇයට කළ හැකි කිසිවක් නො වී ය. පාවහන් බෑගය අල්ලා ගත් වමත බදාමයෙහි ගිලී තිබිය දී, ඇය සිටි වන ම සිටියා ය. නාඳුනන කාන්තාවන් දෙතුන් දෙනකු ඒ අසලින් යද්දී, "මට සමාවෙන්න"යි ඇය සිහින් හඬින් තෙපලා ය. ඇය සෙල්ලමෙහි යෙදී සිටිතියි සිතූ ඔවුහු සිනා සී යන්නට ගියහ.

අඳුරු වැටී ගෙන එද්දී, දුව සොයමින් ආ මව ටොට්ටෝ චං ගේ හිස එම ගොඩැල්ලෙහි මතු වී තිබෙනු දැක, විස්මයට පත්



වූවා ය. ලීයක් සොයා ගෙන එහි එක් කොනක් ටොට්ටෝ චංට අල්ලා ගැනීමට දිගු කොට, අනෙක් කොනෙන් ඇදීමෙන් ඇය ඉවතට ගත හැකි විය. මුල දී දුව ගේ අතින් ඇද ඉවතට ගැනීමට ඇය වෑයම් කළ නමුත්, පා බදාමයෙහි එරී යාම නිසා එය කළ නො හැකි විය. ටොට්ටෝ චං බිත්තියක් මෙන් දුඹුරු බදාමයෙන් වැසී සිටියා ය.

"මම හිතන්නේ මීට ඉස්සර වෙලාත් මේක කියලා තියෙනවා කියලා." මව කීවා ය. "අමුතු දෙයක් දැක්කාම, කෙළින්ම ඒක උඩට පනින්න එපා. පනින්න පෙර සිතා බලන්න."

මෙහි දී මව සඳහන් කළ පෙර වාරය පාසලේ කෑම පැයේ දී සිදු වූවකි. එදා රැස්වීම හල පසුපස අඩිපාරේ සක්මන් කළ ටොට්ටෝ චං ඒ පාර මැද පුවත්පතක් එළා තිබෙනු දුටුවා ය. එය මැදට පැන්නොත් මැනැවැයි ඇයට සිතිණ. මදක් උඩ පැන එල්ලය ගෙන වේගයෙන් දිව අවුත් ඇය පුවත්පත මැදට පැන්නා ය.

මුරකරු මේ පුවත්පත තබා තිබුණේ කලින් ද සඳහන් කළ මලවළෙහි පියන වෙනුවට තාවකාලික වැස්මක් ලෙස ය. වෙනත් කාරියක් සඳහා බැහැර වීමට සිදු වූ බැවින්, සිමෙන්ති පියන ඉවත් කිරීමෙන් දුගඳ අවට පැතිරීම වැළැක්වීම සඳහා පත්තර වැස්ම සකසා තිබුණි. ටොට්ටෝ චං 'ප්ලොප්' යන අනුකරණයෙන් මලවළට වැටුණා ය. එය ඉතා ම බිහිසුණු විය. එහෙත් වාසනාවට සිඟිති දැරිය සෝදා පිරිසිදු කිරීමට ඔවුන්ට හැකි විය. මව සඳහන් කළ පෙර වාරය මෙයයි.

"නැහැ, මීට පස්සේ මම කිසිම දෙයක් උඩට පනින්නේ නැහැ". ටොට්ටෝ චං නිසල ව කීවා ය. මවට සහනයක් දැනිණ. ඊළඟට ඇය කී දෙයින් සහනය කල් යා හැකි බව පෙනුණි.

"නැහැ, කවදාවත් මීට පස්සේ පත්තරයක් උඩට හරි වැලි ගොඩක් උඩට හරි පනින්නේ නැහැ." ඇය වෙනත් දෙයක් උඩට පනින්නට ඉඩ ඇති බව මවට පැහැදිලි විය.

මෙකල දවල කෙටි වෙමින් තිබුණි. ඔවුන් නිවසට පැමිණෙන විට අඳුර වැටී තිබුණේ ය.

## "ඉතින්, ඊට පස්සේ.... අනේ....."

ටොමෝවෙහි අහර කිස කොහොමටත් විනෝද ජනක ය. අන්තිමේ දී තවත් නවාංගයක් ඊට එක් කරන ලදි.

මුහුදෙන් යමකුත් කන්දෙන් යමකුත් තිබේ දැයි බැලීමට මුල් ගුරුතුමා සිසුන් පනස් දෙනා ගේ කෑම පත්වලට ඇනුත් එබී බලයි. කාගේ හෝ පතක යමක් අඩු නම් සැපැයීමට ඔහු ගේ බිරිඳ ද ඇතෙහි බඳුන් දෙකක් දරා, ඇනුත් පැමිණෙයි. එයින් පසු ව, "හපන්න, හපන්න, හොඳ හැටි හපන්න, කන විට සියල්ල හපන්න"යි අඳත් ගයනු ලැබේ. ඊළඟට "ඉතදකිමසු"යි අඳත් කියනු ලැබේ. එක් අයෙක් සුළු කතාවක් ද පවත්වයි.

"අපි කවුරුත් හොඳින් කතා කරන්න පුරුදු වෙන්න ඕනෑ," දිනක් මුල් ගුරුතුමා සිසුන් අමතා කීවේ ය. "මොනවාද, ඒ ගැන ඔය ළමයි සිතන්නේ? අදින් පසු අපි කෑම ගන්න අතරතුර දිනපතා එක් එක්කෙනා මේ කවය මැදට ඇවිත් හිට ගෙන මොනවා හරි කතා කරන්න ඕනෑ, හොඳද?"

තමන්ට එතරම් හොඳින් කතාවක් කළ නො හැකි යැයි සිතූ අය පවා අනෙකුත් අයට සවන් දීමට ආසා කළෝ ය. තමන් දන්නා දේ අන් අයට පැවැසීම ඉතා වටනේ යැයි සමහරු සිතූ හ. කුමක් ගැන කතා කරන්න දැයි නොදත් ටොට්ටෝ චං ඒ ගැන වෑයමක් කිරීමට කැමැති වූවා ය. ළමයි වැඩි දෙනා ඒ අදහසට කැමැති වූ අතර, පසු දා ම කතා ඇරැඹීමට තීරණය කළෝ ය.





ආහාර ගන්නා විට, කතා නො කරන්න යැයි ජපානයේ ළමයි හික්මවනු ලබති. මුල් ගුරුතුමා විදේශ රටවල තමා ගේ අත්දැකීම අනුව, කැමැති තරම් දිගු වේලාවක් ආහාර ගනිමින් කතාබහ කිරීමට දිරි දුන්නේ ය.

එසේ ම අන් අය ඉදිරියේ නැඟී සිටින්නේ කෙසේ ද, තම අදහස් බාධාවකින් තොර ව, නිදහස් ව පැහැදිලි ලෙස ප්‍රකාශ කරන්නේ කෙසේ ද යන්න හැම කෙනෙකු ම දැන ගත යුතු යැයි ඔහු කල්පනා කළේ ය.

යෝජනාවට ළමයින් එකඟ වූ පසු ව, ඔහු මෙසේ කීවේ ය. ටොට්ටෝ චං හොඳින් අසා සිටියා ය. "හොඳ කථිකයෙක් වෙන්ට වෑයම් කරන කොට, තමන්ට එය නොහැකි වේ යැයි හිත කරදර කර ගන්න වුවමනා නෑ. ඔයාලට කැමැති ඕනෑම දෙයක් ගැන ඕනෑම වේගයකින් කතා කරන්න පුළුවන්. අපි වෑයම් කරලා බලමු."

කථිකයන් ගේ අනුපිළිවෙළ තීරණය කරන ලදි. ඒ ඒ දවසට කතා කිරීමට නියමිත සිසුවා ඉක්මනින් අහර ගෙන, ගීතය අවසන් වූ වහා ම ඉදිරිපත් විය යුතු ය.

කෑම ගනිමින් මිතුරන් දෙතුන් දෙනකු සමඟ කතාබහ කරනු මෙන් නො ව, පාසලේ සියලු ම ළමයින්ට මැදි වී, ඔවුන් ඇමතීමට විශාල දිරියක් අවශ්‍ය බවත්, එය එතරම් පහසු නැති බවත් ඔවුන්ට ඉක්මනින් ම පැහැදිලි විය. සමහරු මුල දී මහත් සේ ලජ්ජා වූ හ. ඔවුන් කළේ අහිංසක ලෙස සිනාසීම පමණෙකි. එක් සිසුවෙක් මහත් වෑයමෙන් කතාවක් පුරුදු වී නැඟී සිටියේ ය. සියල්ල අමතක ව තිබුණි. ඔහු තමා ගේ ලස්සණ මැය කීප විටක් ම කීවේ ය. "මැඩියෙක් පැත්තෙන් පැත්තට පනින්නේ ඇයි?" ඊළඟට ආරම්භ කළේ ය. "වැස්ස පටන් ගත්තා ම......" එපමණෙකි, එපමණෙකි. ඉදිරියට නැමී සිට, නැවත සිය අසුනට ගොස් හිඳ ගත්තේ ය.

ටොට්ටෝ චං ගේ වාරය මෙ දක්වා පැමිණියේ නැත. එදාට තමා ගේ ප්‍රියතම කතාන්තරය කීමට ඇය තීරණය කර සිටී. 'කුමාරයා සහ කුමාරිය' එය කවුරුත් දන්නා කතාවකි. ඇය එය කියන හැම විටෙක දී ම "අපි ඕක අහලා තියෙනවා"යි ළමයි පවසති. එසේ වුවත් තමා ගේ වාරයේ දී එය ම කීමට ඇය සූදානම් ය.

අලුත් කතා ක්‍රමය දිගට ම හොඳින් කෙරී ගෙන ගියේ ය. නමුත් එක් දිනෙක දී නියමිත සිසුවා කතාව කීම තරයේ ම පිළිකෙව් කළේ ය. "මට කියන්න දෙයක් නෑ" ඔහු තදින් ම කීවේ ය.

යම් කෙනෙකුට කීමට දෙයක් නැතැයි කීම ටොට්ටෝ චංට පුදුමයෙකි. ඇත්තට ම ඔහුට කතා කළ නො හැකි විය. මුල් ගුරුතුමා හිස් අහර බඳුන සහිත ඔහු ගේ මේසය ළඟට ගියේ ය.

"ඔයාට කියන්න මොකුත්ම නැද්ද?" ඔහු ඇසුවේ ය.

"නැහැ."

ඔහු දක්‍ෂතා කිසිවක් පෙන්වීමට වෑයම් නො කළේ ය. අවංක ව, ඇත්තට ම ඔහුට කීමට දෙයක් නො තිබුණි. මුල් ගුරුතුමා හිස සලා, දත් ඇන්දේ හිදැස් දක්වමින් සිනාසුණේ ය. අපි මෙයාට කියන්න මොනවා හරි හොයලා දෙමු."

" මට සොයලා දෙන්න?" සිසුවා තිගැස්සුණි. මුල් ගුරුතුමා ඔහු කවයේ මැදට කැඳවා ගත්තේ ය. සිසුවා ගේ මේසයේ එතුමා හිඳ ගත්තේ ය.

"උත්සාහ කරන්න. මතක් කර ගන්න." "ඔහු පැවසී ය." "අද උදේ නින්දෙන් අවදි වූ පසු පාසලට ඒමට පෙර ඔයා කළ දේවල් මතක් කර ගන්න. ඉස්සර වෙලාම මොනවද කළේ?"

"ඔව්" කියූ සිසුවා හිස වැනුවේ ය. "අගෙයි, ඔයා කීවා නේ 'ඔව්' කියලා. ඔයාට මොනවා හරි කියන්න තියෙනවා නේ? ම..... එයින් පස්සේ මොනවද කළේ?"

සිසුවා කතා කිරීමට වෑයම් කරයි. "ඔව්... ංආ මම නැඟිට්ටා" තව තවත් හිස වනමින් ඔහු පැවැසී ය. ටොට්ටෝ චං සහ සෙස්සෝ පුදුම වූ හ. හොඳින් සිත යොමු කර සිටියහ. ඔහු කතා කරගෙන ගියේ ය.





"ඊට පස්සේ .... ංආ" නැවතත් හිස සැලුවේ ය. මුල් ගුරුතුමා ඉවැසීමෙන් ඔහු දෙස බලා ගෙන හිඳ ගෙන සිටියේ ය. සිනාවෙන් මුව සරසා දෑත් මේසය මත තබා උනන්දුවෙන් ඔහුට සවන් දුන්නේ ය. ඔහු මෙසේ පැවැසී ය.

"හරි කදිමයි. ඒ ඇති ඔන්න, ඔයා උදේ නැඟිට්ටා. ඒක ඔයා කී නිසා අපි දැන් දන්නවා. අපිව පුදුම කරවන්නවත් අපිව සිනා ගස්සන්නවත් හිතන්න ඕනෑ නෑ. දක්ෂ කථිකයෙන් නුඹාට කමකුත් නෑ. ඉතාම වැදගත් වෙන්නේ කතා කරන්න දෙයක් නැතුව සිටි ඔයා කතා කරන්න දෙයක් සොයා ගැනීමයි."

සිසුවා අසුනට ගියේ නැත. "ඊළඟට ංආ" ඔහු හඬ නඟන්නට විය. සියලු ම ළමයි ඔහු වෙත නැමී ගියහ. ඔහු කියා ගෙන ගියේ ය.

"ඊළඟට...... ංආ..... අම්මා.... ංආ.... එයා කිව්වා..... ංආ.... දත් මදින්න කියලා.... ංආ..... මම ඉතින් දත් මැද්ද..... ංආ"

මුල් ගුරුතුමා අත් පොළසන් දුන්නේ ය. අන් සියල්ලෝ ම ඔහු අනුව ගියහ. ළමයා තවත් හඬ නඟා නැවතත් පටන් ගත්තේ ය. "ඊළඟට.... ංආ"

ළමයි අත් පොළසන නැවැත්වූ හ. තවත් හිස නැඹුරු කර හුස්ම නො ගෙන අසා සිටියහ.

අන්තිමේ දී ළමයා ජයග්‍රාහී ලෙස මෙසේ කීවේ ය: "ඊළඟට ....ංආ ....මම ඉස්කෝලෙ ආවා."

එක් වැඩිමහල් සිසුවෙක් ඉදිරියට නැමීමෙන් සමබර බව නැති ව ගොස් කෑම බඳුනේ තම හිස හප්පා ගත්තේ ය. කතා කිරීමට යමක් සොයා ගත හැකි වීම ගැන හැම සිතක් ම පහන් විය.

මුල් ගුරුතුමා මහ හඬින් අත් පෙළී ය. ටොට්ටෝ චං සහ සෙස්සෝ ද එසේ කළහ. වටය මැද සිට ගෙන සිටි 'ඊළඟට,.... ංආ' පවා අත් පොළසන් දුන්නේ ය! අත් පොළසනින් රැස්වීම හල ගිගුම් දුන්නේ ය.

වැඩුණු මිනිසකු වූ පසු ව පවා ඒ කථිකයාට ඒ ප්‍රීති රාවය අමතක නො වී ය.

## "අපි සෙල්ලම් කළා විතරයි"

ටොට්ටෝ චං බිහිසුණු අනතුරකට මුහුණ පෑවා ය. ඇය පාසල ඇරී නිවසට ආ පසු ව රෑ කෑමට පෙර කාමරයේ රොකී සමග 'වලස් ක්‍රීඩාව' කරද්දී මෙය සිදු විය.

ඔවුන් ඇරඹූ ක්‍රීඩාව මෙවැන්නක් විය. කාමරයේ විරුද්ධ පැති දෙකේ සිට දෙදෙනා මැදට පෙරළී ආ යුතු ය. අන්තිමේ දී එකිනෙකා මත පැන සුළු පොරයකින් ක්‍රීඩා වාරයක් අවසන් වෙයි. කිහිප විටක් මේ ක්‍රීඩාව කළ ඔවුහු මෙයට වඩා අමාරු ක්‍රීඩාවක් කිරීමට එකඟ වූ හ. එසේ තීරණය කළේ ටොට්ටෝ චං ම ය. පෙරළී අවුත් දෙදෙනා මැද දී හමු වූ විට, අනෙකාට රුදුරුතම වලස් මුහුණක් පෙන්වන තැනැත්තා ජය ගන්නා බව අලුත් තීරණය විය. ජර්මානු එඬේර වර්ගයට අයත් රොකීට වලස් මුහුණක් සාදා ගැනීම අමාරු දෙයක් නො වී ය. ඌට කිරීමට තිබුණේ සවන් පෙති ඔසවා, කට හැර දත් විළිස්සීම පමණි. එයට ගැළපෙන ලෙස ඇස් සකසා ගැනීමට ද ඌට හැකි විය. මෙය ටොට්ටෝ චංට මදක් දුෂ්කර විය. අත් දෙපසින් හිස ළඟට ඔසවා සවන් පත් සේ තබා ගැනීමටත්, හැකි තරම් විශාල ලෙස මුඛය සහ ඇස් විවර කිරීමටත්, ගොරවන හඬ නිපැදවීමටත්, රොකී හපා කන ලෙසක් පෙන්වීමටත් ඇයට සිදු වී තිබුණි. රොකී ඉතා හොඳින් ක්‍රීඩා කළේ ය. සුළු වේලාවකට පසු ව, මෙය ක්‍රීඩාවකැයි ඌට අමතක විය. ඌ හදිස්සියේ ම ටොට්ටෝ චං හැබෑවට ම හපා කෑවේ ය.!

තාමත් පැටියකු වුව ද, රොකී, ටොට්ටෝ චං මෙන් දෙගුණයක් පමණ විශාල විය. උගේ උල් දත් තියුණු විය. කුමක් සිදු වේ දැයි සිතා ගැනීමටත් පෙර ම, ඇගේ දකුණු කන් පෙත්ත පහළට එල්ලෙන්නට විය. ලේ දහර වැහෙන්නට විය.

දුව ගේ කෑගැම ඇසී මව කුස්සියේ සිට දිව ආවා ය. දකුණු කන දැතින් ම වසා ගෙන ඇය රොකී සමඟ කාමරයේ මුල්ලක සිටියා ය. ඇය ගේ ඇඳුම ලෙයින් නැහැවෙමින් තිබිණ. සාලයෙහි, වයලිනය වයමින් සිටි පියා ද දිව ආවේ ය. භයානක දෙයක් තමන් අතින් සිදු වී ඇති බව රොකීට හැඟෙන්නට විය. උගේ වලිගය පා අතර වකුටු වී තිබිණ. ඌ ටොට්ටෝ චං දෙස අනුකම්පාවෙන් බලා සිටියේ ය.



ටොට්ටෝ චං ගේ සිතට නැඟුණු එක ම දෙය වූයේ, මවත් පියාත් රොකී කෙරෙහි උරණ වී, ඌ නසන්නට හෝ ඉවත හරින්නට කටයුතු කළහොත් ඇය කුමක් කළ යුතු ද යන්නයි. එසේ වුවහොත්, ජීවිත කාලය තුළ දී ඇය මුහුණ පාන ඛේද ජනක සහ භයානක ම සිද්ධිය එය වනු ඇත. ඒ නිසා, දකුණු කන අතින් වසා ගෙන, රොකී ළඟ වැතිර, "රොකීට බනින්න එපා. රොකීට බනින්න එපා."යි නැවත නැවතත් කෑගැසුවා ය.

ටොට්ටෝ චං ගේ කනට සිදු වූයේ කුමක් දැයි දැන ගැනීමට මාපියෝ වඩාත් උනන්දු වූ හ. ඒ නිසා ඇය ගේ අත ඉවතට ඇදීමට වෑයම් කළහ. ටොට්ටෝ චං ඊට ඉඩ නො දෙමින් "ඒක රිදෙන්නේ නෑ. රොකීට බනින්න එපා. රොකීට බනින්න එපා"යි මොර දුන්නා ය. එවේලේ ඇති වූ වේදනාව ටොට්ටෝ චංට නො දැනුණි. ඇය සිතුවේ රොකී ගැන ම පමණි.

කනෙන් ලේ වැහෙමින් තිබුණි. රොකී ඇය හපා ඇති බව මවත් පියාත් තේරුම් ගත්හ. ඌ සමඟ අමනාප නො වන බව සහතික කළෙන්, දැරිය තම අත් ඉවතට ගත්තා ය. ඇගේ කන එල්ලෙනු දුටු විට, මව්ට කෑගැසුණේ ය. පියා මව සමඟ, ටොට්ටෝ චං වෛද්‍යවරයා වෙත ගෙන ගියේ ය. කල් නොයවා පිළියම් කරන ලදින්, කන සවි කිරීමට වෛද්‍යවරයා සමත් වීම වාසනාවක් විය. එය කලින් තිබුණු ලෙසට ම සුව කළ හැකි වීම මාපියන්ට මහත් අස්වැසිල්ලක් විය. එහෙත් ටොට්ටෝ චං කනස්සලු වූවා ය. රොකීට තරවටු නොකරන බවට මවත් පියාත් දී ඇති පොරොන්දුව එසේ ම ඉටු වේ දැයි ඇයට නිසැක නැත.

හිස මුදුනේ සිට නිකට තෙක් ම වෙළුම් පටි සහිත ව, සුදු හාවකු මෙන් ටොට්ටෝ චං නිවසට පැමිණියා ය. රොකීට නො බනින්නට පොරොන්දු වී සිටිය ද, යම් ලෙසකින් ඌට තරවටු කිරීමට පියාට අවශ්‍ය විය. "ඔබේ පිළිණ රකින්නැ"යි කියන්නාක් මෙන් මව ඔහු ගේ මුහුණ බැලූ කල්හි ඔහු නො කැමැත්තෙන් ඊට එකඟ විය.

සියල්ල හොඳින් සිදු වී ඇතැයි ද කිසිවකු රොකී සමඟ උරණ නැතැයි ද හැකි ඉක්මනින් රොකීට දැන්වීමේ නොතිත් වුවමනාවෙන් ටොට්ටෝ චං එදා ඉක්මනින් ගෙදර ගියා ය. එහෙත් කිසි ම තැනෙක රොකී දැකීමට නො ලැබුණේ ය. බල්ලා කෙරෙහි පළමු වන වරට ටොට්ටෝ චං හඬන්නට වූවා ය.

මාපියන් ගේ තරහ වැඩි විය හැකි බැවින් ඒ බයට වෛද්‍යවරයා පිළියම් කරද්දී පවා, ඇය දත්මිටි කා ගෙන නො හඬා සිටියා ය. දැන් ඇයුට කඳුළු නැවැත්විය නො හැකි ය. ඇය හඬමින් ම, "රොකී, රොකී, මයා කොහේ දැ"යි ඇසුවා ය.

කීප වරක් කතා කළ පසු ව සුපුරුදු දුඹුරුවන් පිටක් සෝපාව පසු පසින් මතු වන විට, කඳුළු බිඳු වැකුණු මුහුණ එසැවී, සිනා පොදක් මෝදු විය. ඌ ටොට්ටෝ චං වෙත ගොස් වෙළුම් පටි අතරින් මතු වී පෙනුණු හොඳ කන සෙමින් ඉව කළේ ය. ටොට්ටෝ චං තම දෑත් රොකී ගේ ගෙල වටා යවා, උගේ කන් තුළට නැහැය යොමු කළා ය. ඒවා දුගඳ යැයි මවත් පියාත් කියා ඇතත් ඒ කුයිල ඇයට පියකරු සුවඳක් විය.

ටෝට්ටෝ චං මෙන් ම රොකී ද නිදිබර වූ හ.

ගිම්හාන අන්තයේ සඳ රැස් තුරු අතරින් ගලා වෙළුම් සහිත සිඟිති දැරිය සහ ඇය ගේ බලු පොව්වා මත දිලිණ. ඔවුන් දෙදෙනා ඉතින් නම්, වලස් ක්‍රීඩාව නො කරනු ඇත. ඔවුහු දැන් පෙරටත් වඩා මිතුරෝ ය.

## ක්‍රීඩා දිනය

ටොමෝවේ ක්‍රීඩා දිනය හැම වසරක ම, නොවැම්බර මස තුන් වෙනිදාට යෙදී තිබිණ. මුල් ගුරුතුමා ඒ දිනය තීරණය කර තිබුණේ බොහෝ විමැසුම්, පිරික්සුම්වලින් පසු ව ය. සරත් ඍතුවේ අඩු ම වැසි වාර්තා වී ඇත්තේ එදින බව ඔහු සොයා ගෙන තිබිණ. කාලගුණ තොරතුරු එක්රැස් කිරීමේ ඔහු ගේ වෙසෙසි හැකියාව නිසා වේවා, එසේ නැතහොත්, හිරු සහ වලාකුළු ඔහු ගේ කැමැත්ත ඉටු කළ නිසා වේවා, වැස්ස ක්‍රීඩා දිනයට කිසි විටෙක බාධාවක් නො වී ය. සිසුවෝ එසේ බලාපොරොත්තු ද වූ හ. පෙර දින ඔවුහු පාසල් වත්ත අලංකාර කොට, සියලු අවශ්‍යතා සූදානම් කළහ. කිසි විටක එදින වැසි නො වැටීම කිසියම් ගුප්ත කරුණක් ලෙස පෙනී ගියේ ය.

ටොමෝවේ සියල්ල මෙන් ම, ක්‍රීඩා දිනය ද අමුතු විය. වෙසෙසි විය. අන් පාසල්හි පවත්නා ක්‍රීඩා ඉසවු අතුරින් මෙහි පැවැතුණේ කඹ ඇදීම සහ තුන් පා දිවීම පමණි. අන් සියලු ක්‍රීඩා



මුල් ගුරුතුමා විසින් සොයා ගන්නා ලද්දේ විය. වෙසෙසි විසිතුරු උපකරණ නැති ව, පාසලේ එදිනෙදා භාවිත සාමාන්‍ය දේවල් යොදා ඒවා ක්‍රියාත්මක විය.

උදාහරණ වශයෙන් 'කාපි දිවුම' ඊට ඇතුළත් විය. කාපි යනු මැයි මාසයේ දරක දින උළෙල සමයෙහි ධ්‍රැව ප්‍රදේශයෙන් ඇදී එන මසුන් දහරෙකි. එබඳු මසුන් දහරක හැඩයට නළාකාර ව, වර්ණවත් රෙදිවලින් තනන ලද කාපි දහරා පිටිය මැද සකසනු ලැබේ. සංඥාව ලද විට, තරගකරුවන් ඒ වෙත ගොස්, එය තුළින් බඩ ගා යා යුතු ය. මුව පැත්තෙන් ඇතුළු වී, වල'ග පැත්තෙන් පිට ව, ආපසු ආරම්භක ස්ථානයට ම යා යුතු ය. තිබුණේ 'කාපි මං' තුනක් පමණි. එකක් රතුවන් ය. දෙකක් නිල්වල් ය. ඒ නිසා එක් විට, තරගකරුවන් තිදෙනකුට ඒ තුළින් රිංගා ගිය හැකි ය. ක්‍රීඩාව ඉතා පහසු බව පේනුණ ද ඉතා ම දුෂ්කර විය. නළ මග ඇතුළත අඳුරු වූ අතර, යාමට බොහෝ දුර තිබිණ. පහසුවෙන් ම දිසාව පිළිබඳ මතකය නැති ව ගොස්, ක්‍රීඩකයෝ මං මුළා වෙති. ටොට්ටෝ චං ඇතුළු ළමයි ඇතුළු වූ කටෙන් ම නිකුත් ව, තමන්ට වැරැදුණු බව දැන, ආපසු රිංගා ගිය හ. ක්‍රීඩාව ඉතා ම විනෝද ජනක විය. තරගකරුවන් ඇතුළත පෙරට පස්සට රිංගන විට, කාපියන් පණ ඇතිවාක් මෙන් ඇඹැරෙනු දඟලනු පෙනේ!

'මවක සොයා ගැනීමට දිවීම' තවත් ඉසව්වකි. සංඥාව ලද විට, පසෙක සවි කර ඇති ලී තරප්පුවක පිය ගැට අතරින් රිංගා ගොස් බඳුනෙන් කවරයක් තෝරා ගෙන එය හැර කියවා බැලිය යුතු ය. එහි තුළ තිබුණු පත්‍රිකාවේ, "සක්කෝ චං ගේ අම්මා"යි සඳහන් වුවහොත්, නරඹන පිරිස අතරට ගොස්, ඇය ගේ අතින් ගෙන අවසන් කරන ස්ථානයට යා යුතු ය. බළලකු ගේ ගමන් රටාව අනුව ගියහොත් යමකුට පියගැට තුළින් රිංගා යාම පහසු විය හැකි ය. නැතහොත් පසු පැත්ත පිය ගැටවල හැපෙයි. තව ද සක්කෝ චං ගේ අම්මා කවුරු දැයි දැන සිටිය යුතු ය. කිසි දා හමු වී නැති 'ඕකු මෙනෙවිය ගේ සොහොවුරිය' හෝ 'මූ මහතා ගේ අම්මා' හෝ 'කුකිනෝරි මහත්මිය ගේ පුතා' යනුවෙන් පත්‍රිකාවේ සඳහන් වුවහොත් නරඹන්නන් ඉදිරියට ගොස්, හඬ නඟා පිරිස ඇමැතීමට තරගකරුට සිදු වෙයි. "ඕකු මෙනෙවිය ගේ සහෝදරී!" මේ සඳහා දිරිය අවශ්‍ය ය. තමා ගේ මව ගේ නම සඳහන් පත්‍රිකාව ලද වසනාවන්ත සිසුවෙක් "අම්මේ අම්මේ

ඉක්මනින් එන්න"යි හඬ නගයි. මේ ඉසව්වේ දී තරඟන්නන්ට ද අවදියෙන් සිටීමට සිදු වෙයි. කුමන මොහොතේ තමා ගේ නම කියැවේ දැයි කිව නොහැකි ය. එසේ කියැවුණු වහා ම, තමන් හිඳගත් පැදුරෙන්, බංකුවෙන් නැගී සිට, සෙසු අය ගෙන් අවසර ගෙන, පොරොත්තුව සිටි සිසුවා වෙත ගොස්, ඔහු ගේ අත ගෙන දිනුම් කණුව වෙත යාමට සූදානම් ව සිටිය යුතු ය. මෙසේ යම් සිසුවකු වැඩිහිටියන් ඉදිරියේ සිට ගත් විට, කවුරුන් අමතන්නේ දැයි සිත යොමු කරන පියවරු පවා ඇතැම් විට, හුස්ම නො ගැනීමට හෝ ඉඩක් පවා නො ලැබෙයි. මේ නිසා උනුන්ට මිම්ණීමට හෝ කැම බීම ක්‍රීඩාවෙහි නිරත වීමට මාපියන්ට ද සිදු වෙයි. දූ පුතුන් තරමට ම

"හේව් හෝ, හේව් හෝ" යි හඬ තළමින් කඹ ඇදීම සඳහා ගුරුවරු සහ මුල් ගුරුතුමා සිසුන්ට එකතු වී දෙපිළකට බෙදෙති. යසුවාකි වං වැනි කඹ ඇදිය නො හැකි ආබාධිත දරුවන්ට කඹයේ මැදින් බැඳ ඇති ලේන්සුව දෙස බලා සිට දිනන පිළ කුමක් දැයි තීරණය කිරීමට සිදුවෙයි.

පාසලේ සියල්ලන් සම්බන්ධ වන අවසාන සහාය දිවීම ද ටොමෝවෙහි වෙසෙසෙකි. එක් අයකුට බොහෝ දුර දිවීමට නො තිබුණි. හැම අයකු ම කළ යුතු වූයේ, රැස්වීම් හලට යොමු ව තිබුණු අඩ කවයේ සිමෙන්ති පිය ගැට නැඟ ආපසු බැස ඒම පමණි. එය හරි ම පහසු යැයි බැලූ බැල්මට පෙනුණි. නමුත් පිය ගැට බෙහෙවින් ම මිටි විය. ළං ළං විය. හැම පිය ගැටයකට ම පය තබා යා යුතු වූ බැවින්, උස් අයට සහ දිගු පතුල් ඇත්තන්ට එය වෙසෙසින් ම අසීරු විය. සිසුන් දිනපතා අහර කිස සඳහා නැඟ ගිය සුපුරුදු පිය ගැට ක්‍රීඩා දිනයේ දී වෙසෙසි විනෝදයක් ගෙන දුන්නේ ය. ඔවුහු යටි ගිරියෙන් කෑගසමින් ඒ මතින් සතුටින් දිව ගියහ. ඈතින් බලා සිටියකුට එය පෙනුණේ පියකරු කලඃාකෘතික්ෂයක් මෙනි. (කලඃාකෘතික්ෂය හෙවත් කැලිඩොස්කෝප් යනු කෝණාකාර ව වීදුරු කැබලි පිහිටුවා සකසා ගනු ලබන විසිතුරු රූ රටා මවන උපකරණයකි.)

මුල් ගුරුතුමා අපේක්‍ෂා කළ පරිදි ම, ටොට්ටෝ චං සහ ඇගේ පන්ති සගයන්ට ක්‍රීඩා දිනය අපූරු අත්දැකීමක් විය. කලින් දිනයේ දී ළමයින් විසින් කඩදාසිවලින් සකසන ලද විසිතුරු දම්වැල් සහ රන් තරු ද, සිත කලඹන නැටි වාදන ද එදින උත්සව සිරියක් ගෙන ආවේ ය.



ක්‍රීඩිකා ඇඳුමකට වැඩි කැමැත්ත ඇතත්, ටොට්ටෝ චං ඇඳ සිටින්නේ කෙටි නිල් කලිසමක් සහ සුදු කමිසයකි. ක්‍රීඩා ඇඳුම්වලට ඇය බොහෝ සේ ප්‍රිය කළා ය. දිනක් පාසල් වේලාවෙන් පසු මුල් ගුරුතුමා, බාලාංශ ගුරු මහත්මීන් පිරිසකට රිද්මවලන පන්තියක් ගනිමින් සිටියේ ය. සමහරුන් ඇඳ සිටි ක්‍රීඩිකා ඇඳුම් ඇය දුටුවා ය. පොළොවෙහි උඩ පනින විට, ඔවුන් ගේ කෙටි සායට යටින් වටොර පියකරු ව සැලිණ. ඇය ගෙදර දිව ගොස්, කෙටි කලිසම උනා උඩ පැන්න ද ඇය ගේ සිහින් ළමා වටොර පියකරු ව නො සැලිණ. කීප වරක් වෑයම් කළ ඇයට හැඟී ගියේ, ඔවුන් ගේ වටොර පියකරු වූයේ ඔවුන් ඇඳ සිටි වෙසෙසි ඇඳුම් නිසා බව ය. ඒ ඇඳුම් මොනවා දැයි ඇය මව ගෙන් විචාළා ය. ඒවා ක්‍රීඩිකා ඇඳුම් බව මව කියා දුන්නා ය. පාසලේ ක්‍රීඩා දිනයේ දී, ඇයට ද එබඳු ඇඳුමක් වුවමනා බව මවට ඇඩී සේ කියා සිටිය ද, කුඩා ප්‍රමාණයේ ක්‍රීඩා ඇඳුමක් වෙළෙඳපළින් ඔවුනට සොයා ගත නො හැකි විය. ටොට්ටෝ චංට කෙටි නිල් කලිසම ඇඳීමට සිදු වූයේ මේ නිසා ය. අහෝ! කිසි ම වටොර සැලුමක් ඇති කිරීමට එය සමත් නො වී ය!

ක්‍රීඩා දිනයේ අරුම පුදුම දෙයක් සිදු විය. පාසලෙහි සිටි කෙටි ම අත් පා තිබුණු කුඩා ම සිසුවා වූ තකහෂි හැම ක්‍රීඩාවකින් ම පළමු වැනියා විය! එය විශ්වාස කළ නොහැකි තරම් ය. අන් අය කාපි මඟෙහි බඩ ගා යද්දී, තකහෂි ඒ තුළින් සැණෙන් දිව ගියේ ය. අන් අය හිණි පෙත් තුළින් හිස රිංගවන විට, ඔහු ඒ තුළින් ඉක්මනින් ඇදී ගොස්, අඩි ගණනාවක් පෙරටුව දිව ගියේ ය. රැස්වීම් හලේ පියගැට අන් අය ඉතා අපහසුවෙන් නැඟ යද්දී, පිස්ටන සේ පා සලමින් හිගු ව නැඟ ගොස්, වැඩි වෙයින් දුවන තීර පටයක් මෙන් පහළට බැස ආවේ ය.

"අපි තකහෂි පරදවන්න ඕනෑ" සෙස්සෝ කී හ. ඔහු පැරැදැවීමේ අදිටනින් අන් සිසුහු හැම දෙයක් ම කළෝ ය. එහෙත් තකහෂි හැම විට ම දිනුවේ ය. ටොට්ටෝ චං ද ඇඩී ව වෑයම් කළ ද, ඔහු පැරැදැවීමට අසමත් වූවා ය. කෙළින් ම දිව යාමේ දී, ඔහු පසු කළ හැකි වුව ද, අපහසු ගමන්වල දී ඔවුහු තකහෂිට පැරැදුණහ.

අබිමන් සිතින් සතුටින් පුතු ව නැගී ගැනීමට ඔහු ඉදිරිපත් විය. හැම විට ම පළමු වැනියා වූ බැවින් නැගී සිට නැගී ලැබුණේ ය. සියල්ලෝ විස්මිත ව බලා සිටියෝ ය.

"ඊළඟ අවුරුද්දේ මම තකහෂි පරදවනවා" හැම ළමයෙක් ම තමාටම කියා ගත්තේ ය. එහෙත් වසරින් වසර ම ක්‍රීඩා තාරකාව වූයේ තකහෂි ය!

තෑගි ද මුල් ගුරුතුමා ගේ ම වර්ගයේ විය. පළමු තෑග්ගට විශාල රාබු අලයක් විය හැකිය. දෙවැන්නට බර්ඩොක් අල දෙකක් ද තෙවැන්නට නිවිති කරටි කීපයක් ද විය හැකි ය. තෑගි ලෙස ලැබුණේ එවැනි දේ ය. සියලු ම පාසල්වල ක්‍රීඩා තෑගි ලෙස පිරිනැමෙන්නේ එළවළු වර්ග යැයි ටොට්ටෝ චං විය පත් වන තුරු ම සිතා සිටියා ය!

ඒ දිනවල බොහෝ පාසල්වල ක්‍රීඩා තෑගි ලෙස පිරිනමන ලද්දේ, සටහන් පොත්, පැන්සල් සහ මකන ආදියයි. ටොට්ටෝ චං එය නො දත්තා ය. ඔවුහු එළවළුවලට කැමැති නො වූ හ. උදාහරණ ලෙස, බර්ඩොක් අල සහ ලොකු ලූනු තෑගි ලෙස ලද ටොට්ටෝ චං ඒවා දුම්රියෙන් ගෙන යාමට සිදු වීම ගැන නො පහන් වූවා ය. නොයෙක් දේ සඳහා අමතර තිළිණ ද ක්‍රීඩා දිනයේ දී පිරිනැමිණ. එදින නිමා වත් ම ටොමෝවේ හැම සිසුවෙක් ම, කුමක් හෝ එළවළුවක් අතැතිව සිටියේ ය! එළවළු ගෙදර ගෙන යාමට සිසුන් කරදර වන්නේ කුමට ද? වෙළෙඳහලින් එළවළු ගෙන ඒමට ඕනෑ ම ළමයකු තම මව විසින් යවනු ලැබීම අරුමයක් නොවේ. එහෙත් පාසලේ සිට නිවෙසට එළවළු ඔසොවා ගෙන යාම නො හොබනේ යැයි ඔවුන්ට සිතිණ.

ගෝවා ගෙඩියක් දිනා සිටි තරබාරු සිසුවෙක් එයින් කුමක් කරම් දැයි අන්ද මන්ද විය. "මේක කාටත් පෙනී පෙනී අරගෙන යන්න මට බැහැ. මම මේක විසි කරනවා" ඔහු නො සතුටෙන් කීවේ ය.

සිසුන් ගේ අසතුට ගැන මුල් ගුරුතුමා දැනුවත් වූ බව පෙනුණි. කැරට්, රාබු ආදි එළවළු අතින් ගෙන සිටි සිසුන් වෙත ගිය ඔහු මෙසේ කීවේ ය: "මොකක් ද ප්‍රශ්නේ? ඔයාලාට මේවා එපාද? අද රෑට මේවා ඔයාලට උයා දෙන්න කියා අම්මලාට දෙන්න. මේවා ඔයාලාම උපයා ගත් එළවළු. තම තමන් ගේ වෑයමෙන් ඔයාලාගේ පවුල්වලට ඔයාලා ආහාර සපයා දී තිබෙනවා. කොහොමද? ඔට්ටුයි, කවුරුත් ඒකට කැමති බවට!"

ඇත්තට ම ඔහු නිවැරදි විය. උදාහරණ ලෙස, ටොට්ටෝ චං ජීවිතයේ පළමු වන වරට රෑ කෑමට යමක් පවුලට සැපැයුවේ



එදා ය. "මම අම්මට කියනවා, කුළුබඩු අල බර්ඩොක් දෙන්න කියලා" ඈය කීවා ය. "ලූනුවලින් මොනව හදන්න කියන්න දැයි මම නාම හිතා බැලුවේ නැහැ."

මේ අතර අනෙක් අය ද මාළු පිණි ගැන සිතමින් ඒ ගැන මුල් ගුරුතුමාට විස්තර කියන්නට වූ හ.

"හරි, හරි දැන් ඔයාලට තේරිලා තියෙනවා." එතුමා දෙකොපුල් රැලි ගන්වමින් සතුටින් කීවේ ය. ළමයින් සහ ඔවුන් ගේ පවුල් ක්‍රීඩා දිනයේ සිදුවීම් ගැන කතාබහ කරමින්, රාත්‍රි ආහාරය ගැනීම කොතරම් මිහිරි දැයි ඔහු සිතුවේ ය.

ඔහු තකහෂි ගැන විශේෂයෙන් ම සිතුවේ ය. ඔහු ගේ කෑම මේසය පළමු වන තෑගිවලින් පිරෙනු ඇත! ඔහු ගේ සිඟිති තරම ගැනත්, තව දුරටත් නො වැඩීම ගැනත් හීන මානයක් ඔහු තුළ ඇති නො වීමට පළමු තෑගිවලින් ඔහුට ලැබුණු සතුට සහ අභිමානය හේතු වෙතැයි මුල් ගුරුතුමා සිතන්නට ඇත. ටොමෝවේ ක්‍රීඩා දිනයේ වූ අමුතු ඉසවු තකහෂි මුල් තැනට ගැනීම සඳහා එතුමා තෝරා ගත් ඒවා නො විය හැකි ද? කවුරු දනිත් ද?

## ඉසා කිච්ලු

මුල් ගුරුතුමාට "ඉසා කොබයාෂි"යි ඇමැතීමට ටොමෝ සිසුවෝ ආසා කළහ. එතුමා ගැන ඔවුහු පහත සඳහන් බඳු සුරතල් පැදි රචනා කළහ.

"ඉසේ තට්ටේ
අපේ සීයා
ඉසා කොබයාෂි"

මුල් ගුරුතුමා ගේ පෙළපත් නම වූයේ, 'කොබයාෂි' යන්න ය. ඔහුට තිබුණේ, දහනව වන සියවසෙහි විසූ පුවතර 'හයිකු' කවියකු වූ ඉසා කොබයාෂි ගේ නම ය. මුල් ගුරුතුමා බෙහෙවින් ඒ කවියා ගේ හයිකු (කවි) ප්‍රිය කළේ ය. නිතර ම පාහේ ඒවා උපුටා දැක්විය. ඉසා කොබායාෂි ද තම මුල් ගුරුතුමා වන සොසාකු කොබයාෂි වැනි ම මිතුරකු ලෙස සිසුවෝ සැලැකූ හ.

ජීවිතයේ සාමාන්‍ය සිදුවීම් සමඟ බැඳී තිබුණු සත්‍යය එළිදරව් කළ ඒ හයිකු, මුල් ගුරුතුමා බොහෝ සේ ප්‍රිය කළේ ය. දහස් ගණන් හයිකු කවීන් සිටි එකල, කිසිවකුට අනුකරණය කළ නො හැකි තමා ගේ ම අනුපම හයිකු ලොවක් ඉසා කිව්ද නිර්මාණය කළේ ය. බිළිඳකු සේ සරල වූ ඒ කවි මුල් ගුරුතුමා බෙහෙවින් අගය කළේ ය. එබඳු හයිකු සිසුවෝ ද හදවතින් ම උගත් හ. මේ එබන්දෙකි:

"කෙසඟ මැඩියාණනේ
අහු වෙන්න නම් එපා
ඉසා ඔබ වෙත සිටී

වැහැරෙන විහඟුනේ
ඉඩ දෙන්න ඉඩ දෙන්න
ඉඩ දෙන්න උතුම් වූ තුරඟාට

මැස්සනේ නවතන්න
දෙඅත් පා කැරකිල්ල
යදියි ඔහු ඔබෙ දයා"

මුල් ගුරුතුමා මෙබඳු පද්‍ය ඇසුරෙන් ගීත ප්‍රස්තාර සකසා, ළමයින් සමඟ ගායනා කළේ ය. විෂය මාලාවේ එබඳු අංගයක් නො තිබුණ ද, එතුමා බොහෝ විට හයිකු පන්ති පැවැත්වී ය.



හයිකු පැබැඳීමේ ටොට්ටෝ චං ගේ පළමු වෑයම පල දැරුණේ ඇය ගේ ප්‍රියතම වීකට තිර චරිතයක් වූ "නොරාකුරෝ" ඇසුරෙනි. ඒ වනාහි අනියම් සෙබළකු ලෙස හමුදාවට බැඳී, ඉහළ පහළ යමින් වුවත්, උසස් වීම් ලත් දඩාවතේ ගිය කළු බල්ලෙකි! ඇගේ හයිකුව ජනප්‍රිය සඟරාවක පළ විය.



"වල් කළු බලු පිටත් වුණේ
මහා දේසෙටයි, ඌ දැන්
අස් කර ආපසු එවලා!"

"ඔබට සිතෙන ඕනෑ ම දෙයක් ගැන අවංක පැහැදිලි හයිකු රචනා කරන්නැ"යි මුල් ගුරුතුමා පවසා තිබිණ. ටොට්ටෝ චං ගේ පබඳ නියම හයිකුවක් ලෙස පිළිගැනීම අපහසු ය. එහෙත් එකල ඇය කෙබඳු දෙයින් පෙලැඹී ගියේ දැයි විමැසීමේ දී මෙය වැදගත් වේ. ඇගේ හයිකුව නියම 5-7-5 මාත්‍රා ආකෘතිය සමඟ නො ගැලැපුණි. ඇය ගේ පද්‍යයේ ඇත්තේ 5-7-7 ආකෘතියයි. එහෙත් වැහැරෙන විහඟුන් පිළිබඳ ඉසා ගේ හයිකුව 5-8-7 ආකෘතියේ විය. ඒ නිසා තම පබඳෙහි වරදක් නැතැයි ටොට්ටෝ චංට සිතිණ.

කුහොන්බුත්සු වෙහෙරට ගිය ගමන්වල දී හෝ එළිමහනෙහි හැසිරිය නො හැකි වැසි වේලාවල රැස්වීම් හලෙහි රොක්ව සිටි අවස්ථාවල දී හෝ ටොමෝවේ ඉසා කොබයාෂි, හයිකු ගැන සිසුනට කියා දෙයි. ජීවිතය සහ සොබා දහම ගැන තම සිතුවිලි එළි දැක්වීමට ඔහු හයිකු යොදා ගත්තේ ය.

ඉසා ගේ සමහර හයිකු ටොමෝව වෙනුවෙන් ම රචනා වී තිබුණා බඳු ය!

"දිය ව යයි හිම,
හිටි වන ම ගම් පෙත ම
පිරී යයි ළමුන් ගෙන්"

## හරි ම ගුප්තයි

ටොට්ටෝ චං ජීවිතයේ මුල් වරට මුදලක් සොයා ගත්තේ එදා ය. පාසලේ සිට දුම්රියෙන් ගෙදර යද්දී එය සිදු විය.

ජියුගාවෝකාවේ ඔයිමාචි දුම්රියෙහි ඇය නැඟුණා ය. ඊළඟ නැවැතුම වන මිදෝරිගාවෝකාවේ දුම්රිය නැවැත්වීමට පොරාතුව, තියුණු වංගුවක් ඇති නිසා, ගැස්සීමක් සමඟ දුම්රියෙහි වේගය අඩු වෙයි. මෙහි දී ඇය පා තෙරපා විසි වී යාම වළක්වා ගනී. ඇය හැම විට ම දුම්රිය යන දෙසට මුහුණ

ලා හිද ගනී. පසුපස මැදිරියක දකුණු පැත්තේ දොරටුව අසල අසුනක් ඇයට සුපුරුදු ය. තමා බසින දුම්රිය නැවැතුමේ වේදිකාව ඒ පැත්තේ ඇති බැවිනුත් පිට වන දොරටුවට ආසන්න බැවිනුත් ඇය මේ අසුන තෝරා ගෙන ඇත.

එදින දුම්රිය වෙන දා මෙන් වංගුව පසු කිරීමට වේගය අඩු කරද්දී, තමා ගේ පා අසල වැටී ඇති කාසියක් වැනි යමක් ටොට්ටෝ චං දුටුවා ය. මීට පෙර දිනක ද මෙවැනි දෙයක් දැක අහුලා ගත් නමුත් එය බොත්තමක් විය. ඒ නිසා වඩා හොඳින් ඒ දෙස බැලිය යුතු යැයි ඇයට සිතිණ. දුම්රිය කෙළින් ගමන් කරද්දී ඇය ඒ දෙස හොඳින් බැලුවා ය. නිසැක ව ම ඒ කාසියෙකි.

සෙන් (සත) පහක කාසියෙකි. අසල සිටින අයකු ගෙන් එය වැටී ඇති බවත් දුම්රිය වංගුව ගනිද්දී එය පෙරළී විත් ඇති බවත් ඇයට හැඟිණ. එහෙත් අසලක කිසිවෙක් නො වූ හ.

කුමක් කළ යුතු දැයි ඇය කල්පනා කළා ය. "ඔබ මුදලක් අහුළා ගතහොත් එය පොලිස් භටයකුට දිය යුතු යැ"යි කවුරුන් හෝ කියනු ඇය අසා තිබිණ. එහෙත් දුම්රියේ එවැන්නෙක් නො වී ය.

එවිට ම දුම්රිය නියමු මැදිරිය විවර විය. නියමුවා ටොට්ටෝ චං සිටි මැදිරියට ඇතුළු විය. කුමක් කළ යුතු දැයි ඇයට නිණවවක් නො වී ය. කෙසේ වුව ද ඇය දකුණු පයින් සෙන් කාසිය වසා ගත්තා ය. ඇය හඳුනන නියමුවරයා ඇය සමඟ සිනා සුණේ ය. නමුත් ඇයට මුළු හදින් පෙරළා සිනා සිය නො හැකි විය. කවර හෙයින් ද යත් දකුණු පයට පෑගී තිබුණු දෙය පිළිබඳ ව, වරදැති හැඟීමෙන් ඇය පෙළෙමින් සිටි බැවිනි. ඒ මොහොතේ ම, දුම්රිය ඔකයාමාවේ නැවැතිණ. ඒ වනාහි ඇය බසින නැවැතුමට පෙරාතුව හමු වන නැවැතුමයි. දුම්රියෙහි වම් පස දොරවල් හැරිණ. මිනිස්සු විශාල සංඛ්‍යාවක් ඇය තෙරපා ගෙන දුම්රියට නැඟුණ හ. එහෙත් ඇය දකුණු පය සෙලැවීමට නො කැමැති වූවා ය. වැයමෙන් උන් තැන ම සිටියා ය. ඊළඟට තමා කරන දේ සිතින් සැලසුම් කළා ය. මුදල රැගෙන දුම්රියෙන් බැස එය පොලිස් භටයකුට දීමට සිතුවා ය. ඊළඟට තවත් අදහසක් පහළ විය. පා යටින් කාසිය ඇහිඳිනු වැඩිහිටියන් දුටුවහොත්, ඔවුන් තමා හොරෙකැයි සිතීමට ඉඩ තිබේ. ඒ දිනවල සීනි බෝල පැකැට්ටුවක් හෝ චොක්ලට් පෙත්තක්



සෙන් පහකට ගත හැකි ය. මෙය විශාල මුදලකැයි වැඩිහිටියන් නො සිතනු ඇතැයි ඇයට කල්පනා විය. වැඩිහිටියන්ට එය විශාල මුදලක් නුවූවත් ටොට්ටෝ චංට මහමෙරකි! එබැවින් ඒ ගැන ඇය බොහෝ සේ තැවුණා ය.

"හරියට හරි" ඇය තමාට ම කියා ගත්තා ය. "මගේ අතින් කාසියක් වැටුණා. මං ඒක ඇහිඳ ගන්න ඕනැයි මම කලබලයක් නැතිව කියනවා. එතකොට හැම කෙනෙක් ම සිතාවි ඒක මගේ කියලා."

එහෙත් ඉක්මනින් ම තවත් ගැටලුවක් ඇයට පෙනී ගියේ ය. "මං ඒක කිව්වාම කවුරුත් මා දිහාව බලාවි. කවුරු හරි ඒක එයාගේ කියලා කීවොත් මම මොනවද කරන්නේ?"

අදහස් රැසක් සිතෙහි මතු වෙමින් යට යමින් තිබිණ. අන්තිමේ දී ඇය තීරණයක් ගත්තා ය. කළ යුතු හොඳ ම දේ දුම්රිය නැවතුම ළං වන විට, සපත්තු තූල බඳින්නට මෙන් පහතට නැඹුරු වී රහසේ ම කාසිය ඇහිඳ ගැනීමයි. එය එසේ සිදු විය. දහදියෙන් නැවී, සෙන් කාසිය මිටින් ගෙන ඇය වේදිකාව මත පා තැබූ විට සිරුර අප්‍රාණික ව යන්නා සේ දැනිණ. පොලිස් ස්ථානය බොහෝ ඈත ය. මුදල භාර දීමට එහි ගියහොත් නිවසට යාම බොහෝ සේ පමා වනු ඇත. එයින් මව කලබලයට පත් වීමට ඉඩ තිබේ. බොහෝ සේ සිතා බැලූ ඇය පිය ගැට බැස ගොස් මෙසේ තීරණය කළා ය.

"මං ඒක රහස් තැනක තියලා, හෙට ඉස්කෝලෙට අරගෙන ගිහින්, අතිකුත් අය ගේ උපදෙස් අහනවා. කිසි කෙනෙක් මේ දක්වා මෙතරම් මුදලක් සොයා ගෙන නැති හින්දා ඒ අයට මේක පෙන්නන්නම ඕනෑ."

කාසිය කොහි සඟවම් දැයි ඇය කල්පනා කළා ය. එය ගෙදර ගෙන ගියහොත් මව ඒ ගැන ඇසීමට ඉඩ තිබේ. ඒ නිසා අන් තැනක සඟවා යාමට ඇය තීරණය කළා ය.

දුම්රිය නැවතුම අසල ලැහැබකට ඇය පිවිසුණා ය. එහි දී කිසිවකුට ඇය නො පෙනේ. කිසිවෙක් මෙහි නො එති. ඒ නිසා එය පරිස්සම ය. ඇය කෝටු කැබැල්ලකින් කුඩා වළක් හාරා වටිනා සෙන් කාසිය එහි තැන්පත් කොට පසින් වැසුවා ය. අමුතු හැඩයේ ගලක් ගෙන සලකුණක් ලෙස ඒ මත තැබුවා ය. ඇය ඉතා ම වේගයෙන් ගෙදර දිව ගියා ය.

බොහෝ දිනවල "දැන් ඇඳට යන්න වෙලාව හරි යැ"යි මව පවසන තුරු ම, ටොට්ටෝ චං නින්දට නො ගොස් පාසල ගැන දොඩමලු වෙමින් පසු වෙයි. එහෙත් ඒ රැයෙහි ඇය වැඩි කතාබහක් නැතිව, කල් තබා ඇඳට ගියා ය.

ඇය පසු දින පිබිදුණේ "අද භයානක වැඩක් කරන්න තියෙනවා"යි සිතමිනි. තමා ගේ රහස් නිධානය ගැන රහසේ ම සිතමින් ඇය ප්‍රීති වූවා ය.

සුපුරුදු වේලාවට කලින් නිවසින් පිටත් වූ ඇය රොකී ද සමඟ ලන්දට රිංගා ගියා ය. "ඒක මෙතන, ඒක මෙතන" ගල් සලකුණ තිබූ ලෙස ම තිබුණේ ය. "මම ඔයාට ලස්සණ දෙයක් පෙන්වන්නම්"යි රොකී අමතා කී ඇය ගල ඉවත් කර පරිස්සමින් හැරුවා ය. පුදුමයෙකි! සෙන් කාසිය නො වී ය. කිසි දිනෙක ඇය මෙතරම් විස්මට පත් වී නැත. එය එතැන සඟවනු කවරෙක් හෝ දුටුවේ ද? ගල අන් තැනකට ගිහින් ද? ඇය අසල හැම තැනක් ම හැරුවා ය. එය ටොමෝහි සගයන්ට පෙන්වීමට නොහැකි වීම ගැන ඇය බොහෝ සේ දුක් වූවා ය. ඊටත් වඩා මෙහි ගුප්ත බව ගැන විස්මිත වූවා ය.

එයින් පසු ව ඇය එතැනින් යන හැම විට ම ලන්දට රිංගා හාරයි. එහෙත් කවරදාකවත් කාසිය හමු නො වී ය. සමහර විට, වැලි මීයකු හාරා ගන්න ඇති. ඇයට සිතිණ. "මේ සිහිනයක්ද? මං ඒක හංගනවා දෙයියොවත් දුටුවද?" ඒ ගැන මොනවා සිතුවද, එය ඉතා ම අමුතු සිදුවීමක් විය. එය කිසි දා අමතක නො වන ගුප්ත සිද්ධියකි.

## දැතින් කතා කිරීම

එක්තරා දවසක, ජියුගාවෝකා දුම්රිය නැවැතුමේ ටිකට් දොරටුව අසල දී ටොට්ටෝ චංට වඩා වැඩිමහල් පිරිමි ළමයින් දෙදෙනෙක් සහ ගැහැනු ළමයෙක් "ගල, කොළ, කතුර" යන ක්‍රීඩාව කරන්නට මෙන් ළං ළං ව සිට ගෙන උන්හ. ඔවුන් තම ඇඟිලිවලින් බොහෝ සංඥා දක්වන බව ටොට්ටෝ චංට පෙනී ගියේ ය. එය බලා සිටීම හරි ම විනෝදයෙකි. හොඳින් ම බලා ගත හැකි වන පරිදි ඇය ඒ අසලට ම ගියා ය. ඔවුන් හඬ නැති කතා බහක යෙදෙන බව පෙනුණි. එක් අයෙක් තම ඇඟිලි



බොහෝ සංඥා දක්වයි. එය බලා සිටි අනෙකෙක් වෙනත් සංඥා ඊට වැඩි ගණනක් දක්වයි. ඊළඟට තෙවැන්නා ද සංඥා කීපයක් දක්වයි. සියල්ලෝ ඊළඟට එතරම් හඬක් නොනඟා සිනා සෙති. ඔවුන් බොහෝ සේ තුටු වන බව පෙනිණ. මඳ වේලාවක් එදෙස බලා සිටි ටොට්ටෝ චං ඔවුන් දැතින් කතා කරතැයි නිගමනය කළා ය.

"මම හිතනවා, මටත් දැතින් කතා කරන්න පුළුවන්ය කියලා." ඇය උනන්දුවෙන් සිතුවා ය. ඔවුන් වෙත ගොස් ඔවුන් හා එක් වීමට ඇය සිතුවා ය. එහෙත් දැතින් ඔවුන් හා කතා කරන්නේ කෙසේ දැයි ඈ නොදත්තා ය. තව ද ඔවුන් ටොමෝ සිසුන් නො වූයෙන්, එසේ කිරීම නුසුදුසු යැයි ඇය සිතුවා ය. ඔවුන් ටොයෝටෝ වේදිකාවට යන තුරු ම, ටොට්ටෝ චං ඒ දෙස නෙත් යොමා සිටියා ය. "මිනිසුන්ට දැතින් කතා කරන්නේ කොහොමදැයි මම කවදා හරි ඉගෙන ගන්නවා." ඇය තීරණය කළා ය.

එහෙත් ඔවුන් බිහිරි අය බවවත්, ඔවුන් තමන් යන දුම්රියේ ගමනාන්තය වූ "ඔයිමාචි" නුවර පිහිටි ගොළු බිහිරි පාසලට දිනපතා යන අය බවවත් ඇය නො දත්තා ය. මේ ළමයින් උනුන් ගේ ඇඟිලි දෙස බැලූ අන්දම පියකරු යැයි ඇයට සිතිණ. යම් දිනෙක ඔවුන් සමඟ මිතුරු වීමට ඇයට වුවමනා විය.

## රොනින්වරු හතලිස් හත් දෙනා

කොබයාෂි මහතා ගේ අධ්‍යාපන ක්‍රමය අනුපම විය. යුරෝපයේ සහ වෙනත් රටවල අදහස්වලින් ඔහු බලපෑම් ලද බව පැහැදිලි ය. ටොමෝහි රිද්ම චලන, දිවා ආහාර සිරිත්, පාසල මඟින් මෙහෙයැවුණු පා ගමන් හා "පදින්න, පදින්න, වටයට පදින්න" යන ගීයේ තනුවට ගයන ලද පෙර අහර ගීය ද ඊට සාක්ෂි දරයි.

මුල් ගුරුතුමා ගේ දකුණු අත වූයේ මරුයාමා මහතා ය. සාමාන්‍ය පාසලක නම් ඔහු උප විදුහල්පති ය. බොහෝ විට, ඔහු කොබයාෂි මහතා ගේ නියම විරුද්ධ පැත්ත ය. ඔහු ගේ නමෙහි අරුත 'වට කන්ද' යනු ය. ඊට ම ගැළපෙන ලෙස, ඔහු ගේ හිස,

මුදුනේ එක් කෙසක් හෝ රහිත ව වටකුරු ව තිබිණ. නමුත් පසු පසෙහි දෙකන් මට්ටමට සුදු කෙස් තීරුවක් විය. වට හැඩයේ උපනෙත් පැළැඳි ඔහු ගේ දෙකොපුල් රත් පැහැයෙන් දිලිණ. ඔහු කොබයාෂි මහතාට වඩා වෙනස් ව පෙනුණා පමණක් නො ව, සිහින් හඬින් ශාස්ත්‍රීය වින ශෛලියේ පැදි ගැයීමට ද පුරුදු ව සිටියේ ය.

දෙසැම්බර දහ හතර වැනි දා උදෑසන සිසුන් පාසලේ රැස් වූ විට, මරුයාමා මහතා පහත සඳහන් නිවේදනය කළේ ය: "මෙයට සියවස් දෙකහමාරකට පමණ ඉස්සර, රොනින් වරු හතලිස් හත් දෙනෙක් ලේ විලක මරා දැමූ දවස අදයි. ඒ නිසා අද 'සෙන්ගාකුජි' විහාරයට ගිහින් ඔවුන් ගේ සුසානය තුළ දී, අපේ ගෞරවය දැක්වීමට බලාපොරොත්තු වෙනවා. අම්මලා තාත්තලාට මේ ගැන දැනුම් දීලයි, තියෙන්නේ."



මරුයාමා මහතා ගේ සැලසුමට මුල් ගුරුතුමා විරුද්ධ නො වී ය. ඒ ගැන එතුමා සිතුවේ කුමක් දැයි මාපියෝ නො දත්හ. ඔහු විරුද්ධ වී නැත්නම් එය අනුමතිය දීමක් ලෙස ඔවුහු අදහස් කළ හ. එසේ ම, ටොමෝ සිසුන් රොනින්වරුන් ගේ සුසානය වෙත යාම, ඔවුන් ගේ කුතුහලය දැනැවෙන කරුණක් වෙතියි ඔවුහු සිතූ හ.



පිටත් වීමට පෙර මරුයාමා මහතා හතලිස් හත් දෙනා ගේ කතාව සිසුන්ට කියා දුන්නේ ය. අසානො සාමිවරයා කෙතරම් වැරදි අයකු වුව ද, ඔහු ගේ කීකරු නිර්භීත මිනිසුන් තමන් ගේ මිය ගිය ස්වාමියා ගේ ගෞරවය වෙනුවෙන් පළිගැනීමට සැලසුම් කළ අන්දම ඔහු විස්තර කළේ ය. හතලිස් හත් දෙනාට අමතර ව 'රිහේයි අමනෝයා' නමැති දිරිමත් වෙළෙන්දෙක් ද විය. අවි සැපයුණේ ඔහු විසිනි. ෂෝගන් නිලදරුවන් විසින් ඔහු අත් අඩංගුවට ගනු ලැබූ විට, "මම රිහේයි අමනෝයා, මම මිනිහෙක්" යි පැවැසූ ඔහු පාපෝච්චාරණය ප්‍රතික්ෂේප කළේ ය. එක ද රහසක් ඔහු ගෙන් එළිදරවු කරගත නො හැකි විය.

මේ කතාවෙන් වැඩි කොටස සිසුනට තේරුණේ නැත. එසේ වුව ද පන්තිවලින් බැහැර ව, කුහොන්බුත්සු විහාරයට වඩා ඈතකට ඇවිද යාමට ද, ගමන් ආහාරයක් බිදීමට ද ඔවුහු බොහෝ සේ ආසා කළහ.

මුල් ගුරුතුමා ගෙන් ද සෙසු ගුරුවරුන් ද ගෙන් ද වෙන් ව, සිසුහු පනස් දෙනා ම මරුයාමා මහතා පෙරටු කොට ගෙන නික්මුණහ. තැනින් තැන දී සිසුන් ගේ කටහඬ ඇතට ඇසිණි. "මම රිහේයි අමනෝයා, මම මිනිහෙක්" දැරියෝ පවා එසේ කී හ. අතර මග හමු වන අය ඒ අසා, හිස් වනා සිනාසුණහ. සෙන්ගාකුජිවලට සැතැපුම් හතක් පමණ දුර විය. පාරේ වාහන හිඟ විය. දෙසැම්බර අහස නිල්වන් විය. "මම රිහේයි, මම මිනිහෙක්"යි නො කඩවා කියමින් ගමන් කිරීම නිසා, සිසුනට දුරක් නො හැඟිණ.

සෙන්ගාකුජි වෙත ළඟා වූ පසුව, මරුයාමා මහතා සෑම ළමයකුට ම සුවඳ කූරක් සහ මල් කීපයක් බැගින් ලබා දුන්නේ ය. මේ විහාරය කුහොන්බුත්සු විහාරයට වඩා කුඩා විය. එහෙත් සොහොන් ගල් පේළි බොහෝ විය. මෙතැන රොනින්වරුන් හතලිස් සත් දෙනා නිසා ශුද්ධ භූමියක් වී ඇතැයි යන අදහස ටොට්ටෝ චං තුළ මහත් ගෞරවයක් ඇති කළේ ය. ඒ නිසා ඇය මරුයාමා මහතා අනුයමින් නිසල ව නැමී සිට, සුවඳ කූර සහ මල් පිදුවා ය. සිසුන් අතර නිහඬ බවක් ඇති විය. නිහඬව සිටීම ටොමෝ සිසුන් අතර නුපුරුදු දෙයකි. ඒ ඒ සොහොන වෙත පිදුණු සුවඳ කූරුවලින් නැඟුණු දුම අහසේ නොයෙකුත් රූ රටා මවමින් ගලා ගියේ ය.

එයට පසුව සුවඳ කුරු දුමෙහි සුවඳ මරුයාමා මහතා සහ රිහේයි අමනෝයා වෙත සිසුන් ගේ මනස යොමු කළේ ය. එයින් ද ඔවුන් අතර, නිසල බවෙහි සුවඳ පැතිරිණ.

රොනින්වරුන් හතලිස් හත් දෙනා ගැන සියල්ල ළමයින් තේරුම් නො ගත්තා විය හැකි ය. ඔවුන් කෙරෙහි පක්ෂපාත ව කතා කළ මරුයාමා මහතාට, කොබයාෂි මහතාට මෙන් සිසුහු ගෞරව කළෝ ය. දෙදෙනාට ගරු කරන ලද්දේ දෙ අයුරකට ය. උපනෙත්හි ඝන කාච පසු පසින් තියුණු ලෙස යොමු කැරුණු ඔහු ගේ දෙනෙතට ටොට්ටෝ චං ආසා කළා ය. ඔහු ගේ සංවර බව එබඳු විශාල සිරුරකට නො ගැළැපෙතැයි ඇයට හැඟිණ.

## "මසෝ චාන්"

දුම්රිය නැවතුමට යන විටත් එහි සිට එන විටත් කොරියානු ජාතිකයන් ජීවත් ව සිටි ගෙවල් පේළියක් පසු කිරීමට ටොට්ටෝ චංට සිදු වී තිබුණි. ඔවුන් කොරියානුවන් බවක් ඇය නො දත්තා ය. ඔවුන් ගැන ඇය දැන සිටි එක ම දෙය වූයේ, එක්තරා කාන්තාවක ඔවුන් අතර සිටි බව පමණෙකි. ඒ කාන්තාව හිස කෙස් මැදින් දෙකට බෙදා, බනිසයක් මෙන් සකසා ගෙන සිටියා ය. බෝට්ටුවෙක ඉදිරිපස මෙන් පෙරට නෙරා ආ තුඩු ඇති රබර් පාවහන් පැළඳ සිටි මේ තරබාරු කාන්තාව දිගු සායක් හැඳ සිටියා ය. දිගු රිබන් පටියකින් තැනුණු විශාල ගැටයක් ඇගේ හැට්ටයේ විය. ඇය නිතර ම 'මසෝ -චාන්' කියමින් තම පුතාට අඬගසන බව පෙනුණි. නියම ලෙස 'ම- සා- ඕ- චං''යි උසුරුවනු වෙනුවට, ඇය දෙවන මාත්‍රාව දිගු කොට, 'චාං' යන්න මහ හඬින් උසුරවනු ඇසෙන විට ටොට්ටෝ චංට සංවේග දායක හැඟීමක් ඇති විය.

ගෙවල් පේළිය පිහිටා තිබුණේ ඔයිමාචි දුම්රිය මඟ පිටුපස, කුඩා ඉවුරක් මත්තේ ය. මසාඕ චං කවුරු දැයි ටොට්ටෝ චං දැන සිටියා ය. ඔහු ඇයට වඩා මදක් ලොකු ය. පාසලේ දෙවන ශ්‍රේණියේ පමණ සිටිනු විය හැකි ය. ඔහු කුමන පාසලකට යන්නේ දැයි ඇය නො දත්තා ය. ඔහු අවුල් හිස කේ ඇති ව, නිතර ම බල්ලකු සමඟ සිටියේ ය. දිනක් ටොට්ටෝ චං නිවස



දෙසට ඉක්මනින් දිව යද්දී, මසාඕ චං ඉවුර මත සිට දෙපා ඈත් කොට, ඈත් ඉඟටියේ තබා ගෙන උදාරම් ඉරියව්වෙන් ඇය දෙස බලා සිටියේ ය.

"කොරියන් කෙල්ලේ!" ඔහු ටොට්ටෝ චංට කෑගැවේ ය.

ඔහු ගේ හඬ නපුරු විය. බාධාකාරී විය. ටොට්ටෝ චං බියට පත් වූවා ය. ඇය කිසි දාක ඔහුට වරදක් කර නැත. ඔහු සමඟ කතා කර නැත. මේ නිසා ඉහළ සිට, මෙසේ විරුද්ධවාදී ලෙස හඬ නැඟීමෙන් ඇය තිගැස්සුණා ය.

නිවසට ගිය ඇය මවට මේ ගැන පැවැසුවා ය. "මසාඕ චං කීවා, මම කොරියන් කෙල්ලෙක්ය කියලා" ඇය කීවා ය. මව ඇගේ කට අතින් වැසුවා ය. මව ගේ දෑසෙහි කඳුළු පිරෙනු දුටුවා ය. එය ඉතා ම අශෝභන දෙයකැයි සිතූ ඇය ගේ සිත කැලැඹිණ. මව ගේ දැසින් නො නැවැති කඳුළු ගලා ගියේ ය. ඇගේ නාස් පුඬු රත් පැහැ විය. "දුප්පත් කොල්ලා!" ඇය කීවා ය. " 'කොරියන් කොල්ලා'යි මිනිසුන් නිතරම ඔහුට කියනවා ඇති. ඒ නිසා එය නරක වචනයකැයි පුංචි ළමයකු වූ ඔහුට සිතෙනවා ඇති. ඒ වචනය මිනිසකු මෝඩයකු බව දැක්වීමට කියන 'බක' වැනි නරක වචනයකැයි ඔහු සිතනවා ඇති. තමාට අනෙක් අය නිතර ම 'කොරියන් කොල්ලා'යි කියන නිසා, නො හොබිනා වචනයකින් කාට හෝ හානි කිරීමට ඔහුට වුවමනා වන්ට ඇති. ඒ නිසා ඔහු 'කොරියන් කෙල්ල'යි ඔබට කියන්නට ඇති." මව පැහැදිලි කළා ය.

ඇස් වියළා ගෙන මව ටොට්ටෝ චංට මෙසේ පැවැසුවා ය. "ඔයා ජපන් ළමයෙක්. මසාඕ චං කොරියාව කියන රටෙන් පැවැතෙන කෙනෙක්. නමුත් එයාත් ඔයා වගේම ළමයෙක්. මෙයා ජපන්ය, මෙයා කොරියන්ය කියලා යම් කෙනෙක් ගැන හිතන්න එපා. ඔසාඕ චංට හොඳින් සලකන්න. මිනිස් කොටසක් කොරියානු වීම නිසා ඔවුන් නරක යැයි මිනිසුන් විසින්ම සලකන එක විශාල කනගාටුවක්."

මේවා තේරුම් ගැනීම ටොට්ටෝ චංට පහසු නැත. නමුත් මසාඕ චං කුඩා ළමයකු බවත් හේතුවක් නැති ව මිනිසුන් ඔහුට නරක ලෙස සලකන බවත් ඇයට තේරුම් ගත හැකි විය. ඔහු ගේ මව නිතර ම නො ඉවැසිල්ලෙන් ඔහු ගැන සොයා බැලුවේ

මේ නිසා යැයි ඇයට තේරුම් ගියේ ය. පසු ආ උදාසන ඇය ගෙවල් පේළිය පසු කර යද්දී "මසෝ-චාන්" යන මව ගේ ගිගුරුම ඇසිණ. ඔහු කොහේ ඇත් දැයි ඇය සිතුවා ය. තමා කොරියානු දැරියක නො වුවත් ඔහු නැවතත් කලින් ලෙස කතා කළහොත් "අපි ඔක්කොම ළමයි. අපි කවුරුත් එකයි," කීමට ඇය හිත හදා ගත්තා ය. ඔහු සමඟ මිතුරු විය යුතු යැයි ඇයට සිතිණ.

කෝපය සහ නො ඉවැසිල්ල කැටි වී පැවැති, මසාඕ චං ගේ මව ගේ හඬ වෙසෙසි විය. දිගු වේලාවක් එය ගුවන් ගැබ නින්නාද දුන්නේ ය. එය වැසී ගියේ අසලින් ගමන් කළ දුම්රියක හඬින් පමණි.

"මසෝ - චාන්" කඳුළින් නෙත් පුරන ඒ සංවේගදායක හඬ ඇසූ කෙනකුට එය කිසි දාක අමතක නො වේ.

## කොණ්ඩා කරල්

එකල ටොට්ටෝ චංට ලොකු ම ආශා දෙකක් තිබුණි. ක්‍රීඩා ඇඳුම් ඇඳීම පළමු වැන්න ය. කොණ්ඩය ගෙතීම දෙවැන්න ය. දිගු කොණ්ඩා ගෙතූ දැරියන් දුම්රියේ දී දුටු විට, එලෙස තම කොණ්ඩය ද සකසා ගත යුතු යැයි ඇයට සිතිණ. ඇගේ පන්තියේ සිටි සෙසු දැරියන් හිස කෙස් කොටට කපා සිටි අතර, ටොට්ටෝ චං ගේ කෙස් ඊට වඩා දිගු විය. ඒවා පැත්තෙන් බෙදා, පටියකින් ගැට ගසා තිබුණි. මව ඒ විලසට කැමැති වූවා ය. ටොට්ටෝ චං කරලට ගෙතිය හැකි වන පරිදි හිස කෙස් වැඩෙතැයි පතා සිටියා ය.

අවසානයේ දී ඇය එක්තරා දිනෙක මව ලවා කරල් දෙකකට කොණ්ඩය සකසවා ගත්තා ය. කෙළවර රබර් පටිවලින් සුරකි කොට, තුනී රිබන් දෙකකින් සරසන ලදි. තමා වැඩිමහලු සිසු දැරියක ලෙස ඇයට දැනිණ. කැඩපතින් බැලූ විට, දුම්රියෙහි යන අන් දැරියන් ගේ මෙන් නො ව, තමා ගේ කොණ්ඩය තුනී බවත් කෙටි බවත් ඇයට පෙනිණ. ඇත්තට ම ඒවා ඌරු වල්ගා වැනි විය. එසේ වුවත් ඇය රොකී වෙත දුව ගොස්, ඒවා ඉදිරියට අල්ලා පෙන්වූවා ය. ඌ වරක් හෝ දෙකක් ඇසි පිය හෙළුවේ ය.



"මට හිතෙනවා, ඔයාගේ කොණ්ඩෙත් ගොතන්න පුළුවන් කියලා" ඇය රොකීට කීවා ය.

දුම්රියේ නැඟුණු පසුව, ඇය කොණ්ඩා කරල් ලිහෙතැයි බියෙන් හිස නිසල කොට සිටියා ය. කවුරු හෝ ඒවා බලා 'කොච්චර ලස්සණ කොණ්ඩාද?" කියා පැවැසුව හොත් කොතරම් අගනේ දැයි ඇයට සිතිණ. එහෙත් කිසි ම කෙනෙක් එසේ නො කළහ. කෙසේ වුවත් ඇය පාසලට ගිය විට, ඇගේ පන්තියේ සිටි මියෝ චං, සක්කො චං සහ කීකෝ ඕකි "ඔව්... කොණ්ඩා කරල්"යි එක හඬින් කීහ. ඇය පිනා ගියා ය.

පිරිමි ළමයින් කිසිවකු එයින් අමුතු සතුටක් ලද බවක් නො පෙනුණි. නමුත් කැමෙන් පසු ව, ඇගේ පන්තියේ ම එකකු වූ ඕව්, "මෙන්න ටොට්ටෝ චංට අලුත් කොණ්ඩයක්" කියමින් කෑ ගැසුවේ ය.

එක් පිරිමි ළමයකු හෝ ඇගේ කොණ්ඩය දැකීම ඇයට මහත් සතුටක් විය. ඇය අබිමනින් මෙසේ කීවා ය.: "ඒවා කොණ්ඩා කරල්!"

එවිට ම ඔහු පැන අවුත්, දැතින් ඒවා අල්ලා ගෙන, "මට මහන්සියි. මම ඒවායේ ටිකක් එල්ලෙන්න ඕනෑ. ෂාආ... ඒවා කෝච්චියේ තියෙන අත් වාරු පටිවලට වඩා හරි අගෙයි." කීවේ ය. ඔහු ගේ කරදරයෙහි කෙළවරක් නො වී ය.

ඕව්, ඉතා ම කෙසඟ ටොට්ටෝ චං මෙන් දෙගුණයක් පමණ විශාල විය. ඇත්තට ම ඔහු පන්තියේ තරබාරු වූ විශාල ම ළමයා විය. එබැවින් ඔහු කොණ්ඩා කරල්වලට දුම්රියේ අත් වාරු පටි යැයි කීමෙන් ම වුව ඇයට රිදුණි. ඔහු කොණ්ඩා කරල්වල එල්ලී ක්‍රීඩා දිනයේ කඹ අදිද්දී මෙන්, "හේව් හෝ, හේව් හෝ" කියමින් ඉවතට අදින විට, ටොට්ටෝ චං හඬා වැටුණා ය.

ටොට්ටෝ චං සිතූ පරිදි වැඩිමහල් දැරියක ගේ සලකුණ කොණ්ඩා කරල් ය. ඒවා නිසා අනෙකුත් හැමකෙනකු ම තමාට ආචාරශීලි ලෙස හැසිරිය යුතු යැයි ඇය අපේක්ෂා කළා ය. අඬ අඬා ම ඇය මුල් ගුරුතුමා ගේ කාර්යාලය වෙත දිව ගියා ය. ඉකි ගසමින් ඇය දොරට ගසනු ඇසුණු විට, ඔහු දොර හැරියේ ය. මුහුණු දෙක සම මට්ටමට එන ලෙස මුල් ගුරුතුමා ඇය ඉදිරියේ නැමී සිටියේ ය.

"මොකක් ද, ප්‍රශ්නෙ?" ඔහු ඇසුවේ ය.

කොණ්ඩා කරල් තාමත් අවුල් නො වී තිබේ දැයි අතගා බලමින් ඇය මෙසේ කීවා ය: "හීච්හෝ, හීච්හෝ කියා කෑ ගසා ඔච් මේවා පහළට ඇද්දා."

මුල් ගුරුතුමා ඇගේ කොණ්ඩය දෙස බැලුවේ ය. ඇය ගේ කඳුළු පිරි මුහුණ මෙන් නො ව, කුඩා කොණ්ඩා කරල් සතුටින් නටන්නා මෙන් ඔහුට පෙනිණ. ඔහු අසුනට ගොස් තමා ඉදිරියේ හිඳ ගැනීමට ඇයට ඉඩ සැලැසී ය. සුපුරුදු පරිදි දත් හිදැස දක්වමින් සිනාසුණේ ය.

"අඬන්න එපා. ඔයාගේ කොණ්ඩෙ හරි ලස්සණයි."

"ඔයා ඒකට කැමැතිද?" ඇය කඳුළු වැකි මුහුණ ඔසවා ලජ්ජාවෙන් ඇසුවා ය.

"හරිම ලස්සණයි" ඔහු කීවේ ය.

ඇය හැඬීම නැවැත්වූවා ය. "ඔච් ආයිමත් හීච් හෝ කිච්චත් මම තවත් අඬන්නේ නෑ."

පුටුවෙන් නැගී සිටිමින් ඇය කීවා ය. මුල් ගුරුතුමා ඇය වෙත යළි සිනා සී හිස වනා අනුමත කළේ ය. ටොට්ටෝ චං ද සිනා සුණා ය. සිනා සෙන ඇගේ මුහුණ කොණ්ඩා කරල් සමඟ හොඳින් ගැළපුණි. ඇය මුල් ගුරුතුමා වෙත නැමී සිට, ආපසු දිව ගොස්, ක්‍රීඩා කරන අන් ළමයින්ට එකතු වූවා ය.

ඔච් ඇය ඉදිරියේ සිට ගෙන සිටින විට, තමා හැඬූ බව ඇයට සපුරා ම අමතක ව තිබිණ. ඔහු ඇය ගේ අත් අල්ලා ගත්තේ ය. "මට කනාගාටුයි. මම ඒවා ඇද්දා" ඔහු පැහැදිලි හඬින් කීවේ ය. "මට මුල් ගුරුතුමා බැන්නා. ගැහැනු ළමයින්ට හොඳ හැටි සලකන්න කියලා එයා කීවා. ඔයාලට ආචාරශීලී වෙන්නත් ඔයාලා හොඳින් බලා ගන්නත් කියා මට කිච්චා."

ටොට්ටෝ චංට පුදුම ය. ගැහැනු ළමයින්ට හොඳ හැටි සලකන්නැයි කිසි ම අයකු කියනු මේ දක්වා ඇය අසා නැත. හැම තැන දී වැදගත් වන්නේ පිරිමි ළමයින් බව ඇය දනී. ළමයින් වැඩි ගණනක් සිටින පවුල්වල නිතර ම කලින් කෑම බීම දෙන්නේ පිරිමි අයට ය. ඇරියන් දොඩමලු වන විට, මවුවරුන් නිතර ම පවසන්නේ 'ඔවුන් පෙනෙන්නට මිස, ඇහෙන්නට සිටින, පිරිසක් නො වන බව ය.



මේ හැමට වඩා දැරියන් බලා ගන්නැයි මුල් ගුරුතුමා ඔච්ට කියා ඇත. එය ටොට්ටෝ චංට අමුතු දෙයකි. එය කොතරම් අගනේ දැයි ඇයට සිතිණ. අනෙකුත් අය විසින් තමන් බලා ගනු ලැබීම කෙතරම් යහපත් ද?

ඇයට මෙන් ම ඔච්ට ද එය කම්පනයට හේතුවක් විය. දැරියන්ට ආචාරශීලි වීම, ඔවුන්ට හොඳින් සැලකීම කොතරම් අගනේ ද? ටොමෝවේ දී මුල් ගුරුතුමා ඔහුට දොස් කී එක ම අවස්ථාව මෙපමණෙකි. ඔහුට කිසි දිනෙක මෙය අමතක නොවෙයි.

## "ඔබට ස්තුතියි!"

නව අවුරුදු ඉසුඹුව ළං විය. ගිම්හාන ඉසුඹුව මෙන් නො ව, ළමයි පාසලේ දී එක්රැස් නුවූ හ. මුළු කාලය ඔවුහු තම තමන් ගේ පවුල් සමඟ ගත කළ හ.

"මම කියුෂුවල සීයත් එක්ක අලුත් අවුරුද්ද ගත කරන්න යනවා." මිජිටා සියල්ලන් සමඟ කියා ගෙන ගියේ ය. විද්‍යා පරීක්ෂණ කිරීමට කැමැති තායි චං "මම අයියා එක්ක විද්‍යාගාරයක් බලන්න යනවා"යි කීවේ ය. ඔහු ඒ සඳහා නො ඉවැසිල්ලෙන් බලා සිටියේ ය. "හොඳයි, අපි නැවත හමුවෙමු." කවුරුත් සමුගනිමින් කීවෝ ය.

ටොට්ටෝ චං මව සහ පියා සමඟ හිම මත ලිස්සීමට ගියා ය. පියා ගේ සංගීත කණ්ඩායමේ නියමු සෙලෝ වාදක හිඩියෝ සයිටෝ මිතුරා ගේ සිත්කලු නිවසක් ශිගා කඳු පෙදෙසෙහි විය. හැම සිසිර සෘතුවෙක ම ඔවුහු එහි ගියහ. ළදරු පන්තියෙහි සිටි කාලයේ පටන් ම, ටොට්ටෝ චං හිම මත ලිස්සීමට උගනිමින් සිටියා ය.

දුම්රිය නැවැතුමේ සිට හිම කෙළි පෙදෙසට වැඩි දුරක් නො වී ය. අසකු පිට තනි ගමනෙකින් ඒ දුර යා හැකි ය. එය සුදෝසුදු හිම තලාවක් විය. ලිස්සා යාමෙන් පලුදු නුවූ එහි අතරින් පතර, ගස්වලින් මතු වූ අතු සහ කරටි විය. සයිටෝ මහතා ගේ නිවස වැන්නක් නැති අයට ජපන් ආරේ නැවතුම් හලක් සහ බටහිර ආරේ හෝටලයක් ඇති බව මව කීවා ය. එහෙත් ඒවා බොහෝ විට පිට රටියන්ට වෙන් විය.

ගිය වසරේ මෙන් නො ව, මේ වසරේ දී ටොට්ටෝ චං අමුතු ය. ඇය දැන් මූලික පාසලෙක පළමු වන ශ්‍රේණියේ සිසුවියකි. දැන් ඇය ඉංග්‍රීසි ඇබිත්තක් ද දනී. එබසින් 'ස්තුතියි' කීමට පියා ඇයට උගන්වා ඇත.

හිම පා පැළඳ සිටින ටොට්ටෝ චං පසු කර යන හැම පිටරටියකු ම ඇයට මොනවා හෝ කීම සිරිතෙකි. ඇතැම් විට එය "හරි විනෝදයි නේද?" වැන්නක් විය. එහෙත් ඇයට නො තේරුණි. මේ වසර වන තුරු ඇයට පිළිතුරු දිය හැකි නො වී ය. නමුත් මේ වසරේ සිට, හිස වනා "ස්තුතියි" කීමට ඇයට පිළිවන.

තව තවත් සිනා සී එකිනෙකා අතර වැඩි දුර කතා බහකට එය හේතු වෙයි. ඇතැම් විට, කාන්තාවක් නැඹුරු වී, කොපුල සිප ගනී. නැතහොත් මහතෙක් නැවතී ඇය බදා වැළඳ ගනියි. "ස්තුතියි" යන්න පමණක් පවසා මෙබඳු මිතුරු මිතුරියන් ඇති කර ගත හැකි වීම කොතරම් විනෝදයක් දැයි ටොට්ටෝ චංට සිතිණ.

එක් දිනක් කදිම තරුණයෙක් පැමිණ, හඬ නගා මෙසේ ඇසුවේ ය. "මගේ හිම පාවේ ඉස්සරහ යන්න ඔයා කැමතිද?" එය වරදක් නො වේ යැයි පියා අනුමත කළේ ය.

"ස්තුතියි" ටොට්ටෝ චං කීවා ය. ඔහු තම හිම පාවේ තම පා අසලින් ඇය තබා, දණින් අල්ලා ගැනීමට සැලැස්වී ය. ඔහු තම හිම පා ළං ළං ව තබා ගෙන ශිගා කඳු පෙදෙසෙහි වැඩි ම බෑවුම සහිත දිග ම ඉසව්ව හරහා පහළට ලිස්සා ගියේ ය. සුළඟ මෙන් වේගයෙන් පහතට ලිස්සා යද්දී, වා රැළි ඇගේ කන අසලින් හඬ නැංවී ය. ඉදිරියට නො වැටෙන පරිදි ටොට්ටෝ චං දණින් තදින් අල්ලා ගෙන සිටියා ය. බියක් ඇති කළ එය, ඉමහත් විනෝදයක් විය. ඔවුන් නැවැතුමට ආ විට, නරඹන්නෝ අත් පොළසන් දුන් හ. ඔහු ගේ හිම පාවලින් මෑත් ව, ටොට්ටෝ චං නරඹන්නන් දෙසට හිස මදක් නැඹුරු කර "ස්තුතියි" කීවා ය. ඔවුහු තව තවත් අත් පෙළූ හ!

ඒ මහතා ගේ නම 'ෂ්නීඩර්' බව ඇය බොහෝ පසු ව දැන ගත්තා ය. ඔහු ලොවෙහි ප්‍රකට මහා හිම ක්‍රීඩකයා විය. ඔහු නිතර ම රිදී දඬු යුවලක් භාවිතා කළේ ය. එහෙත් එදා ඔහුට ටොට්ටෝ වඩාත් කැමති වූයේ, පල්ලමේ ලිස්සා පැමිණි පසු ව, නරඹන්නන්



අත් පොළසන් දුන් විට, ඔහු ඇය වෙත නැමී සිට, ඇය වැදගත් යැයි සලකා, "ඔබට ස්තුතියි" කීමයි. ඔහු ඇයට සැලකුවේ අත දරුවකුට සේ නො වේ. වැඩිහිටි කාන්තාවකට සේ ය. ඔහු නැමී සිටි විට, ඒ නියම මහත්මයකු ලෙස ඇය හදවතින් ම දුටුවා ය. ඔහු පසුපසින් සුදෝ සුදු හිම දසුන අනන්තය තෙක් විහිද තිබුණි.

## පොත් ගුල් මැදිරිය

සිසිර ඉසුඹුවට පසු සිසුහු පාසල වෙත පැමිණියහ. විස්මිත දෙයක් දක්නට ලැබී ඔවුහු සතුටෙන් කෑ ගසන්නට වූ හ. පන්ති කාමර මැදිරි පෙළට විරුද්ධ පැත්තෙන් රැස්වීම් හල අසල මල් පාත්ති පසු පස, නව මැදිරිය නැඟී සිටියේ ය. ඔවුන් නො සිටි දිනවල එය පොත් ගුලක් බවට පෙරැළී තිබිණ. සියලු ම දෙනා ගරු කළ, හැම වැඩක් ම කිරීමට සමත් මුරකරු වූ රියෝ චං බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කර තිබුණි. පොත් රාක්ක විශාල ගණනක් සවි කොට, සියලු ම වර්ගවල වර්ණවත් පොත් ජේළිවලින් ඒවා පුරවා තිබිණ. හිඳ ගෙන කියැවීම සඳහා පුටු සහ මේස තබා තිබුණි.

"මේ ඔයාලා ගේ පොත් ගුල," මුල් ගුරුතුමා කීවේ ය. "මේ ඕනෑ ම පොතක් ඕනෑ ම අයකුට කියවන්න පුළුවන්. සමහර පොත් සමහර පන්තිවලට වෙන් කර ඇතැයි බය වෙන්න ඕන නෑ. ඔයාලා කැමැති ඕනෑම වෙලාවක මෙහි එන්න පුළුවන්. පොතක් ලබා ගෙන ගෙදර යන්න ඕනෑ නම්, ඒකටත් අවසර තියෙනවා. හැබැයි, කියවා අවසන් වූ හැටියේම, ඒක ආපසු ගෙනැවිත් බාර දෙන්න ඕනෑ. ඔයාලාගේ ගෙදරවලත් පොත් ඇති. ඒවා කියවන්න අනෙක් අයත් ආසයි. ඒ නිසා ඔයාලා ළඟ තියෙන පොතුත් මෙහේ ගෙන එන්න. ඔයාලට පුළුවන් තරම් වේගයෙන් හැකි තරම් පොත් කියවන්න."

"අද පුස්තකාල පන්තියක් කරමු" ළමයි එක හඬින් කී හ.

"ඔයාලා කැමැති එහෙමද?" මුල් ගුරුතුමා විමසුවේ ය. පිනා සිටි ළමයින් දෙස බලා, "හරි හරි, එහෙම කරමු"යි කීවේ ය.

එවිට ම ටොමෝවේ සිසු කැලත ම - පනස් දෙනා ම, පොත් ගුල් මැදිරිය තුළ රොක් වූ හ. තම තමන් කැමැති පොත් රැගෙන

ඔවුහු හිඳ ගැනීමට පොර කෑහ. එහෙත් අඩකට වඩා ආසන නො වී ය. අසුන් නොලද්දෝ සිට ගෙන උන් හ. එය හරියට ම මගීන් සිට ගෙන පොත් කියවන තදබද දුම්රිය මැදිරියක් වැනි විය. එය පියකරු දසුනක් වූයේ ය.

සිසුහු බොහෝ සේ පිනා ගියහ. ටොට්ටෝ චං ට තාමත් හොඳින් කියවීමට අපහසු නිසා, ඇය පින්තූර සහිත රසවත් යැයි පෙනී ගිය පොතක් ගත්තා ය. හැම සිසුවකු ම අතෙහි පොතැති ව පිටු පෙරළන්නට වූ විට, හදිසියේ ම මැදිරිය නිහඬ විය. නමුත් බොහෝ වේලාවකට නො වේ. හඬ රැසක් නිහඬතාව බින්දේ ය. සමහරුන්ට පොත් මාරු කර ගැනීමට අවශ්‍ය විය. මැදිරිය සිනාවෙන් පිරී ගියේ ය. 'ගයනා සිතුවම්' නමැති පොතක් කියැවීම ඇරැඹූ සිසුවෙක් කිංකිණි නාදයෙන් ගීයක් ගයන්නට විය.

"වට එකක් සහ තිතක් වට එකක් සහ　　　තිතක්
නාසයට, සිවු ඉරක් වට එකක් සහ　　　තිතක්
කෙස් තුනක් කෙස් තුනක් හහාහා! කෙස්　　　තුනක්
ඇසි පියක සැණෙන් එයි තරබාරු ලිය　　　හිසක්!"

කුඩා වට තුන විශාල වටයකින් වට කළ යුතු වූ අතර, අඩ වට තුනක් ඇසි පිය හෙළන සැණින් ඇඳිය යුතු විය. සියල්ල නිවැරැදිව කළ හැකි වී නම් තරබාරු කාන්තාවක ගේ පැරැණි කොණ්ඩා මෝස්තරයක් ලැබෙනු ඇත.





තමන් කැමැති විෂයයක් තමන්ට වුවමනා අනුපිළිවෙළකට ඉගෙනීමට ඉඩ දී තිබුණු ටොමෝවේ අනෙකුන් අය කරන දෙයින් තම කාරියට අනතුරු කරගැනීම අවශ්‍ය නො වේ යැයි සැලැකිණ. තමන් අවට සිදු වන දේ ගැන නො සලකා තමන් කරන කාරියෙහි සිත නැඹුරු කිරීමට ඔවුහු පුහුණු වී සිටියෝ ය. මේ නිසා ගී ගයන අතර, සැකිලි රුව අඳිමින් සිටි සිසුවා කෙරෙහි අනෙකුන් අය සිත යොමු නො කළහ. එක් අයකු හෝ දෙදෙනකු ඒ දෙස බැලූ අතර, අන් සිසුහු තම පොත්හි ගිලී උන්හ.

ටොට්ටෝ චං ගේ පොත ජන කතාවක් බව පෙනුණි. සුළං වන තරමට හුස්ම හෙළීම නිසා සැමියකු සොයා ගත නුහුණු ධන කුවේරයකු ගේ දියණියක ගැන කතාවකි, ඒ. අන්තිමේ දී ඇයට සැමියකු සොයා දීමට මාපියන්ට හැකි විය. එහෙත් මඟුල් ද රැයෙහි බොහෝ සතුටට පත් ව, වේගයෙන් හුස්ම හෙළීම නිසා, ඒ සුළඟින් මනාලයා ඇඳෙන් විසි වී සත් වටයකුත් අඩක් කාමරය තුළ පාවී ගොස් බිම වැටී සිහිසුන් විය. ඔහු කාමරයේ පියාඹා යන විසිතුරු සිතුවම බෙහෙවින් ම සිත්කලු විය. පසු ව, ඒ පොතට සිසුන් අතර විශාල ඉල්ලුමක් ඇති විය.

කවුළු තුළින් මැදිරියට පතිත වන උදා හිරු රැස් දහරා තුළ, මහත් ගිජු කමින් පොත්වලට වහවැටුණු සිසුන් පොත් ගුල තුළ සාඩින් සේ තද බද ව සිටිනු දකින මුල් ගුරුතුමා ගේ හදවත සතුටින් ඉපිල ගියේ ය.

සිසුහු ඒ මුළු දිනය ම පොත් ගුල් මැදිරිය තුළ ගත කළහ. එයින් පසුව වැසි නිසා එළිමහනට යා නොහැකි වූ විට දී මෙන් ම වෙනත් බොහෝ අවස්ථා වල දී ද පොත් ගුල ඔවුන් ගේ රැස්වීම් පොළක් විය.

"මම හිතන්නේ පොත් ගුල කිට්ටුවෙන් වැසිකිළියකුත් හැදුවොත් හොඳයි කියලා." දිනක් මුල් ගුරුතුමා කීවේ ය. කවර හෙයින් ද යත් තමන් කැමැති පොත් අතින් ගිලිහිය නො දී, එහි ම ගැලී සිටින සිසුන් රැස්වීම හලෙන් ඔබ ඇති වැසිකිළියට යාම පමා කිරීමෙන් ඔවුන් ගේ සිරුරුවලට විසුළු පෙනුමක් ඇති වීමට ඉඩ තිබුණු බැවිනි!

# වල්ගා

එක්තරා සවසෙක ටොට්ටෝ චං පාසල නිමා වී නිවස කරා යාමට සූදානම් වෙද්දී, ඔව් ඇය වෙත දිව විත් රහසක් කීවේ ය. "මුල් ගුරුතුමාට කවුරු හරි ගැන තරහ ගිහිල්ලා".

"කොහේ ද?" ටොට්ටෝ චං ඇසුවා ය.

කිසි දිනෙක මුල් ගුරුතුමා කෝප වූ බවක් ඇය අසා නො තිබුණි. ඇයට පුදුමෙනුත් පුදුමයි. ඕව් ද පුදුමයට පත් ව සිටියේ ය. එතරම් ම වේගයෙන් දිවැවිත් මේ බව ඇයට කීවේ ඒ නිසා ය.

"එයාලා ඉන්නේ කුස්සියේ" ඕව් කීවේ ය. ඔහු ගේ පියකරු ඇස්, පුළුල් නාසා පුඩු මහත් වී තිබිණ.

"යමු යමු."

ටොට්ටෝ චං ඕව් ගේ අත ගෙන මුල් ගුරු නිවාස වෙත දිව ගියා ය. එය රැස්වීම් හලට යාව තිබිණ. එය පාසල් වත්තේ පසු දොරටුව පැත්තේ පිහිටා තිබිණ. ටොට්ටෝ චං මලවළට වැටුණු දිනයේ ඇය මේ කුස්සිය හරහා නාන කුටියට කැඳවා ගෙන ගොස් පිරිසිදු කරනු ලැබුවා ය. එසේ ම මුල් ගුරුතුමා ගේ කුස්සියේ දී ය, සිසුනට දිවා ආහාරයට පිරිනැමීම සඳහා මුහුදෙන් යමක් සහ කන්දෙන් යමක් පිළියෙල කරන ලද්දේ.

ළමයින් දෙදෙනා කුස්සිය අසලට පිය මනින විට වැසුණු දොරෙන් ඔවුනට ඇසුණේ, මුල් ගුරුතුමා ගේ කුපිත ස්වරයයි. "තකහෂිට වල්ගයක් තියෙනවා කියලා හිතා නොබලා කීවේ ඇයි?"

තරවටුව ඔවුන් ගේ පන්ති ගුරුතුමියටයි. "ඒක මම බරපතළ විදියට හිතුවේ නෑ. ඒ වෙලාවේ එයා දුටුවාම මට පෙනුණේ, බොහොම දඟයෙක් විදියට" ඇය පිළිතුරු දෙනු ඔවුනට ඇසිණි.

ඒ වුණාට කියපු එකේ බරපතළ කම ඔයාට තේරෙන්නෙ නැද්ද? මම තකහෂි ගැන දක්වන උනන්දුව ඔයාට තේරුම් කරල දෙන්න මා ළඟ වචන නෑ" මුල් ගුරුතුමා පවසනු ඇසිණ.

එදින උදාසන පන්තියේ සිදු වූ දේ ටොට්ටෝ චංට සිහි විය. මුල දී වල්ගා තිබුණු මිනිසුන් සිටි බව ඇය ළමයින්ට කියා දෙමින් සිටියා ය. ළමයි එය විනෝදයක් කර ගත්හ. මේ කතාව ඇනුමැත්තන් විසින් පරිණාම වාදය හඳුන්වා දීමට යොදා ගෙන තිබුණෙකි. එය ඇඩි ලෙස ළමයින් ගේ සිත් ඇද ගත්තේ ය.



හැම කෙනකුට ම වල්ගයේ සලකුණක් වන කුඩා ඇටයක් (අනුත්‍රිකාස්ථිය) ඇතැයි ගුරුතුමිය කීවා ය. පන්තිය මහ හඬින් ඇළලී ගියේ ය. අන්තිමේ දී ගුරුතුමිය විහිළුවට මෙන්, "කාට හරි වල්ගයක් ඇනුත් තියෙන්න පුළුවන්. තකහෂි, ඔයාට කොහොම ද"යි ඇසුවා ය.

තකහෂි වහා ම නැඟී සිටියේ ය. අනුකම්පාව උපදවන හඬින් අවධාරණයෙන් හිස වනා, මෙසේ කීවේ ය. "නැහැ මට එහෙම එකක් නැහැ."

මුල් ගුරුතුමා පවසන්නේ මේ ගැන බව ටොට්ටෝ චංට වැටැහිණ. දැන් මුල් ගුරුතුමා ගේ හඬෙහි තිබුණේ තරහට වඩා දුකෙකි. "ඒක ඔයාට වුණා නම්, කොහොමද? තකහෂිට ඒ ගැන මොනවා හිතෙන්න ඇද්දැයි ඒ අනුව හිතන්න."

ගුරුතුමිය ගේ පිළිතුර ළමයින්ට නො ඇසිණ. වල්ගය ගැන මුල් ගුරුතුමාට මෙතරම් තරහ ගියේ ඇයි දැයි ටොට්ටෝ චංට තේරුම් ගත නොහැකි විය. මුල් ගුරුතුමා තමාට වල්ගයක් තියෙනවා දැයි අසනවා නම් ඇය කැමැති ය.

ඇත්ත වශයෙන් ම ගුරුතුමිය ගේ වරදක් ඇයට නො පෙනිණ. එබඳු ප්‍රශ්නයක් ඇසීම වරදක් නො වේ. කෙසේ වුව ද තකහෂි ගේ වැඩීම නැවැතී තිබුණි. මුල් ගුරුතුමා එය දැන සිටියේ ය. තකහෂිට හොඳින් කළ හැකි ඉසව්ව ක්‍රීඩා දිනයට ඔහු යොදා තිබුණේ ඒ නිසා ය. තකහෂි වැන්නන් තමන් ගැන සිත කරදර වීම වැළැක්වීමට ය, නාන ඇඳුම් රහිත ව තටාකයේ පිහිනීමට ඔහු අවසර දී තිබුණේ. තකහෂි, යසුවාකි චං වැනි සිරුරේ අඩුපාඩු තිබුණු ළමයින්ට උදවු වන විධියේ ඕනෑ ම දෙයක් කිරීමට ඔහු පුලපුලා සිටියේ ය. අනෙකුත් අයට වඩා තමා පහත් ය යන හැඟීම ද වෙනත් මානසික ගැටලු ද ඇති විය හැකි කිසිවක් සිදු නො වීමට ඔහු වග බලා ගත්තේ ය. තකහෂි වැනි අයකු කෙතරම් නැණවත් වුව ද, එබන්දකු ගෙන් මෙබඳු අමන ප්‍රශ්නයක් අසන්නේ කෙසේ දැයි ඔහුට තේරුම් ගත නො හැකි විය.

ඒ පන්තිය අසලින් ගමන් කරද්දී ඒ ප්‍රශ්නය අසනු මුල් ගුරුතුමාට අහම්බෙන් ඇසී ඇත.

පන්ති ගුරුතුමිය වැලැපෙනු ඇයට ඇසිණ. "ඒක මම කරපු බරපතළ වැරැද්දක්. තකහෂිට කනගාටුව පළ කිරීමට මම මොනවද කරන්න ඕනෑ?" ඇය ඇසුවා ය.

මුල් ගුරුතුමා කිසිත් නො පැවැසී ය. ටොට්ටෝ චංට වීදුරු දොරින් ඔහු නො පෙනිණි. ඔහු වෙත ළං වීමට ඇයට අවශ්‍ය විය. ඒ ගැන වගතුග නොදත් නමුත්, කිසි දිනකට වඩා ඔහු කෙරේ මනාපයක් ඇය තුළ ඇති විය. ඔවට ද එසේ දැනෙන්නට ඇත.

මුල් ගුරුතුමා පන්ති ගුරුවරියට දොස් කීවේ අනෙකුත් අයත් සිටින ගුරු කාමරයේ දී නොව, මුළුතැන් ගෙහි දී ය. එහි වැදගත්කම ඇයට කිසිදාක අමතක නො වී ය. වචනයේ නියම අරුතින් ම ඔහු අධ්‍යාපනඥයකු බව පැහැදිලි ය. ඇයට මේ බව තේරුම් ගියේ බොහෝ කලකට පසු ව ය. ඔහු ගේ වචන මෙන් ම හඬ ද ඇය ගේ මතකයේ සදා රැඳී තිබිණ.

එය වසන්තය විය. එය ටොමෝවෙහි ඇගේ දෙවන වසන්තයයි. ටොට්ටෝ චං ගේ දෙවන වසර ඇරඹුණේ මේ වසන්තයේ දී ය.

## ටොමෝවෙහි ඇගේ දෙවන වසර

පාසල් බිමෙහි සියලු ගස් වැල්වල නිල් වන් දළු මෝදු වෙමින් තිබිණ. පාත්ති, මලින් වැසෙන්නට පටන් ගැනුණි. ටොමෝවේ සිසුන් ගේ සුව දුක් විමසන්නට මෙන්, ජලජ පුෂ්පයෝ දිය මතින් හිස් එසැවූ හ. ලතාවෝ බිම පුරා ඇදී යන ලෙසින් ඉක්මනින් වැඩී ගිය හ. චෙරි කැකුළු සුමුදු පවනෙහි සැලෙමින් පිපීමට සංඥාව ලැබෙන තුරු පොරොත්තු ව සිටියෝ ය.

පිහිනුම් තටාකය අසල කුඩා සිවුරැස් පොකුණුවල රන් වන් අඳුන් වන් මස්සු සතුටෙන් ඉපිළ දිය තුළ පිහිනා ගියහ.

සියල්ල නවමු ලෙස දිලිසෙද්දී එය වසන්තය යැයි වෙසෙසින් හඳුන්වා දීමක් අවශ්‍ය නො වී ය. සියලු දෙනාට ම එය වසන්තය බව පැහැදිලි විය.

ටොට්ටෝ චං කැටුව මව ටොමෝවට ආවේ, හරියට ම මෙයට වසරකට පෙර දී ය. දිනපතා වැඩෙන දොරටුවක් ද, දුම්රිය මැදිරියෙක පන්තියක් ද දැක ඇය විස්මිත වූයේ, සතුටෙන් එහි මෙහි දුව පැන්නේ, සොසාකු කොබායාෂි මුල් ගුරුතුමා තමන් ගේ මිතුරකු වූයේ මෙකල බව ඇයට නිසැක ය. ටොට්ටෝ චං සහ ඇගේ පන්ති සගයෝ දෙවන ශ්‍රේණියේ සිසුන් ලෙස ලද අලුත් තත්ත්වය ගැන උදම් වූ හ. ටොට්ටෝ චං සහ ඇගේ සගයන් පරිදි ම කුතුහලයෙන් වට පිට බලමින් පළමු වන ශ්‍රේණියේ නව සිසුහු දැන් දැන් පැමිණෙමින් සිටිති.



එය ටොට්ටෝ චංට කාර්ය බහුල වසරක් විය. හැම උදයක් ම උදා වන තුරු ඇය නොතිත් වූවා ය. ඇය දැනුත් විදි සංගීත කරුවන්ට කැමැති ය. නමුත් තවත් බොහෝ අයවලුන්ට ප්‍රිය කිරීමට ඇය ඉගෙන සිටින්නී ය. අහේතුකව පාසලෙන් නෙරපුණු සිඟිති දැරිය ටොමෝවට අගනා දැරියක ලෙස දැන් වැඩෙයි.

ටොමෝවේ අධ්‍යාපනය ගැන සමහර මාපියන්ට වැරදි මත තිබුණි. දූව මේ පාසලට ඇතුළු කිරීමෙන් තමා කළේ නිවැරදි දේ දැයි ඇතැම් විට, ටොට්ටෝ චං ගේ මාපියන්ට පවා සැක ඇති විය. කොබයාෂි මහතා ගේ අධ්‍යාපන ක්‍රමය මතුපිටින් බලා අනුමානයෙන් තක්සේරු කළ ඇතැම් මාපියෝ තම දරුවන් පාසලින් අස් කර ගැනීමට පවා සිතූ හ. එහෙත් සිසුහු කිසි ම කෙනෙක් ටොමෝව අත්හැර යාමට කැමැති නො වූ හ. එබඳු සූදානමක දී ඔවුහු හඬා වැටී එයට නො කැමැත්ත පළ කළහ. මේ නිසා එක ද සිසුවෙක් ටොමෝවෙන් ඉවත් නො වී ය. එහෙත් ටොට්ටෝ චං ගේ පන්තියට වඩා එක් වසරකින් ඉහළ පන්තියක සිසුවෙක් මුල් ගුරුතුමා ගේ පසු පස එල්ලී ගෙන, දෙකොපුල් රූරා වැගිරෙන කඳුළු පිරි දෙනෙතින් යුතු ව, දණ හිස් තුවාල වන තුරු පෙරළෙමින් අස්වීමේ නො කැමැත්ත පළ කළේ ය. හැඬීමෙන් මුල් ගුරුතුමා ගේ දෙ ඇස් ද රතු ව තිබුණි. අන්තිමේ දී දරුවා මාපියන් විසින් ඇද ගෙන යනු ලැබිණ. එසේ යද්දීත් ඔහු විටින් විට පාසල දෙස බලා කැරකෙමින් අත් සලමින් වැලැපුණේ ය.

එබඳු සංවේගදායක දේ සිදු වූයේ ඉතා ම කලාතුරෙකිනි. ටොට්ටෝ චං දැන් මෙහොතක් පාසා විස්මිත සතුට පතා සිටින දෙවන ශ්‍රේණියේ දැරියකි. මේ වන විට, ඇගේ පාසල් මල්ල තම පිටට හොඳින් හුරු ව තිබුණි.

# හංස විල

'හංස විල' නම් වූ ඉගි නළුව නැරඹීම සඳහා ටොට්ටෝ චං හිබියා හලට කැඳවා ගෙන යනු ලැබුවා ය. කදිම සංගීත කණ්ඩායමක් වාදනයේ නියුතු වූහ. ඇගේ පියා වයලීනය වැයී ය. මේ ඇය ඉගි නළුවක් නැරඹීම සඳහා ගිය මුල් වතාව ය. දිදුලන කිරුළක් හිසෙහි පැළැඳ සිටි හංස රජින සැබෑ හංසයකු මෙන් ආයාසයෙන් තොර ව අහසේ පාවී යනු ඇයට දැකිය හැකි විය. හංස රජින සමඟ පෙමින් වෙළුණු කුමරා අන් සියල්ලන් පලවා හැරියේ ය. අන්තිමේ දී හංස යුවළ ඉමහත් සතුටින් රඟූ හ. සංගීතය ද ටොට්ටෝ චංට තියුණු වින්දනයක් ඇති කළ අතර, ආපසු නිවසට ගිය පසු ව පවා, ඒ ගැන නො සිතා සිටීමට ඇයට අපහසු විය. ඇය පසු දින උදාසන පිබිදි වහා ම හිසවත් නො පීරා මව සිටි මුලුතැන් ගෙට ගොස් මෙසේ කීවා ය: "මීට පස්සේ ඔත්තු කරුවෙක්වත් වීදි සංගීත කරුවෙක්වත්, ටිකට් විකුණන්නෙක්වත්, වෙන්න මට වුවමනා නෑ. හංස විලේ නටන කෙනෙක් වෙන්න තමයි මට ඕන කරන්නේ."

"ඔව්....." මව පුදුම වූවා ය.

ටොට්ටෝ චං ඉගි නළුවක් නැරඹූ පළමු වතාව එය වුව ද, ඉතා පියකරු ලෙස රඟුමෙහි සමත් 'ඉසදෝරා ඩන්කන්' නමැති ඇමෙරිකානු නිළිය ගැන බොහෝ දේ ඇය මුල් ගුරුතුමා ගෙන් අසා තිබුණි. කොබයාෂි මහතාට මෙන් ම, ඉසදෝරාට ද ඩැල්ක්‍රෝස් ගේ බලපෑම් ලැබී තිබුණි. එය ටොට්ටෝ චංට සෑහෙයි. කිසිදාක ඇගේ රඟුම් දැක නැත ද, ඇය හොඳින් ම හඳුනතැයි ටොට්ටෝ චංට සිතිණ. ඉගි නළුවෙක රැඟීම එබැවින් ඇයට අමුතු දෙයක් නො වේ.

ටොමෝවේ රිද්ම චලන ඉගැන්වූ කොබයාෂි මහතා ගේ මිතුරකුට අයත් රඟහලක් තුදුරෙහි තිබිණ. ටොට්ටෝ චං පාසලින් පසු ව එහි ඉගෙනීම සඳහා මව කටයුතු යෙදුවා ය. මේ මේ දෙය කළ යුතු යැයි මව කිසි දිනක ඇයට බල නො කළා ය. නමුත් ටොට්ටෝ චංට යමක් කිරීමට ඇවැසි වූ විට ප්‍රශ්න ඇසීමෙන් වැළැකී එයට එකඟ වී ඒ සඳහා කටයුතු සලසා දුන්නා ය.



හංස විලෙහි රඟන්නට යම් දිනෙක හැකි වන පැතුම් ඇති ව, ටොට්ටෝ චං එහි ඉගෙනුම ඇරඹුවා ය. නමුත් ගුරුවරයාට ඔහු ගේ ම විශේෂ ක්‍රම තිබුණි. ටොමෝවේ දී කරන ලද රිද්ම චලනවලට අමතර ව, පියානෝවේ සහ ග්‍රැමෆෝනයේ සංගීතයට අනුව චලනය වීමට ද ඔහු සිසුන් මෙහෙයවී ය. ෆූජි කන්ද නගින සැදැහැවතුන් ගැයූ, 'දිලෙන්න ගිරි මුදුනේ-පුප්පු කර මා අත් බැව්" යන යැදුමෙන් උපුටා ගත් "දිලෙන්න ගිරි මුදුනේ" වැනි කියමන් ඔහු මුවෙහි නිතර ම රැව් දුන්නේ ය. හදිසියේ ම ගුරුතුමා 'සැරසෙන්' කියමින් ළමයින් යම් ඉරියව්වක නිසල ව සිටින විට "ආ ආව්" වැනි උද්වේගකාරී හඬක් නගමින් තමා ද යම් ඉරියව්වක නිසල ව සිටී. දැතින් ම හිස අල්ලා ගෙන නැමී සිටින අසරණයකු ගේ හෝ ස්වර්ගය දෙස බලා යාඥා කරන සැදැහැවතකු ගේ හෝ ඉරියව්වෙන් ඔහු සිටිනු විය හැකියි.

කෙසේ වුවද ටොට්ටෝ චං ගේ මනසේ මල් පල ගෙන තිබුණේ දිලෙන කිරුළක් පැළැඳ සුදෝ සුදු ඇඳුමෙන් සැරසුණු හසඟනකි. එය 'ගිරි මුදුනෙහි දිලෙන්නකු' හෝ 'ආආව්' වැන්නක් නො වී ය.

දිනක් ටොට්ටෝ චං දිරිය උපදවා ගෙන ගුරුතුමා වෙත ගියා ය. පිරිමියකු වුව ද ඔහුට රැළි සහිත දිගු කෙස් වැටියක් තිබිණ. ඇය අත් දෙපසට විහිදා හංසයකු ගේ තටු මෙන් සැලුවා ය. "අපි කවදා හරි මේ වගේ කරන්නේ නැද්ද?" ඇය ඇසුවා ය.

ගුරුතුමා විශාල වටකුරු ඇස් සහ තුඟු නාසා ඇති කඩවසම් අයෙක් විය. "අපි ඒ වගේ නැටුම් මෙහේ කරන්නේ නෑ" ඔහු පැවැසී ය.

එයින් පසුව ටොට්ටෝ චං ඒ පුහුණු හලට යාම අත් හැර දැම්මා ය. ඇය හිතෙන හිතෙන ඉරියවු දැක්වීමට ද පාවහන් රහිත ව දුව පැනීමට ද බොහෝ කැමැති බව සැබෑවකි. නමුත් දිලිසෙන සිඟිති කිරුළක් පැළැඳීමට ඇයට අවශ්‍ය ව තිබිණ.

"හංස විල කදිමයි. ඒත් මට ඕනෑ කරන්නේ ඒ ඒ අයට සිතෙන අන්දමට නටන්නට ඉඩ සැලැස්වීමටයි" ගුරුතුමා පැවැසී ය.

මේ ගුරුතුමා ගේ නම 'බාකු ඉෂි' බවත් ඔහු 'නිදහස් ඉගි නළුව' ජපානයට හඳුන්වා දුන්නා පමණක් නො ව, මේ පෙදෙසට 'ජියුගාවෝකා' (නිදහස් කන්ද) යන නම ලැබුණේ ඔහු

නිසා බවත් ටොට්ටෝ චං වසර ගණනාවක් ගත වන තුරු දැන නො සිටියා ය. ඒ සියල්ලට ම අමතර ව, එවකට පනස් වියට එළඹ සිටි ඔහු නිදහස් ලෙස රැඟුමෙහි සතුට ටොට්ටෝ චංට ද ලබා දීමට වෑයම් කළේ ය.

## ගොවි ගුරුතුමා

"මේ අද ඔයාලා ගේ ගුරුතුමා. එයා නොයෙක් අන්දමේ වැඩ ඔයාලට පෙන්නාවි," මුල් ගුරුතුමා නව ගුරුතුමා හඳුන්වා දෙමින් කීවේ ය. ටොට්ටෝ චං ඔහු දෙස හොඳින් බැලුවා ය. ඔහු ගුරුවරයකු ලෙස හැඳ පැළඳ නො සිටියේ ය. ඔහු කමිසයට පිටතින් කෙටි පටි සහිත කපු පිළියෙන් කළ වැඩ කබායක් හැඳ සිටියේ ය. ගෙලෙන් පහළට එල්ලෙන කර පටිය වෙනුවට, උරය මත තුවායක් විය. අඬ දමන ලද පටු පාවලින් යුතු අවරිය පැහැ කලිසමක් ඔහු හැඳ සිටියේ ය. සපත්තු වෙනුවට රබර් අඩි සහිත කම්කරු මේස් පැළැඳ සිටි ඔහු ගේ හිසෙහි දිරා ගිය පන් කොළ තොප්පියක් විය.

කුහොන්බුත්සු විහාරයේ පොකුණ අසල සියලු සිසුහු රැස් ව සිටියෝ ය.

'ගුරුවරයා' දෙස ඇස් යොමු කළ ටොට්ටෝ චංට ඔහු දුටු විරූ අයකු බව හැඟිණ. "කොහේදිද?" ඇය සිතුවා ය. ඔහු ගේ කාරුණික මුහුණ හිරු රැසින් තැවී රැලි ගැන්වී තිබිණ. ඔහු ගේ ළය පෙදෙසෙහි එල්ලෙමින් තිබුණු කළු නූලෙහි බැඳුණු සිහින් පයිප්පය ඇයට දැක පුරුදු ය. හදිසියේ ම සිහිපත් විය.

"ඇළ අයිනේ කුඹුරේ ගොවිතැන් කරන්නේ ඔයා නේද?" ඇය ඔහු ගෙන් විචාළේ සතුටෙනි.

"හරියට හරි," ගුරුතුමා මුහුණ රැලි ගන්වා දසත් පාමින් සිනාසුණේ ය. "කුහොන්බුත්සුවලට එන හැම වාරෙක දීම ඔයාලට මගේ කුඹුර පහු කරන්න සිද්ද වෙනවා. අර අබමල් පිරිල තිබුණේ ඒ කුඹුරෙ තමයි".

"හෝ හෝ! ඔයා අද අපේ ගුරුතුමා වෙන්නයි යන්නේ." ළමයි සතුටින් හඬ ගෑහ.



"නෑ නෑ" මුහුණ ඉදිරියේ දැතට අත් සලමින් ඔහු කීවේ ය. "මම ගුරුවරයෙක් නොවෙයි. මම ගොවියෙක් විතරයි. මේ මුල් ගුරුතුමා මේක මට කරන්න කීවා. එච්චරයි."

"ඔව් ඔව්. මෙයා ඔයාල ගේ ගොවි ගුරුතුමා" ඔහු පසුපස සිටිමින් මුල් ගුරුතුමා කීවේ ය. "කුඹුරක්. වගා කරන්නේ කොහොම දැයි ඔයාලට කියා දෙන්න මෙතුමා කරුණාවන්ත වුණා. ඒක හරියට බක්කරේ කෙනෙක් පාන් පුලුස්සන්න උගන්වනවා වගෙයි" ඊළඟට එතුමා ගොවියා දෙසට හැරී මෙසේ කීවේ ය. "දැන් ළමයින්ට කියා දෙන්න මොකක් ද කරන්න ඕනෑ කියලා. ඔව් අපි පටන් ගනිමු."

ජපානයේ සාමාන්‍ය මූලික පාසලක ගුරුවරයෙක්, ගුරුවරයකු වශයෙන් සුදුසුකම් ලබා සිටිය යුතු වේ. එහෙත් එබඳු කරුණු ගැන කොබයාෂි මහතා කරදර නො වී ය. ඇත්තට ම තරුණු දැකීමෙන් ඉගෙන ගැනීමේ වැදගත් කම ඔහු කල්පනා කළේ ය.

"ඔව්, අපි පටන් ගනිමු" ගොවි ගුරුතුමා කීවේ ය.

ඔවුන් රැස් ව සිටියේ කුහොන්බුත්සු පොකුණ පසුපස ය. මෙය වෙසෙසින් ම නිසල පෙදෙසක් විය. පොකුණ ගසින් සෙවණ වූ ප්‍රියජනක තැනකි. උදලු, ඉස්කෝප්ප ආදි ළමයින් ගේ ගොවි උපකරණ සහිත දුම්රිය මැදිරි අඩක් ගුරුතුමා එහි පිහිටුවා තිබිණ. එය වගා කිරීමට නියමිත බිම් කඩෙහි මැද පියකරු ව පෙනිණ.

මැදිරියෙන් උදලු ඉස්කෝප්ප ගෙන වල් පැළ උදුරන ලෙස ගොවි ගුරුතුමා සිසුන්ට පැවැසී ය. වල් පැළ ගැන සියල්ල ඔහු සිසුන්ට කියා දුන්නේ ය. ඒවා ඉතා කටුක ය. සමහරක් වගාවට වඩා ඉක්මනින් වැඩෙයි. හිරු රැසින් වගාව අවුරයි. හානි කර කෘමි සතුන්ට ඒවා තුළ සැඟවී සිටීමට හැකි ය. පසෙහි පොහොර උරා ගැනීමෙන් ඒවා වගාවට හානි කරයි. මේ කරුණු එකින් එක ඔහු සිසුනට කියා දුන්නේ ය. ඔහු කතා කරද්දී අත නො නැවැතුණේ ය. වල් පැළ උගුලමින් ම ඒවා පැහැදිලි කර දුන්නේ ය. ළමයි ද එසේ ම කරමින් ඔහු කියන දේට සවන් දුන්හ. ඊළඟට උදලු ගාන හැටි, නගුලෙන් හාන හැටි, පෙහොර ඉසින හැටි ආදි කුඹුරු වගාවක දී කළ යුතු සියලු දේ කර පෙන්වමින් විස්තර කළේ ය.

කුඩා සර්පයකු හිස දිගු කොට වැඩිහිටි සිසුවකු වූ තා චං ගේ අතට දෂ්ට කිරීමට ගිය ද එය වළකා ගැනීමට ඔහු සමත් විය. එහෙත් ගොවි ගුරුතුමා ඔවුන් අස්වැසුවේ ය. "මෙහි සර්පයන් විෂ රහිතයි. ඔයාලා උන්ට රිදෙව්වේ නැත්නම්, උන් හපන එකක් නෑ."

කුඹුරක් වගා කරන අන්දම පමණක් නො ව කෘමින් පක්ෂීන්, සමනලයන්, කාලගුණය සහ නොයෙකුත් කරුණු ගැන ඔහු සිසුන්ට කියා දුන්නේ ය කරගැට සහිත ඔහු ගේ ශක්තිමත් අත් ඔහු කී සියල්ල අත්දැකීම මගින් උකහා ගත් කරුණු බවට සාක්ෂි විය.

ගුරුතුමා ගේ උදවු ඇති ව, දහදිය හෙළා, කුඹුර වගාකර අවසන් කිරීමට ඔවුන්ට හැකි විය. හී පහරවල් මදක් ඇද වුව ද, කුමන පැත්තකින් බැලුවත්, එය නිවැරැදි ව වගා කරන ලද කෙතක් ම විය.

එදින සිට සිසුහු ගොවි ගුරුතුමා මහත් ගෞරවයෙන් සැලැකූ හ. ඔහු දුටු ඕනෑ ම මොහොතක "අපේ ගොවි ගුරුතුමා ඉන්නවා"යි ඔවුහු මුර ගාති. ඔහුට පොහොර ටිකක් ඉතිරි වී නම් ඒවා ගෙනැවිත් සිසුන් ගේ කුඹුරේ විසිරැවී ය. දිනපතා එක් අයකු කුඹුරට ගොස් පිරික්සා, එය වැඩෙන අන්දම මුල් ගුරුතුමාට සහ සිසුන්ට වාර්තා කළ යුතු විය. තමන් වපුළ බීජ පැළ වෙද්දී ඇති වන විස්මය සහ සතුට අත් විදීමේ අගනා වරය ඔවුනට ලැබිණ. ඔවුන් දෙතුන් දෙනකු හමු වූ හැම විට ම තම කුඹුරේ වගාවේ ප්‍රගතිය ගැන ඔවුහු කතිකා කළෝ ය.

ලොවෙහි නොයෙක් තන්හි භයානක දේ සිදු වෙමින් තිබිණ. නමුත් තමන් ගේ පුංචි කෙත ගැන කතා කරන හැම මොහොතක ම ඔවුහු සාමය ම වැලැඳ ගත්හ!

## එළිමහන් කුස්සිය

දිනක් පාසල අවසන් වූ පසුව, කිසිවකුට කතා නො කර, "යන්නම්"යි කිසිවකුට නො කියා ටොට්ටෝ චං ජියුගාවෝකා දුම්රිය නැවතුමට ඉක්මනින් පිය මනිමින් සිටියා ය. "හෙණ කඳුරේ එළිමහන් කුස්සිය, හෙණ කඳුරේ එළිමහන් කුස්සිය" ඇය යළි යළිත් මුමුණමින් ගියා ය.



එය සිඟිති දැරියකට අපහසු පාඨයෙකි. 'රකුගෝ' නම් විකට නළුවෙහි සිටින මිනිහා ගේ නම තරම් නම් එය දිග නැත. ළිඳෙහි වැටුණු විට, මුදා ගන්නන්ට නම ඇසෙන්නට පෙර ම ඔහු ගිලී ගියේ, නම එතරම් ම දිග වූ බැවිනි! කෙසේ වුව ද ටොට්ටෝ චංට ඒ පාඨයෙහි දැඩි ලෙස සිත යොමු කර ගෙන සිටීමට සිදු විය. කවර හෙයින් ද යත්, "ජුගෙමු ජුගෙමු" යනුවෙන් ඇරැඹුණු ලෝ පතළ දිගු නම ඇයට ඇසෙන්නට කවුරුන් හෝ කියුවහොත් ඇයට ඒ පාඨය අමතක වී යන්නට ඉඩ ඇති බැවිනි. තව ද මඩ ගොහොරුවකින් එහාට පනිමින් "අපි මෙහෙන් යනවා "යි ඇයට කියැවුණහොත්, එයින් ම පාඨය අමතක වන්නට හැකි බැවිනි. එය ම කටපාඩම් කරමින් යාම හැර අන් කළ හැකි දෙයක් නො වී ය. ඇයට යමක් කීමට නො සිතූ අයට ස්තුති වේවා! සිත් පොලඹවන දෙයක් කෙරෙහි යොමු නො වීමට වෑයම් කළ ඇයට "අර කුමක් ද"යි ඇසීමට පවා හේතුවක් නො මැති ව, තම දුම්රිය නැවැතුමට ළඟා වීමට වරම් ලැබුණේ ය. එහෙත් දුම්රිය නැවැතුම පසු කරත් ම ඇය හඳුනා ගත් අයෙක්, "හා, ආපසු යනවා ද"යි ඇසුවේ ය. ඇය පිළිතුරු දීමට පෙලැඹී, සිත අවුල් වනු ඇතී අත වනා නිහඬ ව ම ගියා ය.

ඇය නිවසෙහි බිහිදොර වෙත ළඟා වූ වහා ම, තමාට නැංවිය හැකි ඉහළ ම හඬින් මෙසේ කියා ගෙන ගියා ය. "හෙණ කඳුරේ එළිමහන් කුස්සිය" මෙය තේරැවිල්ලක් ද, නො එසේ නම්, රොතින්වරුන් හතලිස් හත් දෙනා ගේ සාමූහික විලාපයක් දැයි මව විපිළිසර වූවා ය. සැබෑව ක්‍රමයෙන් පැහැදිලි වන්නට විය. ජියුගාවෝකාවට දුම්රිය නැවැතුම් පොළවල් තුනකට එහා, තොදොරෝකී නැවැතුම අසල, 'තොදොරෝකී කිකෝකු' හෙවත් 'හෙණ කඳුර' නම් සුපතළ සුන්දර ස්ථානයක් සංචාරකයන් ගේ නෙත සිත ඇද ගෙන තිබිණ. පැරැණි ටෝකියෝවෙහි ඉතා ම උත්සව පූර්ණ ස්ථානය වූ එහි දිය ඇල්ලක්, ගඟුලක් සහ මනරම් වනගහනයක් විය. එළිමහන් කුස්සිය යන්නෙහි අරුත නම් සිසුන් එහි ගොස් උයමන් කරනු විය යුතු ය. ළමයින්ට කොතරම් අමාරු පාඨයක් දැයි ඇය පුදුම වූවා ය. නමුත් ළමයින් ගේ රුචිය ඇල්වුවහොත් ඕනෑ ම දෙයක් ඉගෙනීමට ඔවුන්ට හැකි වන බව එයින් පැහැදිලි විය.

දුෂ්කර පාඨයෙන් අත් මිදෙන්නට හැකි වූ වහා ම සියලු අදාළ විස්තර එකිනෙක අනුපිළිවෙළින් ඉදිරිපත් කිරීමට ටොට්ටෝ චං සමත් වූවා ය. ඊළඟ කිවිදින උදයෙහි සියලු ම

ළමයින් පාසලේ රැස්විය යුතු ය. බත් වළඳක්, ඇතිලියක්, හාල් හුණ්ඩුවක් සහ කෑම කූරු ගෙන යා යුතු ය. උයනු ලැබූ විට හාල් හුණ්ඩුව දෙගුණයක් වන බව මුල් ගුරුතුමා පවසා තිබිණ. ඔවුන් මස් සූපයක් ද සැකැසීමට බලාපොරොත්තු වන බැවින් ඌරුමස් සහ එළවළු ටිකක් ද වුවමනා ය. සවස තේ සඳහා අතුරුපසක් ද කැමැති නම් ගෙන ආ හැකි ය.

ඊළඟ දින කීපය තුළ ටොට්ටෝ චං මව ගේ ඇඟෙහි දැවැටෙමින් කුස්සියේ ම ගත කළා ය. ඇය පිහියෙන් කපන හැටි, බඳුන් අල්ලන හැටි, බත් බෙදන හැටි බලා සිටියා ය. එහෙත් ටොට්ටෝ චං වඩාත් අසා කලේ "ඕ... ඒක උණුයි" කියමින් ඇතිලි පියනක් වැනි උණුසුම් යමක් එසැවූ වහා ම, මව ඇගේ මහපට ඇඟිල්ල සහ දබරැඟිල්ලෙන් කන් පෙත්ත අල්ලා ගත් ආකාරයටයි.

"එහෙම කරන්නේ කන් පෙති සීතල නිසයි" මව පැහැදිලි කළා ය. මව ගේ තන්වැසි නුවණ ටොට්ටෝ චං පුබුදු කළේ ය. මුලුතැන් අත්දැකීමෙහි ලා ඇගේ පරිණත බවට ඒ සිද්ධිය සාක්ෂි දැරී ය. "හෙණ කඳුරේ එළිමහන් කුස්සියේ දී' මම ඒකත් කරන්න ඕනෑ"යි ඇය තමාට ම කියා ගත්තා ය.

නියමිත කිව්දින උදා විය. දුම්රියෙන් බැස, ඔවුන් හෙණ කඳුරට සැපත් වූ විට, මුල් ගුරුතුමා වන පෙතෙහි රැස් වූ ළමයින් පිරික්සා බැලුවේ ය. ඔවුන් ගේ ආදර බර මුහුණු, තුඟු තුරු තුළින් පෙරී ආ හිරු රැසෙහි දිලිණ. පිම්බුණු උරපොදි සහිතව, මුල් ගුරුතුමා කියන දේ අසනු සඳහා ඔවුහු නොතිත් ව බලා සිටියෝ ය. ලෝ පතළ දිය ඇල්ල මිහිරි රිද්මයෙන් රැලි නංවමින් ඔවුන් ඉදිරියේ පතිත විය.





"හොඳයි. දැන් අපි කාණ්ඩවලට බෙදෙන්නට ඕනෑ. ගුරුතුමන්ලා ගෙනැවිත් ඇති ගඩොළුවලින් ලිප් තනා ගන්න ඕනෑ. සමහර අයට කඳුරෙන් හාල් සෝදලා බත ඉදෙන්න තියන්න පුළුවන්. ඊට පස්සේ සුප් එක තනන්න පුළුවන්. ඔව, දැන් අපි පටන් ගනිමුද?"

"ගල, කොළ, කතුර" ක්‍රීඩාව මගින් ළමයි කාණ්ඩවලට බෙදුණෝ ය. පණස් දෙනා කාණ්ඩ හයකට අයත් වූහ. වළවල් හාරා ඒ වටා ගඩොළු ලිප් සකසන ලදි. වළං රැඳවීම සඳහා යකඩ දඬු රඳවන ලදි. සමහරු ඒ අතර වනයෙන් දර රැස් කළහ. සමහරු කඳුරෙහි සහල් සේදීමට ගියහ. ළමයි සියලු කටයුතු තම තමන් අතර බෙදා ගත්හ. එළවළු කැපීම සහ මස් සූපය භාර ව සිටීමට ටොට්ටෝ චං කැමැති වූවා ය. ඇයට වඩා දෙවසරකින් වැඩි පිරිමි ළමයකුට ද එළවළු කැපීම භාර ව තිබිණ. ඔහු වුවමනාවට වඩා විශාල සහ කුඩා කැබැලිවලට ඒවා කපමින් කාරිය අවුල් කලේ ය. මහන්සි ව වැඩ කළ ඔහු ගේ නාසයෙන් දහදිය බිඳු වැගිරිණ. මව ගේ ආදර්ශය අනුව ගිය ටොට්ටෝ චං ඉතා හොඳින් එළවළු කැපුවා ය. සිසුන් විසින් ගෙනෙන ලද වම්බටු, අර්තාපල්, ලූනු, බර්ඩොක් අල ආදිය කෑමට සුදුසු නියම ප්‍රමාණයට කැපුවා ය. මීට අමතර ව වම්බටු පෙති ගසා කුඩා කැබැලිවලට කපා, අච්චාරුවක් දැමීමට ද ඇය ඉදිරිපත් වූවා ය. තමාට වඩා වැඩිමහල් ළමයින් පවා තම පැවැරුම අවුල් කර ගත් විට, ඇය ඔවුනට නිසි උපදෙස් දුන්නා ය. තමා මවක බවට පත් ව සිටිතියි ඇයට හැඟිණ. හැම දෙනා ම ඇගේ අච්චාරුව ප්‍රිය කළහ.

"මටත් මොනවා හරි හදන්න පුළුවන් දැයි බලන්න මට හිතුණා." ඇය පැවැසුවා ය.

මස් සූපය රස ගැන්වීමේ කාරිය ගැන හැම අය ගෙන් ම අදහස් විමසන ලදි. "හරි, හරි ඕන විදියක්" කණ්ඩායම් තුළින් ප්‍රීති ඝෝෂා නැගිණ. එම ගොසට විහඟ නද ද එක් විය. එකල්හි හැම බඳුනකින් ම දිව සලිත කරන සුවඳක් හමා ගියේ ය. ආහාර උයනු සරසනු නිවනු මෙයට පෙර බොහෝ ළමයි දැක නො සිටියහ. ඔවුන් පුරුදු ව සිටියේ මේසයට තැබූ යමක් ගිල දැමීමට පමණි. යමක් තමන් ම උයා ගැනීමත්, ඉවීමේ දී මුහුණ දෙන ගැටලුත්, එහි දී ආහාර ද්‍රව්‍යවල ඇති වන වෙනස් කමුත් යන මේ සියල්ල ඔවුන්ට නව අත්දැකීම් උදා කළේ ය.

කණ්ඩායම්වල ඉවීම් කටයුතු නිමා විය. සියලු දෙනාට ම වටයට සිටිය හැකි තණනිල්ලක් මුල් ගුරුතුමා විසින් සොයා ගන්නා ලදි. ඒ ඒ කණ්ඩායම ඉදිරියේ බත් බඳුනක් සහ සූප බඳුනක් තබන ලදි. හදවතෙහි ඇඳී තිබුණු අවසන් පිරික්සුම නො කොට, තම කණ්ඩායමේ සූප් බඳුන ගෙන යාමට ටොට්ටෝ චං ඉඩ නො දුන්නා ය. පියන ඔසවා, "ඕ... ඒක උණුයි" තමාට ම කියා ගෙන දැතේ ඇඟිලි කන් පෙති වෙත ගෙන ගියා ය. එයට පසුව ය, ඇය පැවැසුවේ, "හරි දැන් ඒක ගෙනියන්න පුළුවන්" කියා. මේ සිදුවන්නේ කුමක් දැයි විස්මයෙන් බලා සිටි සිසුන් වෙතට ඊට පසුව ඒ බඳුන ගෙන යනු ලැබිණ. ඔවුන් කිසිවකු එයින් විස්මිත නොවුව ද, ටොට්ටෝ චං බොහෝ සේ තුටු වූවා ය.

සිසුහු "හපන්න, හපන්න, හොඳ හැටි හපන්න" යන ගීතය ගයා "ස්තුතියි, මම පටන් ගන්නම්" කියා කවුරුත් වතය තුළ නිහඬ වූ හ. ඇල්ලේ හඬ මිස අන් කිසිවක් නො ඇසිණි.

## "ඔයා හරිම හොඳ ළමයෙක්"

"දන්නවද? ඔයා හරිම හොඳ ළමයෙක්".

ටොට්ටෝ චං දුටු හැම විටෙක දී ම මුල් ගුරුතුමා කී වචනයි. එසේ කී හැම විටෙක ම ටෝට්ටෝ චං සිනා සී මදක් උඩ පැන, "ඔව්, මම හොඳ ළමයෙක් තමයි" කියයි. ඇය එසේ ම විශ්වාස ද කළා ය.

නොයෙක් අතින් ඇය යහපත් දැරියක් විය. ඇය හැම දෙනාට ම, විශේෂයෙන් ම ආබාධිත මිතුරු මිතුරියන්ට බොහෝ සේ කරුණාවන්ත වූවා ය. ඇය හැමවිට ම ඔවුන් වෙනුවෙන් පෙනී සිටියා ය. අන් පාසල්හි සිසුන් නපුරු වචන කිවහොත් එබඳු හිංසකයන්ට එරෙහි ව සටන් කළා ය. ඒවා බොහෝ විට ඇගේ හඬා වැටීමෙන් කෙළවර වීම වෙන ම කරුණකි. තුවාල වූ සතකු හමු වුවහොත් ඌ රැක ගැනීමට කළ හැකි සියල්ල කළා ය. එසේ ම ගුරුවරුන් නිතර ම පුදුමයට පත් කළ කරුණක් වූයේ, අමුතු දෙයක් දුටු සැණින් ම, තම කුතුහලය සංසිඳවා ගැනීමට ඇය උත්සුක වූ තරමයි.



උදේ රැස්වීමට යන විට, කොණ්ඩා කරල් තම දැත පිටු පසින් සකස් කර ගැනීම වැනි දෑ ඇය කරයි. වරක් පන්ති කාමරය ඇමැදීම ඇයට නියම වූ දිනයෙක ඇගේ තියුණු නෙතට ලක් ව බිමෙහි සවි වී තිබුණු පියනක් හැර කුණු සියල්ල ඒ තුළට ඇමුවා ය. එය දුම්රියක් ලෙස භාවිත වූ සමයෙහි එයට සවි වී තිබුණ යන්ත්‍ර කොටස් පිරික්සුම සඳහා මේ විවරය යොදා ගෙන තිබුණි. ඇයට පියන ආපසු වැසීමට නොහැකි වූයෙන් සියල්ලෝ කරදරයට පත් වූ හ. කොකුවල මස් එල්ලන්නේ කෙසේ දැයි දිනක් කිසිවෙක් ඇයට කියා දුන්නේ ය. ඇය අභ්‍යාස සඳහා පාසලේ භාවිත කැරෙන උස ම දඬුවෙහි එඩා එක් අතකින් එල්ලී සිටියා ය. බොහෝ වේලාවක් එසේ සිටින විට, ගුරුවරයෙකු දැක ඇය කරන දේ විමැසූ විට, "අද මම මස් කෑල්ලක් වෙලා"යි හඬ ගා කීවා ය. එසේ කියත් ම දණ්ඩ අත හැරී බිම ඇද වැටුණා ය. එයින් ඇගේ පෙනහලු පීඩාවට පත් ව, මුළු දවස ම කතා කළ නොහැකි ව සිටියා ය. ඇය මලවළට පැන්නේ ද මේ අවධියේ දී ය.

නිතර ම ඇය එබඳු දේ කිරීමෙන් පීඩාවන්ට මුහුණ දුන්නා ය. නමුත් කිසි දිනක මෙවැන්නක් ගෙදරට දන්වා නො යැවිණි. අනෙක් සිසුන් පිළිබඳ ව වුවත් එය එසේ ම විය. ඒ ඒ කාරණය අදාළ සිසුවාටත් මුල් ගුරුතුමාටත් සීමා විය. ටොට්ටෝ චං පැමිණි මුල් දවසේ පැය හතරක් පුරා ඇයට සවන් දුන් පරිදි ම යම් සිදුවීමක් ගැන සිසුවාට කීමට ඇති සියල්ල අසා සිටීමට ඔහු සැදි පැහැදී සිටියේ ය. ඔවුන් ගේ නිදහසට කරුණු සියල්ල ඔහු ඉවැසීමෙන් අසා සිටියේ ය. සිසුවා ඇත්තට ම නුසුදුසු දෙයක් කර තිබුණේ නම් සහ ඔහු එය පිළිගනී නම් "දැන් සමාව ගන්නැ"යි එතුමා පවසනු ඇත.

ටොට්ටෝ චං ගේ කටයුතු සම්බන්ධයෙන් අන් මාපියන් සහ ගුරුවරුන් විසින් යොමු කෙරුණු පැමිණිලි මුල් ගුරුතුමා ගේ කනට ද ගියේ ය. ඔහුට ඉඩක් ලද හැම විට ම "ඔයා හරිම හොඳ ළමයෙක්"යි පැවැසුවේ එබැවිනි. වැඩිහිටියකුට ඒ කියමන ඇසුණේ නම්, 'හරිම' යන වචනය බර තැබූ අන්දම ඔහු අවබෝධ කර ගනු ඇත.

ටොට්ටෝ චංට අවබෝධ කරවීමට මුල් ගුරුතුමාට අවශ්‍ය වූයේ මෙවැන්නකි. "බොහෝ අතින් ඔබ හොඳ ළමයකු නො වෙතියි සමහරුන් සිතන්නට ඉඩ තිබේ. නමුත් ඔබ ගේ සැබෑ

චරිතය නරක නැත. එහි යහපත් තැන් බොහෝ ය. මම එය හොඳින් ම දනිමි." අහෝ! ඔහු ඇත්තට ම අදහස් කළ දේ අවුරුදු ගණනාවකට පසු ව ය, ඇයට හොඳින් අවබෝධ වූයේ. ඔහු අදහස් කළ දේ තේරුම් නො ගිය නමුත්, මුල් ගුරුතුමා ගැඹුරු විශ්වාසයෙන් යුතු ව, "හොඳ ළමයා"යි කීවේ ය. අසංවර ක්‍රියාවක දී පවා ඔහු ගේ වදන ඇගේ හදවතේ පිළිරැව් දිනි. එබඳු විටෙක, "දෙය්යෝ සාක්කි"යි ඇයට ඉබේ ම කියැවිණ.

ටොමෝවෙහි සිටි මුළු කාලය තුළ කොබයාෂි මහතා නැවත නැවතත් එසේ කීවේ ය. ඒ වැදගත් වචන ඇගේ මුළු ජීවිතය ම තීරණය කළා විය හැකි ය. "දන්නවද ඔයා හරිම හොඳ ළමයෙක්."

## ඔහු ගේ මනාලිය

ටොට්ටෝ චං බොහෝ සේ දුක් වූවා ය.

ඇය මේ වන විට හිටියේ තුන් වන ශ්‍රේණියේ ය. ඇය තායි චංට බොහෝ සේ ඇලුම් කළා ය. ඔහු යහපත් ය. විද්‍යාවට දක්ෂ ය. ඔහු ඉංග්‍රීසි උගත්තේ ය. 'නරියා' යන්නට සමාන ඉංග්‍රීසි වචනය ඇයට කියා දුන්නේ තායි චං ය.

"ටොට්ටෝ චං ඔයා දන්නවද? 'නිත්සුනේ' කියන වචනයට සමාන ඉංග්‍රීසි වචනය? ඒ තමයි 'ෆොක්ස්'" ඔහු ඇයට කීවේ ය.

"ෆොක්ස් ?"

මුළු දවස පුරා ඒ වචනයේ ශබ්දයෙන් ටොට්ටෝ චං වශීකෘත ව සිටියා ය. එයින් පසුව දිනපතා ම පන්ති මැදිරියට පැමිණි විගස ඇය කරන ප්‍රථම කාරිය වූයේ, තායි චං ගේ පාට පෙට්ටියේ සියලු පැන්සල් තම පෑන පිහියෙන් හැකි තරම් හොඳට උල් කර තැබීම ය. ඇය තමා ගේ පැන්සල් ගැන එසේ උනන්දු නුවූ අතර, ඇතැම් විට ඒවා දතින් කඩා තුඩ පාදා ගත්තා ය.

එසේ තිබිය දීත් තායි චං ඇයට රළු ලෙස කතා කළේ ය. එය සිදු වූයේ ආහාර ඉසුඹුවක දී ය. අර කමකට නැති මලවළ පිහිටි රැස්වීම් හල පසු පස ඇය අලස ව ඇවිද යමින් සිටියා ය.

"ටොට්ටෝ චං"



තායි චං ගේ කටහඬ ඇසී ඇය තිගැස්සී නැවැතුණා ය. හුස්මත් නිහඬ ව සිට, ඔහු මෙසේ කීවේ ය. "ඔයා කොච්චර හිටත් මම ලොකු වුණාම ඔයාව කසාද බඳින්නේ නෑ!" එසේ කියමින් බිම බලාගෙන ඔහු ඉවත ගියේ ය.

ඇය අන්දුන් කුන්දුන් වූවා ය. ඔහුත් ඔහු ගේ විශාල හිසත් නො පෙනී යනතුරු ඇය බලා උන්නා ය. මොළයෙන් පිරුණු ඒ හිස ඇය බොහෝ සේ අගය කළා ය. ශරීරයට වඩා විශාල ව පෙනුණ ඒ හිස නිසා ළමයින් ඔහුට කීවේ 'විසම භාගය' කියා ය.

ටොට්ටෝ චං අත් සාක්කුවල දමා ගෙන කල්පනා කළා ය. ඔහු කුපිත කිරීමට තමා කළ කිසිවක් ඇයට මතක් කර ගත නො හැකි ය. අසරණ වූ ඇය තම පන්ති සගයකු වූ මියෝ චං සමග මෙය පැවැසුවා ය. "ඇයි නැත්තේ? අද සුමෝ පොරයේ දී ඔයා තායි චං වටයෙන් පිටට විසි කළා නේද? පිටට විසි වී ගියේ ඔහු ගේ හිස ඒ තරම් බර නිසා වෙන්න ඇති. ඒ වුණාට එයා තාමත් ඔයාට පිස්සු වැටිලා ඇති!" මියෝ චං කීවා ය.

ටොට්ටෝ චං මුළු හදින් ම දුක් වූවා ය. "ඔව් එහෙම වෙන්න ඕනෑ. දිනපතාම පැන්සල් උල් කරලා දීපු මම වැඩියෙන් ම ආසා කරපු කොල්ලා පැරදවූයේ ඇයි? නමුත් දැන් ප්‍රමාද වැඩි"යි. ඇයට කිසි දාක ඔහු ගේ මනාලිය විය නො හැකි ය.

"මා හැමදාමත් එයාගේ පැන්සල් උල් කරනවා" ඇය තීරණය කළා ය. "මොනවා වුණත් මම එයාට ආදරෙයි."



## "පරණ කැත ඉස්කෝලෙ"

මූලික පන්තිවල සිසුන් අතර ජනප්‍රිය ගායන පාඨයක් තිබුණි. ටොට්ටෝ චං ගේ කලින් පාසලේ ළමයි එය බොහෝ සේ ගැයූවෝ ය. පාසල ඇරී නිවසට යාමට පිටත් ව, උරයට ඉහළින් තම පාසල දෙස ආපසු බලා ඔවුහු සාමූහික ව මෙසේ කියති:

"අකමත්සු ඉස්කෝලෙ - පරණ කැත ඉස්කෝලෙ
ඒ වුණත් එහි ඇතුළ - හොඳ ම හොඳ ඉස්කෝලෙ"

අන් පාසල්වල සිසුහු පාසල පසුකර යද්දී අකමත්සු පාසල දෙසට ඇඟිල්ල දිගු කර මෙසේ කියති.

"අකමත්සු ඉස්කෝලෙ - හොඳ ම හොඳ ඉස්කෝලෙ
ඒ වුණත් එහි ඇතුළ - පරණ කැත ඉස්කෝලෙ"

ඔවුන් අවසන් කරන්නේ රළු හඬකිනි.

පළමු වන පේළියේ දී පරණ හා කැත වුව ද හොඳ ම හොඳ වුව ද එයින් කියැවුණේ, ගොඩනැඟිල්ල අලුත් ද පරණ ද යන්න පමණෙකි. ගායනයේ වැදගත් අංගය වූයේ දෙවන පේළියයි. පාසලේ ඇතුළු පැත්ත කෙසේ දැයි එයින් කියැවිණ. පාසලක් පිටතට කැතට පෙනෙන බව පළමු පේළියෙන් කියනු ලැබීම ඒ නිසා ගැටලුවක් නො වේ. වැදගත් වූයේ ඇතුළත කෙසේද යන්නයි. මේ ගායනය නිතර ම කරන ලද්දේ සිසුන් පස් හය දෙනෙකු විසිනි.

දිනක් පාසල් වේලාවෙන් පසු ව සවස් භාගයේ, ටොමෝ සිසුහු ක්‍රීඩා කරමින් උන්හ. පාසල් බිමෙන් පිට විය යුතු බව හැඟැවෙන අවසන් සීනුව නාද වන තුරු ඔවුනට කැමැති ඕනෑ ම දෙයක් කිරීමට අවසර තිබේ. නිදහස් ව සිටින විට ළමයින්ට කැමැති ඕනෑ ම දෙයක් කිරීමට අවසර තිබිය යුතු යැයි මුල් ගුරුතුමා අදහස් කළේ ය. ඒ නිසා මේ කාල ඡේදය අන් මූලික පාසල්වලට වඩා මේ පාසලේ දීර්ඝ විය. එදින සමහරු පන්දු ගැසුවෝ ය. සමහරු දඬු මත හෝ වැලි පෙට්ටියෙහි 'කිලිටි සෙල්ලම්' කළෝ ය. සමහරු පාත්තිවල මල්වලට සාත්තු කළහ.



සමහර වැඩිමහල් සිසුවියෝ පියගැට මත හිඳ අල්ලාප සල්ලාපයෙහි යෙදුණහ. සමහරු ගස් නැඟුණෝ ය. සියල්ලෝ තම තමන් රිසි දේ ම කළහ. ටොට්ටෝ චං වැනි කීප දෙනෙක් දිය බඳුන් උණු කරමින් නළ මඟින් විද්‍යා පිරික්සුම්වල නිරතව පන්ති මැදිරිය තුළ ම උන්හ. සමහරු පොත්ගුලෙහි කියැවූහ. සතුන් රිසි අමදරා ඔහු සොයා ගත් වල් බළලකු පිරික්සමින් ඌ පෙරළා කන් තුළට නෙත් යොමු කළේ ය. සියල්ලෝ තමතමන් කැමැති දේ කිරීමෙන් සතුටු වූහ.

හදිසියේ ම පාසලට පිටතින් විශාල ගායනයක් ඇසුණේ ය:

"ටොමෝවේ ඉස්කෝලෙ - පරණ කැත ඉස්කෝලෙ
ඒ ලෙස ම එහි ඇතුළ - පරණ කැත ඉස්කෝලෙ"

"ඒක හරිම දරුණු කීමක්" ටොට්ටෝ චං සිතුවා ය. ඈ වහා ම දොරටුව වෙත දිව ගියා ය. ඇත්තට ම එය දොරටුවක් නොව, වැඩෙමින් පැවැති රුක් දෙකෙකි. ඔවුන් කී දේ ඇයට හොඳින් ඇසුණි. පාසලේ ඇතුළතත් පිටතත් කැත යැයි කීම ගැන ඇය කුපිත වූවා ය. අනෙක් අය ද කුපිත ව දොර දෙසට දිව ආහ. අන් පාසලේ ළමයි "පරණ කැත ඉස්කෝලෙ"යි යළිත් කීහ. ඒ අමිහිරි වචන සමඟ ම ඔවුහු දිව ගියහ. කෝපාවිෂ්ට වූ ටොට්ටෝ චං ඒ ළමයින් පසුපස දිව ගියා ය. සෙස්සෝ ඇය පසුපස වූ හ. ඉතා වේගවත් වූ අන් පාසලේ ළමයි ඇසි පිය හෙළන සැණින් දිව ගොස් වීදි අතර සැඟැවී ගියහ. මහත් තැවුලෙන් යුතු ව ඇය ආපසු පාසලට පැමිණියා ය. ඇය මෙසේ ගැයුවා ය:

"ටොමෝවේ ඉස්කෝලෙ - හරි පුදුම ඉස්කෝලෙ"
පියවර කීපයක් තබා ඇය නැවතත් මෙසේ කීවා ය.
"පිටත මෙන් ඇතුළතත් - හරි පුදුම ඉස්කෝලෙ"

මේ ගැයුමට ඇය කැමැති වූවා ය. එයින් ඇයට අස්වැසුමක් ලැබිණ. එබැවින් ඇය ආපසු, අන් පාසලකින් පැමිණි අයකු ලෙස පෙනී සිටිමින් වැට තුළින් අන් අයට ඇසෙන සේ මහ හඬින් මෙසේ කීවාය:

"ටොමෝවේ ඉස්කෝලෙ - හරි පුදුම ඉස්කෝලෙ
පිටත මෙන් ඇතුළතත් - හරි පුදුම ඉස්කෝලෙ"

කෙළි බිමෙහි ක්‍රීඩා කරමින් සිටි ළමයින්ට ඒ කවුරු දැයි හඳුනා ගැනීමට මුල දී අපහසු විය. ඒ ටොට්ටෝ චං බව දැන ගත් විට, ආපසු පාරට දිව විත් ඇයට එකතු වූහ. අන්තිමේ දී ඔවුහු අතිනත අල්ලා ගෙන පාසල අවට මාර්ගවල මහ හඬින් ගයමින් ගමන් කරන්නට වූ හ. එකල නො තේරුණ ද මෙහි හඬ එක් වුණාටත් වඩා ඇඩි ලෙස ඔවුන් ගේ හදවත් යාවී තිබුණේ ය. පාසල වටා තවතවත් යත් ම එහි අරුතට ඔවුහු වඩ වඩාත් ඇතුළු වූ හ.

"ටොමෝවේ ඉස්කෝලෙ - හරි පුදුම ඉස්කෝලෙ
පිටත මෙන් ඇතුළතත් - හරි පුදුම ඉස්කෝලෙ"

ඔවුන් ගේ ගායනය පාසලේ කාර්යාලයේ හිඳ ගෙන අසා සිටි මුල් ගුරුතුමාට කෙබඳු සතුටක් ඇති කළේ දැයි ඇත්තට ම ඔවුහු නො දත්හ.

වෙසෙසින් දරුවන් ගැන ම සිතා පසලක් පවත්වන ඔනෑ ම අධ්‍යාපනඥයකුට ඒ සතුට උරුම ය. එවැන්නකු දිනපතා මුහුණ දෙන පීඩා නිමක් නැත. සියල්ල අමුතු ම අමුතු ය. ටොමෝව පිළිබඳ ව සැලැකුවහොත් එය වඩාත් සත්‍ය වේ. වඩාත් සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයකට හුරු වී සිටින පිරිස් වෙතින් එල්ල වන විවේචනවලින් ගැලවීම පහසු නොවේ.

මේ වටපිටාව තුළ, සිසුන් හඬගෑ ගීය මුල් ගුරුතුමාට පිරිනැමිය හැකි අගනා ම තුටු පඬුර විය.

"ටොමෝවේ ඉස්කෝලෙ - හරි පුදුම ඉස්කෝලෙ
පිටත මෙන් ඇතුළතත් - හරි පුදුම ඉස්කෝලෙ"

එදා අවසාන සීනුව නාද වන විට, කල් පමා වී තිබුණි.

## කොණ්ඩා පටිය

දිනක් අහර කිස නිමවා රැස්වීම් හලේ උඩ පනිමින් සිටිය දී ටොට්ටෝ චංට මුල් ගුරුතුමා හමු විය. දිවා ආහාරය ගන්නා මුළු



කාලය තුළ එතුමා ඔවුන් සමඟ සිටි බැවින් ඇයට මුල් ගුරුතුමා දැන් හමු වී යැයි කීම යුතු නො වෙයි. එහෙත් ඇය හමු වී යැයි කිව හැක්කේ එතුමා ඇයට මුහුණ ලා පැමිණි හෙයිනි.

"ෂා ඔයා ඉන්නවාද? මට ඔයාගෙන් අහන්න දෙයක් තියෙනවා" මුල් ගුරුතුමා කීවේ ය.

මුල් ගුරුතුමාට යම් තොරතුරු ලබා දීමට හැකි වීමෙන් සතුටට පත් ඇය "ඒ කුමක් දැ"යි ඇසුවා ය.

"මේ කොණ්ඩා පටිය ඔයා ගත්තේ කොහෙන්ද?" ඇගේ හිසෙහි පැළැඳ සිටි කොණ්ඩා පටිය පෙන්වමින් එතුමා ඇසුවේ ය.

එය ඇසූ විට ඇගේ මුහුණෙහි ඇඳී ගියේ පහන් පෙනුමක් නො වේ. ඇය පෙරේදා සිට මෙය පළඳියි. ඒ ඇය ම සොයා ගත්තෙකි. පටිය වඩා හොඳින් බලා ගත හැකි වන පරිදි ඇය මුල් ගුරුතුමා අසලට ම ගියා ය.

"ඒක තිබුණේ මගේ නැන්දගෙ පරණ පාසල් නිල ඇඳුමෙ" ඇය සාඩම්බර ලෙස කීවා ය." "ඒක එයා ලාච්චුවක දමද්දී මම දැක්කෙ. එයා මට දුන්න. මම බොහොම සෝදිසිය ඇති කෙනෙක්ය කියලත් එයා කිව්වා."

"ආ.... එහෙමද?" මුල් ගුරුතුමා සිතුවිල්ලේ ගිලී ඇසුවේ ය.

ටොට්ටෝ චං කොණ්ඩා පටිය ගැන උදම් වූවා ය. නැන්දා බැලීමට ගිය අන්දමත් ඇය තම ඇඳුම් වියළමින් සිටිනු දැකීම වාසනාවක් වූ බවත් ඇය කීවා ය. ඒ ඇඳුම් අතර, ඇය පාසල් යද්දී අඳින ලද පැරණි මෝස්තරයේ දම් පැහැ දිගු සායක් තිබූ බවත් කීවා ය. නැන්දණිය එය ඉවත තබන විට, එහි පියකරු යමක් තිබෙනු ටොට්ටෝ චං දුටුවා ය.

"ඒ මොකක්ද නැන්දෙ?" ඇය ඇසුවා ය. ඒ ප්‍රශ්නයෙන් නැන්දණිය නිහඬ වූවා ය. එය සායෙහි බඳ පටියේ පිටු පසට මසා තිබුණු රිබන් පටියක් විය.

"පිටුපසින් ලස්සණට පෙනෙන්නයි, ඒක අල්ලලා තියෙන්නෙ," නැන්දණිය කීවා ය. "ඒ කාලේ අතින් මහපු රේන්දයක් හරි නැත්නම් ගැටයක් විදියට සකස් කළ රිබන් පටියක් හරි මේ විදියට අල්ලන එක සිරිතක් වුණා."

ටොට්ටෝ චං එයට කොතරම් කැදර දැයි ඇයට පෙනිණ. "මම මේක නැවත අඳින්නේ නැහැ. ඒ හින්ද ඒක මම ඔයාට දෙන්නම්" ඇය කීවා ය.

ඇය කතුර ගෙන එය අල්ලා තිබූ නූල් කපා වෙන් කරගෙන ඇයට පිරිනැමුවා ය. එය ඇයට ලැබුණේ එසේ ය. ඇත්ත වශයෙන් එය ඉතා පියකරු විය. ඉතා පුළුල් රිබන් පටියක් වූ එය අගනා සේදවලින් නිමවා තිබිණ. රෝස මල් ආදි විසිතුරු මෝස්තර එහි ගොතා තිබිණ. එසේ ම ගැට ගැසූ විට, නො හැකිළි ගැටයක් එයින් සැකසී තිබිණ. එය රටින් ගෙනෙන ලද්දකැයි නැන්දණිය කීවා ය.

ඇය කතා කරමින් විටින් විට හිස සලද්දී ඒ පටියෙන් නැඟුණු සර සර හඬ මුල් ගුරුතුමාට ඇසුණේ ය. ඇගේ කතාවට සවන් දුන් මුල් ගුරුතුමා නො ඉවැසිලිමත් බවක් පෙන්වී ය.

"ෂා එහෙමද? මේ වගේ කොණ්ඩා පටියක් එයාටත් ඕනය කියලා ඊයේ මියෝ චං මට ඇවිටිලි කළා. මම ජියුගාවෝකාවේ සියලුම සාප්පුවලට ගිහින් බැලුවා. මේ වගෙ එකක් තිබුණේ නෑ. මේක රටින් ගෙනාපු එකක්ද?" මුල් ගුරුතුමා විමැසී ය.

එතුමා ගේ වත මුල් ගුරුතුමකු ගේ නො ව දුව ගේ කන්නලව්වෙන් හිරිහැරයට පත් පියකු ගේ වැනි විය. "ටොට්ටෝ චං මේ රිබන් පටිය ඉස්කෝලෙට එන කොට බඳින්නේ නැත්නම් මම ඔයාට හුඟක් ස්තුතිවන්ත වෙනවා. මියෝ චං මේ ගැන මට හරියට කරදර කරනවා. ඒක ඔයාට හිරිහැරයක්ද?" එතුමා පැවැසී ය.

ටොට්ටෝ චං තව දුරටත් සිතා බැලුවා ය. ඇය දෙඅත් බැඳගෙන නිසල ව සිට පිළිතුරු දුන්නා ය. "හරි හරි, මීට පස්සෙ මම ඒක බඳින්නෙ නැහැ."

"බොහොම ස්තුතියි" මුල් ගුරුතුමා කීවේ ය.

කනගාටුදායක වුව ද මුල් ගුරුතුමා කරදරයට පත් ව සිටි නිසා ඇය එකඟ වූවා ය. වැඩිහිටියකු, විශේෂයෙන් ම මුල් ගුරුතුමා එවැන්නක් සෙවීමට දරා ඇති වෙහෙස ගැන කම්පාවට පත් වූවා ය. ටොමෝවේ සැටි එසේ ය. වයස නො සලකා හැම කෙනෙකු ම අන් අය ගේ ගැටලු තේරුම් ගෙන උදවු කිරීම ටොමෝවේ පිළිවෙළයි. එබැවින් එසේ කිරීම අරුමයක් නො වේ.



පසුදින ටොට්ටෝ චං පාසල් ගිය පසු ව, ඇය ගේ කාමරය පිරිසිදු කිරීම සඳහා එහි ඇතුළු වූ මවට දුව ගේ ප්‍රියතම සුරතලා ගේ ගෙලෙහි ඒ කොණ්ඩා පටිය බැඳ තිබෙනු දක්නට ලැබිණ. හදිසියේ ම එය පැළැඳීම අත් හළේ ඇයි? මව විස්මිත වූවා ය. හදිසියේ ම විසිතුරු ලෙස සරසනු ලැබූ ඇගේ දුඹුරුවන් ටෙඩි වලසා එයින් හිරිහැරයට පත් වී ඇති සැටියක් පෙනිණ.

# තුවාල ලද්දන් බැහැදැකීම

ජීවිතයේ පළමු වන වරට ටොට්ටෝ චං රෝහලකට ගියා ය. ඒ තුවාල ලත් සෙබළුන් බැහැදැකීමට ය. නොයෙකුත් මූලික පාසල්වලින් තෝරා ගැනුණු සිසුන් තිහක කණ්ඩායමකට ඇය ද ඇතුළත් වූවා ය. අන් සිසුන් කිසිවකු ඇය නො හැඳින්නා ය. එය මැතක දී ජාතික වශයෙන් සංවිධානය කැරුණු වැඩ සටහනක් විය. ඒ ඒ පාසලින් සිසුන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු තෝරා ගැනුණු නමුත් ටොමෝව වැනි කුඩා පාසල්වලින් තෝරා ගැනුණේ එක් සිසුවකු පමණි. එක් පාසලක ගුරුතුමියක් මුළු කණ්ඩායම භාර ව ගියා ය. ටොමෝවෙන් තෝරාගෙන තිබුණු එක ම සිසුවා ටොට්ටෝ චං වූවා ය.

භාර ව ගිය ගුරුතුමිය උපැස් පැළැඳි කෙසඟ සිරුරකින් යුතු කෙනෙක් වූවා ය. සිසු කණ්ඩායම රෝහලේ වාට්ටුවකට කැඳවනු ලැබූ හ. සුදු පිජාමාවෙන් සැරසුණු සෙබළ පහළොස් දෙනෙක් එහි වූ හ. සමහරු යහන් මත ද සමහරු ඇවිදිමින් ද සිටිය හ. ඔවුන් ගේ සොබාව දැකීමෙන් ටොට්ටෝ චංට දුකක් ඇති විය. ඔවුන් සමහරුන් ගේ හිස් වෙළුම් පටිවලින් වසා තිබුණ ද ඔවුන් සිනාසෙමින් අත් ඔසවා අචාර කළ විට ඇගේ සිතට සහනයක් ඇතිණ.

ගුරුතුමිය සිසුන් වාට්ටුව මැදට කැඳවා සෙබළුන් ඇමැතුවා ය. "අපි ඇවිත් සිටින්නේ ඔබතුමන්ලා බලන්නයි" සිසුහු පෙරට නැමී ආචාර කළහ. "අද මැයි පස් වැනිදා, පිරිමි ළමයින් ගේ දවස. ඒ නිසා අපි කාපි මසුන් ගේ ගීතය ගායනා කරමු."

සංගීත කණ්ඩායම් නියමුවකු මෙන් ඇය දෑත් එසැවූවා ය. සිසුන්ට මෙසේ කීවා ය. "දැන් සූදානම් වන්න. හරි, තුනයි, හතරයි...." ඇය තාලය ඇල්ලුවා ය. එකිනෙකා නො හැඳින සිටිය ද ඔවුහු මුළු හදින් එකතු ව ගයන්නට වූ හ.

"පියසී මුහුදු වෙතින් නැඟී
වලා මුහුදු වෙතින් නැඟී...

ටොට්ටෝ චං ගීතය නො දත්තා ය. ටොමෝවෙහි මෙබඳු ගීත උගන්වනු නො ලැබේ. ගීය ඇසීමෙන් සතුටු වූ බව නො පෙන්වූ කාරුණික මුහුණකින් යුතුව හිඳ ගෙන සිටි සෙබළකු ගේ ඇඳෙහි අයිනක ඇය හිඳ ගත්තා ය. ගීතය අවසන් වූ පසු ව, "අපි දැන් බෝනික්කන් ගේ උත්සවය සම්බන්ධ ගීය කියමු"යි ගුරුතුමිය පවසා සිටියා ය. ටොට්ටෝ චං හැර අන් සියල්ලෝ එය මනරම් ලෙස ගැයූ හ.

"එන්න දල්වන්න පහන්
එකින් එක දල්වන්න පහන්..."

නිහඬ ව සිටිනු මිස ටොට්ටෝ චංට කළ හැකි දෙයක් නො වී ය. සිසුන් ගැයුම අවසන් කළ පසු ව පිරිස අත් පොළසන් දුන්හ. ගුරුතුමිය සිනාසී "ඊළඟට මොකක්ද? අස් පොව්වා වෙළඹ සමඟ... කවුරුත් එකට හා, පටන් ගන්න. තුනයි හතරයි...." කියමින් තාලය තැබීම ඇරැඹුවා ය.

ටොට්ටෝ චං එය ද නොදත්තාය. ගැයීම අවසන් කළ විට, ඇය හිඳසිටි ඇඳේ සෙබළා "ඔයා සින්දු කියන්නේ නැද්ද"යි ඇගෙන් ඇසුවේ ය.

ටොට්ටෝ චං ඉතා ම කනස්සලු වූවා ය. ඇය සෙබළුන් බැලීමට පැමිණිය ද ඔවුන් පිනැවීමට එක් ගීයකුදු ගැයීමට නො හැකි විය. ඇය ඇඳෙන් බැස විත් මඳක් ඈතින් සිට "දැන් මම සින්දුවක් කියනවා"යි නො බිය ව පැවැසුවා ය.

සැලැසුමට අයත් නො වන යමක් සිදු වෙන්නට යන බව ගුරුතුමියට පෙනුණි. "මොකක්ද ඔයා කියන්න යන සින්දුව?" ඇය විමැසුවා ය. ඇය ගැඹුරු හුස්මක් ගෙන ගැයුම ඇරැඹුවා ය. එහෙත් මඳක් නැවැතුණා ය.

තමා ටොමෝව වෙනුවේන් ආ නිසා, ඒ පාසලේ ජනප්‍රිය ම ගීතය ගැයිය යුතු යැයි ඇයට සිතුණි. ගැඹුරු හුස්ම නැවත ගෙන ඇය ඇරැඹුවා ය.



"හපන්න, හපන්න හොඳ හැටි හපන්න
කන විට සියල්ල හපන්න......"

සමහර ළමයි සිනාසුණහ. "මොකක්ද ඒ ගීය? මොකක් ද ඒ ගීය?" සමහරු ළඟ සිටි අය ගෙන් ඇසූ හ. ගුරුතුමිය තාලය තැබීමට උත්සාහ කළ ද කළ යුතු දේ පැහැදිලි නැති නිසා අත් ඔසොවා ගෙන ම සිටියා ය. ටොට්ටෝ චං අවුලට පත් වුව ද සියල්ල ගැයුවා ය.

"බත් මාළු මස් අවුළු
හප හපා හප හපා, හප හපා බුදින්න."

අවසන් කොට පෙරට නැමී ඇය ආචාර කළා ය. සෙබළා ගේ දෑසින් කඳුළු වැගිරෙනු හිස ඔසවන ඇයට පෙනිණ. තම පියාට වඩා මඳක් වැඩිමහලු වයසෙහි සිටි සෙබළා ඇය ගේ හිස අත ගා "ඔයාට ස්තුතියි" කීවේ ය.

ඇය ගේ හිස අතගාමින් සිටි ඔහුට හැඬුම නවතා ගත නො හැකි විය. ඔහු සැනැසීමට දෝ ගුරුතුමිය මෙසේ පැවැසුවා ය. "මේ රණ විරුවන් වෙනුවෙන් අපි ලියලා තියෙන රචනා කියවන්න දැන් වෙලාව හොඳයි කියලා මම හිතනවා".

සිසුහු තමතමන් ලියූ රචනා පිළිවෙළින් කියැවූ හ. ටොට්ටෝ චං ඇගේ සෙබළා දෙස බැලුවා ය. ඔහු ගේ දෙනෙත් සහ නැහැය රතු වී තිබිණ. ඔහු සිනාසුණේ ය. "එයා හිනා වෙනවා. මට හරිම සතුටුයි" ඇය තමාට කියා ගත්තා ය.

ඒ සෙබළා ගේ ඇසට කඳුළු ඉනුවේ ඇයි? ඒ ගැන දන්නේ ඔහු ම පමණි. ඔහුට ටොට්ටෝ චං වැනි දුවක සිටිනු විය හැකි ය. ටොට්ටෝ චං තමාට හැකි ඉහළ ම අයුරින් මිහිරි ලෙස ගැයුවා ඔහු සිත ඇද ගත්තා විය හැකි ය. සියලු ම දෙනා කුසගින්නේ සිටින දිනය වැඩි ඈතක නො වන බව දැන සිටි ඔහුට, "හොඳ හැටි හපන්න"යි ඇය කියූවත් හපන්නට දෙයක් නැති වන බව පෙනී සංවේගයට පත් වූවා ද විය හැකි ය. මේ දරුවන් කොතරම් ඉක්මනින් කෙබඳු භයානක සිදු වීම්වලට මුහුණ දෙනු ඇත් දැයි සිතා මුසුප්පු වූවා විය හැකි ය.

රචනා කියවමින් සිටි සිසුන්ට ඒ ගැන කිසිම හැඟීමක් නො වී ය. එහෙත් පැසිෆික් යුද්ධය හොඳින් කෙරෙමින් තිබුණි.

## සුවතා පොත්ත

ගෙලෙහි එල්ලී තිබුණු දුම්රිය බලපත, තමා හොඳින් හඳුනන දොරටු රක්නාට පෙන්වා ජියුගාවෝකා දුම්රිය නැවැතුමෙන් ටොට්ටෝ චං නික්මුණා ය.

ඉතා ම සිත් කාවදින දෙයක් සිදු වෙමින් තිබිණ. පැදුරෙක කඳු ගසා තිබුණු ගස් පොතු බව පෙනුණු කැබැලි රැසක් පසුපස තරුණයෙක් පලග බැඳ සිටියේ ය. ඔහු දෙස බලා ගත් පස් හය දෙනෙක් ඒ වටා සිට ගෙන උන්හ. "ෂා මේ බලන්න, මේ බලන්නයි" ඔහු කී නිසා එතැනට යාමට ටොට්ටෝ චං ද තීරණය කළා ය. ඇය නවතිනු බලා ඔහු මෙසේ කීවේ ය. "සනීපය තමයි, මේ අයට හුගක්ම වැදගත් වෙන්නෙ. උදේ අවදි වූ හැටියෙම තමන්ට සනීපද නැද්ද කියලා දැන ගත්තොත් කොච්චර අගේද? මේ පොත්ත, තියෙන්නේ ඒකට තමයි. උදේ නැගිට්ට හැටියෙම මේ පොත්තෙන් ටිකක් හපන්න. ඒක තිත්ත නම් ඔයාට සනීප නෑ. තිත්ත නැත්නම් කිසිම අසනීපයක් නෑ. ඔයාලාට ලෙඩක් තියෙනවාද නැද්ද කියන මේ පොතු කෑල්ලකට වියදම් වෙන්නේ සෙන් විස්සක් විතරයි. ඔය මහත්මයා පොඩ්ඩක් හපලා බලන්න."

කෙසඟ අයකුට පෙති කැබැල්ලක් දෙමින් ඔහු කීවේ ය.

"මට පේන්නෙ... ඒක ටිකක්... අඅ... තිත්ත වගෙයි"

තරුණයා උඩ පැන, කතා කර ගෙන යන්නට විය. "මහත්මයා, ඔබට මොකක් හරි අසනීපයක් තියෙනවා. පරිස්සම් වෙන්න ඕනෑ. ඒත් බය වෙන්න කාරි නැහැ. ඒක බරපතළ නෑ. ඔබ කිව්වේ ඒක ටිකක් තිත්ත වගෙයි කියලා නේ. එහායින් ඉන්න නෝනා කරුණාකර ටිකක් හපලා බලනවද?" බඩු මල්ලක් අතැති ව සිටි කාන්තාව විශාල පොතු කැබැල්ලක් හපා බැලුවාය. "මේක කිසිම තිත්තක් නෑ." ඇය සතුටින් කීවා ය.

"මම ඔබතුමීට සුබ පතනවා. ඔබතුමී ඇත්ත වශයෙන්ම හොඳ සනීපෙන් ඉන්නෙ." කියූ ඔහු හඬ උස් කළේ ය. "ලාබායි, ලාබායි, සෙන් විස්සයි, සෙන් විස්සයි, හැමදාම උදේට සැප සනීප බලා ගන්න සුවතා පොත්ත සෙන් විස්සයි. ලාබායි ලාබායි."



දුඹුරුවන් පොතු කැබැල්ලක් හපා සුවතාව පිරික්සා ගන්නට ටොට්ටෝ චංට ද අවශ්‍ය වුවත් ඒ ගැන කීමට ලජ්ජා වූවා ය. "ඉස්කෝලේ ඇරෙන තුරුම ඔයා මෙතන ඉන්නවාදැ"යි ඇය ඔහු ගෙන් ඇසුවා ය.

සිඟිති පාසල් ඇරිය දෙස බැලූ තරුණයා "ඔව් ඔව්, නොවැරදීම ඉන්නවා"යි කීවේ ය. පොත් මල්ල පිටෙහි වේගයෙන් හැපෙද්දී ටොට්ටෝ චං වහවහා පාසල වෙත දිව ගියා ය. පාසල පටන් ගැනීමට පෙර ඉටු කරගත යුතු කාරියක් ඇති බැවින් ඇයට පමා විය නො හැකි ය. පන්ති මැදිරියට ඇතුළු වූ විට සගයන් ගෙන් ඇසීමට දෙයක් ඇයට තිබුණි.

"කාට හරි පුළුවන්ද, මට සෙන් විස්සක් ණයට දෙන්න?"

එහෙත් කිසිවකු ළඟ හෝ සෙන් විස්සක් නො වී ය. විශාල සීනි බෝල පැකැට්ටුවක් වුව ද එකල සෙන් දහයකට මිල දී ගත හැකි විය. විශාල ම මුදලක් නුවුවත් කිසිවකු ළඟ සෙන් විස්සක් නො වී ය.

"මම තාත්තාගෙන් අහන්නද?" මියෝ චං ඇසුවා ය. ඇය මුල් ගුරුතුමා ගේ දියණිය වීම මෙබඳු අවස්ථාවල විශාල ම සහනයක් විය. ඔවුන් ගේ නිවස රැස්වීම්හලට යාබද ව තිබිණ. ඒ නිසා ඇගේ මව ද පාසලේ ජීවත් වූවා වැනි ය.

"ඒක ඔයාට දෙන්න පුළුවන් කියලා තාත්තා කියනවා" අහර ඉසුඹුවේ දී මියෝ චං කීවා ය. "ඒ වුණාට ඒ මොකටද කියලා දැන ගන්න ඕනලු."

ටොට්ටෝ චං කාර්යාලයට දිව ගියා ය.

"ඔයාට සෙන් විස්සක් ඕනෑ නේද?" උපැස් අතට ගනිමින් මුල් ගුරුතුමා විමැසුවේ ය. "ඇයි මේ හදිසියේම සල්ලි ඕනෑ වුණේ?"

"ඕනෑම කෙනෙක් සනීපෙන්ද අසනීපෙන්ද කියලා දැන ගන්න පුළුවන් වෙන පොතු කෑල්ලක් ගන්නයි ඒක ඕන වුණේ." ඇය සැණෙන් පිළිතුරු දුන්නා ය. මුල් ගුරුතුමා ගේ කුතුහලය වැඩිණ.

"කොහේද, ඒව විකුණන්නෙ?"

"කෝච්චි ඉස්ටේසම ඉස්සරහ." ඇය වහා ම පිළිතුරු දුන්නා ය.

"හොඳයි, හොඳයි ඔයාට ඕන නම් එකක් ගන්න. මටත් ඒක හපල බලන්න ඉඩ දෙනව නේද?"

ඔහු කබායෙහි සාක්කුවෙන් පසුම්බිය ගෙන, සෙන් විස්සක් ටොට්ටෝ චං ගේ අල්ලෙහි තැබුවේ ය.

"බොහොම ස්තුතියි" ඇය කීවා ය. "මම අම්මා ගෙන් ඉල්ල ගෙන මේ මුදල ආපහු දෙනවා. අම්මා නිතර ම පොත් ගැනීමට මට සල්ලි දෙනවා. මට මොනවා හරි ගන්න ඕනෑ වුණාම මම කලින් සල්ලි ඉල්ලන්න ඕනෑ. ඒ වුණාට සුවනා පොත්ත කාටත් වැදගත් නිසා, අම්මා මුදල් නොදී ඉන්නෙ නැති බව මට විශ්වාසයි."

පාසල අවසන් වූ පසු ව, සෙන් විස්ස මිට මොළවා ගෙන ටොට්ටෝ චං දුම්රිය පොළට දිව ගියා ය. තරුණයා ඒ වන විටත් මහ හඬින් තම භාණ්ඩය වර්ණනා කරමින් එහි සිටියේ ය. ටොට්ටෝ චං ගේ අතේ වූ සෙන් විස්ස දැක මුව පුරා සිනාසුණේ ය.

"හොඳ ළමයා, ඔයාගෙ අම්මත් තාත්තාත් හුඟාක් සතුටු වේවි."

"රොකීත් සතුටු වේවි" ඇය කීවා ය.

"කවුද, රොකී කියන්නේ?" ඇයට පොතු කැබැල්ලක් තෝරමින් තරුණයා ඇසී ය.

"ඒ අපේ බල්ලා. ඌ ජර්මන් එඬේර වර්ගයේ".

තරුණයා මොහොතක් නැවැතී මෙසේ කීවේ ය. "බල්ලෙක්? ...ඔව් මම හිතනවා බල්ලෙකුටත් ඒක හරි යාවි. කොහොමත් තිත්ත නම් ඌ ඒකට කැමැති නො වේවි. ඒක තේරුම ඌ අසනීප බව තමයි." අඟලක් පළල් වූ අඟල් හයක් පමණ දිග් වූ පොතු කැබැල්ලක් ඔහු ඇය වෙනුවෙන් තෝරා ගත්තේ ය.

"මෙන්න ඒක. හැම උදේකම විකල බලන්න. ඒක තිත්ත නම් ඔයාට අසනීපයි. නැත්නම් ඔයා හොඳ නිරෝගියි"

පත්තර කඩදාසියක ඔතන ලද අගනා පොතු කැබැල්ල පරිස්සමින් අල්ලා ගෙන ටොට්ටෝ චං ගෙදර ගියා ය. ඇගේ පළමු කාරිය වූයේ එයින් මඳක් සපා බැලීමයි. එය වියළි ය. රළු ය. එහෙත් තිත්ත නැත. ඇත්ත වශයෙන් ම එහි කිසි ම රසයක් නැත.





"හුරේ... මං සනීපෙන්!"

"ඇත්තට ම ඔයා සනීපෙන් තමයි" මව කීවා ය. "මොකක්ද ඔයාගෙ ප්‍රශ්නෙ?"

ටොට්ටෝ චං පැහැදිලි කළා ය. මව ද එයින් අංශුවක් හපා බැලුවා ය. "ඒක තිත්ත නෑ"

"ඒ කියන්නේ ඔයත් සනීපෙන් අම්මේ!"

ඊළඟට රොකී වෙත ගිය ටොට්ටෝ චං පොත්ත උගේ මුවට ළං කළා ය. පළමු ව ඌ එය ඉව කළේ ය. ඊළඟට ලෙව කෑවේ ය.

"ඔයා ඒක හපන්න ඕනෑ" ඇය කීවා ය. "ඔයා සනීපෙන්ද අසනීපෙන්ද කියලා එතකොට දැන ගන්න පුළුවන්."

එහෙත් රොකී එය සැපීමට වෑයම් නො කළේ ය. ඌ කන අසල පයින් පහුරු ගෑවේ ය. ටොට්ටෝ චං පොතු කැබැල්ල උගේ මුවට ළං කළා ය.

"එන්න එන්න ඒක හපන්න. ඔයා අසනීප නම් ඒක භයානකයි."

රොකී නො කැමැත්තෙන් එහි අයිනක් හැපුවේ ය. නැවත එය ඉව කළේ ය. නො කැමැති බවක් හඟවන බැල්මක් නො වී ය. ඌ දිග ඇණුමක් ඇරියේ ය.

"හුරේ! රොකිත් සනීපෙන්"

පසුදින මව ටොට්ටෝ චංට සෙන් විස්සක් දුන්නා ය. ඇය කෙළින් ම මුල් ගුරුතුමා ගේ කාර්යාලයට ගොස්, පොතු කැබැල්ල ඔහු ගේ මේසය මත තැබුවා ය.

"මොකක් ද මේ?" කියන්නාක් මෙන් එතුමා ඒ දෙස බැලුවේ ය. ටොට්ටෝ චං අතේ මිරිකා ගෙන සිටි මුදල දුටු ඔහුට කාරණය මතක් විය.

"ඒක හපන්න" ඇය කීවා ය. ඒක තිත්ත නම් ඒකේ තේරුම ඔයාට අසනීපයි."

මුල් ගුරුතුමා අසක් හැපුවේ ය. ඊළඟට එය හරවා හොඳින් පිරික්සා බැලුවේ ය.

"ඒක තිත්ත ද?" ටොට්ටෝ චං ඇසුවා ය. ඇය මුල් ගුරුතුමා ගේ වත දෙස උනන්දුවෙන් බලා සිටියා ය.

"ඒකේ කිසිම රසයක් නෑ." පොතු කැබැල්ල දෙමින් ඔහු මෙසේ ද කීවේ ය. "මම හොඳ සනීපෙන් ඔබට ස්තුතියි."

"හුරේ! මුල් ගුරුතුමාත් සනීපෙන්! මට හරිම සතුටුයි."

එදින ටොට්ටෝ චං පාසලේ හැම කෙනකුට ම පොතු කැබැල්ල හැපීමට දුන්නා ය. කිසි ම සිසුවෙක් එය තිත්ත යැයි නො කීවේ ය. සියල්ලන් සුවෙන් බව එයින් තහවුරු විය. ඇයට මහත් සතුටෙකි.

සියලු ම ළමයි මුල් ගුරුතුමා වෙත ගොස්, තම තමන් සුවයෙන් බව එතුමාට කියා සිටියහ. හැම කෙනකුට ම එතුමා පිළිතුරු දුන්නේ ය. "ඒක හරිම හොඳයි."

මුල් ගුරුතුමා සියල්ල ම දැන සිටින්නට ඇත. එතුමා රටෙහි හදවත වැනි ගුම්මා පෙදෙසේ ඉපද හැදී වැඩුණු අයෙකි. ගඟක් අසබඩ පිහිටි ඒ පෙදෙසට හරුනා කන්ද හොඳින් පෙනුණේ ය. නො හැපුව ද පොත්ත තිත්ත නැති බව ඔහු දැන සිටින්නට ඇත.

එහෙත් සියල්ලන් සුවෙන් සිටින බව ටොට්ටෝ චංට වැටැහී යාම අගනේ යැයි එතුමා සිතුවේ ය. පොත්ත තිත්ත යැයි කියූ යම් කෙනකු හිටියා නම් ඒ ගැන කනස්සලු වන අන්දමේ කෙනකු ලෙස ටොට්ටෝ චං වැඩී තිබීම ගැන ඔහු සතුටු විය.



පාසල අසල දඬාවතේ යමින් සිටි බල්ලකු ගේ මුවට ද පොතු කැබැල්ල ඇතුළු කිරීමට ඇය වෑයම් කළා ය. ඌ හැපීමට පැන්න ද ඈ නො පසුබට වූවා ය.

"ඔයා සනීපෙන්ද අසනීපෙන්ද කියලා මේකෙන් දැන ගන්න පුළුවන්." ඇය බල්ලාට කෑගෑවා ය. "ඔන්න, මේක හපන්න! ඔයා සනීපෙන් නම් හරි අගෙයි."

පොත්තෙන් ටිකක් ඌට හැපීමට සැලැස්විය හැකි වීමෙන් ඈ ජය ලැබුවා ය. බල්ලා වටේට උඩ පනිමින් ඇය මෙසේ කීවා ය: "හුරේ! ඔයත් සනීපෙන්!"

බල්ලා ස්තුති කරන්නාක් මෙන් හිස පාත් කොට පැන ගියේ ය.

මුල් ගුරුතුමා අනුමාන කළ පරිදි ම, පොතු වෙළෙන්දා ජියුගාවෝකාවේ යළි දැක ගත හැකි නො වී ය.

සෑම උදයක ම පාසලට පිටත් වීමට පෙර, ටොට්ටෝ චං අගනා පොතු කැබැල්ල සිය ලාච්චුවෙන් ඉවතට ගන්නී ය. එය සවිමත් රැකවලකු වැනි ය. ඇය එයින් මඳක් හපන්නී ය. "මම සනීපෙන්" කියමින් සතුටින් පිටත් වන්නී ය.

සුවතා පොත්තට තුති වේවා! ඇය දැන් හොඳ සුවයෙනි.

## ඉංග්‍රීසි කතා කරන සිසුවා

නව සිසුවෙක් ටොමෝවට පැමිණියේ ය. ඔහු උසින් මහතින් මූලික පාසලක ළමයකුට වඩා විශාල ය. සත්වන ශ්‍රේණියේ ළමයකු තරම් ය. ඔහු ගේ ඇඳුම් ද වෙනස් ය. වැඩිහිටියකු ගේ වැනි ය.

එදින පාසලේ උදය රැස්වීමේ දී, මුල් ගුරුතුමා නව සිසුවා හඳුන්වා දුන්නේ ය.

"මේ මියසාකි. මෙයා උපන්නේ, හැදුණේ, වැඩුණේ ඇමෙරිකාවේ. ඒ නිසා ජපන් බස හොඳ හැටි කතා කරන්න එයාට අමාරුයි. එයා ටොමෝවට ආවෙ ඒ නිසයි. එයාට මෙහේ දී යාළුවන් ඇති කර ගන්නත් එයාලා එක්ක වැඩි කාලයක් ගත කරලා හොඳින් ඉගෙන ගන්නත් පුළුවන් වේවි.

එයා දැන් ඔයාලා ගේම කෙනෙක් මම්... එයා මොන පන්තියට දැම්මොත්ද හොඳ? තා චංලා ඉන්න පහේ පන්තියට මෙයා දාමුද?"

සිතුවම් ඇඳීමෙහි දස්කම් දක්වන තා චං සොහොවුරු හඬින් මෙසේ කීය: "ඒක අගෙයි."

මුල් ගුරුතුමා සිනාසෙමින් කියා ගෙන යයි. "එයාගේ ජපන් බස දුර්වලයි කියලා මම කිව්වා නේ. ඒ වුණාට එයා ඉංගිරිසි බසට ඉතාම දක්ෂයි. එයාට, ඔයාලා ජපන් ටිකක් උගන්වන්න. එයාට ජපන් ජීවිතය එච්චර පුරුදු නැහැ. එයාට උදවු කරන්න ඕනෑ. හොඳද? ඇමෙරිකාවේ ජීවිතය ගැන එයා ගෙන් අහලා දැන ගන්න. හරිම රසවත් දේවල් එයා ඔයාලාට කියා දේවි. හොඳයි. මම දැන් එයා ඔයාලට බාර දෙනවා."

තමන්ට වඩා තරමින් කුඩා වූ පන්ති සගයන්ට ඔහු නැමී ආචාර කළේ ය. තා චං ගේ පන්තියේ අය පමණක් නො ව, අන් සිසුවෝ ද නැමී සිට ප්‍රත්‍යාචාර කළෝ ය.

අහර ඉසුඹුවේ දී මියසාකි, මුල් ගුරුතුමා ගේ ගෙදරට ගියේ ය. සියල්ලෝ ඔහු පසුපස ගියහ. ඔහු පාවහන් ඇති ව ම ඇතුළු විය. සියල්ලෝ එකට හඬ නැගූ හ. "සපත්තු ගලවන්න."

මියසාකි ගැස්සී ගියේ ය. "අනේ, මට සමාවෙන්න!". පාවහන් උනමින් ඔහු කීවේ ය. කළ යුත්ත සියල්ලෝ එක හඬින් පැහැදිලි කළෝ ය. "බිම කළාල එළාපු කාමරයකට ඇතුල් වෙන කොට, සපත්තු ගලවන්න ඕනෑ. රැස්වීම් හලට යන කොට, සපත්තු ගැලෙව්වත්, පන්තියටත් පොත් ගුලටත් යන කොට ඒවා ගලවන්න ඕන නෑ."

"ඔයා කුහොන්බුත්සු විහාරයට ගියා ම මිදුලේ දී සපත්තු දාගෙන ඉන්න පුළුවන්. හැබැයි ඇතුළට යන කොට ගලවන්න ඕනෑ."

ජපානයේත් පිට රටෙකත් ජීවත් වීමේ වෙනස් කම් දැන ගැනීම සියලු දෙනාට විනෝදයක් විය.

මියසාකි පසු දින විශාල ඉංග්‍රීසි පින්තූර පොතක් පන්තියට ගෙන ආවේ ය. අහර ඉසුඹුවේ දී සිසුහු සියල්ලෝ ම එය බැලීමට පොදි කෑ හ. ඔවුහු පුදුමයෙන් පුදුමයට පත් වූ හ. එයට පෙර කිසි දිනක එවැනි පින්තූර පොතක් ඔවුන් දැක නො තිබුණි. ඔවුන් දැක තිබුණු පොත්වල පින්තූර පළ කොට තිබුණේ තද රතු,



කොළ, කහ යන වර්ණවලින් පමණි. නමුත් මේ පොත සෞම්‍ය සජීවී වර්ණයෙන් යුතු විය. සුදු දුඹුරු මිශ්‍ර පියකරු සෙවණ සහිත ව, නිල් ඇතුළු නොයෙකුත් වර්ණවලින් ඒ විසිතුරු විය. එබඳු වර්ණ ඔවුන් ගේ පාට කූරු පෙට්ටිවල නො වී ය, ඒ පෙට්ටිවල ඇති සම්මත කූරු විසිහතරේ පමණක් නො ව, තාං චං ගේ වෙසෙසි පෙට්ටියේ වූ හතළිස් අට අතරවත් නො වී ය. සියල්ලෝ මහත් සේ පිනා ගියහ. පින්තූර අතුරින් පළමු වැන්න වූයේ බිලින්දකු ඇඳුමෙන් ඇද ගෙන යන පියකරු බල්ලකු ගේ දසුනෙකි. ඔවුන් ගේ සිත ඇද බැඳ ගත් කරුණ වූයේ, බිලිඳා සිත්තම් කළ එකකු නො ව, සැබෑ එකකු ලෙස පෙනීමයි. සැබෑ ම බිලිඳකු මෙන් ඔහු ගේ සම සෞම්‍ය රෝස පැහැයෙන් බැබැළිණ. මෙතරම් දිලිසෙන ඝන කඩදාසියෙන් යුතු, මෙතරම් පියකරු ලෙස පළ කොට ඇති. මෙතරම් විශාල පොතක් ඔවුන් කිසි දාක දැක නො තිබිණ. ටොට්ටෝ චං තමාට සුපුරුදු මිතුරු බව පළ කරමින් ම මියසාකි ගේ පොතට හොඳට ම ළං වී එය සිත් සේ නැරඹුවා ය.

මියසාකි එහි ඇක්වුණු ඉංග්‍රීසි පාඨ ඔවුන්ට කියා දුන්නේ ය. ඔහු ගේ ඉංගිරිසි උච්චාරණය ඉතා මෙළොක් විය. එය සවනට මිහිරක් ම විය. නමුත් ඔහු ජපන් වචන මිමිණුවේ තතනමිනි.

මියසාකි ටොමෝවට අලුත් වෙනසක් ගෙන ආ බව පැහැදිලි ව පෙනුණි.

"අකචං ළදරුවෙකි." ඔහු පටන් ගත්තේ ය. අනෙක් සියල්ලෝ ඔහු අනුව කී හ. "අකචං ළදරුවෙකි."

"උත්සුකුෂි ලස්සණයි" මියසාකි ඊළගට කීවේ ය. 'කු' යන්න බර කර, අග 'ඉ' යන්න ඔහු අත් හැරියේ ය.

"උත්සුකුෂි ලස්සණයි" සෙස්සෝ ද කී හ. තමා ගේ ජපන් උසුරුවීම වැරැදි සහිත බව මියසාකිට පැහැදිලි විය. "ඒක උත්සුකුෂිද? මම හරිද?" ඔහු ඇසුවේ ය.

මියසාකි සහ සෙසු සිසුවෝ ඉක්මනින් මිතුරු වූ හ. ඔහු සෑම දිනක ම ටොමෝවට නොයෙකුත් පොත් ගෙන වේ ය. අහර ඉසුඹුවේ දී ඒවා අන් අයට කියා දුන්නේ ය.

ඇත්තට ම මියසාකි ඔවුන් ගේ ඉංග්‍රීසි ගුරුවරයා වැනි විය. එසේ ම ඔහු ගේ ජපන් බසේ හැකියාව ද ඉක්මනින් ම දියුණු විය. සිතුවම් හා විසිතුරු දේ ප්‍රදර්ශනය සඳහා වෙන් කරන ලද පිළක්වූ 'ටොකොනෝමාවේ' හිඳ ගැනීම වැනි අත්වැරැදි ඔහු තව දුර[illegible]ා කළේ ය.

ඇමෙරිකාව ගැන නොයෙකුත් ඈ ටොට්ටෝ චං ඇතුළු සගයෝ උගත් හ. ටොමෝවෙහි දී ජපන්නු සහ ඇමෙරිකානුවෝ මිතුරු වෙමින් සිටියෝ ය. ටොමෝවෙන් පිටත දී ඇමෙරිකානුත් සතුරන් වූ අතර, ඒ නිසා ම ඉංග්‍රීසිය සතුරු බසක් වී තිබුණි. සියලු පාසල්හි විෂය මාලාවෙන් එය ඉවත් කැරුණේ එබැවිනි.

"ඇමෙරිකානුවෝ දුෂ්ටයෝය, සතුරෝය." රජය විසින් ප්‍රකාශ කරන ලදි. එහෙත් ටොමෝවේ "උත්සුකුෂි ලස්සණයි" යනුවෙන් සාමූහික ව ගයන ලදී. ටොමෝව හරහා ගලා ගිය සුළඟ සුමුදු විය. උණුසුම් විය. ළමයි ඇත්තට ම ලස්සණ වූ හ.

## රස නාළුව

"අපි නාට්‍යයක් කරන්න යනවා."

එය ටොමෝ ඉතිහාසයේ පළමු වන නාට්‍යය විය. අහර කිස අතර දී එක් සිසුවෙකු බැගින් දිනපතා කතාවක් පැවැත්වීම මේ දක්වා ම කරගෙන ආ නමුත් රිද්මචලන සඳහා මුල් ගුරුතුමා විසින් වැයුණු පියානෝව ඇති, කුඩා කරළිය මත, නරඹන්නන් ඇද ගනිමින් නාට්‍යයක් රඟ දැක්වීම සිතීමටවත් අපහසු අසිරියකි. ටොට්ටෝ චං පමණක් නො ව කිසි ම ළමයකු මේ දක්වා නාට්‍යයක් නරඹා නැත. 'හංස විල' නැරඹීමට ගිය වතාව හැරෙන විට ටොට්ටෝ චං එක් වරක් වත් රඟහලට ගොස් නැත. කෙසේ වුව ද වසර අවසාන ප්‍රසංගය සඳහා කෙබඳු වැඩ සටහනක් ඉදිරිපත් කළ යුතු දැයි ඔවුහු කතිකා කළහ.

ටොට්ටෝ චං ගේ පන්තිය "කන්ජින්චෝ" (සම්මාදම් බලපත) නිර්මාණය කිරීමට තීරණය කළහ. එනමින් වූ නියම කබුකි නළුව ටොමෝ කරළියෙහි දක්වනු උගහට ය. එසේ වුවත් ඔවුන් ගේ එක් පෙළ පොතක මෙය ඇතුළත් ය. මරුයාමා මහතා ඔවුන් පුහුණු කරනු ඇත. උස මහත අයිකෝ සයිෂෝට බෙන්කේයි (සවිමත් මිනිසා) ගේ චරිතය කළ හැකි ය. හැඩිදැඩි පෙනුමක් සහ උස් කටහඬක් ඇති අමදරාට ටොගාෂි (අණපති) සේ රඟ පෑ හැකි ය. නළුවෙහි දොරටු රක්නකු ලෙස වෙස් වළා ගන්නා යොෂිත්සුනේ කුමරා ලෙස ටොට්ටෝ චං රඟ පෑ යුතු යැයි තීරණය කරන ලදි. අන් සියලු ම දෙනා සංචාරක හිමිවරුන් ලෙස රඟ පෑ යුතු ය.



පුහුණු වීමට පෙර තම තමන් ගේ දෙබස් කොටස් කට පාඩම් කර ගැනීමට ඔවුනට සිදු විය. ටොට්ටෝ චංටවත් හිමිවරුන්ටවත් කීමට කිසිවක් නො තිබීම කදිම ය. මුළු කාලය නිහඬ ව බලා සිටීමට ඔවුන්ට නියම වී තිබිණ. යොෂිත්සුනේ ලෙස පෙනී සිටි ටොට්ටෝ චං කළ යුතු වූයේ විශාල පිදුරු තොප්පියකින් හිස සඟවා ගෙන දණින් සිටීම ය. ඇත්ත වශයෙන් ම යොෂිත්සුනේ ගේ සේවකයා වූ බෙන්කේයි (දොරටු රක්නකු ලෙස වෙස් වළා සිටී) තම ස්වාමියාට අවලාද කියමින් කස පහර දෙමින් පන්සලක් තැනීමට මුදල් රැස් කරන සම්මාදම් කරුවන් ලෙස පෙන්වමින් 'අතකා' මුරපළෙන් 'රිංගා යාමේ' දක්ෂ වෑයමක යෙදෙයි. බෙන්කේයි චරිතයට පෙනී සිටින අයිකෝ සයිෂෝට බරපතළ රැඟුමක් පැවරී තිබිණ. මුරපළේ අණපති ටොගාෂි සමඟ බහින් බස් වීමටත් ඔහුට වාග් පහර එල්ල කිරීමටත් ඊට අමතර ව ඔහු ගේ නියමය පරිදි සම්මාදම් බලපත කියවන බවක් පෙන්වීමේ සිත් කා වදින අංගයක් රැඟීමටත් ඔහුට සිදු වී තිබුණි. ඔහුට කියැවීමට සිදු වූයේ හිස් හසුන් පතක් බලා ගෙන ය. ඉතා ම සිත් පොලඹවන පැවිදි හඬකින් සිටි වන ම චතුර ලෙස ඔහු එය කියවී ය. "පළමු කොට තොදායිජි විහාරය නැවත ඉදි කිරීමේ උතුම් අරමුණ පෙර දැරී කර ගෙන...."

අයිකෝ සයිෂෝ ඇය ගේ පළමු කතාව දිනපතා ම පාඩම් කළා ය.

බෙන්කේයි ගේ තර්ක බිඳීමට වෑයම් කළ යුතු වූ බැවින්, ටොගාෂි ගේ චරිතයට ද බොහෝ දෙබස් තිබුණි. අමදරා ඒවා මතක් කර දීමට වෑයම් කළේ ය.

අවසන, පුහුණු රංගය පැමිණියේ ය. ටොගාෂි සහ බෙන්කේයි එකිනෙකාට මුහුණ දී සිට ගත්හ. හිමිවරු බෙන්කේයි පසුපස පෙළට උන්හ. යොෂිත්සුනේ ලෙස රඟ පෑ ටොට්ටෝ චං ඉදිරි පැත්තේ දණින් සිටියා ය. මේ කුමක් දැයි ඇයට තේරුමක් නො වී ය. තම පිරිස සමඟ බෙන්කේයි යොෂිත්සුනේට පහර එල්ල කළ විට, ටොට්ටෝ චං චණ්ඩ වූවා ය. ඇය අයිකෝ සයිෂෝට පා පහරක් දී ඇගේ සිරුර පනුරු ගාන්නට වූවා ය. අයිකෝ හඬන්නට වූවා ය. 'හිමිවරු' සිනාසෙන්නට වූ හ.

බෙන්කේයි කොතරම් පහර දුන්න ද, යොෂිත්සුනේ බියගුලු පෙනුමෙන් නිසල ව සිටිය යුතු විය. වොගාෂිට සැකය ඇති වුවත් මේ හැසිරීම්වලින් නො මඟ ගොස්, මුර පොළින් ඉදිරියට යාමට ඉඩ දෙනු ඇත යන්න මෙහි අරමුණ විය.

යොෂිත්සුනේ ගේ එරෙහි වීම මුළු උපක්‍රමය ම විනාශ කළේ ය. මරුයාමා මහතා මෙය ටොට්ටෝ චංට පැහැදිලි කර දීමට වෑයම් කළේ ය. නමුත් ඇය නො නැමුණා ය. අයිකෝ සයිෂෝ පහර දුන්නොත් තමා ආපසු පහර දිය යුතු බව ඇය දැඩි සේ කියා සිටියා ය. මේ නිසා ඉදිරියට යාමක් නො වී ය.

ඔවුන් නැවත නැවත දසුන රඟපෑමට කීප වරක් තැත් කළ ද, ටොට්ටෝ චං හැම විට ම ඉදිරියට පැන්නා ය.

"මට ඉතාමත් කනගාටුයි". අවසන දී මරුයාමා මහතා ටොට්ටෝ චංට කීවේ ය.

"යොෂිත්සුනේ චරිතෙට තායි චං ගත්තොත් හොඳයි කියල මට හිතෙනවා."

ටොට්ටෝ චංට සහනයක් දැනිණි. දිගින් දිගට ම පහර කන එක ම තැනැත්තිය වීමට ඇය කැමැති නුවූවා ය.

"ටොට්ටෝ චං ඔයා හිමිනමක් වීමට කැමැතිද?"

මරුයාමා මහතා ඇසුවේ ය. ඇය පස්සට ම ගොස් අනෙක් හිමිවරුන් සමඟ සිට ගත්තා ය.

දැන් සියල්ල හොඳින් කෙරෙනු ඇතැයි ඔවුහු සිතූ හ. ඔවුන්ට වැරදී තිබුණි. ටොට්ටෝ චංට දිග රිටක් නො දිය යුතුව තිබිණ. දිගට ම නිසල ව සිටීම එපා වූ ඇය අසල සිටි හිමිනම ගේ පාදයට රිටෙන් අනින්නට වූවා ය. ඉදිරියෙන් සිටි හිමිනම ගේ වැලමිට කිති කවන්නට වූවා ය. ඇය රිට වනන්නට වූ අතර, අසල සිටින්නන්ට එය අනතුරු දායක විය. බෙන්කේයි හා වොගාෂි අතර රැකෙමින් තිබූ දසුන ද එයින් කඩාකප්පල් විය.

මේ අනුව හිමිනම ගේ චරිතයෙන් ද ඇය ඉවත් කරනු ලැබුවා ය.

යොෂිත්සුනේ ලෙස පෙනී සිටි තායි චං තමාට පහර වැදෙද්දී දිරිමත් ලෙස දත් තද කර ගෙන සිටියේ ය. නරඹන්නන් ඔහු කෙරෙහි සංවේගී වනු නිසැක ය. ටොට්ටෝ චං නැති පුහුණු රංගය මැනැවින් සිදු වෙමින් තිබිණ.



ටොට්ටෝ චං එතැනින් පිටත් ව පාසල් පිටියට පැමිණියා ය. පාවහන් උනා ඇය ඉඟි නළුවක් නිර්මාණය කිරීමට වෑයම් කළා ය. එය ඇගේ ම සිතේ උපන් පියකරු රැඟුමක් විය. ඇතැම් විට ඇය හසඟනකි. ඇතැම් විට මදනල ලෙසත් ඇතැම් විට විසුළු අයකු ලෙසත් ඇය නැටුවා ය. නැටුවා ය. නැටුම් බැලීමට කෙළි පිටියේ අන් කිසිවෙක් නො වී ය.

සොෂිත්සුනේ ලෙස රැඟුමට ඇගේ හදවතේ සුළු ආශාවක් ද තිබුණි. ඔවුන් ඊට ඉඩ දේවි ද? ඇය ඇත්තට ම අයිකෝ සයිෂෝට පහර දී ඇත. පහුරු ගා ඇත!

මෙසේ ටොමෝවේ පළමු වන සහ අන්තිම නාට්‍යයේ රඟපෑමට ටොට්ටෝ චංට නොහැකි විය.

## රටහුනු

ටොමෝවෙහි සිසුවෝ කිසි දිනක, අන් අය ගේ තාප්පවල හෝ පාරේ කිසිවක් කුරුටු නො ගෑවෝ ය. නො ලීවෝ ය. පාසල තුළ දී එසේ කිරීමට ඕනෑ තරම් ඉඩකඩ තිබුණු බැවින් එවැන්නක් අවශ්‍ය නො වී ය.

රැස්වීම් හලේ සංගීත කාල ඡේදවල දී, මුල් ගුරුතුමා හැම ළමයාට ම සුදු හුනු කැටයක් ලබා දෙයි. එය රැගෙන බිමෙහි ඕනෑ ම තැනක හිඳ ගෙන හෝ වැතිර සිටීමට ඔවුනට පුළුවන. ඔවුන් එසේ සිටිද්දී විදුහල්පතිතුමා පියානෝව වයයි. වයනු අසා සිට, එහි රිද්මය අනුව, සංගීත ප්‍රස්තාරය පොළොවේ සටහන් කළ යුතු ය. දිලිසෙන දුඹුරුවන් දැවයෙහි සුදුවෙන් ලියූ විට, ඇසට පියකරු ය. ටොට්ටෝ චං ගේ පන්තියේ සිටියේ සිසුන් දස දෙනෙකු පමණි. ඔවුන් ශාලාව පුරා පැතුරුණු විට, අනෙකා ලියන 'ඉඩමට' ඇතුළු නො වී, ඕනෑ තරම් විශාල ලෙස තම ප්‍රස්තාරය ලියා ගෙන යාමට හැම කෙනෙකුට ම පිළිවන. ඔවුන්ට තම ප්‍රස්තාර සටහන් සඳහා සමාන්තර ඉරි අවශ්‍ය නො වේ. ඔවුන් කළේ රිද්මය සටහන් කිරීම පමණි. මුල් ගුරුතුමා ද එකතුව කතිකා කොට යොදා ගත් විශේෂ නම් ඒ ඒ සංගීත සටහන සඳහා ටොමෝවේ භාවිත විය. ඒවා මෙසේ ය.

♪.♬ "පිම්ම." උඩ පැනීමට හා ඉදිරියට පැනීමට හොඳ රිද්මයක් නිසා.

♪ "කොඩිය". එසේ පෙනුණු බැවින්.

♫ "කොඩිය කොඩිය"

𝅘𝅥𝅯 "කොඩි දෙක"

♩ "කළුවා"

𝅗𝅥 "සුද්දා"

𝅗𝅥. "ලප සුද්දා"

𝅝 "වටයා"

මේ ක්‍රමය මඟින් සටහන හොඳින් ඔවුන්ට හැඳින ගන්නට හැකි වූ අතර, එය විනෝද ජනක ද විය. එය ඔවුන් ඉතා ම ආසා කළ පන්තියකි.

රටහුනුවලින් බිමෙහි ලිවීම මුල් ගුරුතුමා ගේ අදහසෙකි. කඩදාසියක් අවශ්‍ය තරම් විශාල නැත. වටේ ම ලිවිය හැකි විශාල කළු ලෑලි ද නො වී ය. සංගීතය කොතරම් වේගවත් වුව ද, තමන්ට ඕනෑ තරම් විශාල ලෙස ලිවීමට රැස්වීම් හලේ බිම කදිම කළුලෑල්ලකියි ඔහු සිතුවේ ය. සියල්ලට වඩා, එයින් ඔවුන්ට සංගීතය සිත් සේ රස විඳිය හැකි විය. ඔවුන්ට වැඩිපුර වේලාව ඇතහොත් පසු ව. අහස් යානා බෝනික්කන් වැනි කැමැති ඕනෑ ම සිතුවමක් ඇඳීමට ද හැකි ය. ඇතැම් විට ළමයි එකතු ව මුළු බිම ම එක ම සිතුවමක් බවට පත් කරති. කෙතරම් නම් අගනේ ද?

සංගීත පන්තිය අතරතුර දී, මුල් ගුරුතුමා පැමිණ ළමයින් ලියා ඇති ප්‍රස්තාර පිරික්සයි. "ඒක අගෙයි. මෙතන කොඩිය නො වෙයි. පිම්ම" ආදී ලෙස පවසයි. ඒ ඒ අය ගේ සටහන් නිවැරැදි කොට අනුමත කළ පසු යළිත් වාදනය අරඹයි.



එවිට තමතමන් ගේ සටහන් නැවත පිරික්සා බැලීමටත් ඒවා මතක තබා ගැනීමටත් ඔවුන්ට හැකි වෙයි. මුල් ගුරුතුමාට කෙතරම් වැඩ බහුල වුව ද මේ පන්තිය ගැනීම අනෙකකුට නො පැවැරුවේ ය. සිසුනට ද කොබයාෂි මහතා නැති ව කිසි ම විනෝදයක් නො වී ය.

ප්‍රස්තාර ලියා අවසන් වූ පසු මකා හැරීම සෑහෙන කටයුත්තකි. කළුලෑලි මකනයකින් බිම මකා ඉන් පසු කණ්ඩායම ම එකතු වී හුනු, කුණු, දූවිලි, ඉවත් කොට, නව පෙනුමක් ලැබෙන ලෙස හොඳින් උළා පිරිසිදු කළ යුතු විය. එය බොහෝ සේ වෙහෙසකාරී විය.

කුරුටු මැකීම කෙතරම් වෙහෙසකර දැයි ටොමෝ සිසුහු මෙ මඟින් අවබෝධ කර ගත්හ. ඒ නිසා රැස්වීම් හලේ බිම හැර, අන් කිසි තැනෙක ඔවුහු කුරුටු නොගැහ. පන්තිය සතියකට දෙවරක් තිබුණු නිසා, සිත් පිරිදි කුරුටු ගෑමට ඔවුනට ඉඩ ලැබිණ.

ටොමෝවේ සිසුහු රටහුනු පිළිබඳ වෙසෙසි දැනුමක් ද මේ මඟින් ලද්දෝ ය. හොඳ ම වර්ගය කුමක් ද? හුනු කැටය අල්ලන්නේ කෙසේ ද? හොඳින් ලිවීමට එය හසුරුවන්නේ කෙසේ ද? නො කැඩෙන ලෙස භාවිත කරන්නේ කෙසේ ද? යන කරුණු සියල්ල ඔවුහු හොඳින් දත්හ. එසේ ම හැම අයෙක් ම 'රටහුනු රසිකයෙක්' විය.

## යසුවාකි චං මිය යයි

ඒ වසත් ඉසුඹුවෙන් පසු ව පාසල ඇරඹුණු මුල් දිනයයි. පාසල් පිටියේ සිසු රැස්වීම ඉදිරියේ කොබයාෂි මහතා නැඟී සිටියි. සුපුරුදු පරිදි දෙඅත් සාක්කු තුළ ය. මද කලක් ගත වනතුරු ඔහු කිසිවක් ම නො කියයි. සාක්කුවලින් දෑත් ඉවතට ගෙන සිසුන් දෙස බලයි ඔහු. හඬන්නා සේ ය.

"යසුවාකි චං මිය ගිහිල්ලා" ඔහු සෙමින් පැවැසී ය. "අපි අද එයා ගේ මළගමට යන්න ඕනෑ. මම දන්නවා ඔයාලා හැම දෙනා යසුවාකි චංට හුඟාක්ම කැමැති බව. එයා නැති වීම හරිම

පාඩුවක්. මට හරිම කනගාටුයි." ඔහු ගේ මුහුණ රතු වී දෙනෙතින් කඳුළු බිඳු ගලා ගියේ ය. සිසුහු සියල්ලෝ බසකුදු නො තෙපලා විස්මිත ව බලා උන්හ. ඔවුහු යසුවාකි චං ගැන ම සිත යෙදූ හ. ටොමෝ පිටිය හරහා මීන් පෙර කිසි ම දිනෙක මෙවන් සෝකුරු නිහැඬියාවක් පැතිර නො තිබිණ.

"මෙතරම් ඉක්මනට මැරෙන්න?" ටොට්ටෝ චං යසුවාකි චං ගැන සිතුවා ය. "ඉක්මනින් කියවා නිවාඩුව පටන් ගන්න ඉස්සර වෙලා දෙන්නැයි කියලා යසුවාකි චං මට දුන්න 'ටොම් මාමා ගේ මැදිරිය' කියන පොත තාමත් කියවලා ඉවර කර ගන්න බැරි වුණා." ඇය සිතුවා ය.

වසන්ත නිවාඩුවට පෙර දිනෙක ඔහු පොත තමාට දී "ගිහින් එන්නම්"යි සමු ගනිද්දී ඔහු ගේ ඇඟිලි නැමී තිබුණු අන්දම ඇයට සිහිපත් විය. හමු වූ පළමු වන දිනයේ දී ම "ඔයා ඒ විදියට ඇවිදින්නේ ඇයි දැ"යි තමා ඇසූ අන්දමත් "මට පෝලියෝ හැදුණා"යි සුමුදු ලෙස පිළිවදන් දුන් අන්දමත් ඇයට සිහි විය. ඔහු ගේ කටහඬ ඔහු ගේ සිනාව ඇයට මැවී පෙනුණේ ය. ගිම්හානයේ දී ඔවුන් දෙදෙනා තනි ව කළ ගස් නැඟීමේ වික්‍රමය ඇයට සිහි විය. ඔහු ගේ සිරුර කොතරම් බර වී ද? ඔහු තමාට වඩා වැඩිමහල් වුවත්, උස් මහත් වුවත් ඒ භයානක වික්‍රමයේ දී, තමා කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබූ අන්දම ඇයට සිහිපත් විය. රූපවාහිනිය නමින් යමක් ඇමෙරිකාවේ ඇති බව ඇයට කීවේ යසුවාකි චං ය. ටොට්ටෝ චං ඔහු ඉතා ප්‍රිය කළා ය. ඔවුහු එකට අහර ගත්හ. විවේකය එකට ගත කළ හ. පාසලින් පසු ව දුම්රිය නැවැතුමට එක් ව ගමන් කළ හ. ඔහු මිය ගියා නම් ඉතින් කිසිදාක පාසල් එන්නේ නැත. අර කුකුළු පැටවුන් වගේ ම ය. උන් මළ පසු කොතරම් කතා කළ ද සෙලවුණේවත් නැත.

යසුවාකි චං ජීවත් වූ ඩෙනෙන්චෝෆු පෙදෙසට විරුද්ධ පැත්තේ පිහිටි පල්ලියක දී ඔහු ගේ අවමඟුල සිදු විය.

ළමයි ජියුගාවෝකාවේ සිට, නිසල ව එක පෙළට ගමන් කළහ. ටොට්ටෝ චං වෙන දා මෙන් වටපිට නො බලා නෙත් බිමට ම යොමා සිටියා ය. මුල් ගුරුතුමා දුක් පුවත දැන්වූ පසු ව, තමා වෙනස් ව ඇති බව ඇයට ම දැනෙයි. පුවත ඇසූ සැටියේ ඇය විශ්වාස නො කළා ය. ඊළඟට දුක ආවේ ය. නමුත් දැන්



ඇයට වුවමනා වී ඇත්තේ එක මොහොතක්වත් යසුවාකි චං පණ පිටින් දැකීමට ය. ඔහුට කතා කිරීමට අවශ්‍ය ය. අහෝ! ඇයට දරා ගත නො හැකි ය.

පල්ලිය සුදු ලිලී මලින් වැසී තිබිණ. කළු ඇඳුමෙන් සැරසුණු යසුවාකි චං ගේ මව, සොහොවුරිය සහ නෑයෝ පල්ලිය පිටත සිට ගෙන උන්හ. ටොට්ටෝ චං දුටු ඔවුහු තව තවත් හඬන්නට වූ හ. සුදු අත් ලේන්සු කඳුළින් තෙමිණ. එය ඒ ටොට්ටෝ චං අවමඟුලකට ගිය පළමු වතාව විය. කෙතරම් දුක් මුසු දැයි ඇයට හැඟිණ. කිසිවෙක් බසක් නො දෙඩූ හ. ආගමික සංගීත රාව සුමුදු ලෙස වැයිණ. හිරු රැස් දිලි පල්ලි බිම ඒකාලෝක වුව ද කිසි තැනෙක සතුටක් නො වී ය. කළු අත්පටි පැළැදි අයෙක් ටොමෝ සිසුනට සුදු මලක් බැගින් පිරිනැමුවේ ය. එකිනෙකා පසුපස ගොස් යසුවාකි චං ගේ දෙන තුළ එය තැන්පත් කරන ලෙස ඉල්ලා සිටියේ ය.

දෙනෙත් පියා ගත් යසුවාකි චං මලින් වට ව දෙන තුළ වැතිර සිටියේ ය. මිය ගිය ද, කිසි දිනකට වඩා කුලුණුබර බවක් චතුර බවක් ඔහු කෙරෙන් දිස් විය. ටොට්ටෝ චං දෙදණ බිම ඔබා, අතින් අත් පහසා ගරුසරු ඇති ව, මල තැබුවා ය. තමා ගේ පඬුවන් සිඟිති දැත් මෙන් නො ව, ඔහු ගේ දැත් සුදෝ සුදු විය. වැඩුණකු ගේ මෙන් දිගු ඇඟිලි සහිත විය.

"මෙයින් පස්සේ, අපි ලොකු වුණාම කොහේදි හරි හමු වේවි. එතකොට ඔයා ගේ පෝලියෝ සනීප වෙලා තියේවි," ඇය ඔහු ගේ කනට කොඳුළා ය.

නැඟී සිටි ටොට්ටෝ චං යළිත් යසුවාකි චං දෙස බැලුවා ය. "ඔව්, ඔව් මට අමතක වුණා. 'ටොම් මාමා ගේ මැදිරිය' ඔයාට දෙන්න මට බැරි වෙනවා නේද? ඊළඟට ඔයා හමු වෙන තුරු ඔයා මතක් වෙන්න මම ඒක තියා ගන්නවා."

ඇය ඉවතට යන්නට වූ විට, තමාට ඇසෙන්නේ ඔහු ගේ ම හඬ බව ඇයට නිසැක විය. "අපි දෙන්නා බොහොම සතුටෙනුයි, එකට හිටියෙ, නැද්ද? මට කවදාවත් ඔයා අමතක වෙන්නෙ නෑ නැමයි".

දොරටුව වෙත පැමිණි ටොට්ටෝ චං ආපසු හැරී, "මමත් කව[illegible]ත් ඔයා අමතක කරන්නේ නෑ"යි මිමිණුවාය.

දුම්රිය මැදිරි පන්තියේ දී, යසුවාකි චං හමු වූ දවසේ දී මෙන් ම වසත් හිරු රැස් සුමුදු ලෙස දිලිණ. එහෙත් එදා මෙන් නො ව, අද ඇගේ නෙත් තෙමී ඇත.

## ඔත්තු කාරියක්

යසුවාකි චං ගැන සිතමින් ටොමෝවේ සිසුහු බොහෝ කලක් දුක් වූ හ. උදේ පන්තිය ඇරඹෙන විට, වෙසෙසින් ම දුක්බර ය. ඔහු පමා වෙනවා නො ව, ඉතින් කවර දාකවත් නො එනියි සිතන්නට හුරු වීමට ඔවුන්ට බොහෝ කලක් ගත විය. කුඩා පන්ති කදිම වුව ද මෙබඳු අවස්ථාවලට සුදුසු නො වී ය. යසුවාකි චං ගේ අඩුව හැම දා ම කැපී පෙනුණේ ය. එක ම සහනය වූයේ ඒ ඒ අයට වෙන් අසුන් නො තිබීමයි. ඔහුට වෙන් වූ මේසයක් වී නම් එය හිස් ව තිබීම සංවේගයකි.

වැඩුණු පසු තමා කවරකු විය යුතු දැයි මෑතක සිට ටොට්ටෝ චං සිතන්නට වූවා ය. බාල ම වියේ දී වීදි සංගීත කරුවකු හෝ නළඟනක වීමට සිතූ ඇය ටොමෝවට ඇතුළත් වීමට ආසා කළා ය. ගැහැනුන්ට ගැළපෙන, තරමක් අමුතු අන්දමේ දෙයක් කළ යුතු යැයි දැන් දැන් ඇයට සිතෙයි. හෙදියක වීම වඩා මැනැවැයි ඇයට හැඟෙයි. තුවාල වූ සෙබළුන් බැහැදැකීමට ගිය දිනයෙහි බෙහෙත් විදීම වැනි දේ හෙදියන් කළ බව ඇයට හදිසියේ ම සිහි විය. තමාට එවැනි දේ කළ නො හැකි ය. කුමක් ද, කළ යුත්තේ? එකෙණෙහි ම සතුට නැඟිණ.

"ඇත්තට ම ඔව්! මම කවුරු වෙනවා දැයි තීරණය කරලා ඉවරයි." මද්‍ය ආහකය දල්වමින් සිටි තායි චං වෙත දිව ගිය ඇය මෙසේ කීවා ය:"මම ඔත්තු කාරියක් වෙන්න හිතුවා." ඇය අබිමන් පෙනුමක් ඇක්වූවා ය.

පහත් ඇල්ලෙන් මුව ඉවතට ගත් තායි චං ටොට්ටෝ චං ගේ මුව දෙස මොහොතක් බලා සිටියේ ය. ඒ ගැන සිතන බවක් හඟවමින් කවුළුවෙන් ඉවත බලා සිට, නැවත ඇය දෙසට නැමී, හොඳින් තේරුම් යන ලෙස, නිනද සරින් මෙසේ ක්වේ ය: "ඔත්තු කාරියෙක් වෙන්න නම් හුඟක්ම දක්ෂ වෙන්න ඕනෑ. එච්චරක් නොවෙයි, භාෂා හුඟක්ම දැන ගන්න ඕනෑ".



මදක් හුස්ම ගෙන ඇගේ මුහුණ කෙළින් බලා ඔහු පැහැදිලි ව කථා කළේ ය. "පළමු කොටම ඔත්තු කාරියක් හුඟක් ලස්සණ වෙන්න ඕනෑ."

තායි චං ගේ බැල්මට ගොදුරු ව තිබූ තම ඇස් ඉවතට ගත් ටොට්ටෝ චං හිස පහතට එල්ලා ගත්තා ය. නිහැඬියාවකට පසු ව, ඇය දෙස නො බලා කල්පනාකාරී ව, තායි චං මෙසේ ඇසුවේය.: "එච්චරත් නොවෙයි, කතා පෙට්ටියකට ඔත්තු කාරියෙක් වෙන්න පුළුවන්ද?"

ටොට්ටෝ චං ගල් ගැසුණා ය. ඇය ඔත්තු කාරියක වීම ගැන ඔහු අසතුටු වීම නිසා නො ව, ඔහු පැවැසූ සියල්ල සහතික ඇත්ත නිසා, ඇය අන්ද මන්ද වූවා ය. මේ සියලු කරුණු පිළිබඳ සැක සංකා ඇයට ද තිබිණ. ඔත්තු කාරියකට තිබිය යුතු කිසි ම සුදුසුකමක් තමා තුළ නැති බව දැන් ඇයට පැහැදිලි ය. හේතු නැති ව තායි චං කිසිවක් නො කී බව ඇයට නිසැක ය. අදහස අත් හැරීම හැර අන් කළ හැකි යමක් නැත. මෙය ඔහුට පැවැසීමෙන් සිදු වූයේ යහපතකි.

"අයියෝ තායි චං ඉන්නෙත් මගේ වයසෙමයි. නමුත් එයා මට වඩා කොච්චර දේවල් දන්නවාද?" ඇය සිතුවා ය. "එයා විද්‍යාඥයෙක් වෙන්න කැමැතියි කියලා තායි චං කිව්වොත් ඒකට උත්තරයක් විදියට කියන්න කිසිම දෙයක් මට තියෙනවාද?"



"අපොයි, ගිනි පෙට්ටියෙන් මද්‍ය දාහකය පත්තු කරන්න ඔයාට අගේට පුළුවන් නොවැ?" ඇය කියනු ඇත. එය කොතරම් බොළඳ ද?

"හරි හරි, හරියට ඉංග්‍රීසියෙන් කියන්නේ 'ෆොක්ස්' කියලා. සපත්තුවලට කියන්නේ 'ෂූස්' කියලා. මේ ඉංග්‍රීසි වචන ඔයා දන්න නිසා මම හිතන්නේ ඔයාට විද්‍යාඥයෙක් වෙන්න පුළුවන්" මේ පිළිතුරත් සුදුසු නො වේ.

කෙසේ වුව ද තායි චංට යමක් ඉතාමත් හොඳින් කළ හැකි බව ඇයට නියත ය ඒ නිසා, උණු දියෙහි බුබුළු නරඹමින් සිටි තායි චංට ඇය මෙසේ කීවා ය. "බොහෝම ස්තුතියි, මම එහෙම නම් මත්තු කාරියෙක් වෙන්නෙ නෑ. ඒ වුණාට ඔයා නම් වැදගත් කෙනෙක් වෙන බව මට විශ්වාසයි".

යමක් කොඳුරමින් හිස සැලූ ඔහු තමන් ඉදිරියේ විවර ව තිබුණු පොත ගෙන එයට දෙනෙත් යොමු කළේ ය.

මත්තු කාරියක විය නො හැකි නම්, තමා කවරකු විය යුතු දැයි දාහකයේ ඇල්ල දෙස බලා ගෙන, තායි චං පසුපස සිට ඇය සිතුවා ය.

## පියා ගේ වයලීනය

ඔවුන්ට නො ඇතිම යුද්ධය එහි කුරිරුකම සමඟ ඇරඹී තිබිණ. ටොට්ටෝ චං ගේ පවුලට ද එය දැනෙන්නට විය. දිනේවායි හඬ තළමින් කොඩි වැනීමට අවට මිනිස්සු සහ ළමයි දිනපතා ම යවන ලදහ. ආහාර ද්‍රව්‍ය වෙළෙඳහල්වලින් වේගයෙන් අතුරුදන් වන්නට විය. මුහුදෙන් යමක් සහ කන්දෙන් යමක් යන ටොමෝවෙහි අහර නීතිය තව දුරටත් රැකිය නො හැක්කක් බවට පත් විය. මව මුහුදු පලා සහ මිදි අච්චාරු සකසා දුන්නා ය. එය ද ඉක්මනින් ම අපහසු විය. සියලු දේ ම සලාක කරන ලදී. කොතරම් සෙවුව ද පැණිරසක් සොයා ගත නො හැකි විය.

තම දුම්රිය නැවැතුමට මෙහා නැවැතුම වන ඕකයාමාහි පියගැට පෙළ යට තිබුණු විකුණුම් මැසිමක් ගැන ටොට්ටෝ චං දනී. එහි කවුළුවට මුදල් දැමූ විට සීනි බෝල පැකැට්ටුවක්



එළියට එයි. පැණිරසට ගිජුකම වඩන සිත්තමක් මැසිම මත විය. සෙන් පහකට කුඩා පැකැට්ටුවක් ද, සෙන් දහයකට ලොකු පැකැට්ටුවක් ද ලැබුණි. දැන් බොහෝ කලෙක සිට මේ මැසිම හිස් ය. කෙතරම් විශාල මුදලක් දැමුව ද, මිටින් කෙතරම් පහර දුන්න ද කිසිවක් පිටතට නො එයි. ටොට්ටෝ චං අත් හැරියේ නැත.

"මේක ඇතුළේ කොතනකවත් එක පැකැට්ටුවක්වත් ඇති' ඇය සිතුවා ය. "ඒක ඇතුළේ හිර වෙලා ඇති."

මේ නිසා දිනපතා ඒ නැවැතුමෙන් බැස සෙන් පහේ දහයේ කාසි දමා. ටොට්ටෝ චං වෑයම් කර බැලුවා ය. හඬක් නංවමින් කාසි පිටට වැටුණා පමණි.

බොහෝ අය සිත් ගත් පුවතක් මෙකල පියාට ලැබී තිබිණ. යුද්ධය සඳහා ආයුධ සහ උපකරණ නිපදවූ කම්හල ඉදිරියට ගොස් ජනහද බැඳ ගත් යුද සංගීතය වාදනය කළහොත් සහල්, සීනි සහ වෙනත් තෑගි ලැබෙතියි යන පුවතයි, ඒ. මෑතක දී සංගීත සම්මාන ලබා වයලීන වාදකයකු ලෙස පසිඳු ව උන් ඔහු මෙසේ කළහොත් බොහෝ අමතර තෑගි ද ලැබෙනු නියත ය.

"මොකද හිතන්නේ? ඒකට යනවද?" මව පියා ගෙන් විමැසුවා ය.

ප්‍රසංග බොහෝ සෙයින් හිඟ වී තිබිණ. ප්‍රධාන වාදකයන් ඉවත් ව යාම නිසා, කණ්ඩායමට පිරිස හිඟ වී තිබුණි. ගුවන් විදුලිය ද වෙන් වී තිබුණේ යුද වැඩ සටහන්වලට ය. මේ නිසා පියාට සහ ඔහු ගේ සගයන්ට එතරම් වැඩක් නො තිබුණි. මේ අනුව වාදනයට ලැබුණු මේ අවස්ථාව බොහෝ සේ වටනේ ය.

බිරිඳට පිළිතුරු දීමට පෙර ඔහු ටික වේලාවක් කල්පනා කළේ ය. "මගේ වයලීනයෙන් ඒ වගේ දේවල් වයන්න මම කැමැති නැහැ."

"මම හිතන්නේ ඔයා හරි. මම වුණත් ඕක බාර ගන්නේ නැහැ. අපි කොහොම හරි කෑමට යමක් හොයා ගනිමු" ඇය කීවා ය.

ටොට්ටෝ චංට ද කෑම හිඟ ව ඇති බවත්, දිනපතා ම විකුණුම් මැසිමට මුදල් දමන්නේ ඒ නිසා බවත් පියා දනී. යුද සංගීතය වැයුවහොත්, ලැබෙන තෑගි තම මුලු පවුලට ඉතා ම අගනා බවත් ඔහු දනී. එහෙත් පියා මේ සියල්ලට වඩා තමා ගේ

සංගීතය ඇගැයී ය. මව ද එය දන්නී ය. එබැවින් ඔහු පෙලැඹැවීමට මදකුත් වෑයම් නො කළා ය. "ටොට්ස්කි, මට සමාවෙන්න" ඔහු ටොට්ටෝ චංට දුක්බර ව පැවැසී ය.

කලාව, දර්ශනය සහ වැඩ ගැන දැනගැනීමට ටොට්ටෝ චං ළපැටි වැඩියි. එහෙත් ඇය එක් දෙයක් දනියි. පියා තම වයලීනයට බොහෝ සේ අලුම් කළ බවත් අන් අයට පැහැර ගත නොහැකි 'සියත් බවක්' ඔහු තුළ පැවැති බවත් ඇයට රහසක් නො වේ. පවුලේ අයවත් නෑයෝවත් මේ ගැන තව දුරටත් යමක් ඔහුට නො කී හ. ඔහුට අසීරු කලක් එළැඹී තිබිණ. එසේ වුවත් වයලීනය අත් හැරීමට ඔහු රිසි නො වී ය. තමා අකැමැති දෙයක් නො වයා සිටීම නිවැරැදි යැයි ටොට්ටෝ චං ද සිතුවා ය. ඇය ඔහු වටා පනිමින් මෙසේ කීවා ය: "මට කමක් නැහැ. මම ඔයාගෙ වයලීනයටත් ආදරෙයි."

එහෙත් එයට පසු දින ටොට්ටෝ චං ඕකයාමා නැවැතුමෙන් බැස විකුණුම් මැසිමේ කවුළුවෙන් එබී බැලුවා ය. කුමක් හෝ එළියට එතැයි බලාපොරොත්තුවෙන් සිටියා ය.

## පොරොන්දුව

දිවා ආහාරය ගෙන, වටයට සකසා තිබූ මේස පුටු ආපසු තැබූ විට රස්වීම් හල ඉඩකඩ ඇති ව පෙනිණ.

මුල් ගුරුතුමා ගේ 'පිටේ යන' පළමු වැන්නා විය යුතු යැයි ටොට්ටෝ චං එදා තීරණය කළා ය.

මෙය සැමදාමත් ඇයට අවශ්‍ය දෙයක් විය. ඈ මදක් පසු බෑ විට, කවුරු හෝ රැස්වීම් හල මැද පලඟ බැඳ සිටින ඔහු ගේ ඇකයට පැන ගනී. තවත් දෙදෙනෙක්වත් ඔහු ගේ පිටෙහි එල්ලීමට කලහ කරමින් ඔහු සිත නම්මා ගැනීමට සෝෂා කරති.

"හා හා නවතින්න, නවතින්න" සිනාවෙන් මුහුණ රතු කර ගනිමින්, මුල් ගුරුතුමා තරවටු කරයි. එහෙත් ඔහු ගේ පිට අල්ලා ගත් පසු තමන් ගේ තැන අත හැරීමට කිසි සිසුවෙක් කැමැති නො වෙයි. යමකු පමා වුවහොත් ඔහු ගේ පිට බොහෝ තදබද යැයි ඔහුට හැඟෙනු ඇත. මෙදා මුලින් ම එහි ළඟා වීමට සිතූ



ටොට්ටෝ චං රැස්වීම් හල මැද රැක ගෙන සිටියා ය. ඔහු දුටු වහා ම, "මට ඔයාට කියන්න දෙයක් තියෙනවා"යි හඬ නගා කීවා ය.

"මොකක්ද? මොකක්ද?" මුල් ගුරුතුමා සතුටින් විමසමින් බිම සුපුරුදු පලඟ බඳින්නට විය.

දින ගණනක් සිතා බලා තීරණය කර ගෙන සිටි යමක් ඔහුට කීමට ඇයට අවශ්‍ය වී තිබිණ. එතුමා බිම හිඳ ගත් විට, පිටේ එල්ලීමේ අදහස ඇය අත් හැරියා ය. කීමට ඇති දේ මුහුණ බලා ගෙන කීම වඩා හොඳ ය. එබැවින් ඔහු අසල ඔහුට මුහුණ දී ළඟින් හිඳ ගත්තා ය. තමා කුඩා අවදියේ සිට ම මව "කදිම මුහුණ" යැයි පවසන මඳ සිනා සහිත පියකරු මුහුණ සාදා ගත්තා ය. මෙසේ හොඳ ම 'ඉරිදා මුහුණ' ඇති ව හිස සලද්දී ඇගේ සිතට දිරියක් ලැබිණ. තමා ඉතා ම හොඳ දැරියකැයි සිතමින් ම මුව විවර කළා ය.

මුල් ගුරුතුමා බලාපොරොත්තු සහිත ව ඇය දෙස බලා සිටියේ ය. නැවතත් ඉදිරියට නැඹුරු වෙමින් "ඒ මොකක් දැ"යි ඇසුවේ ය.

අක්කා කෙනෙකු ගේ හෝ අම්මා කෙනෙකු ගේ පැසුණු හඬකින් මිහිරි ව සෙමින් මෙසේ කීවා ය. "මම ලොකු වුණා ම මේ ඉස්කෝලේම උගන්වන්න කැමැතියි. ඇත්තටම මම මේ ඉස්කෝලේ ගුරුතුමියක් වෙනවා."

මුල් ගුරුතුමා සිනාසෙනු ඇතැයි ඇය සිතුව ද, එසේ නො වී ය. බරපතළ පෙනුමක් පළ කරමින්, "හොඳයි, පොරොන්දු වෙන්නැ"යි ඔහු කීවේ ය.

ඇය එසේ කිරීම ඔහුට අවශ්‍ය විය.

ටොට්ටෝ චං තදින් හිස සලා තිර අදිටනින් "ඔව්, මම පොරොන්දු වෙනවා"යි කීවා ය.

පළමු දිනයේ පළමු වන ශ්‍රේණියේ දැරියක වීමට ටොමෝවට පැමිණ කාර්යාලයේ දී මුල් ගුරුතුමා හමු වූ අන්දම ඇයට සිහි විය. එය බොහෝ කලකට පෙර සිදු වූවක් ලෙස ඇයට හැඟිණ. එදා පැය හතරක් පුරා ඔහු ඇය ගේ කතාවට සවන් දුන්නේ ය. ඇගේ කතාවෙන් පසු ව, "ඔයා දැන් මේ පාසලේ ළමයෙක්"යි ඔහු කී වදන්හි උණුසුම ඇයට සිහි විය. කොබයාෂි මහතා එදාටත් වඩා අද ඇයට ප්‍රිය ය. ඔහුට උදවු සඳහා ඔහු වෙනුවෙන් කළ හැකි හැම දෙයක් ම කළ යුතු යැයි අදිටන් කළා ය.

ඇය පොරොන්දු වෙද්දී, ඔහු සුපුරුදු ලෙස අඩු දත් ගැන පවා නො සලකා මහත් සතුටින් සිනාසුණේ ය. ටොට්ටෝ චං ඔහු ගේ සුළැඟිල්ල අල්ලා සිටියා ය. මුල් ගුරුතුමා ද එසේ ම කළේ ය. ඔහු ගේ සුළැඟිල්ල සවිමත් ය. ඒ කෙරෙහි විශ්වාසය තැබිය හැකි ය. චිරාගත ජපන් සිරිතට සුළැඟිලි පටලා ටොට්ටෝ චං සහ මුල් ගුරුතුමා නැවත පිළිණ දුන්හ. එතුමා සිනාසුණේ ය. ඇය ද පෙරළා සිනාසී තහවුරු කළා ය. ටොට්ටෝ චං ටොමෝවේ ගුරුතුමියක වන්නට යයි. මොන තරම් විස්මයක් ද?

"මම ගුරුතුමියක් වුණාම....." ඇය සිතුවිලි සයුරේ කිමිදුණා ය. ඇය සිතුවේ මෙසේ ය. "ඊනෑවාට වඩා ඉගෙනුම් නැත. බොහෝ ක්‍රීඩා දවස්, එළිමහන් කුස්සි, කඳවුරු, පාගමන්!"

මුල් ගුරුතුමා ද සතුටු විය. ටොට්ටෝ චං කවුරු ලෙස වැඩේ ඇයි හිතන්න අමාරුයි. නමුත් ඇයට ටොමෝවේ ගුරුතුමියක වන්නට හැකි බව ඔහුට නිසැක ය. කවර හෙයින් ද යත් ළමයෙක් නම් කෙබඳු අයෙක් දැයි ටොමෝවේ සිසුන් හොඳින් දැන සිටි බැවිනි!

වසර දහයකින් හෝ ඊට පසු ව සිදු විය හැකි දෙයක් ගැන ටොමෝවෙහි මුල් ගුරුතුමා ඉදිරියේ සිසුවකු ගැඹුරු ලෙස පිළිණ දෙද්දී ඇමෙරිකානු යුද ගුවන් යානා බෝම්බ පුරවා ගෙන ඇත අහසෙහි පියාසර කළ බැවින්, ඒ පිළිණය විසඳනු ඇත්තේ කාලය විසින් බව ඊනෑ ම අයකුට පෙනෙනු ඇත.

## රොකී අතුරුදන් වෙයි.

බොහෝ සෙබළු මිය ගියහ. අහර හිඟ විය. සියල්ලෝ බියෙන් තැති ගෙන උන්හ. එහෙත් ගිම්හානය සුපුරුදු ලෙස පැමිණියේ ය. දිනන පරදින සියලු ම ජාතීන්ට හිරු රැස් පතිත විය.

කමකුරාවේ මාමා ගේ නිවසේ සිට ටොට්ටෝ චං ටෝකියෝවට පැමිණියේ මේ දැන් ය. ටොමෝවෙහි දැන් කඳවුරු බැඳීම් නැත. උණුදිය උල්පත් නැරඹීමට සංචාර නැත. එදා වැනි ගිම්හාන ඉසුඹුවක් එවැනි සතුටකින් ගත කිරීමට සිසුනට ඉතින් නම් ඉඩක් නො ලැබෙනු ඇත. කමකුරාවෙහි



නිවසේ ඇගේ සුහුරුබඩුවන් සමඟ ටොට්ටෝ චං හැම ගිම්හානයක් ම ගත කළා ය. එහෙත් මේ වසරෙහි එය වෙනස්ය බියකරු අවතාර කතා කියා දුන් වයසින් වැඩිහිටි තරුණ ඥාතියා මෙවර යුද බිමට ගොස් සිටියේ ය. ඒ නිසා මෙවර අවතාර කතා නැත. ඇමෙරිකාවෙහි ගත කළ ජීවිතය ගැන නොයෙකුත් කතා කියා දුන් මාමා ද නො වී ය. මේ කතා ඇත්ත ද නැද්දැයි ඔවුනු කිසි දාක නො දත්හ. මාමා ද යුද බිමට ගොස් සිටියේ ය. ෂූජි තගුචි නම් වූ ඔහු ඉහළ තනතුරක් දැරූ හමුදා ඡයාරූප ශිල්පියෙක් විය.

නිව්යෝක් නුවර 'නිහොන් පුවත්' ආයතනයේ ප්‍රධානියා ලෙසත්, එයින් පසු ව 'ඇමෙරිකානු මෙට්රෝ පුවත්' ආයතනයෙහි ඇත පෙරදිග නියෝජිතයා ලෙසත් සේවය කර ඇති ඔහු 'ෂූ තගුචි, නමින් ප්‍රසිද්ධ ව සිටියේ ය. ඔහු ටොට්ටෝ චං ගේ පියා ගේ වැඩිමහලු සොහොවුරා විය. පියා ගේ පෙළපත් නම වෙනස් එකක් වූයේ තම. මව ගේ නාමය පවත්වා ගැනීම සඳහා, ඔහු ඇගේ පෙළපත් නම ගත් බැවිනි. නො එසේ නම් ඇගේ පියා ද 'තගුචි' නමින් හැඳින්වෙනු ඇත. ෂූජි මාමා ගේ කැමරාවෙන් නිපැදවුණු 'රබාවුල් සටන' වැනි චිත්‍රපට සිනමාහල්හි ප්‍රදර්ශනය කරන ලදී. යුද පෙරමුණෙහි පටිගත කරන ලද චිත්‍රපට සියල්ල ඔහු ගේ විය. මේ නිසා, ටොට්ටෝ චං ගේ ලොකුඅම්මා සහ සුහුරුබඩුවෝ ඔහු ගැන බියපත් වූ හ. භයානක අවස්ථා පිළිබඳ චිත්‍රපට නිතර ම සෙබළුන්ට පෙන්වනු ලැබේ. මේවා පටිගත කිරීම සඳහා ඡායාරූප ශිල්පියාට නිතර ම සේනාංක සිටින තැනට වඩා ඉදිරියට යාමට සිදු වෙයි. මේ නිසා ය, ටොට්ටෝ චං ගේ වැඩිහිටියන් මේ මාමා ගැන බිය වූයේ.

කමකුරා වෙරළ පවා ඒ ගිම්හානයේ දී අසරණව තිබිණ. එසේ වුවත් යත් චං සතුටින් සිටියේ ය. ඔහු ෂූජි මාමා ගේ ලොකු පුතා ය. ටොට්ටෝ චංට වඩා වසරකින් බාල ය. ළමයි සියල්ලෝ මහ මදුරු දැලක් යට එකට නිදා ගත්හ. ඔහු නින්දට පෙර වෙඩි වැදී මිය යන සෙබළකු ගේ ඉරියව්වෙන් "දිනේවා අදිරදුනි"යි මහ හඬින් පවසා බිම පතිත විය. ඔහු එය යළි යළිත් කළේ ය. විහිළුව නම්, එසේ කළ හැම විට ම නින්දෙන් ඇවිද ගොස්, බිහිදොර අසල වැටී අන් අය ගේ සිනාවට ලක් වීම ය.

නිම කිරීමට කටයුතු තිබුණු බැවින් මවත් පියාත් ටෝකියෝ නුවර නැවතී සිටියෝ ය. ගිම්හාන ඉසුඹුව අවසන් වූ පසු ව, අවතාර කතා කී තැනැත්තා ගේ සොහොවුරිය විසින් ඇය ටෝකියෝවට කැඳවා එනු ලැබිණ.

සුපුරුදු ලෙස නිවසට ආපසු පැමිණි වහා ම, ටොට්ටෝ චං කළ මුල් කාරිය වූයේ රොකී සෙවීම ය. නමුත් ඌ කිසි තැනක සොයා ගත නො හැකි විය. නිවසේ හෝ වත්තේ හෝ ඌ නො සිටියේ ය. පියා උඩවැඩියා වවා තිබූ උයන් ගෙහි ද නො වී ය. අන් දිනවල දී තමා නිවසට පැමිණීමට බොහෝ පෙරාතුව, ඌ තමා සොයා පැමිණෙන බැවින්, ඇය බෙහෙවින් ම මේ ගැන කනස්සලු වූවා ය. ටොට්ටෝ චං නිවසින් බැහැර ව, උගේ නම කියමින් මග දිගේ ගියා ය. අහෝ! උගේ පියකරු ඇස්, කන්, වල්ගය ආදිය ගැන සංඥාවක් හෝ නො වී ය. තමා ආ අතරේ ඌ ගෙදරට යන්නට ඇතැයි සිතී වේගයෙන් ආපසු ගිය ද ඌ පැමිණ නො සිටියේ ය.



"රොකී කෝ?" ඇය මව ගෙන් විමැසුවා ය.

ඌ සොයා ටොට්ටෝ චං දුව ඇවිදිනු මවට රහසක් නො වී ය. එහෙත් ඇය මුවින් නො බැණ සිටියා ය.



"රොකී කෝ?" ටොට්ටෝ චං නැවතත් ඇසුවා ය.

පිළිතුරු දීමට ඇයට අපහසු බවක් පෙනිණ. "ඌ අතුරුදන් වෙලා" ඇය කීවා ය.

ටොට්ටෝ චංට එය විශ්වාස කළ නො හැකි විය. "ඌ අතුරුදන් වුණේ කොහොමද? කවදාද?" ඇය මව ගේ මුහුණ බලා ගෙන ම ඇසුවා ය.

ඇයට වචන හිඟ බවක් පෙනුණි. "ඔයා කමකුරාවට පිටත් වූ හැටියේ ම" ඇය දුක්මුසු ලෙස කීවා ය. ඊළඟට ඇය කියා ගෙන කියා ගෙන ගියා ය."අපි ඌ හෙවුවා අපි හැම තැන ම ගියා. කාගෙනුත් ඇහුවා. නමුත් අපට සොයා ගන්න බැරි වුණා. මේක ඔයාට කියන්නෙ කෙහොමද කියලා සිත සිතායි අපි උන්නේ මට හරි ම කනගාටුයි."

ටොට්ටෝ චංට ඇත්ත එළි වෙමින් තිබිණ. ඌ මැරිලා විය යුතු ය. තමා කනගාටු වන නිසා නො කියනවා විය යුතු ය. "අනේ! රොකී මැරිලා!"

ටොට්ටෝ චංට එය ඉතා පැහැදිලි ය. මේ දක්වා ම ටොට්ටෝ චං කෙතරම් කලක් නිවසින් බැහැර ව සිටියත් රොකී නිවසින් ඈත නො ගියේ ය. ඇය ආපසු එන බව ඌ දැන සිටියේ ය. "මට නො කියා ඌ කවදාවත් ඈතට ගිහිල්ලා නැහැ" ඇය තමාට ම කියා ගත්තා ය. එය පැහැදිලි තීරණයක් විය.

එහෙත් ටොට්ටෝ චං මව සමඟ කතා නො කළා ය. මව ඉඟි මරා "ඌ ගියේ කොහේ දැයි මට පුදුමයි" යනුවෙන් කියන විට, එයින් අදහස් කළ දේ ඇයට පැහැදිලි විය.

මවට කිව හැක්කේ එපමණෙකි. ඊළඟට ටොට්ටෝ චං උඩුමහලේ තම කාමරයට දිව ගියා ය රොකී නැති ව මෙය තම ගෙදර යැයි සිතීමට පවා ඇයට නො හැකි විය. ඇය නො හඬා සිටීමට හැකි තාක් වෑයම් කළා ය. ඒ ගැන තව දුරටත් සිතුවා ය. රොකීට නිවස අත් හැර යාමට සිතෙන පරිදි ඌට අකටයුත්තක් තමා අතින් සිදු වී දැයි සිතීමට ඇය වෑයම් කළා ය.

කිසි ම වෙලාවක සතුන්ට සමච්චල් කරන්න එපායි කොබයාෂි මහතා ටොමෝවේ සිසුන්ට නිතර ම කීවේ ය. "සතෙක් ඔබට විශ්වාසය තබන කොට, ඒ විශ්වාසය කඩ කිරීම දුෂ්ට කමක්, යමක් කරන්න කියලා බල්ලාට කියා ඌට යමක් නොදී සිටින්න එපා. එහෙම වුණොත්, ඌට ඔබ ගැන විශ්වාසය නැතුව යනවා. එයින් ඔබ ගැන අසතුටක් ඌට ඇති වෙනවා."

ටොට්ටෝ චං නිතර ම මේ නීති පිළිපැද්දා ය. ඇය කිසි විටෙකත් රොකී රැවැට්ටුවේ නැත. තමා ඌට කිසි ම වරදක් කළ බවක් ඇයට මතක් කර ගත නො හැකි ය.

බිම බැටී තිබුණු ඇගේ ටෙඩී වලසා ගේ පයෙහි යමක් ඇලී තිබෙනු එවිට ම ඇය දුටුවා ය. මේ දක්වා නො හඬා සිටීමට ඇය සමත් වුව ද, ඒ දුටු වහාම ටොට්ටෝ චං මහ හඬින් හඬා වැටුණා ය. ඇලී තිබුණේ රොකී ගේ ලාදුඹුරු ලොම් ගස් කීපයෙකි. ඇය කමකුරාවට පිටත් වූ දා උදයේ ඌ සමඟ කාමරයේ බිම පෙරළෙමින් සෙල්ලම් කරද්දී, ගැලැවුණු ලොම් ගස් කීපයක් විය යුතු ය. මේ කුඩා ජර්මන් එඬේර ලොම් ගස් කීපය මිටි කර ගෙන ඇය හැඬුවා ය. තව තවත් හැඬුවා ය. ඇගේ කඳුළු සහ ඉකි ගැසීම නැවැත්විය හැකි නො වී ය.

යසුවාකි චං මුලට. දැන් ඊළඟට රොකී. ටොට්ටෝ චංට තවත් මිතුරෙක් අහිමි වී ඇත.

## තේ සාදය

ටොමෝවේ මුරුකරු රියෝ චං සියලු ම සිසුන් විසින් අලුම් කරන ලද අයෙකි. අන්තිමේ දී ඔහු ද හමුදා සේවයට කැඳවා තිබිණ. වැඩුණු මිනිසකු වුව ද, සිසුන් ඔහු ඇමැතුවේ, 'රියෝ චං' යන සුරතල් ළමා නාමයෙනි. ඔහු ළමයින් රක්නා දේව දූතයකු වැනි විය. ඕනෑ ම අයකු කරදරයට පත් වූ විට, සැණින් පිහිටට ආවේ ඔහු ය. ඔහුට ඕනෑ ම දෙයක් කළ හැකි විය. රියෝ චං වැඩි කතා නැත. නිතර ම සිනාසීම පමණි ඔහු කළේ. එහෙත් හැම විටෙක ම කළ යුත්ත හොඳින් දැන සිටියේ ය. එදා ටොට්ටෝ චං මලවළේ පතිත වූ විට, ඇය බේරා ගැනීමට දිව ආවේ රියෝ චං ය. මැසිවිලි කිසිත් නැති ව, වහා ම ඇය ඉවතට ගෙන සෝදා පිරිසිදු කරන ලද්දේ ඔහු විසිනි.

"අපි රියෝ චංට හොඳ තේ සාදයක් පවත්වමු"යි මුල් ගුරුතුමා පැවැසී ය.

"තේ සාදයක්?"

ජපානයේ දිනකට බොහෝ වාරයක් 'හරිත තේ ' පානය කෙරේ. නමුත් උත්සව සඳහා එම තේ යොදා ගනු නො ලැබේ. ඒ සඳහා අන් රසක් ඇති විශේෂ තේ වර්ගයක් භාවිත කෙරේ.



තේ සාදය යනු ටොමෝවට අලුත් දෙයකි. නමුත් සිසුහු ඒ අදහස ගැන බොහෝ සේ සතුටු වූ හ. නො කළ විරූ දෑ කිරීමට ඔවුහු නිතර ම සැදී සිටිති. සිසුන් නො දත්ත ද මුල් ගුරුතුමා නව වදනක් නිපදවා තිබුණි. සුපුරුදු 'සොබෙත්සුකායි' (සමුගැනීමේ සාදය) වෙනුවට ඔහු සිතාමතා ම යොදා ගත්තේ 'සචකායි' (තේ සාදය) යන වචනයයි. සමුගැනීමේ සාදය යන්න දුක උපදවයි. රියෝ චං නැවත නො පැමිණේ නම් හෝ මළේ නම් හෝ ඒ වචනය ගැළැපෙයි. කිසි අයකු තේ සාදයකට මෙතෙක් සහභාගි වී නැති බැවින් මේ යෝජනාවෙන් කවුරුත් සසල ව ගියහ.

පාසලින් පසු ව, දිවා ආහාරයට මෙන් මේස පුටු වටාකාර ව සකසන ලදී. සියල්ලන් එහි හිඳ ගත් පසු මුල් ගුරුතුමා බදින ලද තුනී වියලි මාළු තීරුව බැගින් සිසුනට බෙදා දුන්නේ ය. මේ යුද සමයෙහි එය පවා වටිනා ආහාරයක් විය. ඔහු රියෝ චං අසලින් ම හිඳ ගෙන කුඩා සකේ විදුරුවක් ඉදිරියෙන් තැබුවේ ය. ඒ වනාහි යුද පෙරමුණට යන අයට පමණක් ලබා ගත හැකි වූ සලාකයෙකි.

"මේක ටොමෝවේ පළමු වන තේ සාදය," මුල් ගුරුතුමා කීවේ ය. "අපි මේක ප්‍රීතිදායක අවස්ථාවක් කර ගනිමු. රියෝ චංට කියන්න දෙයක් ඔයාලට තියෙනවා නම්, දැන් ඒකට අවස්ථාවයි. රියෝ චංට පමණක් නොවෙයි. ඔයාලා අතරත් අදහස් හුවමාරු කර ගන්න තියෙනවා නම් එහෙම කරන්නත් පුළුවන්. දැන් එක් එක් කෙනා ඉදිරිපත් වෙන්න. මැදට එන්න."

මෙය ඔවුන් ටොමෝවේ දී මාළු තීරු බුදින පළමු දිනය නො වේ. එහෙත් රියෝ චං ඔවුන් සමඟ එකට හිඳ ගෙන සිටින පළමු වන දිනයයි. ඔහු සකේ තොල ගානු දකින පළමු වන දිනයයි. එකිනෙකා මැද සිට ගෙන රියෝ චං ගේ මුහුණ බලා ගෙන ඔහුට කතා කළේ ය. තමා ගැන පරිස්සම් වන ලෙසත් අසනීපවලට ගොදුරු නො වන ලෙසත් මුල් මුල් අය කී හ. ඊළඟට ටොට්ටෝ චං ගේ පන්තියේ ම සිටි මිජිටා පැමිණ මී ළඟට මම ගමේ ගියා ම, මළ ගෙවලදී කෑමට ලැබෙන අග්ගලා ගේනවායි කීවේ ය.

සියල්ලෝ ම කොක්හඬ ලන්නට වූ හ. මළ ගෙවල දී තමන්ට කෑමට ලැබුණු අග්ගලා ගැනත් ඒවායේ රසවත්කම

ගැනත් ඔහු කියා තිබුණේ මෙයට වසරකට පෙර සිට ය. කිසියම් කරුණක් එළැඹි හැම විට ම ඔහු පිළිණ කළේ ඒවා ටිකක් ගෙනෙන බව ය. එහෙත් කිසි දාක පිළිණ ඉටු වූයේ නම් නැත.

මළ ගෙවල අග්ගලා ගැන මිජිටා සඳහන් කළ විට, මුල් ගුරුතුමා ඒ ගැන සිතුවේ ය. මෙබඳු අවස්ථාවක මළ ගෙවල අග්ගලා ගැන සඳහන් කිරීම අශුභ ලෙස සැලැකෙන දෙයකි. නමුත් මිජිටා ඒ ගැන කීවේ අහිංසක ලෙස ය. බලපෑවේ ඉතා රසවත් දෙයක් මිතුරන් අතර බෙදා ගැනීමේ ආසාව ය. මේ නිසා මුල් ගුරුතුමා සෙස්සන් සමඟ සිනාසුණේ ය. රියෝ චං ද හදවතින් ම සිනාසුණේ ය. මේ අග්ගලා ටිකක් ගෙනැවිත් දෙන බව දිගු කලක සිට මිජිටා මුල් ගුරුතුමාට පොරොන්දු වී තිබිණ.

ඔහු නැඟිට තමා ජපානයේ හොඳ ම උයන් පල්ලා වන බව රියෝ චංට කියා සිටියේ ය. ඔහු තොදොරෝකිවල අගනා තවාන් උයනක අයිතිකරුවා ගේ පුතා ය. කීකෝ ඔකි නැඟී සිටි නමුත් කිසිවක් නො කීවා ය. ඇය ලජ්ජාවෙන් ඇඹරුණා ය. නැමී ආචාර කොට, සිය අසුනට ගියා ය. ඊළඟට ටොට්ටෝ චං ඉදිරියට පැන මෙසේ කීවා ය. "කීකෝ චං ගේ කුකුළන්ට පියාඹන්නට පුළුවන්. ඊයේ මම උන් දුටුවා."

ඊළඟට අමදරා කතා කළේ ය. "කැඩිච්ච බළල්ලු හරි බල්ලෝ හරි ඉන්නවා නම් මා ළඟට ගෙනෙන්න. මම උන් සනීප කරලා දෙන්නම්."

ඉතා කුඩා තකහෂි මේසය යටින් රිංගා ඇසි පිය හෙළන සැණින් වටය මැද පෙනී සිටියේ ය.

ආචාරශීලි හඬින් මෙසේ කීවේ ය. "රියෝ චං ඔයාට ස්තූතියි. සියලු දේකටම ඔයාට ස්තූතියි!"

අයිකෝ සායිහෝ ඊළඟට නැඟී සිටියා ය. "මම වැටිච්ච වෙලාවේ තුවාල වෙළුවාට බොහෝම ස්තූතියි. රියෝ චං මට කවදාවත්ම ඒක මතක නැති වෙන්නෙ නෑ." ඇය කීවා ය. අයිකෝ සායිහෝ ගේ මයිලණුවෝ රුසියානු ජපන් යුද්ධයේ සුපතළ ටොගෝ නැව්පති වූ හ. ඇගේ තවත් නෑයෙක් මෙයිජි අදිරද පාසලේ චතුර කිවිඳියක් වූවා ය. නමුත් අයිකෝ කිසි දිනක මේ අය ගැන සඳහන් නො කළා ය.

රියෝ චං ගේ වගතුග හොඳින් දැන සිටි තැනැත්තිය මුල් ගුරුතුමා ගේ දුව වූ මියෝ චං වූවා ය. ඇගේ දෙනෙත් කඳුළින් බර විය. "රියෝ චං ඔයා ගැන පරිස්සම් වෙන්න. අපි ලියුම්වලින් හමු වෙමු." ඇය කීවා ය.



ඔහුට කීමට බොහෝ දේ ටොට්ටෝ චංට තිබුණි. කොතැනින් අරඹන්න දැයි ඈ නො දන්නා ය. "රියෝ චං ඔයා අද ගියාට හැමදාම අපට තේ සාදයක් තියේවි" ඇය කීවා ය.

මුල් ගුරුතුමාට සිනා ගියේ ය. රියෝ චං ද සිනාසුණේය. ටොට්ටෝ චං ඇතුළු සියල්ලෝ සිනාසුණහ.

එහෙත් ටොට්ටෝගේ වදන් පසු දා ම සැබෑ විය. සිසුහු ඉඩක් ලද වහා ම, කණ්ඩායමක් සැදී 'තේ සාදය' ක්‍රීඩාව කරති. මාළු තීරු වෙනුවට ඔවුහු ගස්වල පොතු වැනි දේ යොදා ගනිති. තේ වෙනුවට දිය වීදුරු තොල ගාති. ඇතැම් විට ඒ සකේ බවක් දක්වති. "මම ඔයාට මළ ගෙදර අග්ගලා ගේනවා"යි යම් අයකු කියනු ඇත. ඔවුහු කොක්හඬ ලති. ඊළඟට තම තමන් ගේ සිතුවිලි එකිනෙකාට කියා ගනු ඇත. කෑමට කිසිවක් නොතිබුණ ද, 'තේ සාද' විනෝද ජනක විය.

තේ සාදය රියෝ චං ළමයින්ට තිළිණ කළ අගනා සමුගැනීමේ තෑග්ගක් විය. එවකට කිසිවකුට සෝදිසියක් නො තිබුණ ද, එකිනෙකා ගෙන් වෙන් ව, වෙන් වෙන් මඟෙහි වෙන වෙන ම ගිය ඔවුන් ගේ අවසාන ම ක්‍රීඩාව එය විය.

රියෝ චං ටෝකියෝ දුම්රියෙන් පිටත් ව ගියේ ය. ඔහු ගේ පිටත් වීම සමඟින් ම ටෝකියෝවේ ඉහළ අහසෙහි පියාසර කළ ඇමෙරිකානු ගුවන් යානා දිනපතා ම බෝම්බ හෙළන්නට විය.

## සයොනාරා, සයොනාරා!

ටොමෝව දැවුණේ ය. එය සිදු වූයේ රැයෙහි දී ය. පාසලට යාබද නිවසේ ජීවත් වූ මියෝ චං, ඇගේ සොහොවුරිය මියා චං හා ඔවුන් ගේ මව කුහොන්බුත්සු විහාරයේ පොකුණ අසල පිහිටි ටොමෝ ගොවි පළට පලා ගොස් පණ බේරා ගත්හ.

බී 29 ප්‍රහාරක යානා මඟින් හෙළන ලද දාහක බෝම්බ දුම්රිය මැදිරි පන්ති කාමර මත පතිත විය.

මුල් ගුරුතුමා ගේ සිහිනයක් වූ පාසල ගිනි දැල්වලින් වෙළී ගියේ ය. සාධාකාලික ව ඔහු ආදරය කළ, ළමා සිනා හඬ, ළමා ගැයුම් හඬ වෙනුවට බියකරු හඬක් නංවමින් පාසල ඇද වැටුණේ ය. බුර බුරා නැඟෙන ගිනි දැල් එය බිමට සමතලා වන පරිදි පුලුස්සා දැමී ය. මුළු ජියුගාවෝකාව ම ගින්නෙන් දිලිණ.

සියලු බියකරු සිදුවීම් මධ්‍යයේ මුල් ගුරුතුමා පාරේ සිට ටොමෝව දැවෙනු බලා සිටියේ ය. වියැකී ගිය, කොටස් තුනකින් පුනු කළුවන් ඇඳුමෙන් ඔහු සැරසී සිටියේ ය. දැත් කබා සාක්කු තුළ ය.

"මීළඟට අපි ගොඩ නඟන්නේ කොයි වගේ පාසලක්ද?" තමා අසල සිට ගෙන සිටි සරසවි සිසු ටොමෝ ගෙන් ඔහු ප්‍රශ්න කළේ ය. ටොමෝ අන්දමන්ද ව සිටියේ ය.

කොබයාෂි මහතා තුළ ළමයින් කෙරෙහි පැවැති ප්‍රේමය හා ඉගැන්වීම කෙරෙහි පැවැති ආදරය පාසල වසා නැගෙන ගිනිදැල්වලට වඩා බලවත් ය. මුල් ගුරුතුමා සතුටින් සිටියේ ය.

ටොට්ටෝ චං සෙනඟ පිරී ඉතිරී ගිය 'අපහරණ දුම්රියෙහි' වැතිර වැඩිහිටියන් අතර මිරිකී සිටියා ය. එය ඊසාන දෙසට ධාවනය විය. අඳුරේ ම, කවුළුව තුළින් පිටත බලා සිටි ඇයට මුල් ගුරුතුමා ගේ සමුගැනීමේ වදන් සිහි විය. "අපි නැවතත් හමුවෙමු" ඔහු නිතර නිතර තමාට කී වදන් ද සිහි විය. "දන්නවද? ඔයා හරිම හොඳ ළමයෙක්." මේවා අමතක කිරීමට ඇයට නො හැකි ය. කොබයාෂි මහතා ඉක්මනින් නැවතත් තමාට හමු වෙතියි යන සුරැකි හැඟුමෙන් ම ඇය නින්දට වැටුණා ය.

තොතින් මගීන් සහිත දුම්රිය අඳුරේ ම ගුගුරමින් ඉදිරියට ඇදුණේ ය.

# පසුවදන

එක ම පන්ති කාමර 'දුම්රියෙහි' මා සමඟ එකට ගමන් කළ මගේ මිතුරු මිතුරියෝ දැන් කුමක් කරත් ද?

## අකිරා තකහෂි

ක්‍රීඩා දිනයේ දී සියලු ම තෑගි හිමි කරගත් තකහෂි එදා සිටි පමණට වඩා මදකුත් නො වැඩුණේ ය. රග්බි කණ්ඩායම නිසා ජපානයෙහි සුපතළ නමක් දිනූ උසස් පාසලකට වර්ණ ලාභියකු වශයෙන් ටොමෝවෙන් පසු ව ඔහු ඇතුළත් විය. එයින් පසු ව මෙයිජි සරසවියට ඇතුළු වූ ඔහු ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා උපාධියක් ලද්දේ ය.

ඔහු දැන් මධ්‍යම ජපානයේ හමානා විල අසල විශාල ඉලෙක්ට්‍රොනික සමාගමක පිරිස් කළමනාකරු තනතුර දරයි. ආයතනයේ ශ්‍රම බලකායේ එකමුතුව ගැන වගබලා ගන්නා ඔහු පැමිණිලි සහ ගැටලු විමසා පිළියම් යොදයි. තමා බොහෝ සේ පීඩාවට පත් වී සිටි බැවින් අන් අයගේ ගැටලු තේරුම් ගැනීමට ඔහුට පුළුවන. ඔහු ගේ ප්‍රබෝධවත් පෙනුම සහ ආකර්ෂණීය පෞරුෂය එහි ලා බොහෝ සේ උදවු වන බව නිසැක ය. චක්‍රාකාර ව සමෝධානය කර ඇති විශාල යන්ත්‍ර සූත්‍ර පරිහරණය කිරීමට ඔහු තාක්ෂණික විශේෂඥයකු වශයෙන් තරුණයන්ට පුහුණුව ලබා දෙයි.

තකහෂි සහ ඔහු ගේ බිරිඳ හමු වීමට මම හමමත්සු වෙත ගියෙමි. ඉතා ම හොඳින් ඔහු හඳුනා ගෙන සිටින බිරිඳ ටොමෝව ගැන බොහෝ දේ තම සැමියා ගෙන් අසා ඇත. තමා ඒ පාසලට ගිය තරමට ඒ ගැන තොරතුරු දන්නා බව ඇය පවසයි. තමා ගේ 'කුරුම්ට් බව' ගැන කිසි ම ගැටලුවක්, කිසි ම සංකීර්ණතාවක් තකහෂි තුළ නොමැති බව ඇය සහතික කළා ය.

ඇය නිවැරදි බව මට නිසැක ය. එබඳු සංකීර්ණතා පැවැතියේ නම්, කීර්තිමත් උසස් පාසලේ හා සරසවියේ ඔහු ගේ ජීවිතය ඉතා දුෂ්කර වනු ඇති සේ ම, පිරිස් අංශයක් භාරව කටයුතු කිරීම ද ඔහුට දුෂ්කර වනු ඇත.

ටොමෝවෙහි පළමු දවස විස්තර කළ තකහෂි පැවැසුවේ තවත් ශාරීරික ආබාධිතයන් එහි සිටිනු දුටු විට, තමාට විශාල සහනයක් දැනුණු බව ය. ඒ මොහොතේ සිට ම ඔහුට කිසි ම කනස්සල්ලක් නො දැනුණු බවත් හැම දවසක් ම ප්‍රීතිදායක වූ බවත් එක් දිනයකුත් ගෙදර නැවතීමට අවශ්‍ය නුවූ බවත් ඔහු පැවැසී ය. නිරුවතින් තටාකයේ පිහිනීමට මුල් දිනයෙහි පසුබෑස්මක් ඇති වුව ද, එකිනෙක ඇඳුම් උනද්දී ලජ්ජාව සහ කුළැටි ගතිය ක්‍රමයෙන් පලා ගිය බවත් ඔහු කීවේ ය. අහර ගනිද්දී කතාවක් සඳහා සෙස්සන් ඉදිරියේ නැඟී සිටීමට ඔහුට කිසි ම ලජ්ජාවක් හෝ කුළැටි කමක් ඇති නො වී ය.

සරඹ ක්‍රීඩාවල දී පිනුම් දණ්ඩියමට උඩින් පැනීමට, කොබයාෂි මහතා තමා දිරි ගැන්වූ අන්දම ඔහු විස්තර කළේ ය. දිරි ගැන්වූවා පමණක් නො ව, එසේ පැනීමට ඔහු උදවු කළ බව ද ඇත් හැඟෙන නමුත්, එම පිනුම කරන ලද්දේ තමා විසින් ම යැයි අවසාන මොහොත දක්වා ම සිතා ගැනීමට ඔහු අවකාශ සැලැස්වී ය. කොබයාෂි මහතා ඔහුට ආත්ම විශ්වාසය දුන්නේ ය. සාර්ථක ව යමක් ඉටු කළ විට ලැබෙන වචනයෙන් කිව නොහැකි සතුට විඳගැනීමට සැලැස්වී ය. තමා පසුබිමෙහි සැඟවීමට වෑයම් කළ හැම අවස්ථාවක දී ම ඉදිරියට ගෙන ජීවිතය පිළිබඳ ව හිතකර යහපත් ආකල්ප වර්ධනය කර ගැනීමට අවස්ථාව ලබා දුන්නේ ය. සියලු ම තෑගි හිමිකර ගැනීමට හැකි වීමෙන් ක්‍රීඩා දිනයේ දී ඔහු ලද ප්‍රබෝධය තාමත් ඔහුට අමතක කළ නො හේ. ඔහු දිදුලන ඇසින් යුතු ව සංවේදී ලෙස ටොමෝව අදත් සමරයි.

එබඳු කදිම පුද්ගලයකු බවට වර්ධනය වීමේ දී, යහපත් ගෘහ පරිසරය ද ඊට පාදක වන්නට ඇත. එසේ වුවත් කොබයාෂි මහතා ඉතා ම දුර දිග බලා අප සියල්ලන් සමඟ කටයුතු කළ සුවිශේෂ විලාසය ඊට බලපෑ බවට කිසි ම සැකයක් නැත. "දන්නවාද? ඔයා හරිම හොඳ ළමයෙක්" යැයි ඔහු මට කී පරිදි ම,



තකහෂි දිරි ගැන්වීමට නිතර ම කීවේ "ඔයාට ඒක කරන්න පුළුවනි" යන්න ය. ඔහු ගේ ජීවිතය හොඳින් හැඩ ගැසීමට එය තීරණාත්මක සාධකය වූවා නිසැක ය.

මා හමමත්සු වෙතින් පිටත් ව ඒමට සූදානම් වන විට, මට මුළුමනින් ම අමතක ව තිබුණු කරුණක් තකහෂි මතක් කළේ ය. ඔහු එකල ටොමෝවට එන විට, අන් පාසල්හි සිසුන් විසින් හිරිහැර හා සමච්චල් කරන ලද බවත්, එයින් දුර්මුඛ ව ඔහු පාසලට එනු දකින මා ඔහුට කරදර කළ සිසුන් ගැන අසා වහා ම දොරටුව වෙත දිව ගොස් ටික වේලාවකින් ආපසු පැමිණ, "දැන් හරි, ආයිත් ඒක වෙන්නේ නෑ!"යි ඔහුට පැවැසූ බවත් තකහෂි මතක් කර දුන්නේ ය.

"ඒ දවස්වල ඔයා මා සතුටු කළේ එහෙමයි!" අප වෙන් වෙද්දී ඔහු පැවැසී ය. මතක් කළාට ස්තුතියි තකහෂි!

## මියෝ චං (මියෝ කනෙකෝ)

කොබායාෂි මහතා ගේ තෙවැනි දුව මියෝ චං කුනිටාචි සංගීත විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ ඉගෙනීම අවසන් කර ඊට අනුබද්ධ මූලික පාසලේ සංගීතය උගන්වයි. කුඩා දරු දැරියන්ට ඉගැන්වීම ඇය බොහෝ සේ ප්‍රිය කරයි. ඇය බහ තේරූ අන්දම ද, අවුරුදු තුනක වයසේ සිට ඇය ගමන් කළ අයුරු හා සිරුර චලනය කළ අයුරු ද කොබයාෂි මහතා මැනවින් නිරීක්සා තිබිණ. ළමයින්ට ඉගැන්වීමේ දී මේ නිරීක්ෂණ ඔහුට බොහෝ සේ උදවු විය.

## සක්කෝ මත්සුයාමා (දැන් සායිටෝ මහත්මිය)

මා ටොමෝවට ඇතුළු වූ දිනයෙහි සස රුවක් මසා තිබූ උඩු ඇඳුමකින් සැරසී සිටි විශාල ඇස් ඇති දැරිය වූ සක්කෝ චං, එකල දැරියන්ට ඇතුළු වීමට ඉතා ම දුෂ්කර පාසලක් වූ මිටා උසස් පාසල නමින් අද හැඳින්වෙන පාසලට ඇතුළු වූවා ය. ටෝකියෝ කාන්තා සරසවියේ ඉංග්‍රීසි අංශයට බැඳුණු ඇය තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමයේ ඉංග්‍රීසි උපදේශිකා තනතුරට පත් වූවා ය. ඇය ඔවුන් ගේ ග්‍රීෂ්මාන කඳවුරුවල දී ටොමෝවෙන් ලද බොහෝ අත්දැකීම් භාවිතයට ගනී.

ජපාන ඇල්ප්ස් වැටියේ හොතාකා කන්ද තරණය කරද්දී මුණගැසුණු පුද්ගලයකු සමග ඇය විවාහ පත් වූවා ය. ඔවුන් හමුවීමේ අවස්ථාව සැලැසූ කන්ද සිහිවීම සඳහා, එහි නමේ කොටසක් අගට යොදා ගෙන 'සසුතාකා' යන නම තම පුතුට තබා ඇත.

## තායිජි යමනවුචි

මා විවාහ කර නොගන්නා බව පැවැසූ තායි චං ජපානයේ ප්‍රමුඛ භෞතික විද්‍යාඥයකු බවට පත් විය! බුද්ධි ගලනයට උදාහරණයක් වෙමින්, ඔහු ඇමෙරිකාවේ වෙසෙයි. ටෝකියෝ අධ්‍යාපන සරසවියෙහි විද්‍යා අංශයට බැඳී භෞතික විද්‍යා උපාධියක් ලද හෙතෙම ඊළඟට විද්‍යාපති පශ්චාත් උපාධිය ද ලද්දේ ය. ෆුල්බ්‍රයිට් හුවමාරු ශිෂ්‍යත්වයක් මත ඇමෙරිකාවට ගොස් අවුරුදු පහකට පසු ව, රොචෙස්ටර් සරසවියෙන් ආචාර්ය උපාධිය ලැබ අධිශක්ති භෞතයන් පිළිබඳ පර්යේෂණයන්හි නිරත වෙමින්, ඔහු එහි ම නතර වූයේ ය. ඔහු දැනට ඉලිනොයිස්හි ජාතික අධිවේගී ෆර්මි විද්‍යාගාරය නමැති, ඒ වර්ගයට අයත් ලෝකයේ විශාලතම ආයතනයෙහි සහකාර අධ්‍යක්ෂ තනතුරක් උසුලයි. ඇමෙරිකාවෙහි සරසවි 53ක දක්ෂතම පුද්ගලයන් ගෙන් සමන්විත මේ විද්‍යාගාරය භෞතික විද්‍යාඥයන් 145ක් ද, තාක්ෂණික කාර්ය මණ්ඩලය 1400ක් ද නියුක්ත යෝධ සංවිධානයෙකි. තායි චං කොතරම් විශද ප්‍රාඥයෙක් දැයි මෙයින් ඔබට පැහැදිලි වනු ඇත. බිලියන පන්සියයක ඉලෙක්ට්‍රෝන වෝල්ටියතාවෙන් යුතු අධිශක්ති කදම්බයක් නිපදවීමෙන් මේ විද්‍යාගාරය මෙයට පස් වසරකට පමණ පෙර ලෝක අවධානයට පාත්‍ර විය.

මෑතක දී තායි චං කොලොම්බියා සරසවියේ මහාචාර්ය වරයකු සමඟ එක්ව, 'අප්සිලන්' නමැති ද්‍රව්‍යය සොයා ගත්තේ ය. ඔහු යම් දිනෙක නොබෙල් ත්‍යාගය ලබන බව මට නිසැක ය.

රොචෙස්ටර් සරසවියෙන් ගණිත විද්‍යාව සඳහා ගෞරව උපාධියක් ලත් දක්ෂ ඇරියක සමඟ ඔහු විවාපත් විය. තමා උගත් මූලික පාසල කුමක් වුව ද, එබඳු බුද්ධිමතුන් සමඟ තායි චං ඉදිරියට ගොස් ඇත. මා සිතන පරිදි නම්, ටොමෝවෙහි සිසුන්ට තමතමන් කැමැති පරිදි විෂය තෝරා ගෙන ඉගෙනීමට ඉඩ



සැලැසීමෙන් ඔවුන් ගේ දක්ෂතා තීව්‍ර කර ගැනීමට ඉඩ ලැබුණේ ය. මද්‍ය දාහකය, උණු දිය බඳුන් හා පිරික්සුම් නළ ඇසුරේ කටයුතු ද, භෞතික විද්‍යාව හා වෙනත් විද්‍යාවන් පිළිබඳ බරපතළ පොත පත කියැවීම ද හැරෙන විට, ඔහු කළ වෙනත් කිසි ම වැඩක් ගැන මට මතකයක් නැත.

## කුනියෝ ඕචි

කොණ්ඩා කරල්වලින් ඇද මා වෙහෙසට පත් කළ ඕචි, ඈත පෙරදිග උඩවැඩියා වර්ග පිළිබඳ ව, ජපානයේ සිටින ප්‍රධාන ම දැනුමැත්තා ය. ඔහු ගේ ඇතැම් පැළ ඩොලර් දස දහස ඉක්මවන මිලට විකිණෙයි. එය සුපිරි විශේෂඥ ක්ෂේත්‍රයක් වන අතර කලාපය තුළ ඔහුට මහත් ඉල්ලුමක් ඇත. ඔහු නිතිපතා ජපානය තුළ සංචාරය කරයි. ගමනෙහි යෙදෙද්දී ඔහු දුරකතනයට හසු කර ගත්තේ ඉතා අමාරුවෙනි. දෙබස කෙටියෙන් මෙසේ විය:

"ටොමෝවට පස්සෙ මොන ඉස්කෝලෙට ද ගියේ?"

"මම කොහේටවත් ගියේ නෑ?"

"ඔයා කොහේටවත්ම ගියේ නැද්ද? ටොමෝව ඔයා ගේ එකම ඉස්කෝලේ?"

"හරි ඒක හරි."

"දෙය්යනේ, දෙවෙනි මට්ටමේ ඉස්කෝලෙකටවත් ගියේ නැද්ද?"

"ඔව්, ඔව් ගියා ඔයිටා ද්විතීයික විද්‍යාලෙ මාස කීපයක් හිටියා. එයින් පස්සෙ අපි කියුෂුවල පදිංචියට ගියා."

"ද්විතීයික පාසලක ඉගෙනීම අනිවාර්යයි නේද?"

"ඔව්, ඒක ඇත්ත, ඒ වුණාට මට බැරි වුණා."

"අය්යෝ, ඔහු කොතරම් වාසනාවන්ත දැ?"යි මට සිතිණ. යුද්ධයට පෙර නිරිත දිග ටෝකියෝවේ, තොදොරෝකි පෙදෙස පුරා මුළුමනින් ම පාහේ පැතිර ගිය තවාන් උද්‍යානයක් ඔහු ගේ පියාට අයත් විය. නමුත් බෝම්බවලින් ඒ සියල්ල විනාශ විය. අප සංවාදයේ දී ඔව් මාතෘකාව වෙනස් කළ විට, ඔහු තුළ එකල පැවැති ශාන්ත නිසල බව යළිත් පෙනී ගියේ ය.

"වැඩියෙන් ම සුවඳ මල මොකක්ද? කියලා ඔයා දන්නවාද? ඒ තමයි චීන වසන්ත උඩවැඩියා. සිම්බිඩියම් වයර්සන්ස්. කිසිම සුවඳක් ඒකට සමාන කරන්න බැහැ."

"ඒවා මිලද?"

"සමහරක් මිලයි. සමහරක් මිල නෑ."

"ඒවා මොන වගේද?"

"ඒවා එච්චර ලස්සණ නෑ. සමහර විට එළියට පේන්නෙත් නෑ. සැඟවිලායි, තියෙන්නේ. ඒක නිසයි, ඒක සිත් ගන්නේ"

ටොමෝවෙහි සිටි අවදියට වඩා ඔහු මඳකුත් වෙනස් වී නොසිටියේ ය. හෙමිහෙමින් කළ ඔහු ගේ කතාවට සවන් දුන් මට මෙසේ සිතිණ. "ද්විතීයික පාසලකින් ඉගෙනීමට නො ලැබීම එයාට කොහොමටවත් ප්‍රශ්නයක් වෙලා නෑ. එයා තමා ගේ ම වැඩක් කර ගෙන තමා තුළ ම විශ්වාසය තියා ගෙන වැඩ කරනවා" මට පුදුම නො වී සිටිය නො හැකි විය.

## කසුවෝ අමදරා

සතුන් ප්‍රිය කළ අමදරා, වැඩුණා ම ගොවිපළක් හිමි ව සත්ත්ව පාලකයකු වීමට අපේක්ෂා කළේ ය. අවාසනාවකට ඔහු ගේ පියා හදිසියේ මිය ගිය අතර, ජීවන පැවැත්ම මුළුමනින් ම වෙනස් කර ගැනීමට ඒ අනුව සිදු විය. නිහොන් සරසවියෙහි පශු වෛද්‍ය හා සත්ත්ව පාලන පාසලෙන් අස් ව, කීයෝ රෝහලේ රැකියාවකට යාමට ඔහුට සිදු විය. දැනට ඔහු ආත්මාරක්ෂක බළකායේ මධ්‍යම රෝහලේ සායනික පරීක්ෂණ සම්බන්ධ වගකිව යුතු තිලයක් දරයි.

## අයිකෝ සායිෂෝ (දැන් කනාකා මහත්මිය)

ටෝගෝ නැව්පති වැනි උසස් මාමා කෙනකු හිමි ව සිටි අයිකෝ සායිෂෝ ඕයමා විදුහලට අනුබද්ධ මූලික පාසලෙන් අස් ව, ටොමෝවට ඇතුළු වී සිටියා ය. ඇය තැන්පත් යහපත් කාන්තාවක වනු ඇතැයි එකල මම සිතුවෙමි. තුන් වන ආරක්ෂක බළකායේ මේජර් වරයකු වූ ඇය ගේ පියා මැන්චූරියන් සිද්ධියේ දී මරණයට පත් ව තිබූ බැවින්; ඇය ගැන මට එසේ සිතුණි,

කමකුරා උසස් කාන්තා විද්‍යාලයේ ඉගෙනුම අවසන් කළ අයිකෝ ගෘහ නිර්මාණ ශිල්පියකු සමඟ විවාහ වූවා ය. දැන් ඇගේ පුත්තු දෙදෙනා ම රැකියා කරන වැඩිහිටියෝ ය. ඇය දැන් කාව්‍ය රචනය සඳහා තමා ගේ කාලය වැඩි වශයෙන් යොදයි.



මෙයිජි මහාධිරාජ සභාවෙහි කිවිඳියක වූ සුපතළ නැන්දණිය ගේ සම්ප්‍රදාය ඇය අනුගමනය කරනවා දැයි මම ඇගෙන් විචාළෙමි.

අපහසුවට පත් ලෙසක් දක්වමින්, "නෑ, නෑ"යි ඇය පිළිතුරු දුන්නා ය.

"ඔයා ටොමෝවෙදි වගේම ඇනුත් හරි ම වාම්, ගැහැනු ගතියක් කැපී පෙනෙනවා" මම ඇයට කීවෙමි. "ඔව්, ඔව් මම බෙන්කෙයි ක්‍රීඩා කරන දවස්වල වගේම තමයි ඇනුත් මගේ පෙනුම." ඇය දිරිමත් හඬින් පිළිතුරු දුන්නා .

ඇගේ ගෘහය කෙතරම් උණුසුම් හා සන්තුෂ්ටි ජනක විය යුතු දැයි සිතන්නට ඇගේ හඬ මා පෙලැඹැවී ය.

## කිකෝ ඕකි (දැන් කවබාරා මහත්මිය)

පියාඹන කකුළු පැටවුන් සිටි කීකෝ චං, කීකෝ සරසවියට අනුබද්ධ මූලික පාසලේ ගුරුවරයකු සමඟ විවාහ වී සිටියි. දැන් ඇය ගේ දුව ද විවාහක ය.

## යොයිචි මිජිටා

මළ ගෙවල අග්ගලා ගෙනේමට පිළිණ දුන් මිජිටා උද්‍යාන විද්‍යා උපාධියක් ලද්දේ ය. නමුත් චිත්‍ර ශිල්පය ඉතා ප්‍රිය කළ ඔහු ආපසු විදුහලකට ඇතුළු වූයේ ය. මුසාෂිනෝ ලලිත කලා විද්‍යාලයේ අධ්‍යාපනය සම්පූර්ණ කළ ඔහු දැන් තමා ගේ ම මුද්‍රණ සැලැසුම් සමාගමක් පවත්වා ගෙන යයි.

## රියෝ චං

යුදට ගිය මුරකරු රියෝ චං උවදුරු රහිත ව ආපසු පැමිණ, සුවෙන් වෙසෙයි, සෑම නොවැම්බර් තුන් වැනිදාවක ම පැවැත්වෙන ටොමෝ එකතුවට පැමිණීම ඔහු කිසි ම වසරෙක පැහැර නො හරියි.